(திருமதி ரங்கநாயகி பத்மநாதன் — மட்டக்களப்பு மாவட்ட அமைச்சர்)
(Mrs. Ranganayaki Pathmanathan – District Minister, Batticaloa)

Sir, I was a little confused listening to the hon. Member for Attanagalla speaking about the performance reports put out by this Ministry. He spoke of the lack of evaluation. All that this Ministry has done is to present statistics, both favourable and unfavourable, presented by other Ministries. It is for us to evaluate the performance from the statistics supplied by the Ministries. This kind of evaluation is meant for the lay people and not for economists. There is the Ministry of Finance and all the institutions under it to evaluate from an economic angle.

The performance of the development programmes of this government is kept under surveilleance by this Ministry. Extensive research, planning and close monitoring in undertaken by its Progress Control Division. They conduct symposiums, workshops and seminars. Periodical reviews of the progress and achievements of the line Ministries, of even lead projects, like Mahaweli, IRDB, UDA Export Development Board are very useful yardsticks to measure the progress of our development activities. Even the performance of individual sectors like tourism, foreign aid and scale of utilization, are all very valuable information afforded to the scurity of the general public and to the government and the Opposition Members. Sir, this Ministry is like a mirror that permanently reflects a performance graph indicating favourable and unfavourable ups and downs for the benefit of the general public.

Plan Implementation as the words suggest may savour of a centralized urban scale implemntation of plans but we find that the Ministry as it stands today has developed new dimensions with district-wise rural orientation. The policy of this Government is to improve the quality of life of the peasant and the rural poor. The Census and Statistic Department has taken surveys of varied fields covering many aspects of life to gather statistics to plan a better life for the people. The Food and Nutrition Policy-planning Division has undertaken a series of programmes of national and district levels. The nutrition education project at district level will help the rural areas. The radio and the television nutrition programmes will reach the village folk. Thanks to this Government, transistor radios are easily available and even television has reached the village. I hope, Sir, FAO assistance will be sought to extend the food and nutrition planning to cover more village areas.

During the last Government leaving the country either for employment or a holiday was a mountain of labour. Travel was an exclusive right of the favoured class. Exchange was a miserly £ 4. But with the open economy people are free to travel. People migrated in search of employment and the flow of foreign exchange was in the reverse order. Foreign exchange flowed into the country and not out of the country.

Therefore, Sir, this Ministry had to put out a bulletin by the title "Migration Statistics-1980". This is a useful study. The need to compile these statistics prove the fact that large numbers have been able to find jobs in the Middle-East countries.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රංගනායකී පද්මනාදන් මහත්මිය]

The Job Bank system cannot by itself satisfy the demands for jobs. Many of those who were under age in 1978 have better qualifications than those in the Job Bank scheme. They have become a disgruntled lot. Then, Sir, in some cases there are more registrants in the district Job Banks than in the central Job Bank. The District Job Banks moved slowly as the jobs for those without the "O" Levels are few. The posts available are only those of hospital orderly labourers, watchers and peons. I understand surveys are conducted for employment opportunities in the private sector. I hope this information will be used to harness all avenues of employment to help the unemployed.

The National Fertilizer Secretariate is another agency that aims at improving the rural sector. Some foreign organizations that cover fertilizer development in Asia and the Pacific region have justified the existence of the NES as beneficial for the farming sector. A report on the use of fertilizer by the paddy farmers would prove very useful to the farming sector. This Government has spent money on many such research and survey projects. Our policies are aimed at increasing the views of the farmer. Many foreign agencies have funded these projects. I hope the Children's Secretariat will widen its scope of activity to cover areas in the Amparai and Batticoloa districts. An integrated rural development programme for Amparai is long over due. I hope this district will be the next in the list.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake - Kotmale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අපට හුඟක් දේවල් කථා කරන්න තිබෙනවා. රජයේ ඇතැම් ප්‍රතිපත්ති නිසා සමහර විට නියෝජ්‍ය ඇමතිතුමාට යම්-යම් කටයුතු නිසියාකාරව කරන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

මේ ආණ්ඩුව 1977 මහා මැතිවරණයේදී ජනතාවට දුන් පොරොන්දු එකින්-එක ඉෂ්ට කිරීම සඳහා ගත යුතු පියවර මොනවාද ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake - District Minister, Kandy)

මොනවාද, අපි නොකළේ ? කරුණාකර, අපි නොකළ ඒවා කියන්න බලන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තවම එක දුම්මල වරමයි, ගැහුවේ. දුන්න ඇවිස්සිලා.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

කට්ටඩි වැඩේද, දුන් කරන්නේ ?

කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා (මාතලේ දිසා ඇමතිතුමා)
(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க — மாத்தளை மாவட்ட அமைச்சர்)
(Mr. K. W. R. M. Ekanayake - District Minister, Matale)

1977 මහා මැතිවරණයේදී මහජනතාව තමුන්නාන්සේලාගේ මුළු ආණ්ඩුවටම දුම්මල ගහලා එලවා දැම්මා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

දුන් කොයි තරම් යාග කළත් වැඩේ හරි යන්නේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

යාග නොවෙයි, අපි දුන් කරන්නේ හෝම.

තමුන්නාන්සේලා පසුගිය මහා මැතිවරණයේදී කී දේවල් ඉෂ්ට වෙනවාදැයි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ කටයුතුවලින් අපට පෙනෙනවා. අපි පසුගිය දවස්වලත් මේ ගැන කීවා. දිළිඳු සහන සම්බන්ධයෙන් සිදු විය යුතු දේවල් හරි විධියට කෙරෙනවාද ?

කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා
(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க)
(Mr. K. W. R. M. Ekanayake)

තමුන්නාන්සේලා කවදද, අපි කළ වැඩක් හරිය කීවේ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපි හරි එකට හරිය කියනවා.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

කවදවත් කියා නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ වාගේම, බෙල්ල කඩලා ගියත් වැරදි දේට වැරදියි කියනවාමයි.

කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා
(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க)
(Mr. K. W. R. M. Ekanayake)

වැරදියි කියන්නේ ඔබතුමා නේ ? තමුන් මහජනයා එහෙම කියන්නේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේලා බලයට එන්න ඉස්සෙල්ලා කීවේ මොකක්ද ? ඇවිදින ඇටසැකිලිවලට මස් දම්මවන්න ඕනැය කියායි.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

ඔව්, දුන් මස් දමලා නැද්ද ?

කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා
(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க)
(Mr. K. W. R. M. Ekanayake)

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා දිහා බැලුවාමත් ඒ බව පෙනෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අද තිබෙන්නේ ඇටසැකිලි නොවෙයි. ඇටත් ගැලව්ච්ච සැකිලි විතරයි.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (අනුරාධපුර දිසා ඇමතිතුමා)
(திரு. கே. டீ. எம். சீ. பண்டார — அனுராதபுர மாவட்ட அமைச்சர்)
(Mr. K. D. M. C. Bandara – District Minister, Anuradhapura)

හොයලා බලන්න, ගැලවිලාද කියා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අර ඇට අටත් ගැලවිලා ගිහිල්ලා.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

ඇට අටක් නොවෙයි, ඕනෑ තරම් තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එදා තමුන්නාන්සේලා කීවේ මොකක්ද? ළමයින් මන්දපෝෂණයෙන් පෙළෙනවාය, ඉස්කෝලේ යන්න විධියක් නැත, ඉගෙන ගන්න මොළයක් නැත –

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

ඒ කාලයේ ඉස්කෝලෙට ඇතුළු කර ගත්තේ අවුරුදු හතෙන්.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා
(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)
(Mr. W. M. G. T. Banda)

තමුන්නාන්සේලාගේ කාලයේ – [බාධා කිරීම්]

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Is the hon. District Minister for Anuradhapura raising a point of Order ? He must allow the hon. Member to speak. I will give each hon. Member an opportunity to speak. Hon. Member for Kotmale can continue now.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අනුරාධපුරේ දිසා ඇමතිතුමාට නම් නියෝජ්‍ය සභාපතිතුමනි, විකුණන්නත් එක්ක මස් තිබෙනවා.

මම මෙතෙන්දී කථා කළේ මූලික සිද්ධාන්ත අනුවයි. තමුන්නාන්සේලාම කිව්ව දේට විරුද්ධව යන එකයි තමුන්නාන්සේලාගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේත් ක්‍රම සම්පාදනයේත් මූලික වරද. මම දන්නෙ නැහැ එය කොතෙක්දුරට තමුනාන්සේලා පිළිගන්නවාද කියා. මම කියවන්නම් පොඩි ප්‍රවෘත්තියක් :

The "Island" of 24.01.85 says :

"Productivity gains are not the only ingredient for development"

This has ben said by Dr. Rasaputram, Governor of the Central Bank :

"What was acceptable today was a theory that ensured growth with social justice. Since Sri Lanka had nearly 40 pc of her people below the poverty line, the attack on poverty needed to be speeded up on several fronts. Every enterprise, organisation or institution must have adequate information to keep a track of productivity performance."

මොකක්ද මෙහි කියන්නෙ ? අද සියයට 40ක් දුප්පත්කමින් පෙළෙන අය ඉන්නවා. මේ කියන්නෙ මේ අවුරුද්ද ගැන. මේ කියන්නෙ මහා බැංකුවේ අධිපති රාසපුත්‍රම් මහතා. 100ක් ගත්තොත් 40ක් දරිද්‍රතාවෙන් පෙළෙන අයලු. අවුරුදු අටක් කරලත් මේකද තත්ත්වය ? එහෙම නම් කොහොමද තමුන්නාන්සේලා කෑගහන්නෙ මේ විධියට ? ඒ මොකද, 1977 දී තිබුණ සියයට ගණන 43යි. අදත් සියයට 40ක් විතර ඉන්නවාය කියා මෙතුමා කියනවා. එතකොට සියයට 40ක ජනතාවක් දුප්පත් කමින් ජීවත් වන්නෙ. බඩගිනි හමුදුව සියයට 40ක් අදටත් ඉන්නවා. එතකොට මේ බඩගිනි හමුදව වැඩි කරන්න තමුන්නාන්සේලා තවත් ආධාර දෙනවා. ඒ කොහොමද ? දිළිඳු සහන කපනවාලු. දිළිඳු සහන තවත් සියයට 50කින් කපනවාය කියන්නෙ අද සියයට 40ට තිබෙන දරිද්‍රතාව සියයට 60ක් 70ක් දක්වා වැඩි වීමයි. [බාධා කිරීමක්] හරි. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය අනුව ක්‍රම සම්පාදනය හරියට හරි. ඇයි ? ඒ ප්‍රතිපත්තිය අනුව සියයට 20ක් 30ක් පමණ වන මහා ධනවතුන්ට පමණක් ජීවත් වෙන්න අවස්ථාව සලසනවාය කියන එක මේකෙන් පෙනෙනවා. [බාධා කිරීමක්]

පූ. භා. 10.45

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman.)

Is it a point of Order ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

Yes, Sir.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

What is the point of Order ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

I must point out to the hon. member that he is discussing matters that should be raised when the votes of the Ministry of Finance are debated. Now we are discussing the Votes under the Minister of Plan Implementation. It is the Ministry of Finance that deals with planning.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I accept that they are two Ministries.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please ! The hon. Member must address the Chair. That is left to me.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I want to explain to the hon. Member because he should know.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

The Planning Minister comes under the Ministry of Plan Implementation. They are not separate Ministries. Who separated them ?

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please !

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

They are two separate ministries.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Yes, I am sorry.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Why does not the hon. Member address theChair ? Then there will be no problem.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Hereafter I will address the Chair.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

It is easy for me to conduct the affairs of this House when the hon. Members address the Chair.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Hereafter I will address the Chair. I do not want to break the rules.

අපේ මහනුවර දිසා ඇමතිතුමා කියනවා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයත් අමාත්‍යාංශ දෙකක්ය කියා. එහෙම අමාත්‍යාංශ දෙකක් ඇති කලේ කවිද ? එකක් වශයෙන් තිබුණ අමාත්‍යාංශය දෙකක් කලේ කවිද ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා මම මෙය කියන්න කැමතියි. අමාත්‍යාංශ පිහිටුවීම බලයේ සිටින රජයට තිබෙන වගකීමක්. එය විරුද්ධ පක්ෂයට තිබෙන අයිතිවාසිකමක් නොවෙයි. ඒ අනුව ජනාධිපතිතුමා කැමති විධියට අමාත්‍යාංශ ඇති කර තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

හරි, හරි, ඒක තමයි මම කියන්නෙ. අමාත්‍යාංශ ඇති කිරීමේ වරද උඩ –
[බාධා කිරීම්]

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

නැහැ ඒකෙ වරදක් නැහැ. [බාධා කිරීම්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

වැරදි න්‍යායක පිහිටුවල තිබෙන්නෙ.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

කිසිම වරදක් නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ක්‍රම සම්පාදනය කරන්නෙ එක්කෙනෙක්. ක්‍රම ක්‍රියාත්මක කරන්නෙ තව එක්කෙනෙක්. ඒ නිසා කිසිම කෙනෙකුට අමාත්‍යාංශයක වැඩක් හරියට කරන්න බැහැ. ඒ නිසා තමයි මේ තත්ත්වය ඇවිත් තිබෙන්නෙ.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

ඇයි නැත්තෙ ? තමුන්නාන්සේ දන්නෙ කොහොමද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ක්‍රම සම්පාදන අමාත්‍යාංශයත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයත් දෙකක් නොව එකක් කළ යුතුයි. එය අනිවාර්යයෙන්ම සිදු විය යුතු දෙයක්. තමුන්නාන්සේලාගේ රජයේ පළමුවැනි පියවරම වැරදියි. පළමුවැනි පියවරම වැරදි හැටියටයි සකස් වී තිබෙන්නෙ.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

අපි පිළිගන්නෙ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මෙතන ක්‍රම සම්පාදනයක් නැහැයි කියන එකයි අපි කියන්නෙ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතන ක්‍රම සම්පාදනයක් ඇත්තෙ නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Please do not interrupt. The hon. Members must listen to the Opposition also. Will the hon. Members please co-operate with me ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

If they want to disturb me I do not mind it. Let them disturb me. [*Interruption*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

The hon. District Minister for Anuradhapura is an experienced Member of this House. He must not behave in this manner. I must be in a position to conduct the affairs of this House. Will the hon Members please co-operate with me ? Let the hon. Member for Kotmale speak. After that I will allow each and every hon. Member to speak. They must listen to the Opposition also.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

He is a very senior Member. He has been in the Senate also with the hon. Deputy Chairman.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Pardon ? I cannot hear the hon. Member.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

I told the Deputy Chairman that the hon. Member is a very senior Member and has been in the Senate with him. He is not a junior Member.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Thank you very much.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

I like to ask the hon. Member whether Mrs. Bandaranaike nominated him to the Sentate.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

I know all about it. The hon. Members need not enlighten me on that. The hon. Member for Kotmale can continue now.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

They like to have some interruptions.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

The hon. Member can wind up now. How long do you want ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

That is a hell of a thing ! Even yesterday –

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Forget about yesterday and think of today.–[*Interruption*]. How long do you want to speak ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Even yesterday, under the Votes of the Ministry of Rural Industrial Development I was not allowed to speak. The hon. Deputy Chairman adjourned within one hour after that. We had enough time but the hon. Members were not given enough time to speak.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Forget about yesterday and think of today. How long does the hon. Member want.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I cannot say. I will go head and finish speaking.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

Did Mrs. Bandaranaike nominate the hon. Member to the Senate ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Why should I answer the hon. Member for Chilaw. Who is he ?

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

Did not the hon. Member fight against Mrs. Bandaranaike ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙක දෙකක් හැටියට තිබීම ගැන මම එදත් විරුද්ධ වුණා. අදත් විරුද්ධයි. මේ දෙක එක් අමාත්‍යාංශයක් බවට පත් කලේ නැත්නම් තමුන්නාන්සේලාට කවදාවත් රටට අවශ්‍ය වන ක්‍රම සම්පාදනය හෙවත් රට සකස් කළ යුතු පිළිවෙළ තිසි විධියට කරන්නට බැහැ. අපි තමුන්නාන්සේලාට විරුද්ධව කතා කරනවා නොවෙයි. තමුන්නාන්සේලාගේ ඒ වරද හදන්න ඕනෑ. එක්කෝ මේ දෙකම මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]
අමාත්‍යාංශය යටතට එන්න ඕනෑ. එසේ නැත්නම් මේ අමාත්‍යාංශ දෙක එක් අමාත්‍යාංශයක් බවට පත්වෙන්න ඕනෑ. එහෙම වුණොත් ඒ නිලධාරි මහත්වරුන්ටත් මේ කටයුතු ක්‍රියාත්මක කිරීම අපහසු වන්නේ නැහැ.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

1973 දීත් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයක් වෙනම තිබුණා. ඒ කාලයේ මොනවද කෙරුණු වැඩ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම කියන්නේ ඒකත් වැරදි බවයි.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

එහෙම නම් පිළිගන්නවා තමුන්නාන්සේලා කළ දේවල් වැරදියි කියල.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

හම්බන්තොට දිස්ත්‍රික් ඇමතිතුමාට මේක විහිළුවක්ද මම දන්නේ නැහැ. තමුන්නාන්සේලා කවුරුවත් කළ වැරදි නැති කරනවාය කියා දැන් අවුරුදු නවයක් තිස්සේ ඒ වරදම කරගෙන යනවා [බාධා කිරීම්]

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් තමුන්නාන්සේලා කළ වැඩ හරි නැහැ. දැන් අපි වැඩ කරගෙන යනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අවුරුදු නවයක් තිස්සේ එය වෙනස් කරන්න තමුන්නාන්සේලාට බැරි වුණේ ඇයි ? ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. අවුරුදු නවයක් ගිහින් අහනවා කලින් 1970 දීත් තිබුණා නේද කියා. 1970 දී හරි 1971 දී හරි තිබුණාට අපට ප්‍රශ්නයක් නැහැ. ඒ ආණ්ඩුව පරාජය වුණේ ඒ ක්‍රම සම්පාදනය ආදී සියල්ලම වැරදි නිසාය කියලනේ තමුන්නාන්සේලා කියන්නෙ. දැන් තමුන්නාන්සේලාත් ඒකම ක්‍රියාත්මක කරලා අපට කියනවා 1970 දීත් තිබුණා. ඒක නිසාත් අපිත් කරනවාය කියා. මොන තර්කද ? තමුන්නාන්සේලා මොන තර්කද ඉදිරිපත් කරන්නේ ?

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

අපි කරන දේ හරිය කියලයි අපි කියන්නෙ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මහදනමුත්තත් කිව්වේ එහෙම තමයි. මුට්ටිය ගන්න බැරිනම් එළුවගෙ බෙල්ල කපන්න කිව්ව ඒක හරියි කියල. ඉතින් ඒක හරි. ඒ විධියට බලන කොට තමුන්නාන්සේලාගෙ කෙරුවාවත් හරියට හරි.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ජනතාව පිළිගෙන තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ජනතාව පිළිගත්තා නෙමෙයි. තමුන්නාන්සේලාට පේනව හරියි කියා. [බාධා කිරීම්]

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

හරි නිසා තමයි අතුරු මැතිවරණ ඔක්කොම දිනුවෙ. [බාධා කිරීම්] මුල්කිරිගල මොකද වුණේ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බලයට එන හැම රජයක්ම — [බාධා කිරීම්]

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. District Minister for Hambantota, please do not interrupt him. I am appealing to the House.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බලයට එන හැම රජයක්ම මේ විධියට හිතන්නෙ. ඒ ගොල්ල කරන වැඩ හරිය කියල හිතන්නෙ.

කේ. අබේවික්‍රම මහතා (මාතර දිසා ඇමතිතුමා)
(திரு. கே. அபேவிக்ரம — மாத்தறை மாவட்ட அமைச்சர்)
(Mr. K. Abeywickrema – District Minister, Matara)

Sir, I would like to clarify one point. I want to know whether it is. "මහජන මුත්තා." or "මහදන මුත්තා."

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මහදනමුත්තයි පොල්බැමුණයි.

ගරු සභාපතිතුමනි, මට තිබෙනවා ප්‍රශ්න දෙකක් තුනක් අහන්න. තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ආචාර්ය වික්‍රම වීරසූරිය මැතිතුමා.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

මස්සිනා නේද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මට ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. එතුමා ඕවාගේ අමාත්‍යාංශයක ලේකම් හැටියට වැඩ කරන්න පමණක් නොවෙයි ඊට වඩා උසස් තැනකට වුණත් සුදුසුයි. මට ප්‍රශ්න වගයක් තිබෙනවා. එතුමාගෙන් මම එකක් අහන්න කැමතියි. එද ආණ්ඩුව පටන්ගත් සංවර්ධන සැලසුම් වගයක් කොත්මලේ ආසනයේ තිබුණා. කොත්මලේ මැතිවරණ කොට්ඨාශ සංවර්ධන සමුපකාර සමිතිය—

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

තමුන්නාන්සේ ඊයෙයි මට ඔක මතක් කළේ. විස්තර දන්වලා ලියුමක් එව්වා නම් ඒ ගැන ක්‍රියා කරන්න තිබුණා. ඔක ගැන ඊයෙයි මට මතක් කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපි මේ ගැන ලේකම්තුමාට—

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

ලේකම්තුමාට මම කියන්නම්. ඒ වෙලාවෙම මම විස්තර දැන්නුවා ලේකම්තුමාට.

කරුණාකර විස්තර ලියා එවන්න. මම ඒ ගැන ක්‍රියා කරන්නම්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

විස්තර මම එවනවා. මේ දළ වශයෙන් මම කියන්නේ [බාධා කිරීමක්]

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please ! Please do not address the Secretary. Address the Minister if you have to say something.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

If I am mistaken I will leave it out. I do not want to address him. I just wanted to mention it.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Address either the Chair or the Minister.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ව්‍යාපෘති 11 ක් තිබුණා. ඒ ව්‍යාපෘති 11 න් දැනට ක්‍රියාත්මක වන්නේ 3 යි. 8 ක් නැතිවන තැනට පත් වී තිබෙනවා. කවුරුවත් ඒවායේ ගණන් මිනුම්වත් සොයන්නේ නැහැ. මම අහන්නේ මෙයයි. සංවර්ධන නිලධාරි මහත්වරු දෙදෙනෙක් සිටිනවා. ඒ අයට පඩි ගෙවනවා. මේ සම්බන්ධව මීට කලිනුත් මම කියා තිබෙනවා. නිලධාරීන් දෙදෙනෙකුත් ඉඳගෙන අවුරුදු 8 ක් 9 ක් තිස්සේ කරන වැඩ මොනවාදැයි මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මෙය කිව්වා. ඒයෙයි එතුමාට කිව්වේ. නමුත් එය අමතක නොවෙන්නට මේ අවස්ථාවේදීත් ඒ ගැන සඳහන් කරන්න ඕනෑ. මම ඒ ලියුම් ටික එතුමාට දෙනවා. මේ අවස්ථාවේ මේ ගැන දිග විස්තරයක් කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. මෙය විශාල ප්‍රශ්නයක්. මට ඕනෑ කරන්නේ ඒ සංවර්ධන ව්‍යාපෘති වැසීම නොවෙයි. ඒක වහන්නට බැරිවයි, තිබෙන්නේ. තමුන්නාන්සේලා කොටස් දෙකකට එය කර තිබෙනවා. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් මෙම ව්‍යාපෘති ඇති කළත් එහි පාලනය තිබෙන්නේ සමුපකාර දෙපාර්තමේන්තුවටයි. සමුපකාර දෙපාර්තමේන්තුවයි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයයි අතරේ තිබෙන කඹ ඇදිල්ල නිසා මෙය ක්‍රියාත්මක කරන්නට නොහැකි වී තිබෙනවා. ඒ නිසා මේවා සියල්ලක්ම අභාවයට යනවා.

දැනට ඒ අය රු.2,45,000 ක ඉතිරි කිරීමක් කර තිබෙනවා. ඒ සංඛ්‍යා ලේඛන මා ළඟ තිබෙනවා. ඕනෑ නම් තමුන්නාන්සේට ඒවා දෙන්නම්. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ නිලධාරීන් කියනවා " අපට ලොරියක් තිබෙනවා, ඒ ලොරියෙන් හොඳ ආදායමක් එනවා, මාසයකට රු.15,000 ක පමණ ආදායමක් එනවා, ඒ ආදායම ගන්නට බැරි වී තිබෙනවා, ලොරිය ඇක්සිඩන්ට් එකක් වෙලා සුළු තුවාල වගයක් සිදු වූ නිසා, එය හදා ගන්නට සමුපකාර දෙපාර්තමේන්තුවෙන් මුදල් ඉල්ලූ විට ඒ අය ඒ සඳහා මුදල් දෙන්නේ නැහැ, ඒ සඳහා අනුමැතිය දෙන්නේ නැහැ " කියා. අනුමැතිය නැතිව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට එය කරන්නට බැහැ. එසේ කළොත් මෙය සමුපකාර සමිතියක් නිසා සංවර්ධන කටයුතු කරන නිලධාරි මහත්වරුන්ට අධිභාරයක් එනවා. කවද හෝ ඒ අධිභාරයට වග කියන්නට ඒ අයට සිදු වෙනවා. ඒ නිසා ඒ අය මෙය නොකර සිටිනවා. දැන් අවුරුද්දකටත් වැඩි කාලයක් තිස්සේ ඒ ලොරිය ගරාජ් එකට දමා තිබෙනවා. ඒ ලොරිය බලා ගන්නවාටත් දවසකට රු. 15 ක් පමණ " සබ්සිස්ටන්ස් " ගෙවනවා. ඊට අමතරව ක්ලීනර්ට සහ ඩ්‍රයිවර්ට පඩිත් ගෙවනවා. අවුරුද්දකටත් වැඩි කාලයක් ඔය තත්ත්වයටයි, තිබෙන්නේ. මේ සම්බන්ධව එහෙන් ලියා එවා තිබෙනවා. සමුපකාර දෙපාර්තමේන්තුවටත් ලියා තිබෙනවා. ඒ අය ගෙන්වා සාකච්ඡා කළා. දෙපැත්තක් නිසා මෙහි අමාරු තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා එය බේරුමක් කර දෙන්නය කියා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා. වහාම සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සංවර්ධන සභා නිලධාරීන් කැඳවා ඒ සම්බන්ධව පරීක්ෂණයක් කර සුදුසු පරිදි කටයුතු කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

පූ. භා. 11

තමුන්නාන්සේලාගේ සැලසුම් ක්‍රියාත්මක කිරීම උඩ අපේ ප්‍රදේශයේ තිබුණු සෑම කුඩා කර්මාන්තයක්ම වාගේ වැසී ගියා. විවිත් සෙන්ටර්ස් ආදී පොඩි පොඩි කර්මාන්ත තිබුණා. පවර්ලූම් සෙන්ටර්ස් තිබුණේ එකම එකයි. එයත් දැන් වහලා. එහි ළමයින් තුන්සිය ගණනක් පමණ සේවය කළා. දැන් එය වහලා. විවිත් සෙන්ටර්ස් ගමක් ගානේ තිබුණා. සමහර ගම්වලට දෙකක් තිබුණා. ඔක්කෝම විවිත් සෙන්ටර්ස් හතළිස් ගණනක් තිබුණා. ගම්බද තරුණයින් හා ගැහැණු ළමයින් 1,200 ක් 1,300 ක් පමණ ඒවායේ වැඩ කර ජීවත් වුණා. සැලසුම් ක්‍රියාත්මක කරනවා කියන්නේ මොකක්ද ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ පරමාර්ථය ගම් දියුණු කිරීමයි. ගරු අගමැතිතුමා හැමදාම කියනවා " ගම හද රට හදමු " කියා. නමුත් ගම හදන්නේ නැහැ ; ගම කනවා.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

ඔය පේෂකර්මාන්ත වැඩේ අපේ අමාත්‍යාංශයේ වැඩක් නොවෙයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම කියන්නෙ සැලසුම් ක්‍රියාත්මක කිර්මේ අමාත්‍යාංශය [බාධාකිරීමක්] ඒවා ක්‍රියාත්මක කෙරෙන්නේ නෑ. ඒකයි මම කිවේ මේ ඇමතිකම් බෙදීමේ වැඩ පිළිවෙළ යටතේ —

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

ගරු මන්ත්‍රීතුමා, කාර්ය නියමයක් නැති අමාත්‍යාංශය යටතේ ඕවා ගැන කතා කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මුළු ලංකාවේම ප්‍රතිපත්තියක් වශයෙන් පොඩි කර්මාන්ත තිබුණු ඒවා අරගෙන නොවෙයි [බාධාකිරීමක්] මම මේ කතා කරන්නෙ ගමත්, ගම් දියුණු කරන්න තිබුණු වාතාවරණයත්, නැතිවීම ගැනයි. මම මේ අමාත්‍යාංශවලට කියන්නෙ නැවත මේවා හදන්න කියලයි. එක පැත්තකින් තමුන්නාන්සේ කියනවා මගේ අමාත්‍යාංශයට අයිති නැහැ කියා. මම පිළිගන්නවා මේ වරද තිබෙන්නේ එතැනයි කියන එක [බාධාකිරීමක්] අපි හැමදාම කෑ ගහනවා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තිබෙන —

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, it is high time you wound up your speech. There are other hon. Members who are waiting to participate in the Debate.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

No Sir, I want another 10 minutes.

සම්පූර්ණයෙන්ම ගම හැදීමේ පරමාර්ථයක් තමුන්නාන්සේලාට තිබෙනවා නම් –

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order please. Hon. Member, you have taken so much of time. There are so many other hon. Members down to speak. Please wind up in five minutes.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I will try, but I cannot give any promise.

මම ඒ සම්බන්ධව කිව්වෙ අපි ළඟ කොතෙකුත් අදහස් තිබුණත්, ගම හැදීම සම්බන්ධව ගතයුතු පියවර, ඒ සම්බන්ධව අදාළ පියවර, ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් හෝ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් අරගෙන නැහැ. ඒක ලොකු වරදක්. අපි දන්නවා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අහු නොවන කිසිම දෙයක් ලංකාව තුළ තිබෙන්නට බැහැ. සෑම එකක්ම ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙන්නේ ඒ අමාත්‍යාංශයටයි. තමුන්නාන්සේලා සැලසුම් ක්‍රියාත්මක කරන්න. නමුත් දැන් බලන්න ජොබ් බැන්ක් කියා එකක් තිබෙනවා. එක කොටසකට පමණයි එය තිබෙන්නෙ. වතු අතරේ තිබෙන රැකියා කාටද දෙන්නෙ ? කවුද ගන්නෙ ? කොහොමද ඒවා දෙන්නෙ ? ඒවා ගැන මොන සැලැස්මක්ද කර තිබෙන්නෙ ? නමුත් එදා සිට, 1977 සිට, අපි කියනවා වතුවල රක්ෂා දෙන්නේ සමහර වෙලාවට ඒ වත්තේම ඉන්න සුපිරින්ටෙන්ඩන්ට් ගේ හෝ වෙන එක්කෙනෙක්ගේ නැත්නම් ටී මේකර්ගේ නෑයාට. ඇයි ඒවාට ඇඩ්වර්ටයිස් කරලා ගන්න බැරි ? ඒවා ප්‍රසිද්ධ කරන්නෙ නැත්තෙ ? වතු රක්ෂා සඳහා අවුරුද්දකට එක්ලක්ෂ පනස් දහක් පමණ වේකන්සීස් ඇතිවෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

අභූත !

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අභූත නෙවෙයි. මම තමුන්නාන්සේට පෙන්වන්නම් ඒවා, ගණන් හදලා ?

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

පෙන්වන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එක්ලක්ෂ පනස් දහකට පමණ රැකියා තිබෙනවා. ඒ එක රැකියාවක්වත් ගම්බද කෙනෙකුට ගන්න පුළුවන්ද ? නැත්නම් ලංකාවේ වෙන කෙනෙකුට ගන්න පුළුවන්ද ?

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

සම්පූර්ණ බොරුවක්. ගම්බද අයටත් දෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඇයි, ඒවා සම්පූර්ණයෙන් ප්‍රසිද්ධ කර ඒ සම්බන්ධව සැලසුමක් හදා ඒක ක්‍රියාත්මක කරන් බැරි ? මම අහන්නෙ ඒකයි. ජොබ් බැන්ක් එක ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. තමුන්නාන්සේ කියන දේ මම විශ්වාස කරන්නම්. තමුන්නාන්සේ කෙරෙහි අපි මිත්‍රයෙක් හැටියට හෝ අපි ගරු කරන කෙනෙක් හැටියට විශ්වාසය තැබුවාට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මොකද, රටට යම්කිසි අයහපතක් වෙනවා නම් ජනතාවට ඵල ප්‍රයෝජන නැත්නම් තමුන්නාන්සේගෙන් අපෙන් මිත්‍රකම තිබුණාට වැඩක් නැහැ. සමහරවිට නැදෑයොත් ඉන්න පුළුවන්. නමුත් ඔවුන් වැඩේ වැරදි විදියට යනවා නම් ඒ ගැන නොකියා බැහැ. ඒ කියන්නෙ යම්කිසි පිරිසකට පමණක් ඒ රැකියා ආදිය උරුම වෙනවා නම් ඒ අස්සේ සිටින ගම්බද ජනතාවට, ඒ වතු තුළ සිටින ගම්බද ජනතාවට ඒවා ලැබෙන්නෙ නැත්නම් කොහොමද මේ රටේ එය සැලසුම් ක්‍රියාත්මක කිරීම සාර්ථක වෙන්නේ ? ඒකයි මම පෙන්වා දෙන්නෙ. එම නිසා මම කියන්න කැමතියි සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී තමුන්නාන්සේලා ගන්නා පියවරවල් හරියට කල්පනා කර, නියම විධියේ සැලසුමක් ඇතිව නොකළොත්, මම හිතන හැටියට තමුන්නාන්සේලාට මේ ප්‍රදේශවල ජනතාව සන්තෝෂ කරන්න ලැබෙන්නෙ නැහැ. මේ ප්‍රශ්නවලදී තමුන්නාන්සේලා අපක්ෂපාත වෙන්නෙ නැහැ. අපට දැනටත් ඒක පේනවා. රැකියා සම්බන්ධව එක ඇමතිවරයෙක් කියනවා, අපි අත ගහන්නේ නැහැ, අපි ලැයිස්තු එවන්නේ නැහැ, අපි ලැයිස්තු යැවීම සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා. පසුගිය ආණ්ඩුව විට ක්‍රමයට පත්වීම් දුන්නා. අපි ඒක කරන්නේ නැහැ කියා. නමුත් අද යන්නේත් ඒ විධියටමයි. ඒ ලැයිස්තු යනවා. ලැයිස්තු යවනවාය කියන්නේ, මම පෙන්වන්නම්, මගේ ළඟ තිබෙන ඒවා. [බාධාකිරීම්] අද බැරි නම් පසුව මම තමුන්නාන්සේට පෙන්වන්නම්. මා ළඟ තිබෙනවා. ඒක මම සභාගත කරන්නම් [බාධාකිරීම්]

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, please wind up in a minute. The Hon. Deputy Minister of Education has to speak.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කාලවේලා නොමැති නිසා මගේ කථාව අවසන් කරන්න වෙනවා. මේ අවස්ථාවේදී මම කියන්න කැමතියි, අමාත්‍යාංශයේ කිසිම කෙනෙකු සමඟ මම විරුද්ධත්වයක් නැති බව. නමුත් ප්‍රතිපත්තිවලට විරුද්ධවයි. ප්‍රතිපත්ති වැරදියි. වැරදි ප්‍රතිපත්ති උඩ තමුන්නාන්සේලාටවත් අපටවත් කවදාවත් සහනයක් ලැබෙන්නේ නැහැ. ඒකයි. අපි කියන්නේ. අපි මේ ගැන සංඛ්‍යාලේඛන එකතු කර තිබෙනවා. ඒවා ගැන මම කථා කරන්නට යන්නේ නැහැ. ඒ මන්ද, කාල වේලා නැහැ කියනවා, තවත් ගරු මන්ත්‍රීවරු කථා කරන්නට එන්නවාය කියනවා, ඒ අයට අවස්ථාව දෙමින් මගේ කථාව අවසන් කරනවා.

වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)
(Mr. Weerawanni Samaraweera – Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක කාරණයක් පමණක් මතක් කිරීමටයි මම බලාපොරොත්තු වුණේ. නමුත්, ඊට වඩා වචන ස්වල්පයක් කථා කළ යුතුයයි මම දැන් හිතනවා.

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වා, මේ ගමයි, ගම සංවර්ධනය කිරීමයි අතර විශාල පරතරයක් තිබෙනවාය, එයින් ගම සංවර්ධනය වන්නේ නැහැ කියා. මම අහන්න කැමතියි, පසුගිය ආණ්ඩුව කාලයේ එක ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයක්වත් මේ රටේ කොතැනකවත් ක්‍රියාත්මක කළාද කියා. අද කියනවා, අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා යටතේ මේ අමාත්‍යාංශය තිබෙනවාය කියා. නමුත් ඒ කාලයේ ඒ අගමැතිනියගේ බලතල යටතේයි මේ අමාත්‍යාංශය තිබුණේ. පස් අවුරුදු සැලැස්මය කියා මොනවාද කළේ ? ශත පහක තුට්ටුවක වැඩක් කළාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිසිම දෙයක් කළේ නැහැ. ඊයේ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා, පොල් කිරි පොවන්නට ලැහැස්ති වෙලා, අපේ කොල්ලන්ට. ගොත් කිරිවත් තිබුණේ නැහැ ඒ කාලයේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඔය කථාව හොඳයි වේදිකාවට. වියළුවේ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
මොකක්ද අද මේ අයවැය විවාදයේදී විපක්ෂය කරන්නේ? සමහර අමාත්‍යාංශවල ඉන්නවා ආණ්ඩු විරෝධී නිලධාරීන්. ඒ නිලධාරීන්ගෙන් හොරෙන් එක එක තොරතුරු අරගෙන විපක්ෂයේ කට්ටිය ඔක්කොම එක්කාසු වෙලා ඒ නිලධාරීන්ව ගැලරියට ගෙන්වාගෙන එක එක අමාත්‍යාංශවලට පෞද්ගලිකව මඩ ගහන ඉතාමත් කැත නින්දිත ව්‍යාපාරයක් ගෙනියනවා. ඊයේ සිදුවූයෙත් ඒවාගේ නින්දිත ව්‍යාපාරයක්. නින්දිත වැඩක් ඊයේ කළේ. පෞද්ගලිකව ධීවර ඇමතිතුමාට පහර ගහන්න ඉතාමත් කැත නින්දිත වැඩක් කළේ, විපක්ෂය එක්කාසු වෙලා. රටට මහජනයාට හිත සුව පිණිස නොවෙයි කථා කළේ. නින්දිත ව්‍යාපාරයක් ඊයේ ගෙන ගියේ. හැම තැනම කරන්නේ ඒකයි. අද මේ අමාත්‍යාංශය ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මොකක්ද කරන්න ගියේ? පෞද්ගලිකව මේ අමාත්‍යාංශයේ ලේකම්ට පහර ගහන්නයි. අපි බලාපොරොත්තු වෙන්නේ ඒවා නොවෙයි. අපි අභියෝග කරනවා විරුද්ධ පාර්ශ්වයට, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ එක ග්‍රාමීය ඒකාබද්ධ යෝජනා ක්‍රමයක්වත් කොතැනක හෝ ඒ ආණ්ඩුව කාලයේදී ක්‍රියාත්මක වුණාද කියා. බොරු ව්‍යාපාරයක් විතරයි ගෙන ගියේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
අභියෝග කරන්න ඕනැ නැහැ, පොත් ටිකක් අවුස්සලා බලන්න දන්නෙ නැත්නම්. [බාධා කිරීම්]

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
පොත් පත් නොවෙයි ඇවිස්සුවේ; කොල්ලොයි, බල්ලොයි, කුණු බක්කි ඇවිස්සුවා. පොත් පත් නොවෙයි ඇවිස්සුවේ. ලක්ෂ ගණන් කෝටි ගණන් පොත් අච්චු ගැහැව්වා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
වේදිකා කථාවක් කරලා වැඩක් නැහැ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
ඊයේ විපක්ෂයෙන් කියන්න යෙදුණා, බොන කිරි ටික බහු ජාතික සමාගම් අයිති කරගෙනය කියා. එදා එතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන කාලයේ පෝලිම්වල අම්මලාගේ උකුලේ දරුවන් මැරුණා, කිරි ටින් එක ගන්න ගිහිල්ලා, පැය ගණන් රස්තියාදුවෙලා. පාන් රාත්තල ගන්න පැය හතරක් පහක් පෝලිමේ හිටියා. ඔන්න ඒ අයගේ සැලසුම් ක්‍රියාත්මක කිරීම. පාන් රාත්තල අරගෙන පාරෙන් අනෙක් පැත්තට පනිනකොට ඇඳිරි නීතිය කියා— [බාධා කිරීම්] තිකම් නොවෙයි මැරුණේ. ඒ විධියටයි මැරුණේ.

අද සහනාධාර ගැන කථා කරනවා. මොනවාද එදා ගන්න තිබුණේ? රෙදි යාර දෙකයි දුන්නේ. අපි කිව්වා නම් පසුගිය ආණ්ඩුවේ අගමැතිනියට ඔය රෙදි යාර දෙක පටලවාගෙන පාරේ යන්න කියා. [බාධා කිරීම්] අද තිබෙනවාද එහෙම එකක්.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ඒක ගන්න ගිහින් තිබුණු රෙද්දත් නැති වුණා.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
අද හැම ගම්මානයකම වාගේ මොනවා හෝ සැලැස්මක් ක්‍රියාත්මක වෙනවා. එදා රජය ත්‍රස්තවාදී ව්‍යාපාරය කියා මිනිසුන්ට කන්නට දුන්නේ නැහැ. අගහරුවාද සහ සිකුරාද බත් කෑවොත් කොල්ලන්ගේ ඔළුව පලනවා. හෝටලයකට ගිහින් කාටවත් බත් කන්න තහනම්. මයියොක්කා නැටි කාලා මිනිසුන්ගෙ පණ ගියා. ඒ පස් අවුරුදු සැලැස්ම යටතේ මිනිසුන් කෑවෙ හුඹස් මැටි. එදා එහෙම කළ අය අද ලොක්කො වගේ කථා කරනවා. අපි කියන ඒවාට උත්තර දෙන්නට බැරි වන විට, විරුද්ධ පක්ෂයට කහින වුන් ටික දෙපාර්තමේන්තුවලින් එක්කරගෙන ඇවිත්, ඇමතිවරුන්ට මඩ ගැසීමේ ජරා වැඩ කරනවා. මේ වගේ ජරා ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න එපා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
දුන් අර ඇට අට කොහේද තියෙන්නේ?

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
අහගාලා බලනවා, කොහේ කොහේ තියෙනවාද කියල.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
ඇට අටට වඩා ඕනෑ තරම් තියෙනවා.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
රටේ සංවර්ධනය ගැන තර්කානුකූලව කථා කරනවා නම් අපිත් ඒ විධියට කථා කරන්නට සූදානම්. කුණුහරුප කියනවා නම් අපිත් කුණුහරුප කියන්නට ලැහැස්තියි. මඩ ගහනවා නම් අපිත් මඩ ගහන්න ලැහැස්තියි. මඩ තවරා ගත් අනන්ත අප්‍රමාණ අය, විරුද්ධ පක්ෂයේ ඔය පැත්තේ ඉන්නවා. අපි ලැහැස්තියි ඒවා වුණත් පෙන්වා දෙන්නට. නමුත් මහජන යහපත පිණිස තර්ක කරනවා නම්, අපි ඒ ආකාරයෙන් තර්ක කරමු.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මඩ නොවෙයි තාර ගෑවිලායි තියෙන්නේ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
පසුගිය ආණ්ඩුවේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළින් රටේ ඇති වුණු සංවර්ධනයත්, මේ අවුරුදු කීපය තුළ අපේ රජයේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ඇති වී තිබෙන සංවර්ධනයත් සංසන්දනය කර බලන ලෙස මම විරුද්ධ පක්ෂයට අභියෝග කරනවා. හැම ගම්මානයකම ඒ සංවර්ධනය දකින්නට තිබෙනවා. එපමණක් නොවෙයි, මන්ද පෝෂණ ව්‍යාපාරය පිළිබඳවත්, පෝෂණ තත්ත්වය පිළිබඳවත් කිසියම් අවබෝධයක් ජනතාව තුළ අද ඇති වී තිබෙනවා. හැම ගම්මානයකම තිබෙනවා—

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
පෝෂණය නැති වුණත් අවබෝධය තිබෙනවා.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
එදා අවබෝධයක් තිබුණෙත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
දැන් අවබෝධය තිබෙනවා, පෝෂණයක් නැහැ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
එපමණක් නොවෙයි, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම යටතේ පාරවල්, ජල යෝජනාක්‍රම, වැව්, විදුලිබලය, සෞඛ්‍ය පහසුකම් මේ ආදි හැම දෙයක්ම අද ඒ ගම්මානවලට ලැබිගෙන යනවා. නමුත් එදා එහෙම තත්ත්වයක් තිබුණාද ? ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම යටතේ අද දිස්ත්‍රික්ක කීයක එවැනි සැලසුම් ක්‍රියාත්මක වෙනවාද ?

විශේෂයෙන්ම අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීම සඳහා පිටරටවලින් අද අපට ආධාර ලැබෙනවා. එමනිසා මේවා ගැන හරි අවබෝධයකින් යුක්තව කථා කරන්න. එපමණක් නොවෙයි, රැකියා බැංකුව මඟින් ගම්බද තරුණ තරුණියන් කොතරම් සංඛ්‍යාවකට රැකියා ලබා දී තිබෙනවා ? එදා එවැනි තත්ත්වයක් තිබුණාද ? එදා තිබුණේ නගරබදට පමණක් සීමා වුණු රැකියා තත්ත්වයක්. පෞද්ගලිකව ආසන මට්ටමෙන් කථා කරනවා නම්, අපටත් තිබෙනවා පෞද්ගලික ප්‍රශ්න ගැන මතක් කරන්නට. නමුත් පොදුවේ ගත්තොත් කිසියම් සේවාවක් සිදු වී ඇති බව පිළිගන්න ඕනෑ. ඇත්තෙන්ම සමහර රැකියා එදා තිබුණේ එක් එක් කණ්ඩායම්වලට විතරයි. නමුත් දැන් පොදුවේ හැම දෙනාටම එම රැකියා ලැබෙනවා. වතුකරයේ රැකියා ලැබෙන්නේ නැතැයි කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වත්, ඒවායේ රක්ෂා අපේ මැතිවරණ කොට්ඨාශවලටත් බෙදා දී තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒක තමයි වරද, හොරෙන් හොරෙන් ගිහින් රක්ෂා ලබා ගන්නවා. අනික් අයට නැහැ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
මොකක්ද කර ඇති වරද ?

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
කොත්මලේ ආසනයෙන් විසි පස් දෙනෙක් තෝරා ගෙන තිබෙනවා, ලිපිකරු, ක්ෂේත්‍ර සහායක, කර්මාන්ත ශාලා සහායක ආදි වශයෙන්. මන්ත්‍රීතුමා ඒවා ගැන දන්නේ නැහැ. ඒ සිංහල අය.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
මන්ත්‍රීතුමා දන්නේ නැහැ. තමුන්ගේ කොට්ඨාශයටවත් යන්නේ නැහැ.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
මන්ත්‍රීතුමා ඉන්නේ ගම්පොළ. තමන්ගෙ ආසනයටවත් යන්නේ නැහැ. ආසනයෙ කෙරෙන්නෙ මොනවාද කියාවත් දන්නේ නැහැ.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් ගම්බද ප්‍රදේශ සංවර්ධනය වී තිබෙනවාද නැද්ද කියා ලබන අවුරුද්දේදී පැවැත්වෙන, පළාත් බද සංවර්ධන සභා මැතිවරණයෙන් අපි බලා ගනිමු. ගම්බද මහජනතාව ඔය ගොල්ලන්ගේ පැත්තේද, පව හලනවුන් පස්සේද එහෙම නැතිනම් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරන අපේ රජය පැත්තේද කියා බලමු.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
අපේ නම් කිසිම විශ්වාසයක් නැහැ, එවැනි මැතිවරණ ගැන. තමුන්නාන්සේලා හොඳට තර්ජනය දමා වැඩේ කර ගනියි.

පූ. භා. 11.15

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
අපි දන්නවා, මුල්කිරිගල අතුරු මැතිවරණයේදී මොකද වුණේ කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට පෙන්වා දෙන්නට කැමති, තවත් එක් කාරණයක් තිබෙනවා. ජාත්‍යන්තර ආධාර යටතේ, ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන යෝජනා ක්‍රම විශාල වශයෙන් ඇති වෙනවා. ඒ හැම එකක්ම ක්‍රියාත්මක වෙන්නේ රජයේ වගකීම යටතේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අනුදැනුම ඇතුවයි. නමුත් මෙයට අමතරව, ජාත්‍යන්තර වශයෙන් මෙන්ම දේශීය වශයෙන්ද යම් යම් සංවිධාන එකතු වී මුදල් සොයා ගෙන ගම්මාන දියුණු කිරීමේ ව්‍යාපාර පවත්වා ගෙන යනවා. විදේශීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන්ද කණ්ඩායම් එකතුව අපේ රට තුළ ක්‍රියාත්මක වන "ජලූන්" නැමැති ආයතනයක් තිබෙනවා. මේ අය අප රට තුළ ගෙන යන ව්‍යාපාරයට රජයේ කිසිම සම්බන්ධතාවක් නැහැ. "අපේ කිසිම දේශපාලන සම්බන්ධකමක් නැහැ, අපි කරන වැඩ ගැන රජයෙන් අහන්නේ නැහැ" ඔය විධියට කියමින්, තමන් කැමති අන්දමට, හිතුවක්කාර විධියට, මෙම ව්‍යාපාරය මඟින් ගම්මානවලට මුදල් දී ගෙන යනවා. එම ආයතන ගම්මානවලට ගිහින් ප්‍රසිද්ධියේම කියනවා, තමන් රජයට කිසිම සම්බන්ධකමක් නැති ස්වාධීන ආයතනයක් බව. නමුත් රජයට විරුද්ධ, දේශපාලන පාක්ෂිකයන්, කණ්ඩායම් එකතු කර යම් යම් වැඩ, ව්‍යාපාර ඇති කර ගෙන යනවා. මෙය ඉතාමත්ම භයානක දෙයක්. එහෙමනම්, "ජලූන්" නමින් හඳුන්වන මෙම විදේශීය ආයතනයේ අය ලංකාවට ඇවිත් සිටින්නේ මොනවාටද, මේ අයගේ සැලසුම මොකක්ද, ග්‍රාමීය ප්‍රදේශවලට ගිහින් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්නට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් අවසර ලබා ගෙන තිබෙනවාද, දේශීය වශයෙන් සම්බන්ධකම් පවත්වන්නේ කවුරුන් සමගද, ගම්මාන තෝරා ගැනීමේ පදනම, සැලැස්ම මොකක්ද ?

ඒ අය ප්‍රසිද්ධියේම කියනවා, "අපි රජයට සම්බන්ධ නැහැ, රජයට බැඳීමක් නැහැ. අපි ස්වාධීනයි" කියලා. එහෙම නම් සල්ලි වියදම් කරන්නේ ඇයි ? අපි දන්නවා, 1970 ගණන්වල දකුණු කොරියාවේ කිම්ඉල්සුන්, කෝටි ගණන් මුදල් වියදම් කර පත්‍රවල ප්‍රචාරයක් ගෙන ගියා. නමුත් 1971 වන විට ත්‍රස්තවාදී කැරැල්ල පටන් ගත්තා. අද මේ සංවිධානවලත් සිටිනවා, විපක්ෂයේ උදවිය. මගේ මැතිවරණ කොට්ඨාශයේ ගම්මානයකදී ඒ අය ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා. "ආණ්ඩුව අපට ඕනෑ නැහැ. අපි සල්ලි පිටරටින් ගෙනත් වැඩ කරනවා" කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර උදවිය, ගම්මානවල. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා, රුසියාව දක්වා මුළු ලෝකයම, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ලෝකයේ හැම රටක්ම ගෙනයන හැම ක්‍රියාදාමයකටම දේශපාලනය මුල් වී තිබෙන බව. එය අද ලෝක සිද්ධාන්තයක්. මේ රටේ සෑම දෙයක්ම සිදු වන්නේ දේශපාලන වශයෙන් පාර්ලිමේන්තුවෙන් රාජ්‍ය තන්ත්‍රයෙන් ගන්නා ක්‍රියාමාර්ග මත නම් එක එක සංවිධානවලට ඇවිත් හිතුවක්කාර විදියට මේ ව්‍යාපාරය කටයුතු කරන්නට ඉඩ දෙන්නේ ඇයි ? සමහරවිට මේ විදේශීය සංවිධාන සමග එකතු වී හිතු මතයට මුදල් ගරා ගන්නා මිනිසුන් මේ පළාත්වල ඉන්න පුළුවන්. මිනිහෙකුට වැසිකිළියක් දීලා, ටකරන් දෙකක් දීලා, ඩොලර්වලින් සල්ලි අරගෙන රුපියල් ශතවලින් වියදම් කරලා පෞද්ගලිකව මුදල් හම්බකරමින් හැදෙන වැඩෙන කුට ව්‍යාපාරිකයින් ඇති වෙන්න පුළුවනි. මා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් දැඩි ලෙස ඉල්ලා සිටින්නේ, මේ "ජලූන්" කියන ආයතනයේ වැඩකටයුතු ගැන සොයා බලන ලෙසයි. මේ ව්‍යාපාරය ඉතාමත් හිතුවක්කාර විධියට කටයුතු කරනවා. කිසිම දෙයක් දැනුම් දෙන්නේ නැහැ. මේ ව්‍යාපාරයේ කටයුතු පිළිබඳව දිසාපති දන්නේ නැහැ. උප දිසාපති දන්නේ නැහැ. ග්‍රාම සේවක දන්නේ නැහැ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රාදේශීය නියෝජිත මහත්වරු දන්නේ නැහැ. ඒ අය බලහත්කාරයෙන් ගම්වලට ගිහින්, ගම් තෝරාගෙන ඒ ගම්වල මේ ව්‍යාපාර ඇති කර ගන්නවා. මේ ව්‍යාපාරය සමහරවිට අන්තවාමාංශික දේශපාලන ව්‍යාපාරයක්ද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහරවිට අපට සැක හිතන්න පුළුවන්. මේවාට සහභාගී වී සිටින සමහර ප්‍රදේශවල අය රජයට විරුද්ධ දේශපාලන සිතුම් — පැතුම් තිබෙන අයයි. මේ සංවිධානවලට සම්බන්ධ වී සිටින අය ඒ ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරු සමග සම්බන්ධ වී වැඩ කරන්න කැමති නැත්නම්, ඒ අය පිළිබඳව දැඩි අවධානයක් යොමු කර ඒ අය මේ රටින් පිට කරන්න. යම් ප්‍රදේශයක ඉන්න මන්ත්‍රීවරයා මොන පක්ෂයේ හෝ වේවා ඔහුයි, මහජන නියෝජිතයා. මහජනයා වෙනුවෙන් සෑම දෙයකටම පෙනී සිටින්නේ ඔහුයි. එහෙම නම් ඔහු අනිවාර්යයෙන්ම සම්බන්ධ විය යුතුයි, මේ ව්‍යාපාරයට. එහෙම සම්බන්ධවීමක් ඇති කර ගන්න එම ව්‍යාපාර කැමති නැත්නම්, ඒ අයට මේ රටින් පිටමන් වෙන්න කියන්න.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට දැනට කරගෙන යන වැඩපිළිවෙළ මීටත් වඩා ප්‍රගතියක් ඇතිව කිරීමෙන් මහජනයා අතරට යන්නට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda – Baddegama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය යටතේ කරුණු කිහිපයක් සඳහන් කරන්න ඕනෑ. ඒ මොකද, මේ රටේ වැඩකටයුතු පිළිබඳ වගකීමක් ඇතුව සෑම අමාත්‍යාංශයකටම උපදෙස් දීමටත්, ඒ අමාත්‍යාංශවල වැඩ පිළිවෙළවල් පිළිබඳව සැලසුම් ඉදිරිපත් කිරීමටත් ආදි වශයෙන් කිවහැකි සෑහෙන වැඩ කොටසක් මේ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා. නමුත් මා හිතනවා, ඒ පැවරී තිබෙන වැඩකොටස්වලින් බොහොමයක් ඒ අමාත්‍යාංශයට ස්වාධීනව හා ඒ අමාත්‍යාංශයේ අභිමතය පරිදි ක්‍රියාත්මක කරන්න අමාරු වෙන්න පුළුවන් කියා. ඒ බව මේ අමාත්‍යාංශයේ අරමුණු දෙස බලන විට පෙනෙනවා. මේ අමාත්‍යාංශයේ අරමුණු 1986 අයවැය ඇස්තමේන්තුවේ 347 වන පිටුවේ මේ විධියට සඳහන් වෙනවා :

1. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම සැකසුම සහ අගැයුම.
2. ජාතික අරමුණු සාක්ෂාත් කරගනු වස් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන්ගේ ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන් සමායෝජනය කිරීම.
3. ආර්ථික කර්තව්‍යයන්හි යෙදුනු ආයතන සහ ව්‍යාපාරායතනවල කටයුතු අගැයුම.
4. සැලසුම් ඉලක්කය කරා එළඹීමෙහි ලා ඊට අදාළ තොරතුරු පතුරුවාලීම.
5. ප්‍රාදේශීය සංවර්ධනය
6. මිනිස්බල සැලසුම් සහ රැකියා දත්ත බැංකුව පරිපාලනය කිරීම.
7. ජනගහන ප්‍රතිපත්ති සැකසුම හා ක්‍රියාත්මක කිරීම.
8. ආහාර හා පෝෂණ ප්‍රතිපත්ති ක්‍රම සම්පාදනය.
9. සංවර්ධන ක්‍රම හා සම්බන්ධිත සංඛ්‍යාලේඛන සේවාවන් දියුණු කිරීම.
10. පරිසරය අපවිත්‍ර වීම අඩු කිරීමට හා වැළැක්වීම සඳහා වැඩපිළිවෙළවල් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

මේ විධියට පැවරී තිබෙන කටයුතු දෙස බලනවිට, ඒ අමාත්‍යාංශයේ වැඩකටයුතු සඳහා අමාත්‍යාංශයේ උපදෙස් සමහරවිට අවශ්‍ය නැති තත්ත්වයට පත් වෙනවා. එම නිසා, පැවරී තිබෙන වැඩපිළිවෙළේ එක පැත්තකට අමාත්‍යාංශය වැඩියෙන් ගමන් කර තිබෙනවා. උදාහරණයක් හැටියට බැලුවොත් ආහාර හා පෝෂණ ප්‍රතිපත්ති ක්‍රම සම්පාදනය එහෙම නැත්නම් මිනිස් බල සැලසුම් සහ රැකියා දත්ත බැංකුව පරිපාලනය කිරීම කියන එක ක්‍රියාත්මක වෙන්න පුළුවන්. නමුත් මේ ප්‍රාදේශීය සංවර්ධනය, පරිසරය අපවිත්‍රවීම අඩු කිරීමට හා වැළැක්වීම සඳහා වැඩ පිළිවෙළවල් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම වැනි ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. උදාහරණයක් හැටියට අරගෙන බැලුවොත් මැලතියොන් නිසා ඇති වුණ පරිසර අපවිත්‍රවීම එහෙම නැත්නම් ක්ලෝරීන් නිසා ඇති වුණ පරිසර අපවිත්‍රවීම පසුගිය මාස කීපය තුළ අවස්ථා කීපයකදීම සෑහෙන දුරට ඇති වුණා. ඒ වාගේ අවස්ථාවලදී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය කවර පියවර ගත්තාද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

අමාත්‍යාංශයට පැවරුණු කාර්යය අපහසුවීමට, එක් අංශයක කටයුතු කිරීම අපහසුවීමට හේතුව, රජයේ ප්‍රතිපත්ති අනික් අමාත්‍යාංශවලින් ක්‍රියාත්මක කරන ආකාරය නිසා නැත්නම් සමස්තයක් හැටියට රජය ගත්තා ප්‍රතිපත්ති නිසා ඇති වූවක් වෙන්න පුළුවන්ය කියන එක විශේෂයෙන් මම සඳහන් කරන්නට ඕනෑ. උදාහරණයක් වශයෙන් ගත්තොත් අපේ වාගේ රටක මේ ආර්ථික සැලසුම් ක්‍රමය ඉතාමත් වැදගත් වෙනවා. නමුත් මේ අමාත්‍යාංශය ඉදිරිපත් කරන ආර්ථික සැලසුම් ක්‍රමය කුමක්ද ? ඒ සැලසුම් ක්‍රමය තුළ රජයට හැසිරවිය හැකි නිෂ්පාදන සහ පරිභෝජන භාණ්ඩ පිළිබඳව එහෙම නැත්නම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ පරිභෝජන ක්ෂේත්‍රය හැසිරවීම පිළිබඳව මේ අමාත්‍යාංශයට කොයි තරම් ශක්තියක් තිබේද ? එහෙම නැත්නම් ඒ ශක්තිය රජයට තිබේද ? මෙයට විශේෂයෙන්ම හේතු වී තිබෙන්නේ මෙන්න මේ නිදහස් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන අවස්ථාවේදී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ආර්ථික ක්ෂේත්‍රයේ කවර කොටසක් කරනවාද කියන එකයි. ඒක හරිම අමාරු වැඩක්.

ඒ නිසා ආර්ථික සැලසුම් පිළිබඳව අමාත්‍යාංශය ඉදිරිපත් කළ යුතු වෙන්නේ පෞද්ගලික අංශයට සහ නිදහස් විවෘත වෙළඳ ප්‍රතිපත්තියට අනුකූල සැලසුමක්. නමුත් පෞද්ගලික අංශය ඒ සැලසුම්වල ඉන්නවාද ? හසුරුවන්න පුළුවන්ද ? පාරිභෝගිකයන්ගේ භාණ්ඩවල මිල පිළිබඳව කථා කරමින් වෙළඳ පොළේ තිබෙන මිල නැඟීම් හසුරුවන්න මුදල් අමාත්‍යාංශයටවත්, රජයටවත් පුළුවන්කමක් නැත කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමෙක් මේ ගරු සභාවේ ප්‍රකාශ කළා මට මතකයි. ඒ විධියට පෞද්ගලික අංශයේ විදේශීය ආයෝජන කැඳවීම් තුළින් ඒ අයගේ වැඩ පිළිවෙළවල් ඉදිරිපත් වෙනවිට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය කවර කොටසක් ඉටුකරනවාද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. මෙන්න මේ නිසා වෙන්න පුළුවන් මේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ පෝෂණ වැඩ පිළිවෙළ පැත්තට, මවු කිරි දීම, කොළ කැඳ දීම, එන්නත් දීම පැත්තට වැඩියෙන් යොමු වී තිබෙන්නේ. ආර්ථික ක්ෂේත්‍රයේ සැලසුම් පිළිබඳව මේ අමාත්‍යාංශයේ සැලසුම් පිළිගන්නා මට්ටමක් නැහැ. පෞද්ගලික අංශය නිසා හෝ විදේශීය කොම්පැණි පැමිණීම නිසා හෝ වෙළඳ පොළවල් පිළිබඳව, නිෂ්පාදනයන් පිළිබඳව හැසිරවීම කෙරෙහි මේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ ආර්ථික ක්ෂේත්‍රයට බලපෑම අඩු වී තිබෙනවා. මේ අමාත්‍යාංශයේ සැලසුම් ක්‍රියාත්මක කිරීම ආර්ථික අංශයට නැඹුරුවීම නැති වී තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන්ම අපේ වගේ සංවර්ධනය වන රටක මේ අමාත්‍යාංශය සතු කාර්ය භාරය මේ කථා කරන පෝෂණ සහ එදිනෙද ජීවිතයට බලපාන වැඩ පිළිවෙළ, පරිභෝජන සැලසුම් වගේම නිෂ්පාදන සහ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ සැලසුම් පිළිබඳවත් යොමුවීම ඉතා වැදගත්ය කියා මම හිතනවා. ඒ පිළිබඳව කල්පනා කරනවිට ප්‍රදේශීය සංවර්ධන අංශයෙන් කිසිම සංවර්ධනයක් පසුගිය කාලයේ තිබුණේ නැත කියන අදහසක් ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කළා. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යටතේ ගම්වල සම්පත් පාවිච්චි කර, ගම්වල නිෂ්පාදන ඒකකයන් ඇති කර, ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර යටතේ කොයි තරම් විශාල පිරිසක් ගම්වල නිෂ්පාදනයන්ට හවුල් වුණාද කියන එක මම අහන්නට කැමතියි. ගම්වල තිබුණු ඒ ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර බොහෝ අවස්ථාවන්හි සාර්ථක ප්‍රතිඵල ඉදිරිපත් කළා. නමුත් අද ඒවා හුඟක්ම අඩපණ වී තිබෙනවා. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල සම්බන්ධයෙන් 1980 ජූලි 15 වනද නිකුත් කළ අංක 57 දරන චක්‍රලේඛය මගින් ඒ මණ්ඩල අහෝසි කිරීම නිසා එහෙම නැත්නම් ඒවායේ බලතල අඩු කිරීම නිසා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව ගම් මට්ටමින් තිබුණු වැඩ පිළිවෙළ අඩපණවුණු බව මම විශේෂයෙන් කියන්න ඕනෑ. උදාහරණයක් හැටියට කියනවා නම්, මගේ ආසනයේ ඉතාම හොඳ කොන්ක්‍රීට් පෙරනිම් භාණ්ඩ කම්හලක් තිබුණා. ඒ කම්හලේ 55 දෙනෙක් වැඩ කළා. මුළු දිස්ත්‍රික්කයටම අවශ්‍ය සිමෙන්ති භාණ්ඩ සැපයුවේ ඒකෙනුයි. සියලුම දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සිමෙන්ති භාණ්ඩ මිලදී ගත්තේ ඒකෙන්. නමුත් මේ ආණ්ඩුව ආවාට පසුව කොන්ක්‍රීට් භාණ්ඩ සම්බන්ධයෙන් මේ ප්‍රාදේශීය සංවර්ධන සමූපකාරයට තිබුණු වෙළඳ පොළ නැති වුණා. ඒ වෙළඳ පොළ නැති වුණේ මොකද ? පෞද්ගලික අංශයේ වෙළෙන්දන්, කොන්ක්‍රීට් කොම්පැණිකාරයන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අල්ලාගෙන ඒ සැපයීම් කරන්නට පටන් ගත්තා. එතකොට රජයේ ආයතන විසින් මේ ප්‍රාදේශීය සංවර්ධන සමූපකාරයේ නිෂ්පාදන මිලදී ගැනීමේ ක්‍රමය අහෝසි වුණා. එසේ අහෝසි වනවිට ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල අලාභදායක තත්ත්වයට පත් වුණා. මෙන්න මේ දෙය රජයේ ප්‍රතිපත්තිය වන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ අඩපන වෙන්නත්, ඒ වැඩ පිළිවෙළ ආර්ථික ක්ෂේත්‍රයේ ගම් මට්ටමට ප්‍රාදේශිකව බලපාන්න අසමත් වෙන්නත් හේතු වුවා.

මේ අමාත්‍යාංශයට අදාළ නොවුණත් දන් උදාහරණයක් වශයෙන් ගත්තොත් අත්යන්ත්‍ර වලින් රෙදි වියමින් ගම් මට්ටමේ රෙදි නිෂ්පාදනයේ නිරත වුණු විශාල පිරිසක් සිටියා. නමුත් අද ඒ අත්යන්ත්‍ර සියල්ලම පැත්තකට දන්න සිදු වී තිබෙනවා. මොකද, රෙදි ආයාත කිරීමත්, විදේශීය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

කොම්පැනි කීපයකට මේ රටේ රෙදි නිෂ්පාදනය පිළිබඳ බලය දීමක් නිසා. අද සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ගම් මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙලක රෙදි නිෂ්පාදනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කලොත්, එය සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙනවා. විදේශීය ආයෝජන කැඳවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය එයට හේතු වී තිබෙනවා. විදේශීය ආයාත කිරීම්, භාණ්ඩ ගෙන්වීම්, වෙළඳ පොළ පිළිබඳව බලයක් නැතිව නිෂ්පාදනයේ යෙදීමේ තේරුමක් නැහැ. මෙන්න මේ නිසා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙනත් වෙනත් වැඩ කටයුතුවලට යොමු වෙනවා. ඒ අයට රටේ මූලිකව කලයුතු වැදගත් කොටසක් අතපසු වෙනවා, එය ඒ අයගෙන් කෙරෙන්නේ නැහැ. ඒ අයට එය කරන්න බලයක් නැහැ. පෞද්ගලික අංශය ලවා විදේශීය කොම්පැනි කැඳවා විවෘත වෙළඳ පොළක් ඇති කොට ආර්ථික ක්ෂේත්‍රයේ නිෂ්පාදන කාර්ය භාරය ඒගොල්ලන්ට භාරදී මෙහෙයවීමේ පිළිවෙතින් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට, ඒ අමාත්‍යාංශයේ පරමාර්ථවල මූලික කොටසක් ඉටු කරන්න බැරිව සිටිනවා. එහෙම නැත්නම් ඒ ගොල්ලෝ ඉදිරිපත් කරන අදහස් ක්‍රියාත්මක කරන්න පෞද්ගලික අංශයේ ඉඩ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිරි නිෂ්පාදනය පිළිබඳව තෙස්ලේ සමාගම ගත් පියවර ගැන කිව්වා. දූන් මෙයින් තෙස්ලේ සමාගම බලාපොරොත්තු වෙන්නේ ගම්බද ගොවීන්ගේ කිරි නිෂ්පාදන අයිතිය අහිමි කරන්න. ලෝකයේ විවිධ රටවල තෙස්ලේ සමාගම එසේ කර තිබෙනවා. අපි ළඟ ඒ පිළිබඳ වාර්තා තිබෙනවා. ඒ සමාගම රටේ කිරි ආහාර නිෂ්පාදනයට පියවර ගෙන, අධිකාරියක් ගොඩ නගා ගත්තාට පසුව ඒ සමාගමට උපදෙස් දෙන්න ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට බැහැ. යම් සමාගමකට බහුජාතික සමාගමක් වෙන්න නම් රටවල් හයක නිෂ්පාදන තිබෙන්නට ඕනෑ. ඒවාගේම කෝටි හැටකට වැඩි පිරිවැටුමක් ඒගොල්ලෝ පෙන්නුම් කරන්න ඕනෑ. ඒ වාගේ සමාගමක් රට තුලට පැමිණ, ඒගොල්ලන්ගේ නිෂ්පාදනයට සහ ඒගොල්ලන්ට වැඩ පිළිවෙලක් ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සැලසුමක් මගින් ඉදිරිපත් කර පිළිගන්නවා කියනවා නම් එය කොහේවත් රටක සිදුවී නැති බව දක්වන්න කැමතියි. අද දකුණු කොරියාවේ එහෙම නැත්නම් වෙනත් විදේශීය සමාගම් කැඳවා ආයෝජනය කළ රටවල්වල, ඒ රටේ ක්‍රමසම්පාදන සැලසුම් කිසි දෙයක් ඒ විදේශ සමාගම් පිළිගෙන නැහැ.

පූ. භා. 11.30

අපි දන්නවා අපේ රටේ ගම් මට්ටමේ මූලික නිෂ්පාදන තිබුණු ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල තිබුණා. ඒ යටතේ උක් කර්මාන්තය පිළිබඳව පැක්ටරි 70ක් එදා අපේ ප්‍රදේශයේ තිබුණා. ගිංගඟ ආශ්‍රිතව මේ කුඩා පැක්ටරි 70ක් තිබුණා. ඒවා සියල්ලම අද වැටුණා, ක්‍රමයෙන් රටේ සීනි නිෂ්පාදනය කොම්පැනි කීපයකට අයිති වෙනවා. ප්‍රාදේශීය සංවර්ධන කටයුතු අතරේ මේ උක් නිෂ්පාදනය කරන ගොවීන්ට හෝ ඒ වැඩ පිළිවෙලට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මොන තරම් උපදෙස් දුන්නත් කොම්පැනි ඒකාධිකාරය ගොඩ නගා ගත්තාට පසුව ඒගොල්ලන් මේ සැලසුම්වල හැසිරෙන්නේ නැහැ. මෙන්න මේ නිසා සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව — ක්‍රම සම්පාදනය පිළිළිබඳව — රජයේ ප්‍රතිපත්තිය මොන විධියකින් කරන්න උත්සාහ කළත්, නිදහස් හා විවෘත ආර්ථික ක්‍රමයක් තිබෙනතුරු ඒ අතින් අමාත්‍යාංශය පරාජිත වෙනවා. අද මේ අමාත්‍යාංශයේ වැඩකටයුතු කොළ කැඳ, මව් කිරි වාගේ පැත්තට වැඩියෙන් යොමු වී ගෙන යන්නේ ඒ නිසයි. එමනිසා රටේ පෞද්ගලික ක්ෂේත්‍රයේ හෝ විදේශීය කොම්පැනි ආයෝජන ක්ෂේත්‍රයන්හි හෝ යම් බලපෑමක් කිරීමේ ශක්තිය මේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙල තුළ විශේෂයෙන් ඇති කළයුතුයි. එහෙම කලොත් සමහරවිට ඒ කොම්පැනි කැමති වන එකක් නැහැ. කොන්දේසි විරහිතව. සමහර අයට බදු විරහිතව ඒ අයගේ නිෂ්පාදන මෙහි සහතික කරගන්න රජයේ ප්‍රතිපත්තිය අනුව ඒ කොම්පැනිවලට අවසර — ඉඩ පහසුකම් — දී තිබෙනවා. ඒ අය පැමිණ මූලික නිෂ්පාදනවල අධිකාරයක් පිහිටුවූවාට පසුව හැසිරවීමක් කරන්න රජයට පුළුවන්කමක් නැහැ. ඒ නිසා විවෘත ආර්ථික ක්‍රමයක් තිබෙන රටක ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳවත්, ජාතික ක්‍රමසම්පාදනය පිළිබඳවත්, සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් උපදෙස් දීමට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට තිබෙන බලතල සීමිත බව මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඒ අය වෙන වෙන දේවල් කරනවා. ජනගහන පාලන වැඩ පිළිවෙලට යන්න පුළුවන්. පවුල් සැලසුම් වැඩ පිළිවෙලට යන්න පුළුවන්. පෝෂණ ප්‍රතිපත්ති ගැන ප්‍රචාරක වැඩ පිළිවෙලට යන්න පුළුවන්. ඒ ඇරෙන්න ආර්ථිකයේ බලපෑම් ඇති කරන මූලික නිෂ්පාදන ප්‍රතිපත්ති ගැන සැලසුම් ඉදිරිපත් කරන්න ඒ අයට බැහැ.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේ බලන්න ඕනෑ හම්බන්තොට වගේ ප්‍රදේශවලට ගිහිල්ලා. ඒ ප්‍රදේශවල ඒකාබද්ධ ග්‍රාමීය වැඩ සැලැස්ම ක්‍රියාත්මක වන හැටි බැලුවොත් තමුන්නාන්සේ ඔය කතාව කියන්නේ නැහැ.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඇත්ත වශයෙන්ම දූන් තමුන්නාන්සේ කියන්නේ තමුන්නාන්සේගේ ප්‍රදේශය පිළිබඳව.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ඒ හා සමාන තවත් ප්‍රදේශ තිබෙනවා. පුත්තලම තිබෙනවා. මාතලේ තිබෙනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

අපේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙළේ තිබෙන ඇද වැටීම දක්වෙන ලැයිස්තු මට ඉදිරිපත් කරන්න පුළුවන්.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ස්ට්‍රෝ බෝඩ් ෆැක්ටරියක් තිබුණා තමුන්නාන්සේලාගේ කාලේ. දස ලක්ෂ ගණනක් වියදම් කරලා ඒක හදල තිබුනේ මුහුද අද්දරටම වෙන්න. නිෂ්පාදනයට යන්න ඉස්සෙල්ලා කඩා ගෙන වැටුණා. අන්න ඒ කාලෙ තිබ්බ්ච සැලැස්ම.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඒ සමාන ඒවා මේ. තමුන්නාන්සේලා අවුරුදු හතක් ආණ්ඩුව කලාට පස්සේ, ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රගතිය පිළිබඳව ගම් මට්ටමේ කර්මාන්ත ශාලාවල ඇති වෙච්ච තත්ත්වය ගැන උදාහරණ දෙකක් මම කිව්වේ. එකක් ප්‍රාදේශීය වශයෙන් අපේ ප්‍රදේශයේ තිබ්බ්ච සීනි කර්මාන්තය ඇද වැටීම. අනෙක් එක ගෘහස්ත රෙදි වීවීමේ කර්මාන්තය ඇද වැටීම.

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (කඹුරුපිටිය)
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன — கம்புறுப்பிட்டிய)
(Mr. Chandrakumara Wijeya Gunawardane – Kamburupitiya)

සක්කර හැදීම.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඒවා මිනිස්සුන්ට තිබ්බ්ච ආදායම් මාර්ග. එහෙම නම් ඒ වෙනුවට ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අංශයෙන් ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරන්න ඕනෑ. උක් කම්හල් ගැන එහෙම කිසිම දෙයක් ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙළේ නැහැ. මිනිස්සු දූන් ඒ උක් ගස් සේරම හරකුන්ට කන්න දීල. උක් වගාව අත හැරල.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අලින්ට කන්න දීලා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

අම්බලන්ගොඩ ආසනයේ විතරක් රෙදි අත් මැෂින් 6,000 ට වඩා තිබුණා. අද ඒවා සේරම මුල්ලට දලා. මොකද රෙදි වෙළඳ පොළ ආයාත රෙදි වලින් පිරිලා. දේශීය කර්මාන්ත පිළිබඳව පැවැත්මක් මේ විධියට කරන්න බැහැ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙළේ පෞද්ගලික අංශය වැදගත් වෙන කොට, ආණ්ඩුවේ කම්හල් මොනවා හැදුවත්, මොනවා සංවර්ධනය කළත් ඒවා විකුණා ගන්න බැහැ. ඒ තත්ත්වය හුඟක් උද්ගත වී තිබෙනවා, ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ තිබ්බ්ච ආයතනවලට. ඒකට උදාහරණයක් මට අපේ දිස්ත්‍රික්කයෙන් දක්වන්න පුළුවන්.

තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්ක ගැන තමුන්නාන්සේලාට කියන්න පුළුවන්, " අපට සේරම සපයන්නේ රජයේ ආයතනවලින්. පෞද්ගලික අංශය මෙතන ඇඟිලි ගහන්නේම නැහැ. සේරම අපි විශ්වාසය තබා තිබෙන්නේ රජයේ අංශය කෙරෙහියි " කියා. නමුත් අපට අපේ දිස්ත්‍රික්කවල ක්‍රියා දාමය තුළින් පෙනෙන්නේ නැහැ මේ වැඩ පිළිවෙළේ ප්‍රගතියක්. ප්‍රාදේශීය සංවර්ධන වැඩ පිළිවෙළට හෝ ප්‍රාදේශීය නිෂ්පාදන ක්ෂේත්‍රයට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ බලපෑමක් තිබෙනවාය කියා අපට පෙනෙන්නේ නැහැ. හේතුව මොකක්ද, කුරුඳු නිපදවන්නන්ගේ ආදායමේ, ස්ථිරතාවයක් නැහැ. තේ නිපදවන්නන්ගේ ආදායමේ ස්ථිරතාවයක් නැහැ. මේවා වෙන අමාත්‍යාංශවලටයි, බාර. නමුත් මේ මිනිස්සුන්ගේ ජීවන ක්‍රම පිළිබඳව් සැලසුම් ඉදිරිපත් විය යුත්තේ මේ අමාත්‍යාංශය තුළින්.

උක් නිෂ්පාදනය කරන හැම වගා කරුවෙක්ම අමාරුවේ වැටිලා ඉන්නවා නම්, වෙනත් වගාවන් කළ පිරිස් අමාරුවේ වැටිලා ඉන්නවා නම්, ඒ.පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා, ඒ ප්‍රදේශවලට අදාළවත්, ජාතික නිෂ්පාදනයේ මේ සැපයුම්කරුවන්ට අදාළවත් සැලසුම් ඉදිරිපත් කිරීම මෙම අමාත්‍යාංශය මඟින් සිද්ධ වෙන්න ඕනෑ. ඒවා නොවෙයි මේකෙන් කෙරෙන්නේ. වෙනත් වෙනත් දේවල්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
කොල කෑද.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

දූත් හොඳම උදාහරණයක් තමයි, තමුන්නාන්සේලාගේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන, පතුලේම ඉන්න නිලධාරියා තමයි විශේෂ සේවා නිලධාරියා. විශේෂ සේවා නිලධාරියෙකුට තිබෙන වැඩ කටයුතු ඒ ගොල්ලන්ට දෙන පත්වීම් ලිපිය අනුව පෙනෙනවා. ඒ ගොල්ලන්ට මේවා කරන්න පුළුවන්ද ? මේ අය මේවා ගැන කොච්චර පුහුණුවක් ලබා ඇති පිරිස්ද ? අපේ ප්‍රදේශයේ එක විශේෂ සේවා නිලධාරියෙක් කරන්නේ රේඩියෝ සාප්පුවක් දාගෙන රේඩියෝ හැදීමයි. එයා පඩි දෙන දාට ඇවිල්ලා පඩි අරන් යනවා. මෙන්න මේ ගොල්ලන්ට තිබෙන වැඩ. "Conduct of social economic survey" මොන පුහුණුවක් මේ ගොල්ලන්ට දීලද මේක දෙන්නේ ?

"Implementation of the District Development Budget, Promotion of National Savings, functions relating to the issue of food stamps, preparation of Electoral/Registers. . . . . ."

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
උගත්කම අවශ්‍ය නැහැ ඒවට.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒවා ඕනෑ නැහැ.

". . . .encroachment and consequential action thereon, assisting the one million housing programme as Secretaries of Gramodaya Mandala."

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
ඒ කියන්නේ, විරුද්ධ පක්ෂයේ මිනිස්සුන්ගේ නම් කපන්න.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මේවා තමයි එස්. එස්. ඕ. ලාගේ වැඩ. [බාධා කිරීම්] මේ පත්වීම් 2,363 ක් දී තිබෙනවා. මොන සුදුසුකමක් තිබෙනවාද මේ මිනිස්සුන්ට මේ වැඩවලට.

මේ අය තෝරා ගත්තේ පළාතේ මන්ත්‍රීවරයාගේ නිර්දේශයෙන්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මේක මන්ත්‍රීවරයාගේ ලැයිස්තුව.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මෙසේ 2,363 දෙනෙක් තෝරාගෙන තිබෙනවා. මේ මිනිසුන්ට මේ වැඩ ගැන කිසිම පුහුණුවක් නැහැ. ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ගේ වැඩ කරගන්නවා. ගම් මට්ටමේ නිලධාරීන්ගේ තත්ත්වය මේක නම් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ උඩට එන විට මොන තත්ත්වයක් පවතීවිද කියා අපට පේනවා. මෙන්න මේ නිසා මේ යටතේ සැහෙන දුරට ඉටු කළ යුතු වැඩ කොටස් තිබුණත් ඒ වැඩ කොටස් ඉටු කරන්නට ඒ අමාත්‍යාංශයට තිබෙන වගකීම පිළිබඳව සමහර විට අමාත්‍යාංශයට තේරුමක් තිබෙන්නත් පුළුවන්; තේරුමක් නොතිබෙන්නත් පුළුවන්. මොකද හේතුව ? මෙතරම් වැඩ කටයුතු තිබෙන අමාත්‍යාංශයක ලේකම්තුමාගේ සේවාවත් — මම එතුමාට පෞද්ගලිකව දෙස් කියනවා නොවෙයි — තවත් අමාත්‍යාංශ ගණනාවකට ව්‍යාප්ත කර තිබෙනවා.

රටක සැලසුම් ක්‍රියාත්මක කිරීම කිච්චම එය විශේෂ වෙහෙසක් දැරිය යුතු වැඩ කොටසක්. මුළු රට තුළම ඇති අමාත්‍යාංශ වැඩපිළිවෙළවල් සැලසුම් කළයුතු පුද්ගලයා තවත් අමාත්‍යාංශවලට වගකීම්වලට පත් කර තිබෙනවා. ඒකෙන් මොකක්ද වෙන්නෙ ? මේ වැඩෙත් හරියට කෙරෙන්නෙ නැති අතර අනික් වැඩත් අසාර්ථක වීමට හේතුවක් වෙනවා. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය කියන එක ආර්ථික ක්ෂේත්‍රයටත්, රටේ සියලුම වැඩපිළිවෙළවිලටත් බලපාන එකක්. ඒකෙ වැඩ හරියට කෙරී නැහැ. මැතිවරණ වේදිකාවක කථා කරන්නා වාගේ දේශපාලන මට්ටමේ කථා අපට මේ සභාවේදී අහන්න ලැබුණා. නමුත් ඒ වැඩපිළිවෙළ හරියට කෙරී නැති නිසා තමුන්නාන්සේලා මොන විධියෙන් කිව්වත් මහ බැංකුවේ අධිපති ඉදිරිපත් කර තිබෙන මේ සංඛ්‍යා ලේඛනවලින්ම — ඔය සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවම ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යාලේඛනවලින්ම — අද රටේ තිබෙන තත්ත්වය පෙන්නුම් කරනවා. අද රටේ ජනගහණය, රටේ දරිද්‍රතාව, වැඩීමේ අඩුකම, මන්දපෝෂණය වැඩි වීමක් මිසක් අඩු වීමක් නැති බව ඒ සංඛ්‍යා ලේඛනවලින් පේනවා.

ඒ නිසා අවුරුදු අටක් තිස්සේ කළ දේවලින් පෙන්නුම් කරන ප්‍රගතිය මිනිසුන්ට යහපත් පැත්තට ඇති ප්‍රගතියක් නොවෙයි. මේ, ආණ්ඩුවේම වාර්තා කියන දේ. අපි නොවෙයි. ඒ නිසා මම විශේෂයෙන් මතක් කරන්නේ, මේ පිළිබඳව කළ යුතු දේ දේශපාලන වේදිකා මට්ටමෙන් කථා කිරීම නොවෙයි. මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට රජයේ සියලුම වැඩපිළිවෙළේ සැලසුම් නිවැරදිව සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමේ බලයක් තිබෙනවාද ? නිෂ්පාදන හැසිරවීම, පරිභෝජන ක්ෂේත්‍රය, වෙළඳ පොළ, බඩු මිල, එදිනෙද, ජීවිතයට බලපාන දේ සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාත්මක කිරීමේ බලයක් තිබෙනවාද ? මව් කිරි දෙන්නය කියනවා. ඒ සඳහා මව්වරුන්ට ප්‍රසූත නිවාඩු කාලය වැඩි කිරීමට කම්කරු අමාත්‍යාංශයෙන් යෝජනා කර තිබෙනවා. ඒකත් සියලුම ක්ෂේත්‍රවලට නොවෙයි. පෞද්ගලික අංශවලට නැහැ.

මේ අමාත්‍යාංශය ඉදිරිපත් කරන යෝජනා මුළු රටේම සැලසුම් වැඩපිළිවෙළට බල පවත්වන්නට තරම් මේ අමාත්‍යාංශයට බලයක් තිබෙනවාද ? අපට පේන්නේ මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු එක පැත්තකට පමණක් බර වී තිබෙන බවයි. ප්‍රචාරක අංශයට පමණක් බරවෙලා. දැක්වූ පරමාර්ථ අටක් තිබෙනවා නම් ඉන් දෙකක් තුනක් පමණක් ක්‍රියාත්මක වෙනවා මිස නිෂ්පාදන ක්ෂේත්‍රයේ වෙන යම් බලපාන කොටස්වල ක්‍රියාත්මක වෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තුන්වෙනි ලෝකයේ රටකට ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. ඒ අමාත්‍යාංශයේ කාර්‍යභාරය බොහෝ විට විසිරවිය යුත්තේ ඒ රටේ අවශ්‍යතාවට ස්වාධීනව සහ එඩිතරව බලපෑම් කළ හැකි මට්ටමේ අයිතියක් ඇතිවයි. නමුත් අපේ සැලසුම් කිරීමේ අමාත්‍යාංශයට සමස්තයක් හැටියට මුළු රටේ වැඩපිළිවෙළ ගැන සැලසුම් ඉදිරිපත් කිරීමේ බලයක් තිබෙනවාද එසේ ඉදිරිපත් කළාට පසුව ඒවා ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව නැවත සමාලෝචනයක් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තුන්වෙනි ලෝකයේ අප වාගේ දියුණු වෙන්න දඟලන රටක ඉටු කළ යුතු වැඩ කොටස් අතර පෞද්ගලික ව්‍යවසාය සහ විදේශික සමාගම් කැඳවීම් ආදී බලපෑම් හේතුකොටගෙන අඩපණ වී තිබෙන ආකාරය, එහෙම නැත්නම් අසරණව තිබෙන ආකාරය පෙනෙන්න තිබෙනවා. [බාධා කිරීමක්] නමුන්නාන්සේලා නැහැයි කිව්වාට මම නැවත විස්තර කරන්න යන්නේ නැහැ. හසුරුවන්න පුළුවන් සමාගම් නොවෙයි ගෙනැවිත් තිබෙන්නෙ. මුළු තිරිඟු පිටි සැලසුම තිබෙන්නෙ ප්‍රිමා සමාගම අතේ. ප්‍රිමා කියන්නෙ බහු ජාතික සමාගමක්. සීනි නිෂ්පාදනයත් බහු ජාතික සමාගමකට යනවා. ළදරු ආහාර පිළිබඳ සැලසුමත් ඒ අය අතට යනවා. තව ටික ටික ඔය විධියට විදේශීය සමාගම් මේ රටට ආවාම සැලසුම් හැදෙන්නෙ මෙහේ නොවෙයි. ස්විට්සර්ලන්තයේ තමයි අපේ කිරි සැලසුම හැදෙන්නෙ. සීනි සැලසුම හැදෙන්නෙ බූකර්ස් ඉන්ටර්නැෂනල් එකේ. ළඟදීම මද්‍යසාරය පිළිබඳ සැලැස්ම හැදෙන්නෙත් —අපි ලාභ ලබමින් පවත්වාගෙන යන කර්මාන්තයක් — එංගලන්තයේ සමාගමක් විසිනුයි. [බාධා කිරීමක්] ගරු ඇමතිවරුන් මේ සභාවේදී පිළිගෙන තිබෙනවා මේ සමාගම් මේ රටට ගෙන්වයි කියා. [බාධා කිරීමක්] පුස්සක් වෙන්නෙ කොහොමද ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමාගම් ගිය රටවල්වල අද මොකක්ද සිදුවී තිබෙන්නෙ ? මැක්සිකෝව අරගෙන බලන්න. අයිවරි කෝස්ට් අරගෙන බලන්න. ඒ සමාගම් ගිය රටවල වාර්තා අරගෙන බලන්න. අපි තුන්වන ලෝකයේ රටක් නිසයි, අපේ ආර්ථික ස්වාධීනත්වය ගැන අපට යම්කිසි කැක්කුමක් තිබෙන නිසයි අපි මේ අදහස් ඉදිරිපත් කරන්නෙ. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට විශේෂයෙන් මේ ගැන මතක් කරන්න කැමතියි. එතුමා පලපුරුදු, හැම අවස්ථාවකදීම වැඩ කිරීමට කැප වුණ කෙනෙක්. මේ කාරණා එතුමාගේ අවධානයට මම යොමු කරවනවා. ඒ වගේම ගරු ජනාධිපතිතුමා යටතේයි මේ අමාත්‍යාංශය තිබෙන්නෙ. රටේ සැලසුම් පිළිබඳ බලතල සම්පූර්ණයෙන්ම මේ අමාත්‍යාංශයට පවරා දිය යුතුයි. එසේ පවරා දී එම සැලසුම් විදේශීය සහ පෞද්ගලික අංශයේ බලපෑම්වලට යටත්වීමට ඉඩ නොතැබිය යුතුයි කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

දයා සේපාලි සේනාධීර මහත්මිය (කරන්දෙනිය)
(திருமதி தயா சேபாலி சேனாதீர — கரந்தெனிய)
(Mrs. Daya Sepali Senadheera – Karandeniya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ,ජනාධිපතිතුමාණන් යටතේ පවතින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ මෙම විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම ගැන මා නමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුළු මහත් ශ්‍රී ලංකාද්වීපයේම සංවර්ධන ක්‍රියාදාමයේ හදවත ලෙස සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය අපට හඳුන්වන්න පුළුවන්. මේ රටේ ඉදිරි ගමන නියම ඉලක්කයකට යොමු කරන්නට මේ අමාත්‍යාංශය ක්‍රියා කරන්නේ විශාල කැපවීමකින්. මේ යන ගමන නියම ආකාරයට හසුරුවනු ලබන මේ අමාත්‍යාංශය භාරව සිටින ප්‍රධාන නියමුවා අපේ අතිගරු ජනාධිපතිතුමා බව අපි දන්නවා. මතු උපදින පරම්පරා ගණනාවකට සෙත සැලසෙන අයුරින් පසුගිය වකවානුව තුළ මේ ගමන නිවැරදිව හැසිරවීමට ඇප කැප වෙමින් ක්‍රියා කළ තවත් අයෝමය පුරුෂයෙකුගේ සහාය අතිගරු ජනාධිපතිතුමන්ට ලැබී තිබෙන බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ පුද්ගලයා වෙන කවුරුවත් නොව මේ අමාත්‍යාංශයේ ලේකම් වික්‍රම වීරසූරිය මැතිතුමායි. මෙතුමාට අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ සම්පූර්ණ සහයෝගය ලැබුණු බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

පූ. භා. 11.45

1977ට කලිනුත් මේ අමාත්‍යාංශය පැවතියත් මේ අමාත්‍යාංශයට මේ රටේ සංවර්ධනය උදෙසා කැපවීමකින් වැඩ කරන්නට අවස්ථාවක් ලැබුණේ මේ රජය පත් වුණායින් පසුව බව අපි සඳහන් කරන්න ඕනෑ. සංවර්ධනයෙන් තොර ශ්‍රී ලංකාවක් නැතිවාක් මෙන්ම නියම සැලසුමකින් තොර සංවර්ධනයක්ද නැති බව අපි පිළිගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ නොයෙක් නොයෙක් දිස්ත්‍රික්ක ආශ්‍රිතව ක්‍රියාත්මක වන දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම අද සාර්ථකව කරගෙන යනවා. එහි ගෞරවය අතිගරු ජනාධිපතිතුමාටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් හිමිවෙන්න ඕනෑ. මේ රටේ කිසිවෙකුට විශ්වාස කළ නොහැකි ඒ වගේම ඇදහිය නොහැකි ග්‍රාම සංවර්ධනයක් මේ දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම තුළින් ක්‍රියාත්මක වී ඇති බව අපි හැම දෙනාම දන්නවා.

1981 දී සැලසුම් කරනු ලැබූ කරන්දෙනිය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රමය මෙයට අනුරූපව සකස් කළ යෝජනාක්‍රමයක්. ඉතාම දුෂ්කර ගම්බද ආසනයක් වන කරන්දෙනිය මැතිවරණ කොට්ඨාශයට මේ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රමය මහත් ආශීර්වාදයක්. කරන්දෙනිය මැතිවරණ කොට්ඨාශයේ ජනතාව පුල - පුලා බලා සිටින්නේ මේ යෝජනාක්‍රමය කවද ක්‍රියාත්මක වේද කියායි. ඇත්ත වශයෙන්ම මේ යෝජනාක්‍රමයට ස්වීඩන් රජයේ ආධාර නොලැබෙනවා නම් වෙනත් ආධාර ක්‍රමයක් මගින් හෝ මේ යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ එක්කම මේ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයකු වන ආචාර්ය වික්‍රම වීරසූරිය මැතිතුමාණන්ට මෙය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබෙන බව අපි දන්නවා. එතුමාණන්ගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා වෙනත් ආධාර ක්‍රමයක් මගින් හෝ කරන්දෙනිය මැතිවරණ කොට්ඨාශයේ මේ සංවර්ධන යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරන හැටියට.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ අප රටේ පුංචි දූදරුවන් නිරෝගීමත් කරලීමෙන් නිරෝගීමත් ජාතියක් බිහි කිරීමට ගන්නා ප්‍රයත්නය අපට කිසිසේත් අමතක කරන්න බැහැ. මේ අමාත්‍යාංශය දිපව්‍යාප්තව සැලසුම් කොට ඇති පෝෂණ වැඩ සටහන් වසරක් පාසා ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යනවා. කරන්දෙනිය මැතිවරණ කොට්ඨාශයේ මේ පෝෂණ වැඩකටයුතු සඳහා සෑම අවුරුද්දේම විමධ්‍යගත මුදලෙන් මුදල් වෙන් කරනවා. මේ කොළකැඳ ව්‍යාපෘතිය, කොළකැඳ වැඩසටහන් අප ජනතාව අතර ඉතාම ජනප්‍රිය වී තිබෙනවා.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ මේ රටේ තවත් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ආයතනයක් තිබෙනවා. එය තමයි රැකියා බැංකුව. රැකියා බැංකුව ගැන මම වචන දෙකක් සඳහන් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අදහසක් අනුව මේ රටේ ප්‍රථම වරට බිහිවුණු රැකියා බැංකුව අද යම් යම් ප්‍රශ්නවලට තුඩු දෙන ආයතනයක් බවට පත් වී තිබෙනවා. සමහර අය රැකියා බැංකුව අනවශ්‍යයයි කියනත් තවත් සමහර අය රැකියා බැංකුව අත්‍යවශ්‍ය බව කියා සිටිනවා. ඇත්තවශයෙන්ම රැකියා බැංකු ක්‍රමය පිළිබඳව නියම අවබෝධයක් ඇති කරගත්තකුට නම් රැකියා බැංකුව අවශ්‍ය බව පැහැදිලිව පෙනෙනවා.

රැකියා බැංකුව පිළිබඳව කිසියම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ රැකියා බැංකු ක්‍රමයේ ඇති වරදක් නිසා ඇති වුවක් නොවෙයි, මේ ආයතනයේ සිටින එහෙත් මේ ක්‍රමය හඳුනා නොගත්, මේ ක්‍රමයෙන් ජනතාවට සැලසී හැකි සේවය හඳුනා නොගත්, හඳුනා ගත්තත් ඒ පිළිබඳ අඹමල් රේණුවක තරම්වත් තැකීමක් නැති නිලධාරීන් කීපදෙනෙක් නිසා බව මම සඳහන් කරන්න කැමතියි. එවැනි පිළිලයන් ඒ තැනින් ඉවත් කලොත් රැකියා බැංකුවේ මීට වඩා විශාල ප්‍රගතියක් දැකිය හැකි බව අපට කියන්න පුළුවන්. රැකියා බැංකුව තුළින් මේ රටට කිසියම් සහනයක් සැලසී තිබෙනවා නම් ඒ නතිකරම ආචාර්ය වික්‍රම වීරසූරිය මැතිතුමාගේ අප්‍රතිහත ධෛර්යය නිසාම බව මම ප්‍රකාශ කරන්න කැමතියි. ක්‍රියාත්මක අංශයේ තිබෙන දුර්වලතා ගැන මෙහිදී මම දීර්ඝ වශයෙන් කරුණු දක්වන්නේ නැති වුවත් අකාර්යක්ෂම උදාසීන නිලධාරීන් වෙතොත් ඒ නිලධාරීන් අයින් කර රැකියා බැංකුවෙන් අපි අපේක්ෂා කරන මාහැඟි සේවාව ඉටු කිරීමට හැකි වන පරිදි එය සකස් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කතාව අවසාන කිරීමට මත්තෙන් ආචාර්ය වික්‍රම වීරසූරිය මැතිතුමා ජනමාධ්‍ය කමිටුව තුළින් සලසන නිහඬ සේවාව පිළිබඳව මම වචනයක් සඳහන් කරන්න ඕනෑ. අප රටේ ත්‍රස්තවාදී උවදුර හේතුකොට ගෙන ඇති වී තිබෙන අවුල් අකාමකා දැමීමට ඇපකැප වී සිටින ජනමාධ්‍ය කමිටුවට අපේ ගෞරවාචාරය හිමි විය යුතුයි. ත්‍රස්තවාදීන් අප රට පිළිබඳ විදේශවල බොරු ප්‍රචාර කරන විට ඒවා බිඳ දමා ඔවුන්ගෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාහසික ක්‍රියා හෙළිදරව් කිරීම විශාල සේවාවක් මේ කමිටුවෙන් සිදු කරන අතරම අපේ විරෝදර සටන්කාමී හමුදාවන් ධෛර්ය කරලීමටත් ත්‍රස්තවාදය උපක්‍රමශීලීව විසඳීමටත් අවශ්‍ය සියලුම දේ ප්‍රචාරය කරමින් මේ සටන ජයග්‍රහණය දක්වා මෙහෙයවීමට අපේ ආරක්ෂක ඇමතිතුමාට අවශ්‍ය සියලුම සහාය දෙමින් මේ කමිටුව සලසන තිහඬ සේවාවන් ගැන මේ රටේ සෑම තරාතිරමකම සෑම කෙනකුගේම උපරිම ගෞරවය ඒට හිමි විය යුතුයි.

අවසාන වශයෙන්, මේ රටෙන් දුගී - දුප්පත්කම තුරන් කරලීමට නියම අඩිතාලමක් දමා සිටියදී නැඟී ආ ත්‍රස්තවාදී උවදුරින් රට ආරක්ෂා කර ගනිමින්ම නිරෝගී ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමේ රජයේ මාහැඟි ප්‍රයත්නයට උර දී සිටින මේ අමාත්‍යාංශයට කරත්දෙණිය ජනතාව වෙනුවෙන් මගේ ආශීර්වාදය පිරිනමමින් මා නිහඬ වෙනවා.

කේ. අබේවික්‍රම මහතා (මාතර දිසා ඇමතිතුමා)
(திரு. கே. அபேவிக்ரம — மாத்தறை மாவட்ட அமைச்சர்)
(Mr. K. Abeywickrema – District Minister, Matara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන කීපයක් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම මම තමුන්නාන්සේට බොහොම කෘතඥ වෙනවා. මේ අමාත්‍යාංශය ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක්ය කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමා අතිගරු ශ්‍රීමත් ජනාධිපතිතුමායි. ඒ වාගේම මේ අමාත්‍යාංශයට ඉතාමත් හොඳ නියෝජ්‍ය ඇමතිතුමකුත් ලැබී ඉන්නවා. ඒ අතරම මේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරී පිරිසත් ඉතාම හොඳයි.

විරුද්ධපාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු මේ අමාත්‍යාංශයට හුඟක් චෝදනා කරන්න යෙදුණා. නමුත් මට හිතා ගන්න බැහැ, මොන හේතුවක් උඩ ඒ විධියට චෝදනා කරන්න යෙදුනාද කියා. කොහොම වුණත් ඒ සමහර කථාවලින් මට නම් පෙනී ගියේ, අර අන්ධයෝ අලියාගේ ඒ ඒ කොටස් අත ගා බලා තමන්ට අහු වුණ — අහු වුණ කොටස් අනුව අලියා ගැන විග්‍රහයක් කළා වාගේ, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුත් මේ අමාත්‍යාංශයේ කටයුතු ගැන කළාය කියායි. විරුද්ධ පාර්ශ්වයේ සමහර ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළේ ද්වේෂ සහගතවයි. රජයේ සාර්ථකත්වය කියන්නේ මේ අමාත්‍යාංශයේ සාර්ථකත්වය යන අදහසින්, සැහෙන භයකින් යුතුව මේ අමාත්‍යාංශය ගැන විරුද්ධ පාර්ශ්වයේ සමහර ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළාය කියා මට හැඟුණා.

ඒ කොහොම වුණත් ඒ ප්‍රකාශවලට අපේ නියෝජ්‍ය ඇමතිතුමන්ලාත්, ආණ්ඩු පක්ෂයේ සාමාන්‍ය මන්ත්‍රීතුමන්ලාත් කීප දෙනෙක්ම සැහෙන පිළිතුරු දුන් බව මම මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නම් නැ. ඒ නිසා මම කල්පනා කරන්නේ නැහැ, මේ අවස්ථාවේදී මමත් විරුද්ධ පාර්ශ්වයේ තර්කවලට පිළිතුරු දීම ඒ තරම් අවශ්‍යය කියා. ග්‍රාමීය ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට, මේ අමාත්‍යාංශය යටතේ අපේ ප්‍රදේශවල මොන විධියේ සේවාවක් කෙරී තිබෙනවාදැයි පැහැදිලි අවබෝධයක් අප තුළ තිබෙනවා. මම හිතන විධියට ඉතාමත් වැදගත් විෂයයන් රාශියක් මේ අමාත්‍යාංශයට සම්බන්ධකම් පවත්වනවා. නමුත් මට ලැබී තිබෙන සුළු කාලය තුළ ඒ සෑම විෂයයක් ගැනම කථා කරන්න මට අවකාශ තිබෙනවායයි මම හිතන්නේ නැහැ. ඒ නිසා, විශේෂයෙන් ඒවා අතුරින් තෝරා ගත් විෂයයන් කීපයක් ගැන පමණක් මගේ අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම, ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන වැඩ පිළිවෙළ ගැන මෙහිදී සඳහන් කරන්න ඕනෑ. මාතර දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක 15ක් පමණ මේ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන සැලැස්මට සම්බන්ධ වෙනවාය කියන එක මම මෙහිදී සඳහන් කරන්න කැමැතියි. මේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය ඒ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන සැලැස්මට පමණක් සීමා කළත්, මේ අමාත්‍යාංශයෙන් ඉතා වැදගත් සේවාවක් ඉටු වන බව තහවුරු කිරීමට එයම ප්‍රමාණවත් වෙනවාය කියන එකයි, මගේ විශ්වාසය. මට මතකයි අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කළ ප්‍රකාශයක් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ මේ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන මුදලදීම ගැන එතුමා සඳහන් කරන්නට යෙදුණා. ඇත්ත වශයෙන්ම ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ දිස්ත්‍රික්කයකට ලැබෙන මුදල ඒ විවිධ අමාත්‍යාංශ යටතේ, විවිධ දෙපාර්තමේන්තු යටතේ වියදම් කරනවාය කියන එක මා එතුමාට පැහැදිලි කරන්නට කැමතියි. මට පෙනෙන හැටියට එතුමාට ඒ ගැන අවබෝධයක් නැහැ. එතුමා කල්පනා කර තිබෙනවා දිස්ත්‍රික්කයකට ලැබෙන මුදල තිකම් ආවාට ගියාට සැලැස්මක් නැතුව, වගකීමෙන් තොරව ඒ දිස්ත්‍රික්කය තුළ වියදම් කරනවා කියා. එවැනි අවබෝධයකින් තමයි එතුමා මේක කළේ. නමුත් අද මේ රජය යටතේ දිස්ත්‍රික් ඇමති ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් දිස්ත්‍රික්කයේ යම්කිසි වැඩපිළිවෙළක් සකස් කර මේ සියලුම මුදල් දිස්ත්‍රික් මට්ටමෙන් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ සහයෝගය ඇතුව විවිධ දෙපාර්තමේන්තුවලත්, අමාත්‍යාංශවලත් උපදෙස් සහ සැලසුම් මත මේ හැම දෙයක්ම ක්‍රියාත්මක කරනවාය කියන එක මම සඳහන් කරන්නට ඕනෑ.

අද විශේෂයෙන්ම මගේ මිත්‍ර හම්බන්තොට දිසා ඇමතිතුමාත්, අනිකුත් දිස්ත්‍රික්ක ඇමතිවරුත් සනාථ කරනවා ඇති ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ අද මේ නොදියුණු දිස්ත්‍රික්කවල මොන විදියේ සංවර්ධනයක් සිද්ධවෙලා තිබෙනවාද කියා.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! The Sitting is suspended till 1 p.m.

රැස්වීම ඒට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1ට නියෝජ්‍ය කථානායකතුමාගේ [නෝමන් වෛද්‍යරත්න මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி. ப. 1 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1 p.m. and then resumed. MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *in the Chair.*

කේ. අබේවික්‍රම මහතා
(திரு. கே. அபேவிக்ரம)
(Mr. K. Abeywickrema)

ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික් ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ මේ වැඩපිළිවෙළ දිස්ත්‍රික්කය තුළ මොන විධියට ක්‍රියාත්මක වෙනවාද කියන එක මම පැහැදිලි කරමින් සිටි අවස්ථාවේයි, අපි දිවා භෝජනය සඳහා විවාදය නතර කළේ. ඒ නිසා විශේෂයෙන්ම මම කලින් සඳහන් කළ අන්දමට අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සඳහන් කළ අන්දමට නොවන බව මම මතක් කරන්න කැමතියි. අදාළ අමාත්‍යාංශය අදාළ දෙපාර්තමේන්තුවේ පූර්ව අනුග්‍රහය ඇතිව දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට පුළුවන් වන අන්දමට ඒ වැය ව්‍යාපෘති වාර්තා සකස් කර ඒ අනුව ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බව මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. මේ යටතේ හැම අමාත්‍යාංශයකටම හා හැම දෙපාර්තමේන්තුවකටම පුළුවන්කම තිබෙනවා නම් ඒ දිස්ත්‍රික්කයේ තිබෙන විශේෂ අවශ්‍යතාවයන් අනුව ඒ ව්‍යාපෘති සකස් කරන්නට, ඒ හැම එකකටම වගේ තිබෙන ආධාර අනුව ඒ අවශ්‍ය මුදල් ලබා ගන්නට පුළුවන්ය කියා මම සඳහන් කරන්නට ඕනෑ.

මම අපේ මාතර දිස්ත්‍රික්කය ගැන සඳහන් කරන්නට කැමතියි. එය විශාල ජනගහනයක් ජීවත් වන දිස්ත්‍රික්කයක්. එමෙන්ම විවිධ අංශත් එහි තිබෙනවා. ධීවර අංශය, අධ්‍යාපන අංශය, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය, නොදියුණු ගම්මාන ආදී වශයෙන් විවිධ අවශ්‍යතාවයන් රාශියක් දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. 1978 සිට 1983 දක්වා පළමු වන අදියරයන් දැනට කෙරෙන දෙවන අදියරත් ඉතාමත්ම සාර්ථකව කෙරීගෙන යන බව ප්‍රකාශ කරන්නට මම ඉතාමත්ම සන්තෝෂයි. මේ අනුව මධ්‍ය මහා විද්‍යාල විවෘත කර අපේ දිස්ත්‍රික්කයේ තිබෙන ඉතාමත්ම දුෂ්කර ප්‍රදේශවලට අධ්‍යාපන පහසුකම් ලබා දෙන්නට අපට පුළුවන්කම ලැබුණා. එසේ කළේ අපේ ළමයින්ට—දුෂ්කර ප්‍රදේශවල සිටින ළමයින්ට—මාතර නගරයේ තිබෙන විද්‍යාලවලට ඇතුළත් වන්නට තිබෙන අපහසුව හා තදබදය නිසයි. මේ අන්දමට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේත් කර්මාන්ත ශාලා දුර්වලව තිබුණු හැම අවස්ථාවකම ඒ දුර්වල කර්මාන්ත ශාලා දියුණු කරන්නටත් අපට පුළුවන්කම ලැබුණා. රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ තිබුණු කර්මාන්ත ශාලා දෙකක් දියුණු කරන්නටත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ නව කර්මාන්ත ශාලාවක් ඇති කරන්නටත් අපට පුළුවන් වුණා. තිබුණු කර්මාන්ත ශාලා දෙකක නව යන්ත්‍රෝපකරණ සවි කර ඒවා දියුණු කළා. මේ අනුව අපට කුඩා තේ වතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. අබේවික්‍රම මහතා]

ගොවීන්ට 1984 මේ රටේ තිබුණු අධික තේ මිලෙන් ප්‍රයෝජන ගන්නට අවස්ථාව ලබා දෙන්නට පුළුවන් වුණා. ඒ වාගේම ගැමි ප්‍රදේශවල තිබෙන මාර්ග සකස් කර නව මාර්ග ඉදිකර, ඒ කුඩා තේ වතු හිමියන්ගේ කෘෂි ක්ෂේත්‍රයට අදාළ පොහොර සහ වෙනත් අදාළ ද්‍රව්‍ය තමන් කරා ප්‍රවාහනය කරගන්නත්, ඒ අයගේ නිෂ්පාදන වෙළඳ පොළට ප්‍රවාහනය කරන්න අවශ්‍ය පහසුකම් සලසා දෙන්නත් පුළුවන් වුණා. ඒ වාගේම කුඩා කර්මාන්ත හා ධීවර කර්මාන්තය, දියුණු කරන්නත්, වෙනත් අංශවලින්, විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල වැඩ කොටසක් මේ දුෂ්කර ප්‍රදේශවල ගම්මානවල ඉටු කර සෞඛ්‍ය තත්ත්වය දියුණු කර මේ දිස්ත්‍රික්කය තුළ මනුෂ්‍ය වාසයට ඉතාමත්ම යහපත් තත්ත්වයක් ඇති කරන්නත් පුළුවන් වුණා කියන එක මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

මම මතක් කරන්නට කැමතියි, මෙම සංවර්ධන යෝජනා ක්‍රමයේ පළමුවැනි අදියර යටතේ අපට රුපියල් දශ ලක්ෂ 75 ක පමණ මුදල් ලැබුණා. දැනට දෙවැනි අදියර යටතේ දශ ලක්ෂ 30 ක් 40ක් පමණ වාර්ෂිකව ලැබෙන මුදල අපට නොලැබුණා නම් අපේ ප්‍රදේශවල ජීවත්වෙන අහිංසක දුප්පත් ග්‍රාමීය සහ ඒ වාගේම නගරබද නැත්නම් මුහුදුබඩ ජීවත්වෙන ජනතාවට පහසුකම් සලසන්නට පුළුවන්කමක් නැහැ කියන එක මම මතක් කරන්නට කැමතියි. මේ තත්ත්වය මත අපේ දිස්ත්‍රික්කය පමණක් නොවෙයි, හම්බන්තොට, මොනරාගල, සහ තවත් දිස්ත්‍රික්ක ගණනාවක්, එහෙම නැත්නම් ලංකාවෙන් භාගයකට වඩා වැඩි ප්‍රදේශයක් දියුණු කිරීමට පුළුවන් වුණා කියන එක අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරන්නට ඕනෑ.

ඒවගේම මෙම වැඩපිළිවෙළ බොහොම ක්‍රමානුකූල විද්‍යාත්මක වැඩපිළිවෙළක්ය කියන එකත් මම සඳහන් කරන්න ඕනෑ. අපේ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා මුදල් ලැබුණත් ඒ සඳහා අවශ්‍ය වාර්තා ආදිය සකස් කරලා යම්කිසි ක්‍රමානුකූල විධියකට ඒ කටයුත්ත කර ගෙන යන්න අපිට දිස්ත්‍රික්ක මට්ටමෙන් නොයෙක් අපහසුකම් තිබෙනවා. මේ හැම දෙයකටම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ විශේෂඥ දැනුම අපිට ලබා දුන්නාය කියන එකත් අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අද මාතර, හම්බන්තොට, මොනරාගල වැනි ඉතාමත් නොදියුණු ප්‍රදේශවල මේ ආකාරයට විශාල දියුණුවක් ඇති වෙන කොට විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් චෝදනා කරන්න කල්පනා කරන එක පුදුමයක් නොවේය කියන එකයි මගේ විශ්වාසය.

හම්බන්තොට ගරු දිසා ඇමතිතුමා සාක්ෂි දරනවා ඇති එතුමාගේ දිස්ත්‍රික්කය ලංකාවේ නොදියුණුම විශාල දිස්ත්‍රික්කයක් හැටියටයි පැවතුනේ. ඒ දිස්ත්‍රික්කයේ විශාල සංවර්ධනයක් අද ඇති වුණා. ඒවාගේමයි දැන් මොනරාගල වැඩපිළිවෙළත්. එම නිසා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ගැන සලකන විට අනෙකුත් මොන වැඩපිළිවෙළක් ගැන කථා නොකළත් මේ දිස්ත්‍රික්ක මට්ටමෙන් ගෙන යන ග්‍රාමීය ඒකාබද්ධ වැඩ සැලැස්ම පමණක්ම වුණත් මේ අමාත්‍යාංශයේ වැදගත්කමට හේතු සාධක වෙනවාය කියන එක මම සඳහන් කරන්න කැමතියි. එමනිසා ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන ජනතාව සඳහා, මේ රජයේ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන වැඩ සැලැස්මට අපි ණය ගැතිය කියන එක ඉතාමත් කෘතඥතා පූර්වකව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මේ වැඩපිළිවෙළ තව තවත් තහවුරු වනවාට කිසිම සැකයක් නැහැ. ඒ තුළින් ශ්‍රී ලංකාවේ විශාල නවෝදයක් ඇති වෙනවා කියන එක මම සඳහන් කරන්න ඕනෑ. මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට දේවල් තිබුණත් මීට වඩා කථා කරන්නට අවස්ථාව ලැබෙන්නේ නැහැ.

ඊළඟට මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ රැකියා බැංකු ක්‍රමය ගැන. අපේ ගරු මන්ත්‍රීවරු කීප පොළක් ඉතාමත් ප්‍රශංසා මුඛයෙන් මේ වැඩපිළිවෙළ ගැන කථා කරන්නට යෙදුණා. මම ඒක අනුමත කරන්න කැමතියි. රැකියා බැංකු වැඩපිළිවෙළ ගැන සලකා බලන විට, ග්‍රාමීය ප්‍රදේශවල ඉන්න උගත් තරුණ තරුණියන්ට මෙය විශේෂ වරප්‍රසාදයක් වුණාය, එසේ නැත්නම් මේ නිසා විශේෂයෙන් යුක්තිය ඉෂ්ට වුණාය කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. මීට කලින් ගම්බද තරුණ තරුණියන්ට රැකියාවක් ලබා ගැනීම එතරම් පහසු කාර්යයක් හැටියට තිබුණේ නැහැ. නමුත් මේ රැකියා බැංකු ප්‍රතිපත්තිය අනුව ලංකාවේ ජීවත් වන උගත් තරුණ තරුණියන්ට යම්කිසි සාධාරණයක් ඉෂ්ට වුණාය කියන එක මම සඳහන් කරන්නට ඕනෑ.

අද විශ්ව විද්‍යාලවලට ළමයින් ඇතුළත් කර ගැනීමේ වැඩපිළිවෙළ ගැන සලකා බලන විටත් පෙනී යනවා, දුෂ්කර ප්‍රදේශවල ළමයින්ටත් යම්කිසි අවස්ථාවක් ලැබෙන විධියට අද වැඩකටයුතු සලසා තිබෙන බව. එසේ නම් බොහෝදුරට එම වැඩපිළිවෙළට මේ රැකියා බැංකු වැඩපිළිවෙළ සමාන කරන්නට පුළුවන්ය කියන එක මම සඳහන් කරන්න ඕනෑ. අපේ ප්‍රදේශවල තරුණ තරුණියන්ට මෙතෙක් කල් මෙවැනි රැකියා ප්‍රමාණයක් නොලැබුණු බව මම සඳහන් කරන්න ඕනෑ.

මම කලින් තිබුණු ආණ්ඩුවට චෝදනා කරනවා නොවෙයි. ඒ ආණ්ඩුව කාලයේ මේ රටේ සංවර්ධනයක් තිබුණේ නැහැ. මේ රටේ ජනතාව බොහොම දුකින් හිටියේ. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා කොපමණ කිව්වත්, ඒ යුගය මේ රටේ ඇවිදින ඇට සැකිලි තිබුණු යුගයක්ය කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒකට කොයි කවුරුවත් විරුද්ධ වන්නට විධියක් නැහැ. කුණු බක්කි අවුස්සන යුගයක් තිබුණේ. ඒ තත්ත්වය අද නැහැ. අද ප්‍රශ්න නැත්තේ නැහැ. කොපමණ ප්‍රශ්න තිබුණත් මහන්සියෙන් වැඩ කරන මනුෂ්‍යයාට එදාට වඩා අද හොඳට ජීවත් වන්න අවස්ථාවක් තිබෙන බව සඳහන් කරන්න ඕනෑ. ගම්බද ප්‍රදේශවල ජීවත්වන පිරිස හැටියට ඒ ගැන අපිට හොඳ අවබෝධයක් තිබෙන නිසා අපිට භය නැතිව ඒක ප්‍රකාශ කරන්න පුළුවන්. හැම දුෂ්කර ප්‍රදේශවලම, හැම ගම්බද පවුලක ම වාගේ අද විශේෂ වරප්‍රසාදයක් ලැබී තිබෙනවා. ඒ දුෂ්කර ප්‍රදේශවල අඩුගණනේ පවුලකින් එක්කෙනෙකුටවත් රජයේ රැකියා ලැබී තිබෙනවා. ඒ මාර්ගයෙන් රැකියා වරප්‍රසාද පමණක් නොවෙයි, නගරයට තිබෙන සම්බන්ධය උඩ පවුල්වලට යම්කිසි දැනුමක් ලබා ගන්නටත් පුළුවන් වී තිබෙන බව මම සඳහන් කරන්නට ඕනෑ. එමනිසා රැකියා බැංකු වැඩ පිළිවෙළේ අඩුපාඩු තිබෙනවා නම්, ඒ අඩුපාඩු සකස් කර, තවත් තහවුරු කරන්නට ක්‍රියා කරන්න ඕනෑ. එහෙම නැති වුණොත්, කොළඹ නගරයට හෝ වේවා, කොළඹ නගරය ආශ්‍රිත වෙනත් ප්‍රදේශවලට හෝ වේවා යම්කිසි වරප්‍රසාද ලැබුණත්, ලංකාවේ ගැමි ප්‍රදේශවලට කවදාවත් එම වරප්‍රසාද ලබා ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එමනිසා ඒ බුද්ධිමත් පිරිස ගැන කල්පනා කර වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගම්බද ජනතාව වෙනුවෙන් මෙම අමාත්‍යාංශයට අපේ ආදර ගෞරවය හිමි කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන පෝෂණ වැඩ පිළිවෙළ විරුද්ධ පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් විහිළුවක් හැටියට සලකා කථා කරන්නට යෙදුණා. කොළ කැඳ සහ වෙනත් ඒ අන්දමේ දේවල් ගැන ඒ අන්දමට කථා කළත්, ගමේ ජීවත් වන, ගමේ ඉපදුණු අය හැටියට මා මතක් කරන්න කැමතියි, තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය යම්කිසි පමණකින් හෝ නගා සිටුවා ගන්නට මේ රටේ අහිංසක දුප්පත් ජනතාවට දේශීය වශයෙන් ලබා ගන්නට යම්කිසි විශේෂ සම්පත් තිබුණා නම්, එම සම්පත් උපයෝගී කර ගෙන, අපේ රටේ ජනතාවගේ පෝෂණ තත්ත්වය දියුණු කරන්නට කිසියම් අමාත්‍යාංශයක් හෝ යම්කිසි පුද්ගලයෙක්, කිසියම් සැලැස්මක් ඉදිරිපත් කරනවා නම් ඒකට අප හැම දෙනාගේම ආශීර්වාදය අනුග්‍රහය ලබා දෙන්නට ඕනෑ බව. මගේ හැඟීම ඒකයි. එම නිසා ඔය කොපමණ උසුළු විසුළු කර කථා කළත්, අපේ කොත්මලේ මන්ත්‍රීතුමාගේ (ආනන්ද දසනායක මහතා) බුද්ධිය ගැන සලකා බලන විට, ඒ මන්ත්‍රීතුමා කොළ හුඟක් කන්නට ඇත කියා මට හිතෙනවා. නැත්නම් ඔය තරම් හොඳ බුද්ධියක් එතුමාට තිබෙන්නට පුළුවන්කමක් නැහැ. මොකද ? එතුමාත් ගම්බද ප්‍රදේශයකින් පැමිණි කෙනෙක් නිසයි. කෙසේ වුණත්, අද අපේ පාසල් හා ස්වෙච්ඡා සංවිධාන මාර්ගයෙන් මෙම බුද්ධිමත් වැඩපිළිවෙළ ලංකාව පුරාම ගෙන යන්නට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විශාල මහන්සියක් දරන බව අප පිළිගන්නවා. එම වැඩ පිළිවෙළ තව තවත් තහවුරු කරමින් ක්‍රියාත්මක කරන්නට වෙහෙස ගන්නවා. එම නිසා එය බොහෝ දෙනාගේ ප්‍රශංසාවට ලක් වුණු වැඩ පිළිවෙළක් බව මා කියන්නට ඕනෑ.

අ. භා. 1.15

ජනගහන ප්‍රශ්නය ගැන, ජනගහන සැලසුම ගැන මෙම අමාත්‍යාංශය දැඩි උනන්දුවකින් ක්‍රියා කර ගෙන යනවා. මා හිතන හැටියට මෙය අපේ රටේ ඇති වැදගත්ම ප්‍රශ්නයක්. අපි කොයි තරම් මහවැලි සංවර්ධන ව්‍යාපාර වාගේ ව්‍යාපාර සකස් කළත්, වෙනත් නොයෙක් වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කළත්, වාර්ෂිකව කොයි තරම් පාසල් ගොඩනැගිලි හැදුවත්, ජනගහන ප්‍රතිපත්තිය ගැන බුද්ධිමත් සැලැස්මක් සහ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට බැරි වුණොත් මොන ආණ්ඩුවක් මේ රට පාලනය කළත්, සැලැස්මක් ඇතුව රට පාලනය කරන්නට බුද්ධිමත් වගකිව යුතු නීතිගරුක පිරිසක් මේ රටේ බිහි කරන්නට බැරි බව මගේ විශ්වාසයයි. එම නිසා, මෙම ජනගහනය පිළිබඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මඟින් බොහොම බුද්ධිමත්ව කල්පනා කර බලා, මෙහි වැදගත්කම රටපුරාම ප්‍රචාරය කර, එයට අවශ්‍ය සැලසුම් සකස් කිරීම බොහොම වැදගත් බව පෙන්වා දෙන්නට කැමතියි. මේ සම්බන්ධයෙන් කිසියම් චෝදනාවක් මට කරන්නට තිබෙනවා නම්, ඒ මේ වැඩපිළිවෙළ මෙයට වඩා වේගවත් කරන්නට ඕනෑය, දැනට ක්‍රියාත්මක කරන වේගය මදිය කියන චෝදනාව පමණයි.

ගරු සභාපතිතුමනි, මට නියමිත කාලය සීමාසහිත නිසා මීට වඩා දීර්ඝ ලෙස මා කථා කරන්නට යන්නේ නැහැ. අවසාන වශයෙන්, මෙම අමාත්‍යාංශය භාර ඇමතිතුමා වන ගරු ජනාධිපතිතුමාටත්, අපේ හිතවත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, ඒ වාගේම මේ වැඩ කටයුතුවලට මග පෙන්වා ක්‍රියා කරන මේ රටේ දක්ෂම නිලධාරී මහතකු වන ඒ ලේකම්තුමා ඇතුළු ඉතාම දක්ෂ නිලධාරී මණ්ඩලයටත් අපේ විශේෂ ස්තුතිය පුද කරනවා. කොයි තරම් වැඩ වැඩිවුණත් විශාල නිලධාරී පිරිසක් වැඩි කර ගත්තේ නැති අමාත්‍යාංශයක් හැටියට මේ අමාත්‍යාංශය සඳහන් කරන්න පුළුවන්. විශේෂයෙන් මේ රටේ නොදියුණු ප්‍රදේශ වෙනුවෙන්, ග්‍රාමීය ප්‍රදේශ වෙනුවෙන් මේ අමාත්‍යාංශයේ තිබෙන වැදගත්කම වැඩිවැඩියෙන් අපට අවබෝධ වෙනවාය කියා මා මතක් කරන්න කැමතියි.

I wish to express my gratitude, on behalf of all my Colleagues in the Matara District and all the people of the Matara District, to the Swiss International Development Agency for giving us this Integrated Rural Development Project which has been a great boon and blessing to the people of the Matara District.

අ. භා. 1.18

ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)
(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார — அமைச்சர்)
(Mr. W. J. M. Lokubandara – Minister)

ගරු සභාපතිතුමනි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවෙන මේ අවස්ථාවේදී එම අමාත්‍යාංශයෙන් මගේ අමාත්‍යාංශයට දුන් සහයෝගය පිළිබඳව වචනයක් සඳහන් නොකළා නම් එය මගේ යුතුකමක් පැහැර හැරියා වෙනවා.

කලවාන ගරු මන්ත්‍රීතුමාගෙන් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) පවා පැසසුම් ලබන්නට තරම් අපේ අමාත්‍යාංශය යම් සේවාවක් කළා නම්, එම සේවාවලින් එකක් තමයි, පෝෂණ ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රයත්නය. බොහෝ විට කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) වැනි අයට මොළේ වඩන මුගුණුවැන් ද, ගොටුකොළ වැනි ගුණදායක ආහාරවල වටිනාකම නොවැටහුනත් මේ රටේ පොදු ජනතාව, විශේෂයෙන්ම කොත්මලේ පොදු ජනතාව වුණත් අගය කරන දෙයක් තමයි, කොළ කැඳ වැනි දේ. මෙය විහිළුවට ලක් වී තිබුණු දෙයක්. කෙහෙල් බඩ කාපු යුගයක කොළ කැඳවලට තැනක් නොතිබුණා නම් එය පුදුමයක් නොවෙයි. මේ රටේ ජනතාව, විශේෂයෙන්ම ගම්බද ජනතාව, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, මන්දපෝෂණයෙන් නොපෙළෙන නිරෝගී ජනතාවක් බවට පත් කිරීමට අපේ අමාත්‍යාංශයෙන් ගන්නා ප්‍රයත්නයට සැලසුම් ක්‍රියාත්මක කිරීම් අමාත්‍යාංශයෙන් දෙන නොමසුරු සහයෝගයට මා මේ අවස්ථාවේදී අතිශයින් ප්‍රශංසා කරනවා. [බාධා කිරීමක්] තවම නම් වෙලා නැහැ. තමුන්නාන්සේගේ මොන බඩුද දන්නේ නැහැ, මිල පාලනයට යටත් කර ගන්න බැරි. කොයි බඩුව කොහොම වුණත් තම තමන් තමතමන්ට පුළුවන් අන්දමේ බඩු බාර ගන්නවා නම් ඔය ප්‍රශ්නය වෙන්නේ නැහැ.

අද මේ රටේ දුප්පත් අහිංසක ජනතාවට කොළ කැඳ ලොකු පිහිටක් වෙලා තිබෙනවා. ඇති ඇත්තන්ට මොනවා වුණත්, අපේ දේශීය වෙදකමෙන් පිටුවහලක් ලබා ගන්නා පොදු ජනතාවට මේ කොළ කැඳ අද ලොකු පිහිටක් වෙලා තිබෙනවා. එබඳු ප්‍රයත්නයකදී අපට ලැබෙන සහයෝගයට මා අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා.

ඊළඟ කාරණය, විරුද්ධ පක්ෂය වුණත්, අපේ අන්තිම හතුරෙක් වුණත් පිළිගන්නා දෙයක් තමයි, මේ කාලයේදී තරම් සංවර්ධනයක් රජ කාලයේදීවත් සිදු වුණේ නැහැ කියන එක. අද යෝධ වැව් ඇති වී තිබෙනවා. මේ පිළිබඳව කොච්චර විලිස්සුවත් යෝධ වැව් ඒ විලිස්සන්නත් දෙස විලිස්සන්නේ නැහැ. අද මොන තරම් සංවර්ධනයක් සිදු වී තිබෙනවාද කියන එක පිළිගන්නට සිදු වී තිබෙනවා. ලූණුගම් වෙහෙර සංවර්ධන ව්‍යාපාරය දෙස බැලුවොත් — පස් කියුබ් 15 ලක්ෂයක් — ඒක අපේ රටේ සාමාන්‍ය සුළු සංවර්ධන කටයුත්තක් පමණයි. එබඳු සමාන කරන්න බැරි, අසමාන, අසහාය යෝධ සංවර්ධන ව්‍යාපෘති ගැන අද අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්කම තිබෙන මේ යුගයේදී, ඒ පිළිබඳ ප්‍රශංසාව හිමි විය යුත්තේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයටයි. කොච්චර සැලසුම් හිතේ තිබුණත්, පොතේ තිබුණත් වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කරන්න බැරි නම්. අපේ සංවර්ධන යෝජනාවලියේ යම්කිසි සාර්ථකත්වයක් තිබෙනවා නම් ඒ පිළිබඳව පැසසුම ඉදුරාම හිමි විය යුත්තේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයටයි.

මුළු ලොවම ආර්ථික අහේනියකට මුහුණ පා සිටින මෙවැනි යුගයකදී අපට සංවර්ධන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ගැනීමට පුළුවන් වීමට මූලික පදනම වැටිලා තිබෙන්නේ මේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තුළිනුයි. මේ රටේ මොන ප්‍රශ්නයක් මොන ආකාරයෙන් ඇති වුණත් පොදු ජනතාවට රිදවන්නේ නැතිව ඒ කටයුතු කිරීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. නොදියුණු ගම්බද ජනතාවක් සිටින අපේ ප්‍රදේශයට විශේෂයෙන්ම බදුල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සෑහෙන වැඩ කොටසක් කර තිබෙනවා. ඒ වාගේම කෝටි ගණන් වටිනාකම් ඇති ව්‍යාපෘති තිබෙනවා. කිරින්ද පාර, මාරදෙල පාර, ගොළුවාහෙල පාර වැනි දේ කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනීමට පිණිස මම කියන්නම්. ගොළුවාහෙලට පාර කපනවාය කියන්නේ අමාරු වැඩකට. ගොළුවා ඒ කන්ද උඩට යනවිට සභාපතිතුමනි, ගොළුවාටත් "අම්මේ" කියවිලා තිබෙනවා. ඒ ගොළුවාට කථා කෙරිලා තිබෙනවා. අර කථා කරන්න බැරිවූ කට ඇරිලා තිබෙනවා. එය ඒ තරම් බරපතළ හෙලක්. ඒ අනුව පෙනී යනවා ගොළුවාහෙලට පාර කැපීම ඒ තරම් බරපතළ දෙයක් බව. එබඳු පළාත්වලට පවා සේවයක් සිදුවන ව්‍යාපෘති ඇති වුණා නම් ඒ ඇති වුණේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් බව මා මේ අවස්ථාවේදී කිව යුතුයි. වෙලන්විට කියන ප්‍රදේශයේ මිනිසුන් සැතැප්ම 24 ක් දුර යන්නෙ එන්නේ පයින්. එබඳු පළාත්වලටත් පාරක් හදන්න තරම් අදහසක් ක්‍රියාත්මක කරන්න පුළුවන් තත්ත්වයක් අපේ ආසනවලට ලැබුණේ මේ අමාත්‍යාංශය නිසයි. හැම දෙයක් කෙරෙහිම වැරදි දෘෂ්ටියකින් බලන ඇත්තන්ට මේවා බොහෝවිට විහිළු වගේ හිතෙන්න පුළුවන්. අනේ! අපට එහෙම නොවෙයි. කවදාවත් පාරක් එහියි නොසිතූ පළාත්වලට හැතැප්ම ගණන් දිග පාරවල් එනකොට සැබවින්ම අපට මේ අමාත්‍යාංශය ගැන ප්‍රශංසා මුඛයෙන් කථා නොකොට බැහැ.

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ තිබෙන විශේෂ අංශයක් තමයි, ප්‍රචාරක අංශය. ඒ ප්‍රචාරය නිකම්ම ප්‍රචාරයක් වෙන්න නොදී කම්මැලිකමක් නැතිව බලාගෙන සිටින අයට—ප්‍රේක්ෂකයන්ට—දැනුමක් තේරුමක් ලැබෙන විධියට, හොඳ අධ්‍යයනයක් ලැබෙන විධියට ඒ වැඩසටහන් හරිහස්සා තිබෙනවා. "මාගම්පුරාණය" නමින් වැඩ සටහනක් මම මේ මෑතකදී දැක්කා. ඒ වැඩ සටහන බැලුවාම ඒ දිශාවේ මොන විධියේ සංවර්ධනයක් සිදු වී තිබෙනවාද නැද්ද කියන එක තේරුම් ගන්නට පුළුවන්. සාමාන්‍යයෙන් විරුද්ධ පාර්ශ්වයේ ඇත්තන්ට මුල්කිරිගල වගේ තැනකවත් ඡන්ද බලයක් පෙන්වන්න බැරි තත්ත්වයක් ඇතිවීමට පදනම ඇති වී තිබෙන්නේ මේ අමාත්‍යාංශ තුළ බව දැන ගන්න එක විරුද්ධ පාර්ශ්වයේ සතීපයට හේතු වෙනවාට සැකයක් නැහැ.

විශේෂයෙන්ම මේ ජනගහන පාලනය ගැන නොවෙයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන පිළිබඳව මට එක වචනයක් නොකියා බැහැ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන නමින් දෙපාර්තමේන්තු ඉස්සරත් තිබුණා. නමුත් මේ වාගේ ඉතාමත්ම රමණීය විධියට එක එක විධියට දත්ත එද සැපයුවේ නැහැ. සමහරවිට පක්ෂ දේශපාලනය අනුව කල්පනා කරනවිට අපටත් පාඩු වෙන අන්දමට ඉලක්කම් ඉදිරිපත් කර තිබෙනවා. අපි එහෙම කල්පනා කර නැහැ. සාධාරණව, සර්ව සම්පූර්ණ විධියට අපට ඒ දත්ත ලබා දීමට කටයුතු කර තිබෙනවා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නොයෙකුත් කාර්යයන් සඳහා පරිහරණය කළ හැකි අන්දමට මෙවැනි යුගයේදී පුළුල් සේවයක් කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මේ සම්බන්ධයෙන් මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්නට ඕනෑය කියා මම හිතන්නේ නැහැ. මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු පිළිබඳව මගේ ස්තුතිය මම ප්‍රකාශ කරනවා. මේ කොළකැඳ ව්‍යාපෘති ආදිය ලබන අවුරුද්දේ මීටත් වඩා පුළුල් විධියට කරන්නට අපි දැනටමත් සැලසුම් යොදලයි තිබෙන්නේ. ඒ වාගේම අපේ ආසනයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්ම වැනි දේවල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]

මඟින් දුප්පත්ම දුප්පත් අහිංසක පවුල්වල තත්ත්වය දියුණු කර ගන්නට මාර්ග අපට සැලසී තිබෙනවා. මේ සියල්ලක්ම පසුපස ඉතාමත්ම නිහඬව සේවය කරන රාශියක් ඉන්නවා. ඒ අය අතරින් අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කවදාවත් කලබල කරන කෙනෙක් නොවෙයි. වැඩිය පිම්බෙන්න කටයුතු කරන කෙනෙක් නොවෙයි. රාජ්‍ය සේවයේ ඉතාමත්ම භාරධූර වගකීම් දරූ ඉතාමත්ම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. මේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ඒවාගේමයි. එතුමා මාගේ ගුරුවරයෙක්. විශේෂයෙන්ම ගුරුවරයෙක් ගැන ගෝලයා වැඩිය හොඳ කියන්නට හොඳ නැහැ. එසේ වුවත් එය කියන්නට මම මෙය අවස්ථාව කර ගන්නවා. එබඳු කෙනෙක් ගුරුවරයා යයි කියන්න ඉතාමත් ආඩම්බරයි. ඒවාගේම අතිරේක ලේකම්තුමා වැනි සැහෙන පිරිසකගෙන් අපේ අහිංසක ජනතාවගේ නැඟීමට තුඩු දෙන ඒ වැඩ පිළිවෙලට ලැබෙන සහයෝගයට මගේ ප්‍රශංසාව හිමිකරමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට තුණුරුවන් සරණයි.

ජිනදස වීරසිංහ මහතා (තංගල්ල)
(திரு. ஜினதாச வீரசிங்ஹ — தங்கல்ல)
(Mr. Jinadasa Weerasinghe – Tangalle)

ගරු සභාපතිතුමනි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේදී වචන ස්වල්පයකින් හෝ කෘතගුණ සැලකීම නොකලොත් ලොකු අඩුපාඩුවක් කළාය කියා පසුව පසුතැවිලි අමාත්‍යාංශය පිළිබඳව විවිධ මතිමතාන්තර ප්‍රකාශ වුණත් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වෙන්න සිදු වෙනවාය කියා මම එසේම හිතනවා. එසේම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් උපරිම ප්‍රයෝජනයක් ලැබූ ආසනයක මන්ත්‍රීවරයෙක් හැටියට ඒ ලැබූ ප්‍රයෝජනය පිළිලබඳව පැසසුමක් නොකලොත් එය කෙලෙහි ගුණ නොදන්නාකම හුවා දක්වීමක්ය කියා මම හිතනවා.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට තෝරාඩි ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ ජනතාවගේ එදිනෙද පැවැත්මට අවශ්‍ය විවිධ ආකාරයේ විසඳුම් ලබා දෙන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. විශේෂයෙන්ම තංගල්ල ආසනයේ කෘෂිකර්මාන්තය ජීවන රටාව හැටියට පත් කරගෙන ජීවත්වන පිරිසට තමන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වෙළඳ පොළට ගෙන යාමටවත් පුළුවන්කමක් නොතිබුණු දිස්ත්‍රික්කයක් තමයි, හම්බන්තොට දිස්ත්‍රික්කය. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ තෝරාඩි ව්‍යාපෘතියෙන් ලැබෙන ආධාර යටතේ අපේ ප්‍රදේශවලට ඒ විධියේ පහසුකම් විතරක් නොවෙයි ලැබී තිබෙන්නේ. ආබාධිතයන්ට පිහිටවී තිබෙනවා. අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන්ට අධ්‍යාපනයට අවශ්‍ය ගොඩනැගිලි, ඒ ගොඩනැගලි සඳහා අවශ්‍ය උපකරණ ආදී හැම දෙයක්ම හැම අංශයකින්ම අපට ලබා දී තිබෙනවා. ඒවාගේම මුහුදුකරයේ ගම්මානවල ජීවත්වන ඒ අයට ජීවිත කාලය තුළ හොඳ වතුර වීදුරුවක් බී මිය පරලොව යන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. අවුරුදු හතළිහක්, හතළිස් පහක් පමණ මේ රටේ ආණ්ඩු ඇති වුණා. ආණ්ඩු නැති වුණා. විවිධාකාර බල පුළුවන්කාරයෝ ඇති වුණා ; නැති වුණා. නමුත් ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන අතිගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ යටතේ මේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ උනන්දුව නිසා මගේ ආසනයේ මුහුදුකර ගම්මාන හැම එකකටම ජල නල යෝජනාක්‍රම ක්‍රියාත්මක කර දෙන්නට මට පුළුවන්කම ලැබුණා.

ඒ වාගේම දන් සත්ව පාලන කටයුතු ඇතිකර. කිරි දෙනුන් ඇති කරන උදවියට කිරි සාධාරණ මිළකට අලෙවි කරගන්න පහසුකම් ලබාදී තිබෙනවා. එමෙන්ම බුද්ධිමත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් හම්බන්තොටට තෝරා පත්කිරීම පිළිබඳව මගේ ප්‍රශංසාවත්, විශේෂයෙන්ම තංගලු ජනතාවගේ ස්තුතියත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමාටත්, ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයටත් මා පිරිනමන්නට ඕනෑ. කවුරු මොනවා කිව්වත්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයට ලැබුණු පහසුකම් අපේ අම්මා මුතුන් කාලයේවත් ලැබුණෙත් නැහැ ; ලබාගන්න පුළුවන් වෙයි කියා අපිට විශ්වාස කරන්නත් පුළුවන්කමකුත් නැහැ.

අපේ දෙනියාය ගරු මන්ත්‍රී, මාතර දිසා ඇමතිතුමා රැකියා බැංකුව පිළිබඳව පොඩි ඉඟියක් කළා. රැකියා බැංකු පෝර්ම දහක් අපේ සංවිධානවල උදවියට දෙන්න අපට අවස්ථාව සලසා දුන්නත්, රැකියා බැංකුව ක්‍රියාත්මක කිරීමේ මුල් අවස්ථාවේ අපටත් ඒ හැටි පලපුරුද්දක් නොතිබුණු බව මෙම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අවධානයට යොමු කරවන්න මේ අවස්ථාවේ අදහස් කරනවා. අපි කොපමණ උපදෙස් දී ඒ රැකියා පෝර්ම ලබා දුන්නත් ඒවා ලබාගත් අධ්‍යාපන සුදුසුකම් නොලැබූ අය ඒවා පිරවීම නිසා රැකියා අවස්ථාවක් ලබා ගන්න බැරිව අද සැහෙන පිරිසක් ඉන්නවා. ඒ වාගේම අද අධ්‍යාපනය ලැබූ උගත් උදවිය තමන්ගේ කුශලතා අනුව —තමන්ගේ උගත්කම අනුව — රැකියාවක් ලබාගැනීම සඳහා රැකියා බැංකු පෝර්මයක් ලබාගන්න අවස්ථාවක් නැතිව ඉන්නවා. ඒ නිසා මේ කරුණු අවබෝධ කරගෙන රැකියා බැංකු පෝර්ම නැවත වරක් නිකුත් කිරීමට සාධාරණව කල්පනා කර බලන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. එතකොට අපි ලැබූ අත්දැකීම් උඩ රැකියාවක් අවශ්‍ය උපරිම අධ්‍යාපන සුදුසුකම් ලැබූ උදවියට ඒ පෝර්ම ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ සම්බන්ධව ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරන ගමන්, මෙම අමාත්‍යාංශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ආසනයට මා තරම් ප්‍රයෝජන ලබාගත් වෙනත් කෙනෙක් නොමැති බවත් ප්‍රකාශ කරන්න කැමතියි. ඒ මොකද — හම්බන්තොට ගරු දිසා ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටිනවා — හම්බන්තොට දිස්ත්‍රික්කය නගා සිටුවීමට තමුන්නාන්සේලා පත්කර දුන් ව්‍යාපෘති අධ්‍යක්ෂතුමාගේ හොඳ හිත දිනාගන්න පුළුවන්කම ලැබුණු නිසා මට ඒ වාසනාව ලැබී තිබෙනවා.

අ. භා. 1.30

ඒ නිසා රැකියා බැංකු පෝර්ම ලබාදීම සම්බන්ධව මා කලින් කී කරුණු ගැන කල්පනා කර බලා ඉදිරියට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ තවත් තිබෙන අඩුපාඩුකම් රාශිය ඉදිරි අවුරුදු තුනේදී මගහරවන්නට තමුන්නාන්සේලාගේ උපරිම සහයෝගය ලබා දෙන්න කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තුතියි.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මට සුළු කාලයක් හෝ කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) මේ ගරු සභාවේ දැන් සිටින නිසා එතුමා "සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයත්, ක්‍රමසම්පාදන අමාත්‍යාංශයත් දෙක එකට යා යුතුයි. මේ දෙක වෙන් කර තිබීමෙන් වැඩක් සිදු වෙන්නේ නැහැ " කියා එතුමාගේ කථාවේදී කළ ප්‍රකාශය මට මතක් වුණා. ඒවාගේම ඒ අයගේ උපදෙස් අරගෙන එය ක්‍රියාත්මක කරන්න කොහොමටවත් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ කියා මම මතක් කරන්න ඕනෑ. එද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයක් තිබුණත්, එය ක්‍රියා විරහිත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයක් මිසක් අද වාගේ ක්‍රියාත්මක අමාත්‍යාංශයක් නොවේය කියන එක පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒවාගේම එතුමා ඇහුවා 1977 දී අපේ රජය බලයට පත් වන විට දුන් පොරොන්දු ඉෂ්ට කර තිබෙනවාද කියා. ඒවා අමතක වෙලා නේද කියා ඇහුවා. හොඳට ඇස් ඇරලා එතුමාගේ ආසනය දිහා බලන්න කියා මම එතුමාට පැහැදිලිව කියන්න ඕනෑ. එතුමාගේ ආසනයේ කොත්මලේ ජලාශය දිහා බැලුවොත් එතුමාට හිතාගන්න පුළුවන්, 1977 දුන් පොරොන්දු ඉෂ්ට කරලා තිබෙනවාද, නැද්ද කියන එක ගැන. ඒ විතරක් නොවෙයි. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ විශේෂ උනන්දුව, අනුග්‍රහය මත ලැබී තිබෙන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය දිහා බැලුවොත්, නුවරඑළිය දිස්ත්‍රික්කයට, කොත්මලේ ආසනයට කොයි තරම් සේවයක් සංවර්ධනයක් ඒ තුළින් ඇති වී තිබෙනවාද කියන එක දැන ගන්න පුළුවන්ය කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ. ඒ අපේ පොරොන්දුවක් නොවෙයි. 1977 දී පොරොන්දු වුණේ නැහැ, නෙදර්ලන්තයෙන් හෝ වෙනත් රටක හෝ ආධාර ලබාගෙන අපි මේ කටයුතු කරනවාය කියා. එහෙනම් ඒ පොරොන්දුවලට බාහිරව මේ වගේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ඉෂ්ට කර තිබෙනවා.

මම හිතනවා එතුමාට පැහැදිලිව පිළිතුරු දුන්නා, නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත්, ඒ වගේම මාතර දිසා ඇමතිතුමාත්. කෙසෙල් බඩ කාපු යුගය අමතක කරල දැල. බාල්දි අවුස්සන් කාපු යුගය අමතක කරල දැල. අද කියනවා ඇවිදින ඇටසැකිලි ලංකාවේ තිබෙනවාය කියන එක. එතුමාට කියන්න දෙයක් නැති නිසා හෝ එහෙම නැත්නම් මේ රජයෙන් කළ සංවර්ධන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ව්‍යාපෘති අගය කරන්නට බැරිකම නිසා හෝ ඒ වගේ ප්‍රකාශ කරනවා විය හැකියි. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ආහාර හා පෝෂණ කටයුතු වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් බැලූවොත් එතුමාගේ ආසනයේ මොන තරම් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවාද කියන එක ගැන එතුමා නොදන්නවා විය හැකියි. මම හිතන්නේ ඒකට හේතුව වෙන මොකක්වත් නොවෙයි. තමන්ගේ ආසනයේ වැඩ කටයුතු තමන් සොයා නොබලා නිහඬව සිටින නිසා දන්නේ නැතිව ඇති. ලංකාවේ කෙසේ වෙතත්, තමන් නියෝජනය කරන, එහෙම නැත්නම් තමන් පාර්ලිමේන්තුවට පත් කර එවූ ජනතාවගේ දුක සැප ගැනවත් නොබලන බවයි, එයින් පැහැදිලිව පෙනෙන්නේ. ගම්පොල තමයි දූන් එතුමාගේ පදිංචිය. කොහොම වුණත් මම හිතන්නේ, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ගැන කියන කොට, එය නිහඬව විශාල සේවයක් කෙරෙන අමාත්‍යාංශයක්ය කියන එක අපි කවුරුත් ප්‍රසංශාත්මකව කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශයෙන් සැහෙන වැඩ කොටසක් ඉෂ්ට වෙනවා.

මට මතක් වුණා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ගැන කියන කොට කවුරුත් වාගේ කිව්වා, නියෝජ්‍ය ඇමතිතුමා නිහඬව සේවය කරනවා කියා. ශ්‍රීමත් ජනාධිපතිතුමා තමයි මෙම අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා වශයෙන් ක්‍රියා කරන්නේ. එහි ලේකම්තුමා වශයෙන් ක්‍රියා කරන්නේ ආචාර්ය වික්‍රම වීරසූරිය මහත්මයා. එතුමා ගැන කියන කොට මට මතක් වුණා, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සී—නෝර් පදනමක් අරගෙන එතුමාට සැහෙන පහරක් ගහන්න උත්සාහ කළ බව.

ගරු සභාපතිතුමනි, මම හිතනවා මේ සී—නෝර් පදනම උපයෝගී කරගෙන පහර ගහන්නට යන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය කාලේ,—1976 දි වගේය කියලයි මට මතක—එතුමා අවුරුදු හතරක් මොනෑෂ් කියන විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය වරයෙක් වශයෙන් ඉඳලා ලංකාවට ආවා. ඒ ඇවිල්ලා 1977 ජනවාරි මාසයේ නැවත ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට යන්න යන වෙලාවේ එතුමාගේ පාස්පෝට් එක තහනම් කලා. ඒ පාස්පෝට් එක තහනම් කළේ "සත් වසක සාපය" කියා පොතක් ගැහුවාය, ඒකට ඔහු සම්බන්ධ වුණාය කියලයි. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) දෙතුන් වතාවක්ම ඇහුවා, ඕස්ට්‍රේලියාවේ පදිංචියට නැවත යනවාද කියන එක ගැන. ඔව්, මම ඒක තමයි කියන්න හදන්නේ. පරණ කතාව නැවත මතක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එතුමා ඕස්ට්‍රේලියාවට යනවාද කියා අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා ඇහුවා. එතුමාට යන්න තිබුණු අවස්ථාව නැති කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය. අපි සන්තෝෂ වෙනවා, ඒ වගේ ක්‍රියාවක් කර, ඒ වගේ බුද්ධිමත් කෙනෙක්, අපේ පාක්ෂිකයෙක්, අපේ අමාත්‍යාංශයක ලේකම් වශයෙන් පත් කර ගැනීම සඳහා අපට සහාය දීම සම්බන්ධව. ඒ නිසා මම ඉල්ලීමක් කරන්නට කැමතියි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන්. ආචාර්ය වික්‍රම වීරසූරිය මහතාට එහෙම යන්න දීමෙන් බුද්ධිමත් පුද්ගලයෙකුගෙන් අපේ ලංකාවට ලබාගන්න තිබෙන සේවය නැති කර ගන්න එපා. ඒක අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. "සත් වසක සාපය" කියන කොට මට මතක් වුණා, කාටුත් පොතක් ගැහුවාකියා—ගැහුවා හෝ නොගැහුවා හෝ—පාස්පෝට් එකක් තහනම් කරන්න තරම් එද රජය ද්‍රෝහී වුණු බව. අද මොන විධියේ කාටූන් යනවාද අපේ රජයට විරුද්ධව. කිසිම පුවත් පතක් තහනම් කරන්න අපි උත්සාහ දරන්නේ නැහැ. ඕනෑම කාටූන් එකක්, ඕනෑම විධියකට, ඕනෑම කෙනෙකුට ප්‍රචාරය කරන්න තරම් අද ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සම්පූර්ණයෙන්ම දීලා තිබෙනවාය කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත්, කවුරු මොන විධියට රජයට මඩ ගහන්න උත්සාහ කළත් ඒ මඩ ගහන අයටම නැවත ඒ මඩ වදින බව මම පැහැදිලිවම ප්‍රකාශ කරනවා.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වැඩ සම්බන්ධව කථා කරන විට ආහාර හා පෝෂණ කටයුතු සෑම දිස්ත්‍රික්කයකම සෑම ආසනයකම ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. මම හිතන්නෙ විශේෂයෙන් අපේ ත්‍රිපෝෂ වැඩ සටහන මෙම අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. අපේ දිස්ත්‍රික්කය ගත්තොත් කොළ කැඳ ව්‍යාපෘතිය විදුහල් 75ක ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව ජාතික වශයෙන් නොව ගම් මට්ටමෙනුත් මේ ආහාර සහ පෝෂණ වැඩ ක්‍රියාත්මක වන බව අපි කවුරුත් දන්නවා. කාන්තා ව්‍යාපෘතියත් කාන්තාවන් වෙනුවෙන් හොඳින් ක්‍රියාත්මක වෙනවා.

ජනගහණය සම්බන්ධව කථා කළොත් මෙහි කෙරෙන්නේ ජනගහණය සීමා කිරීමක් නොවෙයි සැලසුමක් ඇතිව පවුල් සැලසුම් කිරීමයි. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ උපදෙස් මත ඒ පවුල් සැලසුම් ක්‍රමය ක්‍රියාත්මක කරගෙන යනවා. මම හිතන්නේ හැම ප්‍රදේශයකම වාගේ එය ක්‍රියාත්මක වෙනවා. මගේ ප්‍රදේශය ගත්තොත් ගමත් වත්තත් සම්බන්ධ කෙරෙමින් එය ක්‍රියාත්මක වෙනවා. සමහර කෙනෙක් කියන්න පුළුවන් මෙය සිංහල ජනගහණය නැති කරන්න හදන වැඩපිළිවෙළක්ය කියා. නමුත් සිංහල පමණක් නොව මගේ දිස්ත්‍රික්කයේ ගමත් වත්තත් සම්බන්ධ කරගෙන මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවාය කියන එක මට ඔප්පු කරන්න පුළුවන්.

ඒ වාගේම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ළමා කාර්යාංශයක් ක්‍රියාත්මක වෙනවා. මම ඒ ගැන දිගටම කථා කරනවා නොවෙයි. ඒ වුණත් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න කැමතියි ළමා කාර්යාංශය යටතේ අපේ දිස්ත්‍රික්කයට ව්‍යාපෘති දෙකක් ලබා දී තිබීම ගැන.

ඊ ළඟට විශේෂ සේවා නිලධාරී ක්‍රමයත් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. ග්‍රාමෝදය මණ්ඩලවල ලේකම් වශයෙන් වැඩ කරන්නේ ඒ නිලධාරියා. ගම්වල සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරවන්නෙ ඒ විශේෂ සේවා නිලධාරියා විසින්.

මේ විශේෂ සේවා නිලධාරීන්ට වැඩ රාශියක් පැවරී තිබෙනවා. ඒ ගොල්ලන් දැනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සහාය වෙනවා. ඡන්ද නාම ලේඛන කටයුතුවලට සහාය දෙනවා. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතුවලට සහාය දෙනවා. ඒ වාගේම ආහාර හා පෝෂණ වැඩ කටයුතුවලට සහාය දෙනවා. ජනගහණ වැඩ කටයුතුවලට සහාය දෙනවා. ඔය විධියට විශේෂ සේවා නිලධාරීන් හැම වැඩ කටයුත්තකටම සහාය දෙනවා. කොටින් කියතොත් විශේෂ සේවා නිලධාරීන් විශාල වැඩ කොටසක් කරන පිරිසක් බව අපට කියන්න පුළුවන්.

ග්‍රාමෝදය මණ්ඩලය ගත්තොත් ඒ අය ඒ ගමේ සංවර්ධනය සඳහා නොයෙක් යෝජනා ක්‍රම ඉදිරිපත් කරනවා. තවත් නොයෙක් ව්‍යාපෘතිවල කටයුතු කරගෙන යනවා. ඒවාට සහාය දෙනවා. ග්‍රාමෝදය මණ්ඩලයේ ලේකම් වසයෙන් ඒ සැමදෙයක්ම කරන්නේ විශේෂ සේවාව නිලධාරීන්. නමුත් දැනට විශේෂ සේවා නිලධාරීන් පත් කර සිටින්නේ ග්‍රාම සේවා කොට්ඨාශ දෙකකට එක්කෙනා බැගින්. ගම්වල ඇති වැඩකටයුතුවල බහුල භාවය ගැන කල්පනා කරන විට විශේෂ සේවා නිලධාරීන් ඒ සියලූ වැඩකම නිරත යුතු නිසා මම නියෝජ්‍ය ඇමතිතුමාට යෝජනා කරන්න කැමතියි එක ග්‍රාම සේවා කොට්ඨාශයකට එක විශෙෂ නිලධාරියා බැගින් පත් කරන්නය කියා. එවිට ඒ ගොල්ලන්ගෙන් අපට මීට වඩා වැඩි වැඩ කොටසයක් ඉටු කරගන්න පුළුවන් වේවි.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ගැන නොකියාම බැහැ. අනික් දිස්ත්‍රික්ක කීපයකට වාගේම අපේ දිස්ත්‍රික්කයටත් නෙදර්ලන්ත සහාය ඇතිව ඒකාබද්ධ ග්‍රාමීය ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ විශේෂ අනුග්‍රහය සහ පාලනය යටතේ ලබා දී තිබෙනවා. ඒ තුළින් හැම ආසනයකම විශාල වැඩ කොටසක් ඉටු වෙනවා. මට මතකයි මුල් අවුරුද්දේ මෙය ක්‍රියාත්මක වන විට ප්‍රශ්න රාශියක් මතු වුණු බව. නමුත් ලේකම්තුමා මුල් වී ඒ ප්‍රශ්න නිරාකරනය කරමින් ගමටත් වත්තටත් සාධාරණ වන විධියට ඒකාබද්ධ ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අපට සහයෝගය ලබා දුන්නා.

එපමණක් නොවෙයි යුනිසෙප් ආධාර යටතේත් විශාල වැඩ කොටසක් අපේ දිස්ත්‍රික්කය තුළ කෙරීගෙන යනවා.

මේ අවස්ථාවේදී මම නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි, මගේ ආසනයේ තිබෙන කොළ පාට කිරි ගරුඬ ගලක් ගැන. එය අක්කර පහක පමණ ප්‍රදේශයක පැතිර ගොස් තිබෙනවා. මේ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ අවධානය යොමු කළත් මේ වන තුරු කිසිම ක්‍රියාත්මක පියවරක් අරගෙන නැහැ. මම කැමතියි, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තුළින් යම්කිසි කර්මාන්තයක් [බාධා කිරීමක්] ඔව්, ගලත් කොළ පාටයි. නමුන්නාන්සේලාගේ ආසනවල එහෙම ගල් දකින්න නැහැ. ඒ නිසා නමුන්නාන්සේලාත් මගේ ආසනයට ඇවිත්, එය බලාගෙන යනවා නම් මම කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
කොල් පාට කිරිගරුඩ ගල්.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)

කොහොම වුණත් ඒ කිරිගරුඩ ගලෙන් යම්කිසි කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අවධානය යොමු කරාවිය කියා මා බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් රැකියා බැංකුක්‍රමය ගැන මතක් කරන්න කැමතියි. ඇත්තවශයෙන්ම ඉතාම සාධාරණවත් සමානාත්මතාවයකින් යුතුවත් දුෂ්කර ආසනවල සිටින අයට පවා රැකියා ලබාගැනීමට අවස්ථාව ලැබී තිබෙන්නේ රැකියා බැංකුක්‍රමය ක්‍රියාත්මකවුණ නිසයි. එහෙම නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් ලේකම්තුමාගේත් අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. සමහරවිට මේ අවස්ථාව වනවිට ලිපිකරු සුදුසුකම් වැනි සුදුසුකම් තිබෙන අයට අවස්ථාවක් නැති තත්ත්වයක් තිබෙනවා වෙන්න පුළුවන්. එහෙම නම් ඊට බාහිර අය සඳහා අවස්ථා සලසා දෙන්නය කියා මා මතක් කර සිටින්න කැමතියි. එවැනි අයට මීට කලිනුත් අවස්ථාව ලබාදුන්න බව මා දන්නවා. නමුත් තවදුරටත් ඒ ගැන දැඩි අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලීමක් කරන්න කැමතියි.

රැකියා බැංකුක්‍රමය තුළින්ම නැත්නම් ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තුළින්ම රැකියා ලබාදීමේ කටයුත්ත කළ යුතුය කියා අප තරයේම කියා සිටින්න ඕනෑ. එහෙම වුණොත් පමණයි දුෂ්කර ආසනවලටත් එහෙම නැත්නම් හැම ආසනයකටම සාධාරණව රැකියා ලබා ගැනීමට පුවත් වන්නේ. එම ප්‍රකාශය කරමින් මේ වගේ වැදගත් අමාත්‍යාංශයක් නියෝජනය කරන අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයටත් මගේ ස්තුතිය පිරිනමමින් 1986 වර්ෂයේදී මීටත් වඩා සේවයක් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තුළින් ඉටුවේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

එම්. ඩී ප්‍රේමරත්න මහතා (නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)
(திரு. எம். டீ. பிரேமரத்ன — பாராளுமன்ற அலுவல்கள்., விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)
(Mr. M. D. Premaratne – Deputy Minister of Parliamentary Affairs & Sports)

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබාදීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. විනාඩි පහක පමණ වේලාවක් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටියේ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ පසුගිය අවුරුද්දෙත් මතක් කළ කාරණයක් නැවත මතක් කරදීමටයි. ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක්. මා නියෝජනය කරන ආසනය අයිති වෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයටයි. මේ කාරණය ගැන මම පසුගිය අවුරුද්දේදීත් කථා කළා. නමුත් මේවරත් කථා කරන්නට සිදුවී තිබෙනවා. මා මේ කියන කාරණය මගේ ආසනයට පමණක් බලපාන කාරණයක් නොවෙයි. තවත් ආසන කීපයටකම මේ කාරණය බලපානවා. වෙනත් දිස්ත්‍රික්කවල ආසන දුෂ්කර ආසන හැටියට සලකා ඒවාට නොයෙක් විධියේ විදේශ ආධාර ලබාදෙනවා. ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ නොයෙකුත් සංවර්ධන යෝජනාක්‍රම ක්‍රියාත්මක කරනවා. නමුත් කොළඹ දිස්ත්‍රික්කයට අයිති අවිස්සාවේල්ල, හෝමාගම, කඩුවෙල, කැස්බෑව වගේ ආසනවලට මෙමම වැඩපිළිවෙළ යටතේ ග්‍රාමීය සංවර්ධන යෝජනාක්‍රම හෝ නොයෙකුත් අංශවලින් ලැබෙන ආධාර හෝ විදේශීය ආධාර වශයෙන් ලැබෙන සංවර්ධන යෝජනාක්‍රම කිසිවක් ලැබෙන්නේ නැහැ. මෙය ඇත්තවශයෙන්ම බලවත් අසාධාරණයක්. මොකද ? කොළඹ දිස්ත්‍රික්කය කියා කියනවිට අපේ ආසනත් ඉතාම දියුණු ප්‍රදේශ හැටියටයි කල්පනා කරන්නෙ.

දැන් හම්බන්තොට වැනි ප්‍රදේශවලට විශාල වශයෙන් විදේශීය ආධාර ආදිය ලැබෙනවා. ඒ ආසනවල ඉන්න මන්ත්‍රීවරුන්ට ඒ ආසන දියුණුකර ගැනීමට ඒ නිසා අවස්ථාවක් සැලසේනවා. කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන හැම ආසනයක්ම තවමත් දියුණු ආසන හැටියට සලකන්න බැහැ. නමුත් කොළඹ දිස්ත්‍රික්කයේය කියා කියනවිටම අර දියුණු ගොන්නටම අපේ ආසනත් වැටෙනවා. කොළඹ නගරය තුළ තිබෙන තත්ත්වයම අපේ ආසනවලත් තිබෙනවාය කියා හිතනවාද මම දන්නෙ නැහැ. එහෙම හිතනවා නම් එය සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ නිසා අපි මේ මතය වෙනස් කරන්න ඕනෑ. ඒ හැකියාව තිබෙන්නේ මේ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයටයි.

ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම, විදේශීය ආධාර ආදිය ලබා දෙන විට කොළඹ දිස්ත්‍රික්කය ගැනත් කල්පනා කරනවා නම්, කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන නොදියුණු ආසන ගැනත් කල්පනා කරනවා නම් ඉතාම වැදගත් වෙනවා. අපේ ආසනවල තවමත් පාරවල් හරියට සකස් වී නැහැ. අපේ ආසන විශාල වශයෙන් දියුණු වුණු ආසන නොවෙයි. කාලයක් තිස්සේ දියුණුවෙන් අඩුව තිබුණු මේ ආසනවල, මේ වර්ෂ කීපය තුළදී පමණයි අපට යම්කිසි ප්‍රගතියක්, දියුණුවක් ඇතිකර ගන්න පුළුවන් වුණේ. ගිය අවුරුද්දේත් මම ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ ඉල්ලීම කළා. ඒ නිසා මේ කාරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. අනෙක් දිස්ත්‍රික්කවලට නොයෙක් ක්‍රමවලින් පහසුකම් ආධාර ලැබෙනවා. අපට ලැබෙන්නේ ලක්ෂ විසි පහ පමණයි. ඒ ලක්ෂ විසි පහෙන් හැම වැඩක්ම කරන්න සිදු වී තිබෙනවා. මම මේ ඉල්ලීම විතරයි කරන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ දියුණුවෙන් අඩු ආසන ගැන විශේෂ අවධානය යොමු කරන්න. මේ ආධාර ලැබෙන විට, ආධාර ලබා දීමට රටවල් හෝ සංවිධාන ඉදිරිපත් වන විට කොළඹ දිස්ත්‍රික්කය කියා මුළු දිස්ත්‍රික්කයේම තිබෙන ආසන සියල්ලම දියුණු ආසන සේ සලකන්නේ නැතිව ඒ ආසන ගැනත් කල්පනා කර යම් වැඩපිළිවෙළක් සකස් කරන ලෙස මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. මට මේ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මේ කාරණය පමණයි.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Sir, I am very grateful to the hon. Members who have spoken today in a very complimentary manner with a few worthy criticisms, which has made my task very easy. I think I must first begin replying to a few points raised by the hon. Members in the Opposition.

The hon. Member for Kalawana raised a point with regard to the Job Bank and wanted to know how many job cards have been issued. There have been 154,000 cards issued and 113,126 people have been employed already. The rest are also being investigated. For the information of hon. Members I will table a sheet giving the details with regard to all the other parts of the Island and the respective jobs given to various sections in the country.

The hon. Member also raised a point about a lottery ticket in the "සංවර්ධන ලොතරැයිය". He said a certain gentleman known to him and had got a ticket with no proper figures or lettering or whatever it is. I must point out that in the printing of currency, printing of stamps and lottery tickets defects do occur. But there is a codified method of having all these tickets controlled. If the hon. Member gets the gentleman concerned to come over to our office and look at the computerized counterfoil of that ticket – (*Interruption*). There is a little more than that. We are prepared to pay that gentleman's travelling expenses up and down and if he has won a ticket we are prepared to make good that amount to him.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

If he has won Rs. 5 or Rs. 10, why should be come all the way to Colombo to get his travelling expenses. He wants the first prize.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Then I am sorry ; that is all we can do about it, that is the most we can do. As you know, stamps had been mutilated in printing ; so have been currency notes all over the world. This is not a thing that has been done deliberately. It is a mistake. And we are prepared to help that gentleman.

Then, Sir, the hon. Member for Kotmale mentioned about some problem in his area where there is a clash between a Development Society and a Co-operative. I promise to look into the matter and let him know if he writes to me the details of the case.

The hon. Member for Baddegama was very correct in what he said. He said there are certain companies that have come into Sri Lanka and which are probably spreading out at the expense of other small industries. We all want to get together and prevent this sort of thing but that does not mean that we must prevent the foreign companies from coming. The other day I was listening to the Voice of America. They are inviting people from all over the world to invest monies in their country. That is the way they can have more employment available to the people and have more currency in circulation. So can we. I am glad that the hon. Member pointed that out.

Then, Sir, there was a question about *kola kenda*. That was a dirty word at some time. When a man could not play cricket or when he could not run fast he was called a *"kendaya"* . That is no longer there. Actually, if you go into the history –

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அநுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

When we want to refer to a UNPeer we call him *kola kendaya.*

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Very good. We will be happy to hear that. We will also offer you *kola kenda* when you come that way.

If you remember our history, we have been living on *kola kenda* at a certain time. We were very healthy at that time. You were speaking of nutrition. You remember the time when the children in Sri Lanka were puny, when they had distended bellies, when they had *korala* from elbow down to the wrist and from the knee down to the feet. That was only a few years ago. Can you remember when they used to die like flies due to Malaria and othe diseases ? The Health Department has been able to overcome this. I am glad to see that the Hon. Minister of Indigenous Medicine is now propagating *kola kenda* and lots of other things which will prevent people from being deformed and unhealthy. – (*Interruption*). Very good.

Sir, in 1976 the pre-school population that was said to be under-nourished was 57.4 per cent. in 1981-82 it has been brought down to 34.8 per cent. – (*Interruption*). You can check that up from the –

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

But where are those figures ?

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

I will give the figures over to you. That is not all. We have got a Census Department in our Ministry. You are welcome to go and ask them whatever you want.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

But there was never this much of malnutrition among pre-schoolers before this.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

You are telling me that ? Are you very honest about what you are saying ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Yes.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Do you remember the time when children could not even read properly because they were affected by eye troubles ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Your Finance Minister admitted it during the Second Reading of the Budget.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Hon. Member, I am very sorry to hear that type of story from you !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Your Finance Minister said that during the Second Reading.

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

That is not all, Sir. The infant mortality rate in this area was 34.5 per thousand. This has gone down to 5.6 per thousand and do you call that malnutrition in a bad way ? Look at your neighbours. What is the position of other countries ? Sir, I must mention this. Our දස මහ යෝධයෝ, විසි මහ යෝධයෝ were brought up on *kola kenda* –

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Hear ! Hear !

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

– and *nivudu hal ! – [Interruption]* It was only a short time ago that you laughed at people who drank *kola kenda* and you were trying to make people more sick by making them eat more , and so forth to be healthy but we have overcome that. The Hon. Minister in charged of Indigenous Medicine has strongly advised people all over the country to grow their own herbs. In my own area, in every school, in every garden I get them to grow herbs. I wish the hon. Member for Kalawana comes and sees what is happening there when he comes to the courts next. I will serve him *kola kenda* so that he will not fall ill after that and his health is no impaired !

විජයපාල මෙන්ඩිස් මහතා (පේෂකර්මාන්ත ඇමතිතුමා)
(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)
(Mr. Wijayapala Mendis – Minister of Textile Industry)

Give him *wel penela !*

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

Wel penela is also necessary but *wel penela* is not so very good for him.

I do not think I will take more of your time, Sir. I am very grateful to the hon. Members for the complimentary remarks they made about the Ministry. I am also thankful to all the staff of my Ministry for having done very good work last year. We hope to do much better this year and we expect your co-operation.

" 49 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 10,40,78,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

49 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 10,40,78,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 104,078,000 for Head 49, Programme 1, Recurrent Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 49, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule

1 වන වැඩ සටහන.– සාමාන්‍ය පරිපාලනය, කාර්ය මණ්ඩල සේවා හා සැලසුම් ක්‍රියාත්මක කිරීම – මූලධන වියදම, රු. 1,18,50,000

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் திட்டஞ் செயற்படுத்தலும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 1,18,50,000

Programme 1 – General Administration, Staff Services and Plan Implementation – Capital Expenditure Rs. 11,850,000

" 49 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,18,50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

49 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,18,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 11,850,000 for Head 49, Programme 1, Capital Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 49, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule

2 වන වැඩ සටහන.– ප්‍රාදේශීය සංවර්ධනය – පුනරාවර්තන වියදම, රු.1,91,58,000

நிகழ்ச்சித் திட்டம் 2.— பிராந்திய அபிவிருத்தி — மீண்டுவருஞ் செலவு, ரூபா 1,91,58,000

Programme 2 – Regional Development – Recurrent Expenditure Rs. 19,158,000

" 49 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,91,58,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

49 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,91,58,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 19,158,000 for Head 49, Programme 2, Recurrent Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 49, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන වැඩ සටහන.– ප්‍රාදේශීය සංවර්ධනය – මූලධන වියදම, රු. 42,70,00,000

நிகழ்ச்சித் திட்டம் 2.— பிராந்திய அபிவிருத்தி — ஆக்கப்பொருட் செலவு, ரூபா 42,70,00,000

Programme 2 –Regional development – Capital Expenditure Rs.427,000,000

" 49 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 42,70,00,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

49 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 42,70,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு. 49, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 427,000,000 for Head 49 Programme 2, Capital Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 49, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule

3 වන වැඩ සටහන.– මිනිස්බල සැලසුම් හා දත්ත බැංකුව පරිපාලනය කිරීම – පුනරාවර්තන වියදම, රු. 21,45,000

நிகழ்ச்சித் திட்டம் 3.— ஆள்வலுத் திட்டமிடலும் தொழில் வசதி, தரவு வங்கியின் நிருவாகமும் — மீண்டுவருஞ் செலவு, ரூபா 21,45,000

Programme 3 – Man Power, Planning and Administration of the Employment Data Bank – Recurrent Expenditure Rs. 2,145,000

" 49 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 21,45,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

49 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

"தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 3, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 21,45,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 49, நிகழ்ச்சித் திட்டம் 3, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,145,000 for Head 49, Programme 3, Recurrent Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 49, Programme 3, Recurrent Expenditure, ordered to stand part of theSchedule

50 වන ශීර්ෂය.– ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– සංඛ්‍යානමය සහ වෙනත් සේවා – පුනරාවර්තන වියදම, රු. 4,03,70,000

தலைப்பு 50.— தொகை மதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— புள்ளி விபரமும் பிற சேவைகளும் — மீண்டுவருஞ் செலவு, ரூபா 4,03,70,000

HEAD 50 – DEPARTMENT OF CENSUS AND STATISTICS.

Programme 1 – Statistical and Other Services – Recurrent Expenditure Rs. 40,370,000.

" 50 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,03,70,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

50 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 50, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 4,03,70,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 50, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 40,370,000 for Head 50, Programme 1, Recurrent Expenditure, be inserted in the schedule", put, and agreed to.

Head 50, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule

1 වන වැඩ සටහන.– සංඛ්‍යානමය සහ වෙනත් සේවා – මූලධන වියදම, රු. 33,78,000

நிகழ்ச்சித் திட்டம் 1.— புள்ளி விபரமும் பிற சேவைகளும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 33,78,000

Programme 1 – Statistical and Other Services – Capital Expenditure Rs. 3,378,000

" 50 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 33,78,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

50 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 50, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 33,78,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 50, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,378,000 for Head 50, Programme 1, Capital Expenditure; be inserted in the schedule", put, and agreed to.

Head 50, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule

175 වන ශීර්ෂය.– රෙදි කර්මාන්ත අමාත්‍යවරයා

1 වන වැඩ සටහන.– රෙදි කර්මාන්ත නගා සිටුවීම හා සංවර්ධනය කිරීම – පුනරාවර්තන වියදම, රු. 50,50,000

தலைப்பு 175.—புடைவைக் கைத்தொழில்கள் அமைச்சர்

நிகழ்ச்சித் திட்டம் 1.— புடைவைக் கைத்தொழில்களின் அபிவிருத்தியும் மேம்பாடும் — மீண்டுவருஞ் செலவு, ரூபா 50,50,000

HEAD 175 – MINISTER OF TEXTILE INDUSTRIES

Programme 1 – Promotion and Development of Textile Industries – Recurrent Expenditure, Rs. 5,050,000

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

The Votes on Heads 175 and 176 will be taken at 6.00 p.m. The Hon. Minister wants to speak. The hon. Member for Matugama can move the cut formally and speak later.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

May I move the cut ? I have another meeting to go. So I will speak for ten or fifteen minutes and thereafter the Hon. Minister can speak.

විජයපාල මෙන්ඩිස් මහතා (රෙදිකර්මාන්ත ඇමතිතුමා)
(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)
(Mr. Wijayapala Mendis – Minister of Textile Industries)

I want to make a statement and state some facts and figures. Really, it would be more helpful to all Members.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

We will follow the old practice. The Hon. Minister can reply at the end. Otherwise, we do not know whether we are coming or going.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

You will know exactly what is happening if you allow me to make the statement.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

You will have a new dimension to speak about.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I can reply to you later also.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

May I move the cut formally and then speak for about ten or fifteen minutes ? I move,

"That the Programme be reduced by Rs. 10"

Sir, the Ministry of Textile Industries is really in crisis because of the fact that textiles are now being imported into this country legally. On the facade of legality textiles are being imported but everywhere the textiles have been imported illegally and they are a constant problem to the manufacturers here, Sir. I believe, Mr. Gnanam, one of the stalwarts of the United National Party and a supporter of the Government, made a statement saying that this the textile industries is going to finish off in this country. He is a person who is very much in the know, having a textile factory, who has long experience as a entreprener and has risen from right below. And it is his considered view that this Government's policy on the import of textiles is entirely wrong.

Sir, I want to say very clearly that as far as we the Sri Lanka Freedom Party, are concerned, we believe that you have allowed the open economy to destroy the industries that have been built up with great difficulty over a period of years. Particularly, after Mr. S. W. R. D. Bandaranaike became the Prime Minister there was an emphasis on the development of industries.

අ. හා. 2

The other day I read a statement made by no other person than Dr. Gamini Corea who has had a great deal of experience in dealing with developed countries, where he said that unless you are able to expand the base of the economy towards industrialization merely expanding agriculture is very strenuous for any economy. I think all of you agree with it. I admit that you have been able to improve the quality of textiles. We are not at all against the idea of getting technical know-how for the development of all industries, including the textile industry. Certainly, there has been very great improvement by bringing in some of these firms like Tootals. But you will also agree that they are not the complete answer. I have with me the magazine, 'India Today' which cites the example of the Reliance Group of Companies in India which started somewhere in the 1960s. Today it is one of the most modern yarn and fabric making companies in the whole of India and it is second only to Tatas in the total turnover but their profits are much more than Tatas. How did they come up to this position ? They beat "Bombay Dyeing" who are working here, and a number of other companies because they started to improve the machinery, getting more and more modern machinery and changing machinery every five years until they had some of the most modern machinery in the world. And they are expanding daily.

On the otherhand, with regard to our textile industries, even the one at Thulhiriya Textile Mill and so on the machinery is dated. When you have machinery that is dated it is difficult to compete in the world market because other countries are having the most modern developed machinery of extremely good quality. So this is a lesson we have to learn. Our textile industry has to get modern machinery, not merely the know-how, because even Tootals in England are in difficulties. Bombay Dyeing is in difficulties. You are bringing in people who are in difficulties to advise us to get out of a difficulty, which is not a very easy way. Certainly they have improved the quality but these are problems you have to face.

I want to state this. You have decided to close down the Wellawatte Weaving Mills, one of the oldest mills. I understand that there are a lot of constrictions and so on. When you close it down what are you going to do ? You promised us that you will put up a modern mill at Homagama. I want you to answer whether that true or not ? Are you going ahead with it ? I think you are not going ahead with it, as you have not got Cabinet sanction because of the amount of money that is necessary to develop a very modern mill ! So what have you done ? You have presided over the liquidation of one of the oldest mills in this country, which is not a very good thing. The Hon. Minister is a very nice person I must say, a very pleasant person to work with and talk to, but unfortunately, he has had to do this unpleasant task of trying to knock off one textile industry after another. Therefore, he must tell us what are his plans. If he is not going to have a new mill at Homagama, why is that so ? What is the policy of this government. Is it for the expansion of the textile industry or is it again for closing them down because the industry is faced with more and more competition ? The argument that many of the spokesmen for this government put forward is that if you produce item which is very expensive than its equivalent coming from outside, then you must close it down ! If that was the philosophy in Japan, Japan would never have come to what it is today. Japan had to deal with one of the most developed countries and they did it

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

by having a closed market. Take Korea for instance. Today the general feeling is that the Korean Hyundai cars are going to overtake the Japanese cars. The Japanese cars are now becoming more and more expensive. They are being taken by people who have much more money to spend. But the basic car, the Hyundai and Daewoo Group car is going to oust all other cars. Already in Canada alone they are selling more than 100,000 cars. Similarly your Government must formulate a policy. What is your policy ? Just because one of our products is not good, are we going to close down that industry ? Is that the policy of the Government ? Or are you going to give it protection and intelligent projection and see that more money and capital is invested and technology is brought in in order to develop that ? I will give an example of how it can be done.

I understand Sri Lanka is a small country, Sir, and we are sometimes at the mercy of these various wind blasts that are going on in the world. Take the example of the Suzuki in India, built under the name of "Maruti". They found that many of the items imported from Japan were so expensive and the Maruti car was having so many accidents in Delhi that when they had to replace the parts they found that it was impossible to do it. What did the Japanese do ? Finaly they said "We are going to produce items in India under licence as replacement parts which will be much cheaper, half the price of the Japanese parts". What I am trying to say is that you must have a flexible policy in dealing with the growth of the textile industry. Basically the textile industry is one which was the starter for all industrial development. It was so in Europe. England started with textiles and expanded into other spheres. It is so with India. It is so with Brazil. It is so with many countries. Textile was the basis of a starter industry from which industrialization took place all over. Egypt is also a point. Therefore, we want to now whether the textile industry is the starter or is it going to end up all developments as it appears to us ?

Now I understand that Tootals are also thinking of closing down. They want to go away ! You have given enough protection to them and enough money to them, but they say the climate here is not good. You will be placed in a very invidous position when these people pull out, and you will not have technology to go on with it. I would like very much a statement of government policy on this matter.

Take the question of yarn. You know a lot of small producers here use your yarn. Take the people who produce bandages. They have to come to Colombo to buy the yarn. The sale of yarn is not decentralized. Even people from far off places as Galle have to come to Colombo to buy the yarn. May not be very much of yarn because they are very small producer units. Why are you not decentralizing sales ? The price of yarn also has been increased. It is far more than the price prevailing in any other country. You are giving this yarn at inflated prices and you keep on incresing the prices and the small man is going to be thrown out of business !

There is a problem. The Health Department buys the bandages at a certain fixed price. Then the producer has to buy the yarn from you. If the yarn prices keep on rising and he wants to increase the price of bandages but the Health Department says, "Oh ! No, according to the Hon. Minister of Finance we are not having inflation. We are having negative inflation. So why increase the price of bandages ? Bandages must be bought at the same price," then the producer will find himself in a very great difficulty. So, I would like the Hon. Minister to look into this question and see why yarn prices are being kept up like this. Is it because of these multi-nationals or the foreign firms who have come here and have inflated the price of these things ? This is an item which I like the Hon. Minister to consider.

Then, Sir, in the matter of textile technology, I think, we have people who are Sri Lankans abroad who have reached the highest rungs of textile technology. It is time we brought some of those people here, and even if you had to pay them more they are Sri Lankans who will be able to add to our poor fund of knowledge in technology and improve the industry much more on a local basis rather than foreigners who, of course, will stay here for a short time and disappear. These are the few comments I would like to make on this matter.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Yes, the Hon. Minister can make his statement.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshmap Jayakody)

I think it is better to do this. Let him reply after all the hon. Members have spoken.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

You allow him to speak and then you can reply to whatever the Minister says.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Let the other hon. Members speak and then he can reply.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

No. I recognize the Hon. Minister.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

Normally, we have a speech from that side.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No. Then you cannot speak again. Sir, it is very unfair.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I will speak again. This is only a statement.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

If the Hon. Minister is to speak again then we should also have the right tspeak again. Yesterday it was like this and ultimately we did not have speakers here. The Chair stopped us, stopped me saying "Time is up." You can ask the hon. Member for Kotmale (Mr. Ananda Dassanayake) about it. Yesterday, the Debate collapsed. What happened yesterday can happen today. – (*Interruption*).

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! I am not on what happened yesterday. Just now the Hon. Minister made a request and the hon. Member for Matugama (Mr. Anil Moonesinghe) said that he will take ten or fifteen minutes and he took fifteen minutes. So the Minister can now start. this is the Committee Stage.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, it is very unfair.

අනුර බණ්ඩාරනායක මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(திரு. அனுர பண்டாரநாயக்க — எதிர்க்கட்சி முதல்வர்)
(Mr. Anura Bandaranaike – Leader of the Opposition)

How long will the Minister take ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

It may be about half an hour.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, Sir.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

We have done this earlier also. I will cut it short.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You cannot take half an hour. It is wrong.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

You are now wasting the time available.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

At the end we will be able to give them some time.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

You will be in an advantages position once you hear the Minister.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

With all due respect to the Minister, if the ministers start this practice and continue with this kind of thing where they make an opening statement running to about half an hour to forty-five minutes and then speak for another half an hour later –

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I may not take all that time.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

There are hon. Members on both sides of the House who wish to speak.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

I will give all the time you need.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I have always done it. if it is necessary even after 6 p.m. we might be able to help them by giving a little more time.

තේ, රබර්, පොල් ආදී සාම්ප්‍රදායික කෘෂිකාර්මික නිෂ්පාදන හැරුණු විට සංවිධානාත්මක පදනමක් මත මේ රටේ ක්‍රියාත්මක වන විශාලතම කර්මාන්ත අංශය පේෂ කර්මාන්තයයි.

Without these facts and figures you will not be able to reply. You do not know what is there. You will have to read it in Hansard if I table it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You should have given it to us as a document.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

මෙම අංශයේ සම්පූර්ණ දළ ආයෝජනය රුපියල් දශ ලක්ෂ 2,500ක් පමණ වෙනවා. මෙම අංශයෙන් පුද්ගලයන් 2,50,000කට පමණ රැකියාව සැපයෙනවා. ලංකාවේ කාර්මික නිෂ්පාදනයේ මුළු වටිනාකමින් සියයට 16ක් පමණ නිපදවන්නේ පේෂ කර්මාන්ත අංශයයි.—[බාධා කිරීම්]

– I have not given, take my word.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The whole thing will be carried in the papers tomorrow. That is going to be the statement.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

සාමාන්‍ය වශයෙන් අයවැය විවාදයකදී සලකා බලන්නේ පසුගිය වර්ෂයේ හා මෙම වර්ෂයේ මුල් කාලය තුළ ඒ ඒ අංශ ලබා ඇති ප්‍රගතියයි. එනමුත් එයට වඩා පුළුල් වශයෙන් කරුණ සලකා බැලීම කාරණය වඩාත් පැහැදිලි වීමට හේතු වනු ඇත. ඒ නිසා 1984 හා 1985 සැප්තැම්බර් මාසය දක්වා පේෂකර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වයත් නිෂ්පාදන දියුණුවත් අපනයන වර්ධනයක් සංඛ්‍යාලේඛන අනුව කෙටියෙන් පැහැදිලි කරන අතර, එම සංඛ්‍යාලේඛන මෙම රජය බලයට පත් වන අවස්ථාවේ තිබුණු තත්ත්වය හා සසඳා බැලීමට ද අදහස් කෙරේ.

අ. භා. 2.15

1984 හා 1985 මුල් නව මාසය තුළ වාර්තාගත දියුණුවක් මෙම අංශයෙන් සිදු වි ඇති බැව් අවධාරණයෙන් සඳහන් කළ යුතුයි. සැම අංශයකින්ම වාගේ, අතීතයෙහි සිදු නොවූ අන්දමේ නිෂ්පාදන දියුණුවක් අපනයන දියුණුවක් නිෂ්පාදන වටිනාකමේ වර්ධනයක් අලාභ ලබමින් තිබුණු පෙහෙකම්හල්වල ලාභදායී තත්ත්වයක් සේවකයින්ට ලැබුණු වේතනවල උසස් වීමත් පර්යේෂණ කටයුතුවල දියුණුවත් ලබා ගන්නට අපට හැකි විය.

නූල්කැටීම (කිලෝ ග්‍රෑම් දශ ලක්ෂවලින්)

1980	*1981*	*1982*	*1983*	*1984*	*1985* මුල් නව මාසය
6.49	8.25	9.86	8.51	8.69	8.6

විවීම (මීටර් දශ ලක්ෂවලින්)

1980	*1981*	*1982*	*1983*	*1984*	*1985* මුල් නව මාසය
90.0	97.9	114.9	112.9	119.2	96.7

නූල් කැටීම හා විවීම මේ වර්ෂය අවසන් වන විට කලින් සැම වර්ෂයකම නිෂ්පාදන ඉක්මවා යනු ඇත.

ඊළඟට, අපනයන දියුණුව. 1977 වර්ෂයේ දී ඇඟලුම් අපනයනයේ වටිනාකම රු. දශ ලක්ෂ 133ක් විය. ඒ අවධියේ රෙදි හෝ නූල් අපනයනයන් ගැන කථාවක්වත් තිබුණේ නැත. මෙම අපනයනක් 1984 දී එනම්, පසුගිය වර්ෂයේ රු. දශ ලක්ෂ 4,024ක් විය. මෙයට නිදහස් වෙළඳ කලාපයේ අපනයනයක් ද එකතු කළහොත්, මුළු වටිනාකම රු. දශ ලක්ෂ 7,535කි. මෙය දෙවැනි වන්නේ තේ අපනයනයට පමණකි. රබර් අපනයනයෙන් 1984 දී ලැබුණේ රු. දශ ලක්ෂ 3,301කි. පොල් අපනයනය කිරීමෙන් අපට උපයා ගන්නට හැකි වූයේ රු. දශ ලක්ෂ 2,118කි. මේ අනුව පේෂ කර්මාන්ත අංශයේ අපනයන වර්ධනය ගැන මීට වඩා කරුණු කීම අවශ්‍යයි නොසිතේ. 1985 හි මුළු අපනයන ප්‍රමාණය 1984 රේ ප්‍රමාණය ඉක්මවා යනු ඇත. තවද නූල් සුළු වශයෙන් 1981 සිට අපනයනය කෙරේ. එනිසා අපනයනය අතින් ද මේ කාලපරිච්ඡේදය වාර්තා ගත වේ.

ඊළඟට අපනයන සඳහා දේශීය රෙදි යොදා ගැනීම. අපගේ අපනයනයන් පිළිබඳව තවත් ඉතා වැදගත් දියුණුවක් ඇත. එනම්, මෙතෙක් කිසිදක සිදුනොවූ අන්දමට පූගොඩ, වේයන්ගොඩ හා තුල්හිරිය යන පෙහෙකම්හල්වලින් නිෂ්පාදනය වන රෙදි ඇඟළුම් අපනයනය සඳහා පසුගිය වර්ෂයේ සිට උපයෝගී කරගන්නට හැකි වී තිබීමයි. මෙම පෙහෙකම්හල්වලින් නිෂ්පාදනය වන රෙදිපිළිවල තත්ත්වයේ දියුණුව නිසා මෙය ඉටුකර ගන්නට හැකිවිය. 1984 වර්ෂයේ දී මෙම පෙහෙකම්හල් තුනෙන් රු. දශ ලක්ෂ 121ක් වටිනාකම ඇති රෙදි අපනයනය සඳහා උපයෝගී කරගන්නා ලදී. 1985 වර්ෂයේ මුල් මාස 9 තුළ රු. දශ ලක්ෂ 136ක් වටිනාකම ඇති රෙදි අපනයනය සඳහා උපයෝගී කර ගත්තෙමු. මෙම වර්ෂය අවසන් වනවිට මෙය රු. දශ ලක්ෂ 150 ඉක්මවා යනු ඇත. මෙයට කලින් මෙවැන්නක් මේ රටේ සිදුවූයේ කවදාදැයි නොදනිමු.

මෙයට අමතරව පෞද්ගලික අංශයේ ආයතන කිහිපයක් පසුගිය වර්ෂයේ සිට දේශීයව නිපදවන අමුරෙදි විශාල වශයෙන් පිටරට යැවීම ආරම්භ කොට තිබේ. එය ද තවතවත් දියුණු වෙමින් පවතින බව සඳහන් කරමු.

අපනයන දියුණුවට ඉදිරි කාලයේ බාධකත් තිබෙනවා. ඇඟළුම් අපනයන කර්මාන්තය පසුගිය වසර 6 තුළ සීඝ්‍ර ලෙස දියුණු වූ අන්දම කලින් සඳහන් කළ සංඛ්‍යාලේඛනවලින් පෙනුනි. 1977දී අපනයනය කරන ලද ඇඟළුම්වල මුළු වටිනාකම රු. දශ ලක්ෂ 132ක් වූ අතර, පසුගිය වසරේ අපනයනය නිදහස් වෙළඳ කලාපයේ අපනයනය ද ඇතුළුව රු. දශ ලක්ෂ 7,535ක් විය. එසේ අපනයනයක් සීඝ්‍ර ලෙස වර්ධනයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් රටවල් කිහිපයක දැනටමත් අප වෙත අපනයන සීමා පනවා ඇත. එකී රටවල් නම්, යුරෝපීය ආර්ථික හවුලේ රටවල් 10ත්, අමෙරිකා එක්සත් ජනපදයත්, කැනඩාව, ස්වීඩනය, නොර්වේ හා පින්ලන්තයත්ය. අමෙරිකාව විසින් පනවන ලද සීමා එන්ට එන්ටම පුළුල් වෙමින් පවතී. අලුත් භාණ්ඩ නිෂ්පාදනය කොට එය වර්ධනය වේගෙන එන විට එකී භාණ්ඩවලට සීමා පැනවේ. මෙසේ දියුණු රටවල් සීමා පැනවීම නිසා මෙතෙක් පැවති සීඝ්‍ර වර්ධනය ඉදිරියේදී අඩාලවීමට ඉඩ තිබේ. මේ අතර අමෙරිකාවේ ප්‍රබල වෘත්තීය සංගම් තුනක් විසින් අපගේ අපනයනයන්ට විරුද්ධව අමෙරිකාවේ වෙළඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද දිරි ගැන්වීමේ සහන නිෂ්ප්‍රභා කරන තීරුබදු පැනවීමේ පෙත්සමක් (Countervailing Duty Petition) නිසා අපගේ ඇඟළුම් අපනයනයන්ට 3.06%ක් හා රෙදිපිළි අපනයනයන්ට 5.0% අමතර තීරුබදු ඔවුන් විසින් පනවන ලදී. ඒ අතර දියුණුවන රටවලින් අමෙරිකාවට අපනයනය කරනු ලබන රෙදිපිළි හා ඇඟළුම් තවදුරටත් සීමා කිරීමේ අරමුණ ඇතිව අලුත් පනතක් අමෙරිකාවේ මන්ත්‍රණ සභා දෙකටම පසුගිය මාස දෙක තුළ ඉදිරිපත් කරන්නට යෙදුනි. Jenkins පනත නමින් හැඳින්වෙන මෙම පනතට මන්ත්‍රණ සභා දෙකේම අනුමැතිය ලැබුණ නමුත් එය අමෙරිකාවේ ජනාධිපතිතුමාගේ විටෝ ආඥාවකට යටත්වන බවට කරුණු පැහැදිලි වී තිබේ. මන්ත්‍රණ සභා දෙකේම තුනෙන් දෙකක ඡන්දයක් මෙම පනතට නොලැබුණු හෙයින්, එම විටෝ ආඥාව වෙනස් කිරීමට ඉඩ නොලැබෙනු ඇත. එනමුත් මෙවැනි පනතක් නිසා ලෝක වෙළෙඳපොළෙහි ඇතිවන වාතාවරණය අපට හිතකර නොවනු ඇත. තවද ගැට් ආයතනය යටතේ ක්‍රියාත්මක වන එම්. එෆ්. ඒ. – Multi Fibre Agreement – සම්මුතියේ කාලය ලබන වර්ෂයේ ජූනි මාසය වනවිට අවසන්වන අතර, අලුත් සම්මුතියක් සම්බන්ධයෙන් සියලුම රටවල් ඒකරාශී වී ලබන වසරේ සාකච්ඡා පැවැත්වීමට නියමිතය. එහි ප්‍රතිඵල කුමක් වේද යන්න මේ අවස්ථාවේ කිසිසේත් පැහැදිලි නැත. එහි දී එළඹෙනු ලබන සම්මුතියද කෙළින්ම අපගේ ඇඟළුම් අපනයනයන්ට බලපානු ඇත. මේ සියල්ල සලකා බලන කල, ඇඟළුම් කර්මාන්තය ලබා ඇති සීඝ්‍ර දියුණුව ඒ අයුරින්ම අනාගතයේදීත් පවත්වා ගැනීමට හැකි වේදැයි සැක සහිතය. දැනට ඇති තත්ත්වය අපට ආරක්ෂා කරගත හැකි නම් එය ද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මහතා]

දේශීය නිෂ්පාදනයේ වටිනාකම වර්ධනයවීම ගැන සඳහන් කරන්න කැමතියි. පේෂ කර්මාන්ත අංශයේ දේශීය නිෂ්පාදනවල වටිනාකම ගැන ද යමක් සඳහන් කළ යුතුයි. කර්මාන්ත වර්ගීකරණය අනුව රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන එක් වර්ගයක් ලෙස සංඛ්‍යා ලේඛන සඳහා ගණන් ගැනේ. 1984 මහා බැංකු වාර්තාවේ සඳහන් වන විස්තර අනුව, 1977 රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදනවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 698කි. 1984 වර්ෂයේ මෙම නිෂ්පාදනයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 7,565කි. උද්ධමනය සඳහා සුළු අඩු කිරීමක් කළත්, නිෂ්පාදන වටිනාකම අතිත් විශාල දියුණුවක් මෙම සංඛ්‍යාලේඛනවලින් පෙනේ. මේ ගැන ද මෙම සංඛ්‍යා ඉදිරිපත් කිරීමට වඩා යමක් කිවයුතු වන්නේ නැත. මෙය ද තවත් වාර්තාවකි.

රජයේ පෙහෙකම්හල් ලාභ ලැබීම ගැනද කිවයුතුයි. රජයට අයිති පෙහෙකම්හල් 1978 හා 1979 වර්ෂවල සෑම එකක්ම පාඩු ලබමින් තිබුණ බැව් මුළු රටම දන්නා කාරණයකි. මෙම තත්ත්වය වෙනස් කිරීමට නොයෙකුත් මාදිලියේ ක්‍රියාදමයන් අනුගමනය කරන්නට සිදු විය. ප්‍රධාන වශයෙන් මෙම පෙහෙකම්හල්වල කළමනාකරණය පේෂකර්ම ක්ෂේත්‍රයේ විශාල පළපුරුද්දක් ඇති සමාගම්වලට 1980 දී භාර දෙන්නට සිදු විය. කළමනාකරණය භාර දුන්නා මිස මෙම පෙහෙකම්හල් ඔවුන්ට පවරා දී නැත. මෙම පෙහෙකම්හල් බොහොමයක්ම දැන් ලාභ ලබන තත්ත්වයට පරිවර්තනය වී තිබේ. නිෂ්පාදනවල තත්ත්වයේ දියුණුව කලින් සඳහන් විය. 1981 දී රුපියල් දශ ලක්ෂ 26 ක් අලාභ ලැබූ තුල්හිරිය පෙහෙකම්හල පසුගිය වර්ෂයේ එනම්, 1984 රේ රුපියල් දශ ලක්ෂ 4.4 ක ශුද්ධ ලාභ ලැබිය. ඒ නිසාම පසුගිය වර්ෂයේ තුල්හිරිය පෙහෙකම්හලේ සේවකයන්ට ගෙවන ලද පාරිතෝෂික දීමනාව ද වැඩි කරන්නට අපට හැකි විය. 1985 මුල් නව මාසය අවසන් වන විට තුල්හිරිය පෙහෙකම්හලේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 8.4 කි. ඒ අනුව දැනටමත් පසුගිය වර්ෂයේ ලාභය දෙගුණ වී ඇත. වර්ෂය අවසන් වන විට මෙම ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 10.0 ඉක්මවනු ඇත.

1981 රුපියල් දශ ලක්ෂ 17 ක් අලාභ ලැබූ පූගොඩ පෙහෙකම්හල 1984 දී එම අලාභය රුපියල් දශ ලක්ෂ 5.8 කට අඩු කර ගන්ට සමත් වූහ. එනමුත් මේ වර්ෂයේ මුල් නව මාසය තුළ ඉතා විශාල පරිවර්තනයක් මෙම පෙහෙකම්හලේ ඇති වී තිබේ. මෙම නව මාසය තුළ ලබා ඇති ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 25.2 කි. වර්ෂය අවසන් වන විට මෙය රුපියල් දශ ලක්ෂ 30 දක්වා වැඩි වනු ඇතැයි විශ්වාස කරමු. මේ අනුව පූගොඩ සේවකයන්ට ද මේ වර්ෂය අවසානයේ පාරිතෝෂික දීමනාව වැඩි කිරීම නියත වශයෙන් සිදු වෙයි.

නූල් කැටීමට පමණක් සීමා වූ මත්තේගම පෙහෙකම්හල 1981 දී රු. දශ ලක්ෂ 4.4 ක් අලාභ ලැබීය. එනමුත් මේ වර්ෂයේ මුල් නව මාසය තුළ මෙම පෙහෙකම්හල ලබා ඇති ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 8.6 කි. ඒ අනුව එම කම්හලේ සේවකයන්ට ද පාරිතෝෂික දීමනාව මේ වර්ෂයේ වැඩි කිරීමට අදහස් කෙරේ.

මෙවැනි දියුණු තත්ත්වයක් මෙම පෙහෙකම්හල්වල තිබුණේ කවදද්දයි ඇසීමට මෙය කදිම අවස්ථාවකි.

තව එක කාරණයක් මතක් කරන්නට කැමතියි. මම විශේෂයෙන්ම මේ කාරණා සඳහන් කරන්නේ දේශීය වෙළඳ පොළට මේ රෙදි එවන අයට දැඩි දඬුවම් දෙනවාය කියා ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්ව නිසයි. ඒ රෙදි ගෙනෙන කුට වෙළඳුන්ට ඉස්සරවෙලා දඬුවම් කරන්නට මිනිස්සු ඉන්නවා. අන්න ඒ උදවියටත් දඬුවම් කරන්නය කියලයි මම ඉල්ලන්නේ. අන්න ඒ උදවිය දෙන අනුබලය නිසා තමයි මේ කුට වෙළඳුන්ගේ ජාවාරම් අද දෙගුණ වී තිබෙන්නේ. ඒගොල්ලන්ගේ අනුබලය නැත්නම් මේ ජාවාරම් කාරයන්ට කිසිවිටකත් මේ ජාවාරම් කරන්නට බැහැ. මේවාට උදව් කරන ඇතැම් උදවිය රේගුවේ ඉන්නවා. පිටකොටුවේ එක්තරා සාප්පුවකට ඇඳුම් ටිකක් ගන්නට මම ඊයේ ගියා. රේගුවේ නිලධාරීන් 15 දෙනක් පොරකකා ඇඳුම් ගන්නවා. ඒ උදවිය ඇඳුම් ටික ඔක්කොම "කොස්ට්" එකට ගන්න ඇවිල්ලාය කියා ඒ මුදලාලි මා සමඟ කිව්ව. "කොස්ට්" එකට ගන්න "ක්‍රිස්මස් ෂොපිං" ඇවිල්ලා. මේකයි, තත්ත්වය. කුට වෙළඳුන්ට මේවා ගෙන්වන්නට කවුද මේ අනුබලය දෙන්නේ ? මේවා ගෙන්වන්නටත් අනුබලය දෙනවා ; රේගුවෙන් පිට කරන්නටත් අනුබලය දෙනවා ; රීඑක්ස්පෝර්ට්" කරන්නටත් අනුබලය දෙනවා. මෙහෙමත් ජාවාරමක් ! මේ රටේ විදේශ විනිමය ඉතිරි වෙයි කියා මම හිතන්නේ නැහැ. විදේශ විනිමය කොහෙන් ඉතිරි වෙයිද කියන්නට දන්නේ නැහැ. අරහේ මුදල් ඇමතිතුමා විදේශ විනිමය හොයා ගන්නට රටවල් ගානේ යනවා. දේශීය නිෂ්පාදනය දියුණු කරන්නට තමුන්නාන්සේ උත්සාහ කරනවා. නමුත් මෙන්න වෙන වැඩ !

තව එක කාරණයක් මම මතක් කරන්නට කැමතියි. කරුණාකර මේවා හොයා බලන්න. "සන් කෝනල් ටෙක්ස්ටයිල් ලිමිටඩ්" එකට එක්ස්පෝට් ඕඩර් එකක් තිබුණා, සැන්කෝ සීකෝ කොම්පැණි ලිමිටඩ්, ඔසාකා. රෙදි යාර ලක්ෂ 20ක්. මම හිතන විධියට ලක්ෂ 30ක් නැත්නම් ලක්ෂ 20ක් වටිනා රෙදි තොගයක් සමාගමට තිබුණේ. මේ සමාගම කළ හැම ගනුදෙනුවක්ම ක්‍රමානුකූලව කර තිබුණා, එකක් හැර. මේ එක තමයි මම තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නේ. ඒ ඇණවුම එක්ස්පෝට් ඕඩර් එක—මම ටේබල් කරන්නම්. කරුණාකර සොයා බලන්න. මේ එක්ස්පෝට් ඕඩර් එකු අවාට පස්සේ මේ ගැන සැක හිතිලා රේගුවෙන් රෙදි ඕඩර් එක නැවැත්තුවුවා. නවත්වලා පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේදී එහි සභාපති, එහි වැඩ කරන සේවකයන්, ජෙනරල් මැනේජර්ලා, මේ සැන්කෝ සමාගමේ අධිපති, එහි මැනේජර් ආදී සියලු දෙනාම ගෙන්වා කස්ටම් එකේ ලොකු පරීක්ෂණයක් කළා. පුවත්පත්වලත් ඒ ගැන පළවුණා. මොකක්ද ඒ පරීක්ෂණයේදී හෙළි වුණේ ? ඒ පරීක්ෂණයේදී තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ලේකම් හේරත් මහත්මයා ස්ටේට්මන්ට් එකක් දීලා තිබෙනවා. මොකක්ද ? "රෙදි ආනයනය කිරීමේදී අමාත්‍යාංශය අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්ද කියා මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

දන්නේ නැහැ." මා ළඟ තිබෙනවා කඩදාසි. තමුන්නාන්සේට ඕනෑ නම් මට ඒවා ලබා දෙන්න පුළුවන්. "මම කරන්නේ මේ තනතුරේ මම එන්නට ඉස්සරවෙලා හිටපු එක්කෙනා කරපු දේමයි. ඒ නිසා මම නියෝග දෙන්නේ මගේ හිතු මතයේ මට වුවමනා විධියටයි."

එතකොට මේ විදේශීය සමාගමේ එක්ස්පෝර්ට් ඕඩර් එක උඩ දී තිබෙන ඕඩර් එක මොකක්ද ? ඒ අයිතිකාරයා ගෙන්නා සාක්ෂි විමසුවාම එයා කියා තිබෙන විධියට විදේශීය සමාගමේ මේ එක්ස්පෝට් ඕඩර් එක අත්සන් කර තිබෙන මනුෂ්‍යයාත් සිංහල මිනිහෙක්. එස්. බී. හේරත් කියල සිංහල මිනිහෙක්. ඒක දනුම් දීලාවත් නැහැ. කිසිම ලිපිගොනුවක් හරියාකාරව නැතිව තමයි පේෂකර්ම අමාත්‍යාංශය මේ එක්ස්පොට් ඕර් එකට බලපත්‍රය නිකුත් කළේ. ඒ සමාගමේ අයිතිකාරයා කියා තිබෙන විධියට මේ ඕඩර් එකේ අංකය ඊ 8395. නමුත් ඒ මනුස්සයාගේ කටඋත්තර ගන්න අවස්ථාවේදී ඒ ගොල්ලන් නිකුත් කරන්නේ ඕඩර් අංක 8200 කාණ්ඩයේ කොල. එයා කියනවා 8395 කොලය තව අවුරුද්දකින්වත් ඒගොල්ලන්ට නිකුත් කරන්න හම්බවෙන්නේ නැහැයි කියා. ඒක තවම ඒ සමාගම පාවිච්චි කරලත් නැහැ. නමුත් මෙහේ ලංකාවේ පාවිච්චි කරලා ඉවරයි. ඒ උදවිය තවම, පාවිච්චි කරන්නේ 8200 කාණ්ඩයේ කොල. ඒක එයාගේ කටඋත්තරයේ තිබෙනවා. මේක මගේ ඇස් දෙකින් දැක්කා. මට පුළුවන් ඒක ටේබල් කරන්න. ඒගොල්ලන්ට තිබෙන්නේ හොර බැංකු ගිණුමක්ය කියා පසුව පරීක්ෂණයේදී ඔප්පු වුණා. අනික් එක මේ එක්ස්පෝට් ඕඩර් එක අයිතිකාරයා එල්. සී. එක ඇරලත් නැහැයි කියා පරීක්ෂණයේදී ඔප්පු වෙලා තිබුණා. නමුත් හේරත් මහත්මයා — අතිරේක ලේකම්තුමා — කවුන්ටර් එකෙන්ම — Over the counter — රෙදි ටික ආනයනය කරන්න බලපත්‍රය නිකුත් කළා. මේ, ඇඟලුම් නිෂ්පාදනවලටය කියා ගෙනාව රෙදි. ඒ අංශයට කියා ගෙන්වා ගත්තේ සාරි සහ වෙනත් වටිනා රෙදි තොගයක්. දැන් ඒවා අත්අඩංගුවට ගෙන තිබෙනවා. කොම්පැණියට රුපියල් දහදහක් ගෙවන්න නියම වුණා. මේ රෙදි ටික රාජසන්තක කර දැන් ඒවා විකුණන්න රේගුවට අවසරය ලැබී තිබෙනවා. මෙන්න කරන වැඩ ! මේ විධියට ඒ අදාළ කොම්පැණියේවත් වෙනත් නීත්‍යානුකූල ලියකියවිලි නැතිව මෙපමණ වටිනා රෙදි තොගයක් ලංකාවට ගෙනෙන්නට මේ විධියේ ලේකම් මහත්මයෙක් — වගකිව යුතු නිලධාරී මහත්මයෙක් — එක පෑන් පාරෙන් අත්සන් කර දෙනවා නම් අපට හිතන්න වෙන්නේ මොකක්ද ? මේ ෆැක්ටරිය තියෙනවාද බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම දැන් ඒ ෆැක්ටරිය වහලා. ෆැක්ටරිය තිබෙනවා ; මැසිම තිබෙනවා. ඒ වුණත් දැන් ඒක වහලා. සේවකයෝ නැහැ. නමුත් කොහොම හරි හොරෙන් ලංකාවට රෙදි තොග එනවා. දැන් මට පුදුම මෙය ආපසු යවන්න "රී-එක්ස්පෝට් ඕඩර්" එකක් තොගත් එකයි. අර කලින් වතාවල වගේ හුහක් දෙනෙක් උත්සාහ කර තිබෙනවා මෙයට "රී-එක්ස්පෝට් ඕඩර්" එකක් ගන්න. නමුත් පුවත්පත්වලින් මෙය හෙළි වුණු නිසා එය අසාර්ථක වුණා. මෙන්න කරන වැඩ ! තමුන්නාන්සේ කරන රත්තරන් සේවයට, තමුන්නාන්සේලාගේ ව්‍යායාමයට කැළලක් ඇති වන්නේ මෙන්න මේ විධියේ දූෂිත ලේකම්වරුන්ගේ ක්‍රියාකලාපය නිසයි. මෙය සිදු වී තිබෙන්නේ ඒගොල්ලන්ට හිතුමතේ — අත්තනෝමතිකව — ක්‍රියා කරන්නට ඉඩ ලැබී තිබෙන නිසයි. කස්ටම් එකට දී තිබෙන එයාගේ "එස්ටේට්මන්ට්" එක කියෙව්වොත් තමුන්නාන්සේ පුදුම වෙයි. පේෂකර්ම අමාත්‍යාංශයේ කිසිම පාලනයක් නැහැ කියා ඒ "ස්ටේට්මන්ට්" එක අනුව කාට හෝ හිතන්න පුළුවන්.

රෙදි නිෂ්පාදනය අතින් මේ තරම් සංවර්ධනයක් ඇති වී තිබෙන යුගයක අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කථා කරමින් අපට උපදෙස් දුන්නේ එද ඒගොල්ලන්ගේ යුගයේ මේ රෙදි අංශයේ සංවර්ධනයක් ඇති වී තිබුණාය කියා හිතාගෙනයි. නමුත් අදින්න සරමක් ගන්න පෝලිමේ හිටියා. ඝන්ධාර මාක් සරම් ඇන්දේ. ලාම්පු තෙල් ගඳ ගහන රෙදි යාර දෙක ගන්න මේ රටේ කාන්තාවෝ වරු ගණන් පෝලිමේ තැප්පා. ඒවා අද අමතක වී මෙහෙම කරන්න ඕනෑය කියා අපට අද උපදෙස් දෙනවා. කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) එහෙමයි. මේ තැන්වල ඉඳගෙන දැන් අපට කන්න එන්නේ ඒගොල්ලන්ගේ නිලධාරීනුයි. අන්න ඒ නිසා අපේ ඇමතිවරුන් ආරක්ෂා කරගන්නයි අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඝන්ධාර මාක් සරම් පිළිබඳව විස්තර අපි දන්නේ නැහැ.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

I wish to table this document* so that the Hon. Minister can carry out the necessary investigations or if he wishes he can appoint a fact finding committee and I am prepared to come before that Committee.

මෙන්න මේ විධියට තමයි කටයුතු කරන්නේ. ඒ නිසා මෙය නවත්වන්න මේ ඇඟලුම් නිෂ්පාදනය සඳහා මේ රටට එන රෙදි අපේ දේශීය වෙළඳපොළට එන්නේ කොහොමද කියා රේගුවත් සමඟ සාකච්ඡා කර සොයා බලන්න. නීතිරීති දම්මාට මේවා හරි යන්නේ නැහැ. දඬුවම් කරනවා කියා පාර්ලිමේන්තුවේ කිව්වාට හරි යන්නේ නැහැ. එතැන කරන වැඩ දැක්කොත් එහෙම අපේ රට ඉතුරු වෙයිද කියා හිතෙනවා. ගරු සභාපතිතුමනි, මේ විධියේ අපරාධ, මේ විධියේ දූෂණ වෙන්නේ මේ නිලධාරීන්ගේ අනුමැතිය ඇතිව බව කියන එක මම වගකීමෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, ඒ සඳහා කොමිසමක් හෝ කොමිටියක් පත් කරන්නේ නම් ඕනෑම අවස්ථාවක ඊට පැමිණ සාක්ෂි දෙන්නට — කරුණු ඉදිරිපත් කරන්නට — මා බලාපොරොත්තු වන බවත් සඳහන් කරමින් මට කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මා වැඩි වේලාවක් කථා කරන්න අදහස් කරන්නේ නැහැ. එක ප්‍රධාන කාරණයකට පමණක් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රශ්නය මීට පෙරත්, ඒවාගේම අයවැය දෙවන වර කියවීමේ විවාදයේදීත්, කීප වතාවකත් සාකච්ඡා කර තිබෙනවා. විවෘත ආර්ථිකයක් ඇති කර, ඒ විවෘත ආර්ථිකය නිසා ඇති වී තිබෙන ඵල විපාක තමුන්නාන්සේලාට පාලනය කරගන්න බැරි වුණාම තමුන්නාන්සේලාට වළක්වන්න බැරි ක්‍රියාදාමයක තමුන්නාන්සේලා පැටලීලා තිබෙනවා. රෙදිපිළි අංශය පිළිබඳව මෙවර අයවැය යෝජනාවලින් මහදනමුත්තාගේ යෝජනාවක් කර තිබෙනවා.

රේගු වංචා මාර්ගයෙන් මේ රටට රෙදි ඇතුළුවීම වළක්වන්න බැරිය කියන පදනම මත ගරු මුදල් ඇමතිතුමා තීරුබදු සියයට සියයක් වැඩිකර රෙදි ආනයනය කරන්න ඕනෑම කෙනෙකුට ඉඩකඩ දෙනවාය කියා යෝජනා කර තිබෙනවා. ඒකේ තත්ත්වය කුමක්ද කියල අපි තවම දන්නේ නැහැ. මොකද, එක්වතාවක විවාදයේදී ඇමතිතුමා කියල තිබුණා, ඒ ගැන නැවත සලකා බලන්න කටයුතු කරනවා කියා. ඒක තමුන්නාන්සේගේ අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරල, පසුව ගන්න තීරණයක් වෙන්න ඕනෑ. නමුත් එහෙම කියල මේ තත්ත්වය නවත්වන්න පුළුවන්ද ? මේ වංචාවල් නවත්වන්න පුළුවන්ද ? මට ඉස්සෙල්ලා කතා කළ නියෝජ්‍ය ඇමතිතුමා කියපු වංචාවල් ගැන නොවෙයි මම කියන්නේ. රේගු වංචාවල් ගැන.

මෙරටට කන්ටේනර් එන්න තමුන්නාන්සේලා ඉඩකඩ දීලා, ඒව ඔක්කොම කරලා, ඊට පස්සේ රේගු වංචාවල් නවත්වන්න කරල තිබෙන පිළියම කිසිසේත් ඒකට සාර්ථක පිළියමක් වෙන්නේ නැහැ කියන එක බොහොම පැහැදිලියි. ඒකේ අනෙක් පැත්ත තමයි ඒකෙන් වෙන්නෙ. තමුන්නාන්සේලා කරල තිබෙන වැඩෙන් අද මොකක්ද වෙන්නේ ?

100%ක තීරුබදු ගෙවන්න සිද්ධ වෙනවට කරන්න තිබෙන්නේ එකම දෙයයි. රෙදි " අන්ඩර් - ඉන්වොයිස් " කරන්න. ඇණවුම් කරනකොට " අන්ඩර් - ඉන්වොයිස් " කළාම තීරුබදු ගෙවන්න වෙන්නේ ඒ ප්‍රකාශ කරපු මුදලට. ඊළඟට මේකෙන් ඇතිවන ප්‍රතිඵලය නම්, විවෘතව සුලු වශයෙන් බඩු ඇණවුම් කළාම, වංචා සහගතව ගෙනෙන රෙදි, විවෘතව වෙළඳාම් කිරීමට ඉඩකඩ සලසා දෙන එකයි. ඔය තිබෙන සාප්පු ඔක්කොම විවෘතව රෙදි ආනයනය කළායින් පස්සේ, වංචා සහගතව රෙදි ගෙන්වා තිබෙනවා නම්, ඒක විවෘතව කවුන්ටරයේ තබාගෙන වෙළඳාම් කරන්න ඉඩකඩ සලසා දෙන එකයි. ඒක නිසා තමුන්නාන්සේට මේ ක්‍රමයෙන් ගැලවෙන්න බැහැ. රෙදි මෙහාට ඇතුළුවන එකෙන් මේ රටේ දේශීය නිෂ්පාදන සම්පූර්ණයෙන් වළලා දැමීමට කටයුතු සිදුවීම තමුන්නාන්සේට වළක්වන්න බැහැ.

* පුස්තකාලයේ තබා ඇත.
நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
Placed in the Library.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේ දන්නවා අද මේ තත්ත්වයට තමුන්නාන්සේලාගේ සමස්ත ප්‍රතිපත්තියම වගකිව යුතුව තිබෙන බව. ඒක එක පැත්තකින් පෞද්ගලික අංශයට දිරිදීමක් ; අනෙක් පැත්තෙන් ආර්ථිකය විවෘත කිරීමක් පාලනයක් නැතිව ආයතයනය, අපනයනය ඕනෑ හැටියට කරන්න ඉඩදීමක් මිල පාලනයක් නැතිවීමක්. පාරිභෝගිකයා පිළිබඳව, විශේෂයෙන්ම අසරණ පාරිභෝගිකයා පිළිබඳව කිසිම තැකීමක් නැතිවීම මේ සියල්ලටම හේතුවය කියන එක තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ.

අද මොකක්ද ඇතිවෙලා තිබෙන තත්ත්වය ? අයවැය ලේඛනය දෙවන වර කියවීමේ විවාදය පටන් ගන්නවාත් එක්කම, කොළඹ තිබෙන සළුසලේ දිග පෝලිමක මිනිස්සු සිටියා, රෙදි ගන්න. ඒ ගොල්ලො බලාපොරොත්තු වුණා මිල වැඩිවීමක් වේවිය කියා. පස්සේ තමුන්නාන්සේලාට අපි ඒ කාරණය කියනකොට තමුන්නාන්සේලා ප්‍රකාශයක් කළා, රෙදිවල මිල වැඩිවීමක් වෙන්නේ නැත කියා ; මෙහි නිෂ්පාදනවල මිල වැඩිවීමක් වෙන්නේ නැත කියා. නමුත් අද සාප්පුවකට ගියොත්, විශේෂයෙන්ම පාසල් යන ළමයෙකුට රෙදි අරන්දීමට යන දෙමාපියන්ට වෙනදාට වඩා මිලට රෙදි ගන්න සිදු වී තිබෙනවා. ඒක අද කාටවත් නැත කියා කියන්න බැහැ. ඒක අද පාරිභෝගිකයාට මුහුණ පාන්නට වෙලා තිබෙන තත්ත්වයක්.

ඒ නිසා තමුන්නාන්සේලාට අඩු තරමින් යුතුකමක් තිබෙනවා, තමුන්නාන්සේලා අවුරුදු අටක් තිස්සේ අනුගමනය කරපු ප්‍රතිපත්තිය පිළිබඳව සමාලෝචනයක් කරන්න. මම කියන්නේ නැහැ, ඒක තමුන්නාන්සේගේ අමාත්‍යාංශයටම තනියම කරන්න පුළුවන්ය කියා. ඒක වැල නොකැඩී දිගටම තිබෙන ප්‍රශ්නයක්. මොකද, ඒක ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. මේ විවෘත ආර්ථික ක්‍රමය තමුන්නාන්සේලාට ගෙන යන්න බැහැ : ඒක උහුලන්න බැහැ. ලොකු වර්ධනයක් තිබෙනවාය කියන සිංගප්පූරුව අද බිඳ වැටෙන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අද හැම රටකටම, ඉතාමත්ම දියුණු රටවලටත්, තමන්ගේ රටවල නිෂ්පාදන ආරක්ෂා කර ගැනීමේ පියවර ගන්න සිද්ධ වී තිබෙනවා.

තමුන්නාන්සේලා එක්ක ඇමෙරිකාව සාකච්ඡා කරනවා, ලංකාවට තිබෙන ඇඟලුම් ඇණවුම් කෝටා එක අඩු කරන්න. තමුන්නාන්සේලා දන්නවා ඉතාම අඩු ආයෝජනයක් ඇතිව තමයි නිදහස් වෙළඳ කලාපයට ඇඳුම් නිෂ්පාදකයෝ ඇවිල්ලා තිබෙන්නේ කියා. ඒ අය මෙහේ සේවකයින්ට පඩි ගෙවන්නේ කීයද ? රුපියල් 16 ඉඳලා ඉහළට පඩි ගෙවනවා. ගැහැණු ළමයෙකුට රුපියල් 16 ඉඳලා ඉහළට. ඒ ගැහැණු ළමයින්ට බෝඩිමක ඉන්න ගියාම බොහෝ අවස්ථාවල ගන්න පඩිය මදි. බෝඩිමේ ඉඳලා, ප්‍රවාහන ගාස්තු ගෙවලා, මාසයකට සැරයක් ගමට යන්න ගියොත්, ඒ අයට ඒ පඩිය මදි. මහා ලොකු ආර්ථික කොමිෂන් එකෙත් එහෙමයි. එයින් පිට ඇති රෙදි කර්මාන්ත ශාලාවලත් එහෙමයි. ඒ නිසා මේක භයානක තත්ත්වයක්.

එක පැත්තකින් දේශීය නිෂ්පාදන වැඩි වෙලා නැහැ. අඩු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් පාරිභෝගිකයාට තමන්ට වුවමනා කරන රෙදි සැහෙන මිලකට ගන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. සංඛ්‍යාවක් වශයෙන් යම්කිසි පිරිසක් වැඩ කළත් අද ඇඳුම් නිෂ්පාදනයේදී ඒ ගොල්ලන්ට ගෙවන පඩිය දෙස බැලුවාම ඒ අය විශාල ලෙස සූරාකෑමකට ලක් වී සිටිනවා. මම හිතන්නෙ මේක වෙන සියලුම ක්ෂේත්‍රවලට වඩා ඉතාම අධික සූරා කෑමක්. අද මේ කර්මාන්තයේ යොදවා සිටින ගැහැණු ළමයින් සූරා කෑම ඉතාම භයානක ලෙස කෙරෙනවා. ඒ ගැන තමුන්නාන්සේ වග කියන්න ඕනෑ. මෙය මේ කර්මාන්තයෙහි ඇති වන ප්‍රශ්නයක්. ඒ නිසා තමුන්නාන්සේ මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

අද වැල්ලවත්තේ රෙදි මෝල වසා දමා තිබෙනවා. පසු ගිය අවුරුදු කීපය තුළම මම මේවා ගැන කථා කර තිබෙනවා. මම නැවත නැවතත් ඒවා ගැන මතක් කරන්න ඕනෑ නැහැ. තුල්හිරිය, පූගොඩ දිපු හැටි අපි දන්නවා. ඒවා පාලන ගිවිසුම් කිව්වට ඒ ගිවිසුම් අපට කවදාවත් දකින්න ලැබුණේ නැහැ. ඒවා පාලන ගිවිසුම්ද වෙන මොන විධියේ ගිවිසුම්ද කියලා රටේ කිසි කෙනකුට දකින්න ලැබී නැහැ. වැල්ලවත්තේ රෙදි මෝලේ මිනිස්සු මහ මගට බස්සලා, රෙදි මෝල වසා දමා ඒ වෙනුවෙන් අලුත් එකක් පිහිටුවනවාය කිව්වට ඒකත් එහෙමම අර පරණ පොරොන්දු සංඛ්‍යාවටම වැටුණා මිසක් වැඩ කෙරෙන කාලයක් පේන්න නැහැ.

අ. භා. 3.45

දැන් පෞද්ගලික අංශයත් වහන්න පටන්ගෙන තිබෙනවා. තමුන්නාන්සේලා හද වඩා ගත් පෞද්ගලික අංශයේ — නොයෙක් බදු සහන ආදිය දී ඇති කරගත් පෞද්ගලික අංශයේ — නිෂ්පාදන ආයතනත් වහන්න පටන්ගෙන තිබෙනවා. එහෙම නම් මොකද්ද මේකෙන් අපට දකින්න තිබෙන එළිය ? මම හිතන්නෙ මෙහෙම ගියොත් බරපතල තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. සමහර මන්ත්‍රීවරුන් කියන විධියට යන්ත්‍රෝපකරණ නවීකරණය කර මෙය කරන්න බැහැ. මේක යන්ත්‍රෝපකරණ නවීකරණ ප්‍රශ්නයක් නොවෙයි. ඉන්දියාවේ වාගේ අපට මෙහෙ දේශීය වෙළඳ පොළක් නැහැ. ඉන්දියාවෙ වගේ අපට මේ රටේ අවුරුදු 10කින් 12කින් කර්මාන්තයක් දියුණු කරගන්න බැහැ. එහෙම දේශීය වෙළඳ පොළක් අපට නැහැ. ඒ නිසා අපේ දේශීය නිෂ්පාදනය රාජ්‍ය අංශයට අරගෙන ඒවාගේ දුර්වලතා මකා වැඩ කෙළේ නැත්නම් අන්තිමට රෙදිත් නැහැ, කර්මාන්තත් නැහැ, රක්ෂාත් නැහැ, තමුන්නාන්සේලා කර ඇති දේකුත් නැහැ.

අන්න ඒ කාරණය තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්නයි මම මේ කාලය පාවිච්චි කළේ. මේ තත්ත්වය යටතේ තමුන්නාන්සේලා මේ ප්‍රතිපත්ති තවදුරටත් ගෙන ගියොත් තමුන්නාන්සේලා අපි ඔක්කොමත් එක්ක තවත් පාතාලයට ඇදගෙන යාමක් තමයි කරන්නේ කියා මතක් කළ යුතුයි.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා (නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)

(திரு. எம். டீ. பிரேமரத்ன — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)

(Mr. M. D. Premaratne – Deputy Minister of Parliamentary Affairs & Sports)

සභාපතිතුමනි, පේෂ කර්මාන්ත අමාත්‍යාංශය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මම අදහස් කරනවා. ඇත්ත වශයෙන්ම සාමාන්‍ය මහජනයාගේ මට්ටමින් අපි කල්පනා කළොත් පසුගිය වකවානුවට වඩා රෙදි පිළි අංශය පිළිබඳව යම් කිසි ප්‍රගතියක් අපේ රටේ ඇති වී තිබෙන බව අප පිළිගන්න ඕනෑ. ඒ වකවානුවේදී දේශීය නිෂ්පාදනවලට තැන දුන්නාය, දේශීය නිෂ්පාදන ආරක්ෂා කරන්න කටයුතු කළාය, දේශීය නිෂ්පාදන ආයතන රැකගන්න උත්සාහ කළාය කියා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා. ඒ මොන උත්සාහයක් ගත්තත් රටේ සාමාන්‍ය මහජනතාවගේ මට්ටමෙන් බැලුවොත් රෙදි පිළි අංශයෙන් මහජනයා ඇත්ත වශයෙන් බලවත් අසතුටක් තමයි ප්‍රකාශ කෙළේ. එහෙම නම් ඒ ගත් වෑයමෙන් කිසිම ප්‍රයෝජනයක් වී නැති බව අපි පිළිගන්න ඕනෑ.

අපේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එතුමාගේ කථාවේදි කිව්වා අපේ විවෘත ආර්ථිකය නිසා අපේ රටේ දේශීය නිෂ්පාදන දියුණු කරන්න, එහෙම නැත්නම් ඒවා ආරක්ෂා කරගන්න අපේ ආණ්ඩුව කිසිම වෑයමක් ගත්තෙ නැත, අපේ රජයේ ආයතනත්, ඒ වාගේම නොයෙක් තැන්වල පෞද්ගලික ස්ථානත් අපේ දේශීය නිෂ්පාදනවලට තැනක් දෙන්නෙ නැත කියා. නමුත් මම ඒක පිළිගන්නෙ නැහැ. එහෙම වෙනවානම් ඒක වැරදිය කියා අපි කියනවා. දේශීය නිෂ්පාදනවලට අපි පුළුවන් තරම් තැන දෙන්න ඕනෑ. පෞද්ගලික ස්ථාන පිළිබඳව අපට පාලනයක් කරන්න බැහැ. ඒක තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති.

එතුමා කිව්වා එතුමන්ලාගේ පාලන යුගයේදී දේශීය නිෂ්පාදනවලට සම්පූර්ණයෙන්ම තැන දුන්නාය, ඒවා ආරක්ෂා කළාය කියා. මම ඒක පිළිගන්නෙ නැහැ. මම දන්නවා නොබැඳි ජාතීන්ගේ සම්මන්ත්‍රණය පැවැත්වුණු වකවානුවේ පිටරටින් කෝටි ගණනක රෙදි ගෙනා බව.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැහැ. නැහැ.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

මොකද නැත්තෙ ? තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. ශ්‍රාවස්ති මන්දිරය එද ඒ සමුළුවේ ආණ්ඩුවේ නේවාසික ස්ථානයක් හැටියට පරිවර්තනය කර තිබුණා. ඒ වාගේම සමිට් ෆ්ලැට්ස්වලත් ඒ අයට නවතින්න සූදානම් කර තිබුණා. ඒ ස්ථානවල පාවිච්චි කළ සියලුම රෙදි, ඇඳ ඇතිරිලි, කොට්ට මෙට්ටවලට පාවිච්චි කළ රෙදි —

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

නැහැ, නැහැ, කවදාවත් ගෙන්නෙව්වෙ නැහැ. ඒ තිබුණෙ වේයන්ගොඩ හැදුව රෙදි.

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

තමුන්නාන්සේ නැහැයි කියනවා. තමුන්නාන්සේ අපට චෝදනා කළා. ඒ නිසයි මම මේවා මතක් කර දෙන්නෙ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඒ කාලයේ හෝටල්වලත් තිබුණෙ ලංකාවෙ රෙදි.

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

හෝටල්වල නොවෙයි, තමුන්නාන්සේලාවත් ලංකාවේ රෙදි ඇන්දෙ නැහැ. තමුන්නාන්සේ එය පිළිගන්න ඕනෑ. තමුන්නාන්සේ දූත් පුද්ගලික ආයතනවල පාවිච්චි කරන රෙදි ගැන මතක් කළා. තමුන්නාන්සේ නවලෝක ආරෝග්‍යශාලාවට ගිය අවස්ථාවේදී එතැන තිබුණ බෙඩ් ෂීට්ස් ගැන කථා කළා. ඒවා අපට පාලනය කරන්න බැහැ. එය පෞද්ගලික ආයතනයක්. තමුන්නාන්සේ කිව්වා තමුන්නාන්සේගේ රජය කාලයේදී දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තු සංස්ථා සියල්ලම දේශීය නිෂ්පාදන පාවිච්චි කළ බව. අන්න ඒ තර්කය ගැනයි මම මේ කරුණු ඉදිරිපත් කරන්නෙ. ඒ නොබැඳි ජාතීන්ගේ සම්මේලනය පැවති අවස්ථාවලදී තමුන්නාන්සේලා කෝටි ගණනක රෙදි පිටරටින් ගෙන්නුවා. එද මොකක්ද සිද්ධ වුණේ ? ලංකාවේ නිෂ්පාදන තිබුණා. නමුත් ඒවා පාවිච්චි කළාද ? නැහැ. තමුන්නාන්සේලා ඒවා පාවිච්චි කළේ නැහැ. ලංකාවේ රෙදි වියන මධ්‍යස්ථාන තිබුණා. නමුත් මොනවාද සිද්ධ වුණේ ? ඒ සෑම ස්ථානයකම වාගේ නිෂ්පාදනය කළ රෙදි මහජනයා ප්‍රයෝජනයට ගත්තෙ නැහැ. නිෂ්පාදන කළ ලක්ෂ කණන් වටිනා රෙදි ගොඩගැහිල තිබුණා. දිරාපත්වෙමින් තිබුණා. සමහර අවස්ථාවලදී නොයෙක් උවදුරු ඇති වුණ අවස්ථවලදී සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ඒවා අරගෙන බෙද දෙනු ලැබුවා. එද නිෂ්පාදනය කළ රෙදි හොඳ තත්ත්වයෙන් තිබුණෙ නැහැ. හොඳ තත්ත්වයේ රෙදි නිෂ්පාදනය කරන්න කවුරුවත් උනන්දු වුණේ නැහැ. උත්සාහයක් කළේ නැහැ. අපි පාරිභෝගිකයාට යම් දෙයක් බලෙන් දුන්නොත් ඔවුන්ට ඒවා ගන්ට සිදු වෙනවා. තිබෙන්නෙත් එකම වර්ගයක් නිසා එය ගන්නම සිදු වෙනවා. ඒ කාලයේ තිබුණේ අන්න එවැනි තත්තවයකුයි. කල්පනා කර බලන්න, එද සමුපකාර කඩයකට ගියාම දකින්න ලැබුණ දේ. මම මේ තමුන්නාන්සේලාට දෙස් කියනවා නොවෙයි. අපට එහෙම කරන්න බැහැ. අපි අනුගමනය කරන වැඩපිළිවෙළ අනුව අපට එහෙම කරන්න බැහැ. තමන්ගේ අතේ තිබෙන මුදලට අනුව, තමන් උපයා ගන්නා මුදලට අනුව තමන්ට ඕනෑ කරන බඩුවක් තෝරාගන්න පාරිභෝගිකයාට නිදහස තියෙන්න ඕනෑ. අපි අද දවල්ට කන්නෙ මොනවාද, අපි රෑට කන්නෙ මොනවාද, අපි අඳින්නෙ මොනවාද, අපි අඳින්නෙ මොන පාට රෙද්දක්ද, මොන වර්ගයේ රෙද්දක්ද කියා තීරණය කිරීමේ අයිතිය සහ නිදහස පාරිභෝගියාට තිබෙන්න ඕනෑ.

සමහර විට අපේ ක්‍රමයේ වැරදි තියෙන්න පුළුවන්. අපි ඒවා හරිගස්සන්න ඕනෑ. නමුත් පාරිභෝගිකයාට නිදහස තියෙන්න ඕනෑ. තමන් කරන රැකියාව මොකක්ද, තමන් කා සමගද විවාහ වෙන්නෙ, තමන් අද යන්නෙ මොකකින්ද, බස් එකෙන්ද, කාර් එකකින්ද, බයිසිකලයෙන්ද, ඇඳුම මොකක්ද, මොන වර්ගයේ රෙද්දක්ද ඔය ආදී දේවල් සම්බන්ධයෙන් තීරණය කිරීමේ අයිතිය මහජනතාවට තියෙන්න ඕනෑ. එහෙම නැතිව, "තුඹලා අඳින්න ඕනෑ මේ රෙද්ද, අද මේ පාට අඳින් ඕනෑ, රෙදි මෙපමණයි දෙන්නෙ, කන්න ඕනෑ මේ දේ" කියල ආණ්ඩුව තීරණය කරන්න සූදානම් වුණොත් එතැන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇතිවෙන්නෙ නැහැ. අපි ඒ ක්‍රමය අනුමත කරන්නෙ නැහැ. අපි ඒ ක්‍රමය වෙනස් කළේ ඒ නිසයි. තමුන්නාන්සේලාගේ යුගයේ මොකක්ද සිද්ධ වුණේ ? කල්පනා කර බලන්න. දෙපැත්තම කල්පනා කර බලන්න. මේ ක්‍රමයෙත් වැරදි ඇති. අපි ඒවා හරිගස්සන්න ඕනෑ. එද මොනවාද සිද්ධ වුණේ ? සමුපකාර කඩයකට රෙදි කෑල්ලක් ගන්න ගියාම ඇති වුණ තත්ත්වය මොකක්ද ? එකම පාට, එකම වර්ගයේ, එකම ඩිසයින් එකේ රෙදි තමයි තිබුණේ. මුළු ගමේම ඉන්න අය අඳින්නෙ එකම වර්ගයේ එකම ජාතියේ රෙදි තමයි. අවුරුදු දවස්වලදී තමුන්නාන්සේලාට පෙනුනෙ නැද්ද ? 1970 කාලයේදී තිබුණ තත්ත්වය තමයි ඒ. කොල්ලටයි, බල්ලටයි, යට ගවුමටයි ඔක්කොටම තිබුණෙ එකම රෙද්ද.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

බල්ලොත් රෙදි අඳිනවාද ?

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

බල්ලන්ටත් අඳින්න සිද්ධ වෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

බල්ලො රෙදි අඳින කාලෙ.

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

බල්ලන්ටත් අඳින්න බැරි රෙදි තමුන්නාන්සේලා දුන්නෙ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඔය කියන බල්ලන් ගැන අපි නම් දන්නෙ නැහැ.

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

ඒ නිසයි මම තමුන්නාන්සේට මතක් කළේ. ඒ රෙදි බල්ලො ඇන්දත් බැල්ලියක් නම් අඳින්නෙ නැහැ. මම තමුන්නාන්සේට මතක් කරන්නේ මෙයයි. අපි ඒ යුගය වෙනස් කළා. තමුන්නාන්සේලා අද ඉදිරිපත් කරන තර්කය අහන විට මහජනයා තමුන්නාන්සේලාට හිනා වේවි. අපේ ක්‍රමයේ අඩුපාඩුකම් තිබෙන්නෙ පුළුවන්. නමුත් මහජනයා එය පිළිගන්නවා. එද සමුපකාර කඩයකට ගොස් රෙදි කෑල්ලක් ගන්නට මොන තරම් අපහසුකම් තිබුණාද ? මොන තරම් අමාරුවක් තිබුණද ? කොපමණද හම්බ වුණේ ? මොන විධියටද අඳින්න සිදු වුණේ ? අහිංසක ගැහැනු ළමයකුට පාසල් යන ශිෂ්‍යයකුට රෙදි කෑල්ලක් ගන්න පුළුවන් වුණාද ? රෙදි යාර කීයද දුන්නේ ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මිල ඒ කාලයෙ කීයද ? අද කීයද ?

එම්. ඩී ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

අද ඕනෑ තරම් තියෙනවනේ සල්ලි තියෙනවනම් ගන්න. [බාධා කිරීම්] ඔය ප්‍රතිපත්තිය තමයි තමුන්නාන්සේලා හැමදම කියන්නේ. නමුත් අපේ ප්‍රතිපත්තිය මේකයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අද මිනිස්සු පතුල හූරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

මම එක ප්‍රශ්නයක් අහන්නම්. සල්ලි අතේ තිබුණත් ඒ තිබෙන සල්ලිවලට තමුන්නාන්සේට ගන්න බඩු නැත්නම් වැඩක් තියෙනවද ? මම අහන ප්‍රශ්නය ඒකයි. [බාධා කිරීම්] මම අහන ප්‍රශ්නයට උත්තර දෙන්න. අපේ අතේ තිබෙන සල්ලිවලට වුවමනා කරන බඩුවක් ගන්න නැත්නම් ඒ සල්ලිවලින් ඇති ප්‍රයෝජනය මොකක්ද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

බඩු තිබුණට සල්ලි නැත්නම් මොනව කරන්නද ?

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

මම අහන ප්‍රශ්නය එතුමාට තේරෙන්නේ නැහැ. එද මොකක්ද සිදු වුණේ ? අතේ සල්ලිත් නැහැ. ගන්න බඩුත් නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

බඩු තියෙනව. ගන්න සල්ලි නැහැ. මිනිස්සු හුල්ල හුල්ල ඉන්නවා.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

මොකද නැත්තේ ? එහෙම නම් මේ බඩු විකිණෙන්නේ නැද්ද ? තමුන්නාන්සේලාගේ ගමකට යන්න. සාමාන්‍ය කඩයකට යන්න. අද මොනවද නැත්තෙ කියල බලන්න. විකිණෙන්නේ නැත්නම් ඒ මිනිස්සු පිස්සෝද ඒ බඩු ගෙනත් තියා ගන්න. [බාධා කිරීම්] එහෙම නම් ඒ මිනිස්සු අංගොඩ අරින්න ඕනැ. තමුන්නාන්සේගෙ අත්තනගල්ල ආසනයෙ තිට්ටඹුව හන්දියට යන්න. එද තිට්ටඹුවෙ හන්දියේ මැස්සො ඇහිරී ඇහිරී තිබුණේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

එහෙ මැස්සො නැහැ.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

එද බඩු නැහැ ගන්න. බක්කි හිස් වෙලා. මුදලාලි හුල්ල හුල්ල ඉන්නවා. එද කොළඹ තිබුණු බඩු අද තමුන්නාන්සේගේ ආසනයේ තිට්ටඹුව හන්දියේ තියෙනව. [බාධා කිරීම්] අද ඒ මිනිසුන්ට වුවමනාවක් නැහැ බඩු ගන්න කොළඹ එන්න. කොළඹට යන්න මොන විධියේ රෙදි කන්දරාවක් තිබෙනවාද බලන්න.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

සල්ලි කොහෙන්ද ඒවා ගන්න ?

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

සල්ලි නැත්නම් ඒවා විකුණන්න තෙමෙයිද ගේන්නේ ? විකිණෙන්නේ නැත්නම් විකුණන්න බැරි නම් ඒ මිනිස්සු ඒවා ඔය ටවුන්වලට ගේන්නෙ මොනවටද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඒව හොරෙන් ගෙනත් තියෙන්නේ ; ඒකයි.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

ඔව කියන්න කියන්න තමුන්නාන්සේලා පාරාජික වෙනවා. ඔව කියන්න කියන්න තමුන්නාන්සේලාට තිබෙන තැනත් නැති වෙනවා. මම කතා කරන්නේ ඒක නොවෙයි. මේ වැඩ පිළිවෙළ උඩ අපේ රජය ක්‍රියාත්මක කළේ [බාධා කිරීම්] මහජනයාට විශේෂයෙන්ම අවශ්‍ය වී තිබෙන [බාධා කිරීම්]

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

He is an excellent trader.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

I am not a trader, Sir.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, he is owning one of the biggest stores.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා
(திரு. எம். டீ. பிரேமரத்ன)
(Mr. M. D. Premaratne)

No, Sir. The hon. Member is an excellent trader.

මේ වැඩ පිළිවෙළ අද මහජනයා පිළිගෙන තිබෙන බවයි මම මතක් කරන්නේ. එද තිබුණු තත්ත්වය අද වෙනස් වී තිබෙනව. නමුත් අප දන්නවා මේ වැඩ පිළිවෙළ තුළින් කූට ව්‍යාපාරිකයන් අයුතු ප්‍රයෝජන ගන්න ලැස්ති වී සිටින බව.

එද පිටරට ගිහින් ආ මනුස්සයෙක් කාට හෝ රෙදි යාරයක් ගෙනත් දුන්නා නම් ඒක හරියට දිව්‍ය ලෝකයෙන් බඩුවක් ගෙනත් දුන්නා වාගේ මිනිස්සු හිතා ගත්තේ. නමුත් ඒ තත්ත්වය අද වෙනස් වී තිබෙනවා. මහජනයාට වුවමනා කරන විධියේ රෙදි කෑල්ලක් ගන්න අවස්ථාව ලැබී තිබෙනවා. ඒ සමගම කූට ව්‍යාපාර නවත්වන්න ගරු ඇමතිතුමා සහ රජය කල්පනා කළා පිටරටින් ගේන නිෂ්පාදනවලට රෙදිවලට සීයයට සීයයක බද්දක් දන්න. එය ක්‍රියාත්මක කර බලනවා කරන්න පුළුවන්ද කියා. එහි ප්‍රතිඵල අයහපත් නම් එහි වෙනසක් කිරීම ගැන ඇමතිතුමා කල්පනා කරයි. නමුත් අප බලාපොරොත්තු වන්නේ මේ වැඩ පිළිවෙළ තුළින් මේ රටේ නිෂ්පාදන ආරක්ෂා කරගන්නයි. එසේ ආරක්ෂා කර ගැනීම සඳහායි ඒ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. නමුත් මම මතක් කරන්න ඕනැ. ඇත්ත වශයෙන්ම සමහර අවස්ථාවලදී සමහර අය මෙයින් අයුතු ප්‍රයෝජන ගන්නට ඉඩ තිබෙන බව. දැන් අවුරුදු උත්සව නත්තල් උත්සව සමය එනවා. අපේ ප්‍රදේශවල පොළවල් තිබෙනවා. ඒවායේ විශාල වශයෙන් රෙදි තිබෙනවා. නමුත් මේ බද්ද නිසා අද සමහර වෙළෙන්දන් අහිංසක ජනතාව නොමග අරින්න උත්සාහ කරගෙන යනවා. අන්න එම නිසායි මම විශේෂයෙන් තමුන්නාන්සේට මතක් කරන්නෙ එයින් පාරිභෝගිකයා ආරක්ෂා කර ගත යුතු බව. ගමේ පොළට රෙදි කෑල්ලක් ගන්න යන මනුස්සයා දන්නෙ නැහැ. මේක පිටරටින් ගෙනා රෙද්දක්ද කියා ; ආනයනය කළ රෙද්දක්ද කියා. ඒ නිසා මේ පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක්—අමාත්‍යාංශයෙන් හෝ වෙනත් දෙපාර්තමේන්තුවක් මගින් හෝ මිළ පාලන වැඩ පිළිවෙළක්—ඇති කොට මේ විකුණන රෙදි ගැන හොයා බලන්න. මෙය අද අහිංසක ජනතාවට විශාල පටලැවිල්ලක් වී තිබෙනවා. පිටරටින් ගෙන්වන රෙදිවලට සීයයට 100 බද්දක් දමා තිබෙනවාය කියමින්, දැනට ලංකාවේ නිපදවන ඉතාමත් හොඳ රෙදි පවා පිටරට රෙදි හැටියට හඳුන්වමින් ඇතැම් වෙළෙඳ ව්‍යාපාරිකයන් මේ රටේ රෙදිත් වැඩි මිලට විකුණා අයුතු ලාභ ලබා ගන්නවා. ඒ නිසා ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඩී. ප්‍රේමරත්න මහතා]

අ. භා. 4.00

ඊළඟට, තවත් වැදගත් කාරණයක් මතක්කරන්න කැමතියි. අද මේ රටේ නොයෙක් ස්ථානවල පිහිටුවා තිබෙනවා, ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තශාලා. යම් යම් උදවිය බලපත්‍ර ලබාගෙන තිබෙනවා ඇඟලුම් කර්මාන්තශාලා පිහිටුවන්න යන්ත්‍රෝපකරණ ගෙන්වා ගන්නත්. නමුත් එසේ බලපත්‍ර ලබාගත් ඇතැම් තැන්වල ඒ සඳහා අවශ්‍ය කිසිම දෙයක් නැහැ. ඒ කර්මාන්තශාලා තිබෙන්නේ නමින් පමණයි. සමහරවිට මැෂින් දෙක - තුනක් සවිකරගෙන, නොයෙක් පිරිස් සම්බන්ධ කරගෙන, සංවිධානාත්මක වශයෙන් මහා පරිමාණයෙන් වංචා කෙරෙනවා. ඇඟළුම් කර්මාන්තයටය කියමින් ලබාගන්නා බලපත්‍ර මඟින් පිටරටින් රෙදි ගෙන්වාගෙන ඒ සම්පූර්ණ රෙදි ප්‍රමාණයම හොර වෙළෙඳ පොළට යවන්න සමහර අය ක්‍රියා කරනවා. මම දන්නේ නැහැ, මේ පනවා තිබෙන බද්ද තුළින් ඒ සම්බන්ධයෙන් යම්කිසි සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

මේ අමාත්‍යාංශය පසුගිය අවුරුදු කීපය තුළ ඉතාමත් සාර්ථක වැඩ කොටසක් කළා. පසුගිය ආණ්ඩු කාලයේ මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද ? තුල්හිරිය, පූගොඩ ආදී වශයෙන් නොයෙකුත් තැන්වල කර්මාන්තශාලා තිබුණා. නොයෙක් විධියේ පේෂකර්ම මධ්‍යස්ථාන මේ රටේ තිබුණා. නමුත් මේ රටේ ජනතාවට එයින් කිසිම ප්‍රයෝජනයක් සිදු වුණේ නැහැ. තමන් උපයා ගත් මුදලට, තමන්ගේ හිතට හරියන විධියට, තමන්ගේ රුචිකත්වයට ගැළපෙන විධියට රෙදි කැල්ලක් තෝරා ගන්න ඒ කාලයේ මේ රටේ ජනතාවට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඔවුන්ට ගන්න පුළුවන්කම තිබුණේ, සමූපකාරයෙන් හෝ වෙනත් කඩයකින් හෝ දෙන රෙද්ද තමයි. සමූපකාර කඩයට සාරි 6ක් ලැබුණා නම් ඒ සාරි 6 ගන්න ගමේ තවත් 500ක් නැත්නම් 1,000ක් සමග පොරකන්න, රෑ පාන්දර දෙකේ - තුනේ ඉඳලා පෝළිමේ ඉන්න සිදු වුණු යුගයක් තමයි, ඒ කාලයේ තිබුණේ. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ජනතාවට තමන් කැමැති විධියේ රෙදි ගන්න පුළුවන් තත්ත්වයක් මේ ඇමතිතුමා ඇතිකර දුන්නා. මේ ආණ්ඩුවේ හොඳ නමත් ආරක්ෂා කරගෙන් එතුමා ඉතා සාර්ථකව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන ආවා. නමුත් දැනට අවුරුද්දක පමණ කාලයක ඉඳලා ඒ තත්ත්වය ටිකක් වෙනස් වෙමින්, පිරිහෙමින් පවතිනවා. ඒ නිසා දැන් ඇමතිතුමාට සිදු වී තිබෙනවා, මුලදී රැකගෙන ආ හොඳ නම ආරක්ෂා කර ගැනීම සඳහා දැඩි සටනක් කරන්න.

ඒ නිසා ඒ සඳහා ගන්නා වැඩ පිළිවෙළ සාර්ථකව ඉටු වෙනවාද කියන එක ගැනත් ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් අවධානයෙන් ඉන්න ඕනෑ. විශේෂයෙන් වර්තමානයේ ඇති කරන ලද මේ සියයට 100 බද්ද නිසා ඇති වී තිබෙන මහජන ආන්දෝලනය ගැන ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

මෛත්‍රීපාල සේනානායක මහතා (මැදවච්චිය)
(திரு. மைத்திரிபால சேனநாயக்க —மதவாச்சி)
(Mr. Maithripala Senanayeke–Medawachchiya)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සළකා බැලීම ආරම්භ වූ අවස්ථාවේදී ගරු ඇමතිතුමා ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරමින් ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය අනුව අද ලංකාවේ රෙදි නිෂ්පාදනය ස්වයම්පෝෂිත තත්ත්වයකට ඇවිත් තිබෙනවා. නමුත් මෑතකදී ඇති කළ සියයට 100 ආනයන බද්ද නිසා මේ රටේ ජනතාවට ලොකු බරක් පැටවී තිබෙනවා ; පැටවීගෙන යනවා. කලින් කථා කළ කලවානේ ගරු මන්ත්‍රීතුමාත් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ඒ ගැන සඳහන් කළා. දැනට මේ රටේ නිෂ්පාදනය කෙරෙන හොඳ රෙදිවලටත්, හොරෙන් ගෙන්වන රෙදිවලටත් ඒ සියයට 100 බදු බර එකතු කරලයි, ව්‍යාපාරිකයන් ඒ රෙදින් විකුණන්නේ කියන එක මේ අවස්ථාවේදී නොකියාම බැහැ.

ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය රෙදි ඕ.ජී.එල්. ක්‍රමයට ගෙන්වා ගැනීමට ඒ අයට අවසර දී තිබෙන නිසා, ඒ මාර්ගයෙන් දැන් හොර රෙදි ජාවාරමකුත් මේ රට තුළ කෙරීගෙන යනවාය කියන එකත් රහසක් නොවෙයි. මේ ළඟදී රේගුවට අහු වුණා, ඒ විධියේ රෙදි - පිළි තොගයක්. එය රුපියල් ලක්ෂ සංඛ්‍යාත වටිනාකමක් ඇති රෙදි තොගයක්. ඇඟළුම් කර්මාන්තයේ ව්‍යාජයෙන් ඒ කර්මාන්ත හිමියන් කොයිතරම් දුරට ජාවාරම් කටයුතු කරනවාද කියන එකත් කාටත් දැන් පැහැදිලි වී තිබෙනවා. රහසේ කෙරෙන යම් විධියක ව්‍යාපාරයක් දැන් එළිපට කිරීමට හැකියාවක් ලැබෙන්නට යනවා, මේ සියයට සියයේ තීරුබදු ක්‍රමය ඇති කිරීම නිසා අපි මෙන්න මෙහෙම සිතා බලමු. තීරු බදු ක්‍රමය යටතේ රෙදි මීටර් 10,000ක් පමණ ගෙන්වා ඒවා කඩේ තබාගෙන හොර රහසේ එන රෙදි ටික සියයට සියයක ලාභයක් ඇතිව විකුණන්නට පුළුවන් තත්ත්වයකට මෙය පත්කර ගන්නට වෙළඳුන්ට පුළුවන්කම ඇති වෙනවා. විශේෂයෙන්ම පාසල් යන දුප්පත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අද ඇති වී තිබෙන තත්ත්වය ඉතාමත්ම කණගාටුදායකයි. එය ජනතාවට කරදරකාරී තත්ත්වයක් යයි නොකියාම බැහැ. ඉස්සර ශිෂ්‍යයෙකුට අවශ්‍ය ඇඳුමක් මසා ගැනීමට අවශ්‍ය රෙදිපිළි මිලදී ගැනීම රුපියල් 20කින් හෝ රුපියල් 30කින් කරන්නට හැකියාවක් තිබුණත් අද රුපියල් 160කින් අඩුව එය කර ගන්නට බැරි තත්ත්වයක් ඇතිවී තිබෙනවා කියන එකත් මේ අවස්ථාවේදී නොකියා බැහැ.

ඔය ක්‍රමය සම්බන්ධව එද මුදල් ඇමතිතුමා මේ ස්ථානයේදී ප්‍රකාශයක් කරමින් කිව්ව, එය පේෂ කර්මාන්ත අමාත්‍යාංශයට බාරදී තිබෙනවාය, එම කටයුත්ත කරන්නේ ඒ අයගේ උපදෙස් අනුවය කියා. මෙපමණ කලක් තමුන්නාන්සේ ඒ පිළිබඳව යම්කිසි ප්‍රකාශයක් නොකර සිටි නිසා අපට හිතන්නට සිදු වී තිබෙනවා, ඒ නියෝගය තමුන්නාන්සේත් අනුමත කරනවාය කියා. එහෙම නම් ඒ කටයුත්ත කරනවිට සිදුවිය හැකි අකටයුතුවලින් බේරෙන්නටත් ක්‍රම සකස් කර ගන්නට ඕනෑ. දැනට පවතින විධියට තමුන්නාන්සේ සළුසල මඟින් රෙදිපිළි ගෙන්නවා සළුසල මඟින්ම තීරුබද්ද ගෙවීමට වැඩපිළිවෙළක් සකස් කරන්න. එසේ නොවුණොත් " අන්ඩර් - ඉන්වොයිස් " කර ගෙන්වන්නටත් ඇඟළුම් කර්මාන්තයේ යෙදී සිටින අයට හොර රහසේ එන රෙදිපිළි වැඩි මිලකට විකුණා ගන්නටත් පුළුවන් වන පරිදි ඒ වෙළෙඳුන් කටයුතු කරන්නට පුළුවන්ය කියා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අන්න ඒ නිසා මේ සඳහා වෙන මාධ්‍යයක් සලසා ගැනීම ඉතාමත්ම අවශ්‍යයි.

මේවා හොර රහසේම ගෙන්වා ගැනීමට ආධාර වන තවත් මාර්ගයක තිබෙනවා. ඒ කන්ටේනර් ක්‍රමයට ගෙන්වීමයි. කන්ටේනර්වල දමාගෙන ඇවිත් ඒවා නියම විධියට පරීක්ෂා නොකරන පිළිවෙළට කටයුතු යොදා ඒවා ඇතුළේ ගෙනෙන රෙදිපිළි පිටමං කර ගන්නට කටයුතු යෙදුවොත් ඒ මඟිනුත් ලොකු ජාවාරමක් ඇතිවන බව නොකියාම බැහැ.

මෙය නියම විධියට ක්‍රියාත්මක කිරීමට කටයුතු යෙදිය හැකි තවත් මගක් තිබෙනවා. යම් කෙනෙක් සියයට සියයේ තීරුබදු ගෙවීමේ ක්‍රමයට යම් රෙදි ප්‍රමාණයක් ඇණවුම් කරනවා නම් එසේ ගෙන්වන රෙදි වෙනම ගුදම්වල දමා එහිදී කන්ටේනර් සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරන වැඩපිළිවෙළක් ඇති කළොත් එය වළක්වන්නට පුළුවන් යයි මම හිතනවා. එසේ වුණොත් හොරෙන් එන රෙදි ටිකෙනුත් මේ රටේ නිෂ්පාදනය වන රෙදි ටිකෙනුත් අර වැඩි කරන මිල මහජනතාවට පිට පටවා ගැනීමට නොහැකි වන පරිදි කටයුතු කරන්නට ඔබතුමාට පුළුවන් යයි මම විශේෂයෙන්ම කල්පනා කරනවා.

අන්න ඒ නිසා සියයට සියසේ බද්දත් දිගටම පවත්වා ගෙන යන්නට තමුන්නාන්සේලා අදහස් කරනවා නම් අර විධියේ යම් වැඩපිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. එද මුදල් ඇමතිතුමා කී අන්දමට නම් එතුමා ස්ථිර වශයෙනුත් තීන්දුවක් අරගෙන නැහැ. එය ඔබතුමාට පවරා තිබෙනවා යයි කිව්වා. මෙතෙක් කල් ඔබතුමාගෙන් ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රකාශයක් කෙරී නැහැ. එහෙම නම්, රජය ඒ සියයට සියයේ බද්ද අය කිරීමට කටයුතු කරනවා නම්, ඔන්න ඔය සඳහන් කළ ස්ථානවලින් ආරක්ෂාවීමට වැඩපිළිවෙළක් යෙදීම ඉතාමත්ම අවශ්‍යයි. තමුන්නාන්සේලා විසින් කළයුතු පළමුවන එක අන්ඩර් - ඉන්වොයිස් නොකිරීමට ක්‍රියාමාර්ගයක් ගැනීමයි. ඔබතුමා මෙතෙක් කල් කළ අන්දමට සළුසල මඟින් රෙදිපිළි ගෙන්වා ඒවා සම්බන්ධයෙන් නියම විධියට කටයුතු කිරීමේ වැඩපිළිවෙළක් ඇති කරන්නට පුළුවන්. එතනින් තීරුබද්ද අය කරන්නටත් පුළුවන්. අනික කන්ටේනර් පරීක්ෂා කිරීමේදී විශේෂ පරිශ්‍රමයක් දැරීමයි. ඒ කටයුත්තේදී ඔබතුමාගේ අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහයෝගයත් ලබාදී ඒවායින් අකටයුතු සිදු නොවන විධියට කටයුතු කිරීමයි. එහෙම නැත්නම් වෙනම ගුදම් ක්‍රමයක් ඇතිකර ඒ ගුදම්වලට දමා ඒවායින් පිටමං කිරීමට වැඩපිළිවෙළක් යෙදීමයි. එසේ කළොත් යම්කිසි හොඳ තත්ත්වයකට පත්වන්නට ඉඩ තිබෙනවා යයි කියන්නට කැමතියි.

එම නිසා ඒ කරුණු ටික හිතට අරගෙන ඔබතුමා ගන්නා පියවරින් අර හොර ජාවාරම් නවත්වා ගැනීමට හැකියාවක් ඇතිවිය යුතුයි. අන්ඩර් — ඉන්වොයිස් කිරීම වළක්වාලීමට ක්‍රමයක් ඇතිකළ යුතුයි. ඒවා රජය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාර්ගයෙන් ගෙන්වා, සළුසල වැනි ආයතනයක් මාර්ගයෙන් ගෙන්වා, ඒවා පාරිභෝගිකයාට ඉදිරිපත් කිරීම, කන්ටේනර් පරීක්ෂා කිරීමේදී සම්පූර්ණයෙන් ක්‍රමානුකූල පරීක්ෂණයක් කිරීම, ඒ වාගේම ඒවා වෙනම ගුදම්වලට ගෙන්වා ඒ ස්ථානවලින්ම පිටමං කිරීමට වැඩපිළිවෙළක් යෙදීම, මම හිතනවා විශේෂයෙන්ම අවශ්‍යයි කියා. මේ රටේ රාජ්‍ය අංශයෙන් වේවා, සංස්ථා මාර්ගයෙන් වේවා, පුද්ගලික අංශයෙන් වේවා, දේශීය නිෂ්පාදනයට රැකුලක් දීමට හැකිවන පරිදි තමුන්නාන්සේ ඉතා ඕනෑකමින් කල්පනා කර මේ වැඩපිළිවෙළ සකස් කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹறகம)
(Mr. Dinesh Gunawardene – Maharagama)

ගරු සභාපතිතුමනි, පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. කියැවුණු සමහර කරුණු මමත් එලෙසම කියන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් ගරු ඇමතිතුමා කලින් ප්‍රකාශ කරන්නට යෙදුණා පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන ප්‍රමාණයන්ගේ වැඩිවීම ගැන. මම එකක් ඇමති තුමාගේ අවධානයට යොමු කරන්න කැමතියි. පේෂ කර්ම ක්ෂේත්‍රයේ නිෂ්පාදන අංශවල වැඩිවීමත් සමගම අනික් පැත්තෙන් රටේ පේෂ කර්මාන්තයේ යෙදුණු විශාල ප්‍රමාණයකට රැකියා අහිමිවෙලා තිබෙනවා. ඒ තුළින් ජීවත් වුණු දහස් ගණනක ප්‍රමාණයකට මේ පේෂ කර්මාන්ත ප්‍රතිපත්තිය තුළ රැකියා අහිමි වෙලා තිබෙනවා. දහස් ගණනින් ග්‍රාමීයව අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ යෙදී යම්කිසි ආදායමක් ලබාගත්, ඒ ආර්ථික රටාවේ සිටි කොටසකගේ ආදායම අද විනාශවෙලා ගිහින්. එනිසා අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය විශාල වැටීමකට ගොදුරු වෙලා තිබෙනවා.

මම එක උදාහරණයක් පෙන්වන්නම්. කොළඹ දිස්ත්‍රික්කයේ පේෂ කර්මාන්ත කරුවන්ගේ සමුපකාර සමිතියක් තිබුණා. එහි මධ්‍යස්ථාන 144ක් තිබුණා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් වෙද්දී. අද තිබෙන්නේ 14යි. ලංකාවේ හිටපු ජනාධිපතිතුමා විදේශ සංචාරවල යෙදෙන විට මේ පේෂ කර්මාන්තයේ නිපැයුම් වලින් තමන්ගේ ඇඳුම් මහගෙන තමයි ගියේ. එතරම් දුරට එහි නිපැයුම්වල අගය ඉතා ඉහළ තත්ත්වයක පැවතුණා. අද මේ පේෂකර්මාන්ත ප්‍රතිපත්තිය තුළ මේ ක්ෂේත්‍රයේ අපි ගමන් කරන්නේ මහා පරිමාණ කර්මාන්ත ශාලා ක්ෂේත්‍රයට පමණක් ද කියන ප්‍රශ්නය මම ඇමතිතුමාට යොමු කරනවා. නැගෙනහිර පළාතේ කාත්තන්කුඩිවල අත් යන්ත්‍ර මගින් ඉතා ඉස්තරම් වර්ගයේ සාරි නිෂ්පාදනය කළා. සරොම් නිෂ්පාදනය කළා. අද ඒවාට සිද්ධවෙලා තිබෙන්නේ මොකක්ද ?

අපි මහා පරිමාණ පේෂ කර්මාන්ත කම්හල් ගැන එක මට්ටමකින් සිතන අතර ඊට පල්ලෙහා මට්ටම ගැන ඊට වැඩි අවධානයක් යොමු කරන්නට නැවත වතාවක්වත් කල්පනා කරන්නට ඕනෑ. එය ආදායම් මාර්ගයක් සඳහා පමණක් නොවෙයි, එය විකල්ප රෙදි වර්ගයක් හැටියටත් කල්පනා කරන්න පුළුවන්. අද යුරෝපයේ රටවල් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදනවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. අපේ රට ඒ වෙළඳ පොළ සඳහා දක්වන උනන්දුව ඉතාමත්ම අල්පයි. ඒ වෙළඳපොළ සඳහා අළුත් උනන්දුවක් දක්වා අවුරුදු පහක ආර්ථික එකඟතාවයක් මාර්ගයෙන් හෝ ගිවිසුමක් ඇතිකර ගන්නවා නම් හොඳයි. මම හිතන්නේ මේ සඳහා දරන්නට සිදුවන ආයෝජනය බොහොම අඩුයි.

මම ඇමතිතුමාට විශේෂයෙන් කියනවා කොළඹ දිස්ත්‍රික්කයේ පේෂ කර්මාන්ත කරුවන්ගේ යන්ත්‍ර අදත් තිබෙනවා. ඒවා එකිනෙක තැන්වල ගොඩ ගසා තිබෙනවා. ඒක මහජන මුදල් නාස්තියක්. ඒක ප්‍රාණවත් කරන්න බලන්න. සෑම දිස්ත්‍රික්කයකම මෙවැනි තත්ත්වයක් තිබෙනවා. මන්ද, ලංකාවේ බොහෝ දෙනා පලයකාට් සරොම්වලින් බොහොම මානසික තෘප්තියක් ලබනවා. එය ඉන්දියාවේ අත් යන්ත්‍ර පේෂකර්මාන්තය තුළින් නිෂ්පාදනය වන දෙයක්. එහි අවසන් නිපැයුම සඳහා පමණයි, කම්හලකට යන්නේ. එම නිසා මේ ක්ෂේත්‍රය අත් හැරිය යුතු නැති ක්ෂේත්‍රයක්. දේශීය වෙළඳපොළ සහ ජාත්‍යන්තර වෙළඳපොළේ ඒ සඳහා එන්ට එන්ටම ස්ථාවර කොටසක් තිබෙනවා. ඒ කොටස සඳහා අපේ තිබුණු අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය නැවත සකස් කරන්නටවත් උනන්දු වන්නටය කියා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 4.15

බලවේග පේෂ කර්මාන්තය ගැන කියවුණා. එම නිසා මම ඒ ක්ෂේත්‍රය ගැන කියන්නේ නැහැ. නමුත් බලවේග පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයත් අද මේ රටේ දේශීය රෙදි පිළි නිෂ්පාදනය කරන ජනතාව අනිත් ගිලිහී ගොස් බොහෝවිට වෙනත් සමාගම් කීපයක් අතට පත් වී තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ වාර්තාවෙන් කියවුණා නම් ඉතා හොඳයි, පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ කොතරම් දුරට රක්ෂාවල් අහිමි වුණාද කියා, නිෂ්පාදනය වැඩි වෙනවාත් සමගම. දහ දහස් ගණනින්ය කියන එකයි, මගේ නම් අදහස.

මේ රටේ වර්ෂ සියයක් පමණ පැරණිම කම්හලක් වූ වැල්ලවත්තේ රෙදි මෝල හදිසියෙන්ම වසා දමන්නට සිද්ධ වුණා. ඒ තුළින් දෙදහසකට කිට්ටු ප්‍රමාණයක් කෙළින්ම රැකියා විරහිත භාවයට පරිවර්තනය වුණා. ඇයි, ඒ ආයතනය එසේ වසා දමන්නට සිද්ධ වුණේ ? ඊට පිටිපස්සේ පිහිටි 'සී සිල්ක්' ආයතනයත් අද විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඒ වගේම 'ලීබ්‍රා ඉන්ඩස්ට්‍රීස්' එකත් රජයට පවරාගත් ආයතනයක්. ඒ සංකීර්ණයට එම තත්ත්වයට මුහුණ දෙන්නට සිද්ධ වුණේ පරිපාලනමය වැරදි නිසයි. අකාර්යක්ෂමතාවය සහ දූෂණය ඒ ස්ථානවල රජකළ නිසයි. රෙදි නිෂ්පාදනයේ යෙදී සිටින උදවියට දවස් අනුවේ, දවස්එකසිය විස්සේ ගෙවීමේ ක්‍රමයට රෙදි පිළි ණයට දුන්නා. ඒ අයගෙන් නැවත ඒ ණයට ගත් රෙදිවලට මුදල් ලැබුණේ නැහැ. අසූතුනේ කලබලයේදී ඒවා පිච්චුණාය කිව්වා. ඒ නිසා ආපසු ගෙවන්න බැහැ කිව්වා. රක්ෂණ සංස්ථාවෙන් ඒ අයට වන්දි ගෙවා තිබෙනවා. නමුත් ඒ අයගේ වන්දිය මේ ආයතනවලට ලැබුණේ නැහැ. වැල්ලවත්ත රජයේ පෙහෙකම්හල විනාශ කිරීමේ සැලැස්ම සාර්ථක වුණා, එය වසා දමීම කරා වුවමනාවෙන්ම ගෙන ඒමෙන්. මම ගරු ඇමතිතුමාට පෞද්ගලිකව දෝෂාරෝපනය කරනවා නොවෙයි. මේ, අකාර්යක්ෂමතාවයේ පැහැදිලි ලක්ෂණයන් පෙන්වා දෙන්නේ.

පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ පැලැත්තියක් සිටිනවා, සියලු දේ පිළිබඳව අරක් ගත් ඒ කොටස ඒවායේ අභ්‍යන්තරයේ වෙන මහා විනාශයක් පිළිබඳව මොකක් හෝ වාර්තාවක් දීලා බේරෙන්නට හදනවා. ජාතික සංවර්ධන බැංකුව — National Development Bank — විශාල ලෙස ණය දුන්නා, මේ ආයතනය දියුණු කරන්න. පිටරටින් උපදේශකයෝ ගෙන්නුවා. ඉන්දියානු උපදේශකයෝ ආවා. මේ විධියට උපදේශකයන් ගෙනල්ලා, ණය දීලා, මේ ආයතනය මොකද මේ තත්ත්වයට පරිවර්තනය වුණේ ? මේවා සම්බන්ධ වගකිවයුත්තන්ට දඬුවම් දෙන්නට ඕනෑ. මේ විධියේ වගකිවයුත්තන් තබාගෙන පේෂ කර්මාන්තය මොන ආයතනයේ පටන් ගත්තත් සිද්ධ වෙන්නේ එකම දෙයයි. මම අමාත්‍යාංශ මට්ටමේ කිසිම නිලධාරියෙකුට දෝෂාරෝපණය කරනවා නොවෙයි. නමුත් මේ ආයතනවල හිටපු අය මේවා ගැන වගකියන්නට ඕනෑ. මේ තත්ත්වයට ඒවා පරිවර්තනය කිරීම ගැන. මම හිතන විධියට අමාත්‍යාංශවල මේ සම්බන්ධ තොරතුරු ඇති. ලක්ෂ ගණන් අයවියයුතු මුදල් ලැබිලා නැහැ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කීවාක් මෙන්, ඒ පෙහෙකම්හල වසන වෙලාවේ ඒ සේවකයන්ට කීවා, හෝමාගම කම්හලක් ඉදි කරනවාය කියා. ඒ කම්හල අද හෝමාගම ඉදි වෙලා නැහැ. නමුත් එකක් වෙලා තිබෙනවා. එහි දහස් ගණනක් සේවකයන්ගේ රක්ෂා අහිමි වී තිබෙනවා. එම රෙදි නිෂ්පාදන කම්හලේ තිබුණු යන්ත්‍ර සූත්‍ර ක්‍රමානුකූලව වෙනත් ආයතනවලට පවරාදීම සඳහා වැඩ කටයුතු අරඹා තිබෙනවා. මොකක්ද මේ වැසීමේ ප්‍රතිපත්තියේ අරමුණ ? ඒක ලංකාවේ පේෂ කර්මාන්තය දියුණු කිරීම සඳහා යෙදුණු ක්‍රමයක්ද ? පෞද්ගලික අංශයට දීම සඳහාය කියා කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කියනවා. ඒ ගැන මම කියන්නට යන්නේ නැහැ. එතුමතාගේ කථාවේදී ඒ ගැන කියයි. පෞද්ගලික අංශයෙන් කර ගෙන යන රෙදිපිළි කර්මාන්තයක් ලංකාවේ පවතිනවා. මේ අනුව රාජ්‍ය අංශය මෙන්ම කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යන පෞද්ගලික අංශයකුත් ලංකාවේ තිබෙනවා. ඒක හැම ආණ්ඩුවකින්ම පිළිගත් අංශයක්. එය විදේශිකයන්ගේ නොවෙයි, දේශීය ව්‍යාපාරිකයන් විසින් පවත්වා ගෙන යන අංශයක්. එහෙමනම් මෙවර අයවැය ලේඛනයෙන් ඇති කර තිබෙන රෙදි පිළි ප්‍රතිපත්තිය උඩ ඒ අයගේ අනාගතය කුමක්ද ?

මේ රටට වංචනික අන්දමින් රේගුවට අසු නොවී වෙළඳපොලට රෙදි පිළි ඇතුළුවන නිසා, මේ අන්දමේ අලුත් තීරු බද්දක් පැනවීම තුළින් එය නවත්වන්නට පුළුවන්ය කියන විශ්වාසයකිනුයි, මෙම බද්ද ඇතිකර තිබෙන්නේ. නමුත් මෙයින් සිද්ධ වෙන්නේ මොකක්ද ? මෙයින් ලංකාවේ කපු රෙදි කර්මාන්තයට පමණක් නොවෙයි. මිශ්‍ර රෙදි වර්ග නිෂ්පාදනය කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

දේශීය රෙදි කර්මාන්තයටත් අනිවාර්යයෙන්ම තර්ජනයක් එල්ල වෙනවා. දේශීය නිෂ්පාදනවල මිල ගණන්වල යම්කිසි මට්ටමක් තබා ගන්නට පුළුවන් වෙනවාය කියා ඇමතිතුමා බලාපොරොත්තු වුණත්, ලංකාවේ වෙළඳපොළට ඇතුළුවන රෙදිවල ප්‍රමාණයේ පාලනයක් කරන්නට කිසිලෙසකින්වත් ඇමතිතුමාට අවකාශ ලැබෙන්නේ නැහැ. අපි යථාර්ථය දිහා බලමු. යථාර්ථය පිළිගනිමු. රේගුවට හැකියාවක් නැහැ, මේ රටට ඇතුළු වන විවිධ ද්‍රව්‍ය පාලනය කරන්නට. එම නිසා වෙනත් අංශවලින් රටට ඇතුළු වීම පාලනය කරන්නට නම් නිරන්තර වැටලීම් කරන්නට ඕනෑ. නමුත් නිරන්තර වැටලීම්වලින් ලද අසාර්ථක ප්‍රතිඵල තමයි තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවත් රේගුවත් අනිකුත් අංශත්, පසුගිය කාලයේදී ප්‍රදර්ශනය කර තිබෙන්නේ. අද ඊට වඩා වෙනසක් ඇති කරන්නට පුළුවන් වෙනවාය කියා මා නම් හිතන්නේ නැහැ. එම නිසා, අද ඉදිරිපත් කළ වාර්තාව අනුව වැඩි දියුණු වුණු ලංකාවේ රෙදි පිළි අංශයේ නිෂ්පාදනය, මෙම අලුතෙන් ඇති කරනු ලබන ආනයන ප්‍රතිපත්තිය නිසා, අනිවාර්යයෙන්ම තර්ජනයකට මුහුණ දෙනවා. [බාධා කිරීමක්] මම රෙදිපිළි ආනයනය කරනවාට විරුද්ධව කථා කරනවා නොවෙයි. මේ ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ තුළින් අපේ රටේ රෙදිපිළි අතින් ස්වයම්පෝෂිත භාවයක් ඇති කිරීමට නම්, පසුගිය කාලයේ නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු වුණාය කියා ඉදිරිපත් කරන කරුණු වලින් පෙනෙන තත්ත්වය, ආපස්සට යන ගමනක තමයි, මෙම අයවැය යෝජනා තුළින් අනුගමනය කරන ප්‍රතිපත්තිවලින් සිද්ධ වෙන්නේ. මොකද, වෙළඳපොළේ මිල ගණන්වල සුළු එහා - මෙහාවීම් වළදී හොඳ වර්ගයේ රෙදි පිළි සම්බන්ධයෙන් ජනතාව දක්වන උනන්දුව තමුන්නාන්සේට හෝ අපට පාලනය කරන්නට බැහැ. අද මේ රටේ විතරක් නොවෙයි, ඒ තත්ත්වය පවතින්නේ. ඒ අනුව ඉතා සුළු මිල ගණන්වල ඉතා සුළු වෙනස්කම් පවතින වෙළඳපොළේ රෙදි පිළි තරගයකට යොමු වීම තුළින් දේශීය නිෂ්පාදන අනිවාර්යයෙන්ම විශාල අර්බුදයකට වැටෙනවා. එම නිසා, මෙම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් ඉදිරි අවුරුදු කීපය තුළදී දේශීය රෙදිපිළි නිෂ්පාදනයේ තවත් විශාල පසුබෑමක් ඇති වෙනවා.

එම නිසා, අයවැය යෝජනාවක් හැටියට ඉදිරිපත් වුණු එම ආනයන ප්‍රතිපත්තිය නැවත සමාලෝචනය කරන්නටය කියන ටිකයි මා ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ. ඒ අතරම විදේශීය ආයතන ගණනාවකට පවරා දුන් කම්හල් පිළිබඳ තත්ත්වයත් මෙයට වඩා විමර්ශනය කරන්නටය කියන ටිකත් ගරු ඇමතිතුමාගෙන් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මොකද ? ඒවා පවරා දීමේදී ඇති කර ගන්නා ලද ගිවිසුම් කිසිලෙසකින්වත් අප රටට වාසිදායක ගිවිසුම් නොවෙයි. එම ගිවිසුම්වල වගන්ති අතර, විශාල වාසිදායක තත්ත්වයක් පවතිනවා, විදේශීය පාලනයට, කළමනාකාරිත්වයට පැමිණි අයට. කළමනාකාරිත්වය දියුණු කිරීම සඳහා ඒ අය මේ රටට ගෙන ආවා නම්, අද අපි ඒ පිළිබඳව සොයා බැලුවොත්, ලාංකිකයන් එහි කළමනාකාරිත්වය භාර ගැනීම සඳහා යොමු කර නැති බව පෙනී යනවා ඇති. මෙම ආයතන කීපය පාලනය කරන්නට අපි විශාල මුදලක් යොදවනවා. නොයෙක් අන්දමේ වක්‍ර ආකාරවලින්, ඔවුන් මෙරටට ගෙන්වන බඩුබාහිරාදිය සඳහා වන ඇනවුම් තුළින්, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඔවුන්ගේ සමාගම්වලට යොදවනවා. ප්‍රධාන වශයෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ, ඔවුන් සමග ඇති කර ගන්නා ලද ගිවිසුම්වල වරද නිසා බවයි මට හැඟෙන්නේ. එම නිසා දැනට මේ එක් එක් සමාගම සමග ඇති කර ගන්නා ලද ගිවිසුම් මොනවාද කියා මේ ගරු සභාවට දැනගැනීම පිණිස, සභාගත කරනවා නම් හොඳ බවයි මට කියන්නට තිබෙන්නේ. සැබැවින්ම එය සියළු මන්ත්‍රීවරුන්ට දැන ගැනීමට අවස්ථාවක් ලැබී නැහැ. මෙහිදී රහස් ගිවිසුමක් ඇති වෙන්න බැහැ. එම නිසා මේ එකඟත්වයට පැමිණි ගිවිසුම සභාගත කරන්නය කියා මා ඉල්ලා සිටිනවා, අළුත් ගිවිසුමට අවතීර්ණ වෙන්නට කලින් මේ පැමිණි ගිවිසුම මොකක්ද කියා අවම වශයෙන් පාර්ලිමේන්තුවටත් දැන ගැනීම සඳහා.

ඇඟලුම් කර්මාන්තය සඳහා අද මුහුණ පා තිබෙන ප්‍රශ්නය පිළිබඳවත් මම කියන්න කැමතියි. ඇමරිකන් වෙළඳ පොළේ ඇති වී තිබෙන තත්ත්වයත් යුරෝපා පොදු වෙළඳ හවුලේ ඇති වී තිබෙන තත්ත්වයත් නිසා ඉදිරි වර්ෂවලදී මෙම කර්මාන්තයේ වර්ධන වේගය විශාල ලෙස පසු බහින්නට ඉඩ තිබෙනවාය කියා ගරු ඇමතිතුමාත්, මුදල් ඇමතිතුමාත් පිළිගත්තා. අපේ ලොකුම වෙළඳ පොළවල් දෙක පිළිබඳවයි, මේ ප්‍රශ්නය ඇති වෙන්නේ ජෙන්කින්ස් පනත සම්මත වුණත්, එය අමෙරිකාවේ ජනාධිපතිතුමා විසින් ප්‍රතික්ෂේප කළත්, ලබන අවුරුද්දේ හෝ ඊළඟ අවුරුද්දේ මා හිතන්නේ එම්එෆ්ජ්ජ් ඇග්‍රිමන්ට් එක යටතේ අලුත් ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීමට අපට සිදු වෙනවා. මේ පිළිබඳව පසුගිය වතාවේදී ලංකාව මුහුණ දුන් අවස්ථාවේදී යම් යම් ක්ෂේත්‍රවල අවාසිදායක තත්ත්වයන්ට අපි ගොදුරු වුණා.

එම නිසා අනිවාර්යයෙන්ම ඇඟලුම් කර්මාන්තයේ ප්‍රධාන වෙළඳ පොළවල් දෙකට ඇතුළු වීම පිළිබඳ වර්ධනය සීමා වන තත්ත්වයකට අපි පත් වෙනවා. මේ ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනය පිළිබඳව තවදුරටත් විශ්වාසයක් තබන්න බැරි තත්ත්වයකට අපි ගොදුරු වෙලා තිබෙනවා. එයින් ප්‍රධාන දේ තමයි, ශ්‍රී ලංකාව අනුගමනය නොකරන ආර්ථික ප්‍රතිපත්තිය. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පිළිගැනීමට සූදානම් නැති මූලික ආර්ථික ප්‍රතිපත්තියයි, එය. අද ලෝකයේ ධනවත්ම රට හැටියට සලකන අමෙරිකාවෙත් යුරෝපයෙත් ආරක්ෂක පිළිවෙත් පිළිබඳව උද්ඝෝෂණ ඇති වී තිබෙනවා. නමුත් අපේ රටේ එවැනි ආරක්ෂක පිළිවෙතක් නැහැ. අපේ රටේ සියලුම දේ විවෘත කරලා, විදේශික ආයෝජකයන්ට ඕනෑම දෙයක් කරන්න ඉඩ දෙනවා. ඔතරම් දියුණු එම රටවල අභ්‍යන්තර කර්මාන්තවලට යම් කිසි තර්ජනයක් එල්ල වන විට එයට ප්‍රතික්‍රියා, උද්ඝෝෂණ ව්‍යාපාර ඇති වී තිබෙනවා. මේ රටවල ප්‍රතිපත්තිය දෙස බලා අපේ රටේත් ඒ ප්‍රතිපත්තියේ අවම දෙයක් හරි ක්‍රියාත්මක කිරීම තුළින් ලංකාවේ පේෂකර්මාන්තය සම්පූර්ණයෙන් විදේශිකයන් සතු වීමෙන් වළක්වා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ඇමතිතුමා ක්‍රියාත්මක කළ යුතුයි.

ජෙන්කින්ස් පනත මගින් ඇති වෙන්න පුළුවන් තත්ත්වයන් පිළිබඳව මම දීර්ඝ වශයෙන් විස්තරයක් කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. එහි තිබෙන වගන්ති කුමක් වුණත් ඒවායේ අභ්‍යන්තර එක් ලක්ෂණයක් නිර්මානය වෙනවා. මෙවැනි රටවලට ඒ රටවල වෙළඳ පොළට වෙනදා වාගේ වර්ධනය වෙමින් ඇතුළු වෙන්න තිබෙන අවස්ථාවල් ඉදිරි කාලයේදී දරුණු ලෙස සීමා වෙනවා. ඒ නිසා මේ කර්මාන්ත ක්ෂේත්‍රය ඉතාම ලොකු තර්ජනයකට මුහුණ දෙනවා.

මින්නේරියේ කම්හල පිළිබඳ කරුණත් මම ඇමතිතුමාගේ අවධානයට ගෙන එන්න කැමතියි. ඒ ආයතනය වසා දැමීමෙන් පසු විවිධ අක්‍රමිකතාවන් සිදු වෙනවා. එක් උදාහරණයක් තමයි, එම ආයතනයේ සේවකයන්ගේ වැටුප් පිළිබඳව තිබෙන තත්ත්වය. මා හිතන්නේ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන් හෝ අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමහර විට ඇමතිතුමා ඇහුවොත් ඒ අය මෙයට පිළිතුරු දෙයි. මම කියන දේ වැරදියි කියා මම හිතන්නේ නැහැ. මින්නේරිය කම්හලේ වැඩ කරන සමහර අය එම කම්හලෙනුත් වැටුප් ගන්න අතර තුල්හිරිය කම්හලෙනුත් වැටුප් ලබා ගන්නවා. මොකක්ද මෙහි තේරුම ? මේ තත්ත්වය නැහැයි කියා ඇමතිතුමා කියන්න එපා. මම කියන්නේ කරුණු ඇතිවයි. එතුමාට අවශ්‍ය ඒ පිළිබඳ විස්තර ටිකක් මම දෙන්නම්. එම තත්ත්වය නවත්වන්න අමාත්‍යාංශයෙන් නියෝග පනවා තිබෙනවා. පරිපාලනයේ පවතින මෙවැනි දූෂිත තත්ත්වයන් වළක්වන්න ක්‍රියා කරන්න. මම හිතන්නේ මේ විධියෙන් වැටුප් ගෙවීම් නිසාත් වෙනත් දීමනාවල් නිසාත් මේ ආයතනයේ විශාල ලෙස මුදල් නාස්තියක් සිදු වේගෙන යනවා. මේවා ගැන සොයා බලන්න. ඇමතිතුමාට ඕනෑ නම් ඒ පිළිබඳ විස්තර මම දෙන්නම්. මා ළඟ විස්තර තිබෙනවා. මට ඔප්පු කරන්න පුළුවන්.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු සභාපතිතුමනි, මින්නේරිය කම්හලේ අනාගතය පිළිබඳව වැඩපිළිවෙලක් තිබෙනවාද කියන ප්‍රශ්නය මා අහන්න කැමතියි. ඒ කම්හල වැසීමත් සමග අදත් ඒ සේවකයින්ට අර්ධ වැටුප් ගෙවීම් කරගෙන යනවා. එම කම්හලේ සේවකයන්ගේ අනාගතය පිළිබඳ ප්‍රශ්නය හා ඒ කම්හලේ දැනට පවතින ධාරිතාවේ අනාගතය පිළිබඳ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කළ යුතු කාලය පැමිණ තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙම කම්හල වසා දමා දැනට අවුරුදු දෙකක් ගත වී තිබෙනවා. එම නිසා මේ පිළිබඳව පැහැදිලි තීන්දුවකට එළඹිය යුතු කාලය පැමිණ තිබෙනවා.

පේෂකර්ම ක්ෂේත්‍රයේ පසුගිය කාලයේදී සීඝ්‍ර ලෙස මිල වැඩිවීම සම්බන්ධයෙනුත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. යුනිසෝප් ආයතනයෙන් නිකුත් කර තිබෙන වාර්තාවේ 54 වැනි පිටුවේ සඳහන් මිල ගණන් මම කියවන්නම්. එහි තිබෙන අන්දමට 1977 දී කලිසම් රෙදි මීටරයක් රුපියල් 30.23යි. 1984 දී එය රුපියල් 40යි. මම මේ කියවන්නේ අවම ක්ෂේත්‍රයන් පිළිබඳවයි. 1977දී කමිසයක් රුපියල් 45යි. 1984දී රුපියල් 95යි. 1977දී සරමක් දළ වශයෙන් රුපියල් 26.92යි. 1984දී රුපියල් 57.71යි. 1977දී බැනියමක් රු. 7.50යි. 1984දී රු. 28.56යි. 1977දී සාරියක් දළ වශයෙන් රු. 84.85යි. 1984දී රු. 185.75යි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඒ කාලයේ ඒවා තිබුණාද ?

අ. භා. 4.30

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

1977 දීත් මේවා තිබුණා. තමුන්නාන්සේලා හැම දෙයක්ම නැහැයි කියනවා. තමුන්නාන්සේලා අවුරුදු 8ක් තිස්සේ මේවායේ මිල වැඩි කරලා, ඒ බර මහජනතාව පිට පටවා ඒකෙන් බේරෙන්න පසුගිය ආණ්ඩු කාලයේ අඩුපාඩු ගැන දැන් කථා කරනවා. එදා ගවුම් රෙදි මීටරයක් රු.11.58යි. 1984දී රුපියල් 51.00ක් පමණ වෙනවා. මම මේ ටික කිව්වේ තමුන්නාන්සේලාගේ කාලයේ මිල ගණන්වල බර වේගයෙන් වැඩි කර තිබෙන බව පෙන්වන්නටයි. ගිය අවුරුද්දේ ඊටත් වඩා වැඩියි. මේ අවුරුද්දේ තවත් වැඩියි. 1986දී ඊටත් වැඩි වෙනවා. අනික් අතින් පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවය කරන සංඛ්‍යාව දේශීය වශයෙන් ලැබූ ආදායම විනාශ කර තිබෙනවා. පේෂ කර්මාන්ත නිෂ්පාදනය වැඩි වී තිබෙනවා. එහි හරය—එහි ප්‍රධාන හරය—අරගෙන තිබෙන්නේ විදේශිකයන්ය කියන ටිකය මෙහිදී අවසාන වශයෙන් ලැබෙන නිගමනය. ඒ නිසා මේ පේෂ කර්මාන්ත ප්‍රතිපත්තියේ ප්‍රධාන බර වැටී තිබෙන්නේ විදේශිකයන්ගේ වාසියටයි.

අවසාන වශයෙන් ගරු ඇමතිතුමාගෙන් මම එක ප්‍රශ්නයක් අහන්නට කැමතියි. අද තමුන්නාන්සේලා ඇති කර තිබෙන ප්‍රතිපත්තිය, විවෘතව ගෙන්වීමට ඉඩදීමේ ප්‍රතිපත්තිය කපන ලද නූල් ගෙන්වීම සම්බන්ධයෙන් අනුගමනය කරන්නට තමුන්නාන්සේලා මැළිකමක් දක්වන්නේ ඇයි ? ඒ කියන්නේ විදේශවල නිපදවන ලද රෙදි ගෙන්වීම සඳහා තමුන්නාන්සේලා විවෘතව අවසර දෙනවා. නමුත් කපන ලද නූල් ගෙන්වීමට ඉඩ දෙන්නේ අවසර පත්‍ර අනුවයි. ලංකාවේ කම්හල් ගණනාවක් උපරිම ධාරිතාවයට ගෙනෙන්නට, නූල් පාවිච්චි කර රෙදි නිෂ්පාදනය කරන ක්ෂේත්‍රයට නූල් ගෙන්වන්නේ බද්දක් සහ ඒ සඳහා වූ විශේෂ අවසර පත්‍ර අනුවයි. මෙය වෙනස් කරනවා නම් මම හිතන විධියට මේ නිමවූ භාණ්ඩයක් ගෙන් වීමට වැය වන මුදල් ප්‍රමාණය කපන ලද නූල් ගෙනැවිත් මේ රටේ රෙදි විවීමේ කර්මාන්තයට යොදනවා නම් එය මීට වඩා දියුණු අදියරකට ගෙනෙන්නට පුළුවන්. ඔය අලුතෙන් ඇති කළ ප්‍රතිපත්තියට වඩා, විවිධ නූල් වර්ග ගෙන්වීමේ ප්‍රතිපත්තිය ලිහිල් කළොත් මීට වඩා සහනදායක සහ ප්‍රතිඵලදායක තත්ත්වයක් ඇති වෙනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

මෙහි හදන නූල් වර්ගත් පිටරටින් ගෙන්වන්න ඉඩ දෙන්නය කියන එකද ගරු මන්ත්‍රීතුමා කියන්නේ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මෙහි හදන ඒවා විතරක් නොවෙයි. මෙහි හදන ටික ප්‍රමාණවත් නැහැ. මෙහි හදන ඒවාත් වැඩි දියුණු කරන්න පුළුවන්.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

නැහැ ! නැහැ !

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ කපන ලද නූල් ගෙනැවිත් අපට මීට වඩා නිෂ්පාදනයක් කරන්නට පුළුවන්. ඒ අංශය වැඩි දියුණු කරන්නට අපට පුළුවන්කම තිබෙද්දී ඇයි අප නිමැවූ රෙදි ගෙන්වන්නේ ? ඒ අතරමැදි නිෂ්පාදනයක් ගෙනැවිත් අවසන් නිෂ්පාදනය කරන්නට පුළුවන්කම තිබෙද්දී ඇයි අපි අවසන් නිෂ්පාදනය ගෙනෙන්නේ ? මම අහන්නේ අන්න ඒකයි. ඇමතිතුමා මේ පිළිබඳව අදහස යොමු කර, මේ පිළිබඳව සොයා බලන්න. අපි ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේදී අවසාන වශයෙන් හැම තිස්සේම විදේශ විනිමය ඉතිරි කිරීමක් මේ රටේ රැකියා බිහි කිරීමක් යන ප්‍රතිපත්ති දෙක ගැනම සලකා බලන්නට ඕනෑ. එසේ නොවන ප්‍රතිපත්තියක් පේෂකර්මාන්තයට යෙදවීම නිසා තමයි, අපි අද අවුල් ජාලාවකට ගොදුරු වී තිබෙන්නේ. ඇමතිතුමාගේ අංශයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ මහා ඉදිරි පිම්මක් පෙන්නුම් කළාට එහි ප්‍රධාන වාසිය ලබා තිබෙන්නේ විදේශීය ආයතනයි කියා මම හිතනවා.

අවසාන වශයෙන් පූගොඩ පේෂ කර්මාන්ත ආයතනයේ සේවකයින්ට කම්කරු කොමසාරිස්වරයා මඟින් නියම කළ ගෙවීම් ගණනාවක් ලබාදීම සඳහා මෙතෙක් පියවර ගෙන නැහැයි කියන එක සඳහන් කළ යුතුව තිබෙනවා. මම මීට ප්‍රථමත් මේ පිළිබඳව ඇමතිතුමාට ප්‍රශ්න ඉදිරිපත් කළා. උපදේශක කාරක සභාවේදීත් ඉදිරිපත් කළා. යම් යම් ගෙවීම් කරන්නට ආයතනයේ යම් යම් බැඳීම් පවතිනවා. කම්කරු කොමසාරිස්වරයා මේ ගෙවීම් පිළිබඳව තීන්දු දී තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කර එම පේෂකර්ම ආයතනයේ නිරත වූවන්ට නියමිත නීත්‍යනුකූල ආදායම් මාර්ග ලබා දීමට කටයුතු කරන ලෙස මම ඉල්ලනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව ඉතා සුළුවෙන් අපට අපේ අදහස් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. අපි පසුගිය අවුරුද්දේත් මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කළා. ගරු ඇමතිතුමා කළ ප්‍රකාශත් අප ළඟ තිබෙනවා. ඒ සෑම ප්‍රකාශයක් දෙසම බැලුවාම, ඒ අවුරුද්ද තුළ නොයෙකුත් වාද විවාද ඇතිවූ අවස්ථාවලදී ගරු ඇමතිතුමා පේෂ කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් කළ ප්‍රකාශ පවා හරියට ක්‍රියාත්මක වී නැහැ. අපේය කියා නිෂ්පාදනයක් තිබෙන්න ඕනෑය කියන එකයි ඇත්තවශයෙන්ම අපට ඕනෑ කරන්නේ. රෙදි හෝ වේවා, හාල් හෝ වේවා, අනෙක් ද්‍රව්‍ය හෝ වේවා ඒ හැම නිෂ්පාදනයක්ම අපේ වෙන්න ඕනෑ. අපේ අය පුහුණු වෙන්නේ — අපේ අය ඉගෙන ගන්නේ — කොහේවත් ගිහිල්ලා වෙන රටක කටයුතු කරන්න නොවෙයි. රෙදි නිෂ්පාදනය කරන්න පුළුවන් දක්ෂ ඉංජිනේරුවන් — රෙදි කර්මාන්තය ගැන විශේෂඥයන් පුහුණු කර සිටින බව අපි දන්නවා. දැන් විශාල තොගයක් ඉන්නවා. ඒ ඒ අංශයෙන් ශිෂ්‍යත්වලට — රෙදි නිමහම් කිරීමට — පේෂකර්ම සංස්ථාවෙන් පිටරට යවා උසස්ම උපාධි, සමහරවිට පශ්චාත් උපාධි පවා ලබාගෙන තිබෙනවා. ඒ සම්බන්ධව පුහුණු වූ අය බර ගණනක් රැකියාවල් නැතුව ඉන්නවා. ඒ අයට අවස්ථාවක් අපි දෙන්නේ නැද්ද ? ඊළඟට රෙදි විවීම සම්බන්ධව මෙයට පුහුණු වී, විදේශීය වශයෙනුත් පුහුණු වී සිටින ඒ අය අපේ කර්මාන්තවලට අපි යොදා ගන්නේ කොහොමද ? ඒ වාගේම පේෂකර්ම සංස්ථාව කාලයක් තිස්සේම පුහුණුව පිණිස යවා රෙදි වෙළඳාම සම්බන්ධව, විදේශීය මාකට් එක සම්බන්ධව සෑහෙන ඉගෙනීම් ලබාගත් හොඳ පරිචයක්, පළපුරුද්දක් ඇති කරගත් අය ඉන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

රෙදි නිෂ්පාදනය කරන්න අවශ්‍ය ශ්‍රම ශක්තිය අපට තිබෙනවා. අපට ඕනෑ කරන ඉතාම සුදුසුකම් ලැබූ සේවක පිරිස් ඉන්නවා. ඊළඟට රෙදි නිෂ්පාදනය සම්බන්ධව එක එක ක්‍රමවලට නොයෙක් නොයෙක් වර්ගවල ලෝකයේ අනෙකුත් අය සමග තරගකාරී ලෙස රෙදි නිෂ්පාදනය කරන්න පුළුවන් අය සිටින බව පසුගිය අවුරුදු විස්ස, විසිපහ කාලය තුළ පෙන්වා තිබෙනවා.

වෙළඳාම අතින් දක්ෂ, වෙළඳාමක් කරන්න පුළුවන් අය ඉන්නවා. අපි දැන් ඇත්තවශයෙන්ම කල්පනා කර බලමු. අපේ රටේ එක්කෝටි හැට ලක්ෂයක් ජනතාව ඉන්නවා. [බාධා කිරීමක්] ඔව්, එක්කෝටි හැට ලක්ෂයක් වෙන්න ඉන්නවා. 1983දී එක්කෝටි පනස්පත් ලක්ෂයයි. දැන් එක්කෝටි හැට ලක්ෂයක් පමණ ඉන්නවා. එතකොට ඒ එක්කෝටි හැට ලක්ෂයක් ජනතාවට ආහාර ලඟට වුවමනා කරන ද්‍රව්‍යයක් ඇඳුම්. එතකොට රෙදි සම්බන්ධව කොපමණ නිෂ්පාදනයක් අපි කරන්න ඕනෑද ? ඒ රෙදි නිෂ්පාදනයට ශ්‍රමය කොපමණ ඕනෑ කරනවාද, ඒ අනුව සේවකයන් කී දෙනෙකු රක්ෂාවල අපට යොදවන්න පුළුවන්ද ? අපේම කර්මාන්ත අපට ඕනෑ වී තිබෙන්නේ ඒ නිසයි. ඒ නිසා තමයි මම ගිය අවුරුද්දේත් කිව්වේ.

අධිරාජ්‍යවාදීන්, විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය ඉන්දියාව හූරාකෑමේ වැඩපිළිවෙළේ යෙදුනා. ඔය යටත්විජිත කාලයේදී බ්‍රිතාන්‍යයන්, ජර්මන්කාරයන්, ඉතාලිකාරයාන් ඒ රට සම්පූර්ණයෙන්ම හූරා කෑ කාලයක් තිබුණා. එක්දහස් නවසිය විසි ගණන්වල මහත්මා ගාන්ධිතුමා කදර් වස්ත්‍ර ව්‍යාපාරය තුළින් එයට විරුද්ධව නැඟී සිටියා. අවුරුදු තිස් ගණනක්, හතළිස් ගණනක් යනකොට මුළු ඉන්දියාවේම කදර් වස්ත්‍ර අඳින අය සියයට අසූ ගණනකට නැංගා. ඉන්දියාවේ අදත් වැඩි දෙනෙක් අඳින්නේ ඉන්දියාවේම නිෂ්පාදනය කරන ඇඳුම්. එය විග්‍රහ කර තිබෙනවා. සියයට 80ක් පමණ ඒගොල්ලන් රෙදි නිෂ්පාදනය කරනවා. ඒගොල්ලෝ පරිභෝජනයට ගන්නේ ඒ රෙදිමයි. එතකොට ඇත්තවශයෙන්ම රටක නිෂ්පාදනය කියන්නේ ඒ රටේ පරිභෝජනය සඳහා යම්කිසි කොටසක් ඇති කිරීමටයි. අපේ රටේ පරිභෝජනයට අවශ්‍ය රෙදි ප්‍රමාණය පිටින් ගෙන්වනවා නම්, විදේශවලින් ගෙන්වනවා නම්, ඒක සෑහෙනදුරට සීමා කරන්න ඕනෑ. එසේ සීමා කරන්නේ නැත්නම් මෙරට රෙදි කර්මාන්තය සම්පූර්ණයෙන්ම මැරී යනවා.

මෙතැනදී සුලු දෙයක් තිබෙනවා, අපට දැනගන්න. අපට දේශීය මමත්වයක් තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ, අපි ජාතියක් වශයෙන් ස්වාධීනව, කිසිම දෙයක් සඳහා විදේශීය රටකට අත පාන්නේ නැතිව, අපේ රටේ කර්මාන්තවලින්, අපේ හැකියාවන් තුළින් ජීවත්වෙන්න වුවමනා කියන එකයි අපේ මූලික පරමාර්ථය වෙන්න ඕනෑ.

ඒ පරමාර්ථය අපෙන් ඉෂ්ට වෙනවාද ? අපි කාටවත්, එක එක්කෙනාට දෙස් කියන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලා අහනවා, ඇමතිතුමා අහනවා, කලින් ආණ්ඩුව කාලයේදී රෙදි තිබුණාද කියා. මම දන්නේ නැහැ ඒ කාලයේ මිනිස්සු රෙදි ඇඳගෙන සිටියාද නැද්ද කියා. එහෙම නම් තමුන්නාන්සේලාට රෙදි තිබුණේ නැතුවා වෙන්න ඇති. ඔය තරම් ලාමක ප්‍රශ්න ඔය වගේ අය අහනවාද කියා මම දන්නේ නැහැ. එතකොට තමුන්නාන්සේලාගේ නායකතුමා කොහොමද හිටියේ ? අපි කොහොමද හිටියේ ? මේවා අහන ප්‍රශ්න නොවෙයි. මේවා ලාමක ප්‍රශ්න. ඉස්කෝල ළමයින්ටවත් වටින්නේ නැහැ ; ගැළපෙන්නේ නැහැ.

ඉන්දියාවේ කදර් වස්ත්‍ර ව්‍යාපාරයට අනුකූලව එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක හිටපු අගමැතිතුමා එදා රෙදි කර්මාන්තය දේශීය කර්මාන්තයක් හැටියට පටන් ගත්තා. ඒ අනුව තමයි අන්තනගල්ලේ රෙදි මධ්‍යස්ථානය ඉස්සෙල්ලාම පටන් අරගෙන, ඒ ව්‍යාපාරය දියුණු කරගෙන ආවේ. එතකොට වැල්ලවත්ත වීවින් මිල්ස් එකත් මේ ව්‍යාපාරයට එකතු වුණා. පෞද්ගලික අංශයෙන් " නුවර වීවින් මිල්ස් ", " ලක්විව් " ආදී වශයෙන් රෙදි නිෂ්පාදනායතන ආරම්භ වුණා. ඒක දේශීය කර්මාන්තයක් හැටියට පැන නැගුණා. ඒ අතරේදී රජය යම් යම් අවස්ථාවලදී ඒ ව්‍යාපාරවලට විශේෂ වරප්‍රසාද ලබාදුන්නා. 1970 සිට 77 දක්වා කාලයේදී වීවින් මධ්‍යස්ථාන උපරිම තත්ත්වයකට දියුණු වුණා. ඊට හේතුව පිටරටින් ගෙන්වන රෙදි ප්‍රමාණය අඩු කිරීමයි. මම හිතන්නේ 60%ක් පමණ අඩුකළා. 40%ක් විතර ගෙන්නෙව්වා. ඒ තරම් රෙදි ගෙන්වීම අඩුකළා. ඇයි ? වෙන කිසිවක් නිසා නොවෙයි. අපේ ව්‍යාපාරවල අපේ අයම වැඩ කළා. අපේ කර්මාන්තයෙන් අපිම හම්බ කරගෙන, අපිම ජීවත්වන්න ඕනෑය කියන පරමාර්ථය උඩයි එහෙම කළේ.

දේශීය කර්මාන්ත දියුණු කරන්න ඕනෑ. අපට පාඩු වෙන්න පුළුවන්. අපට ඒවා දියුණු කරන්න කාලයක් යන්න පුළුවන්. අපේ නිෂ්පාදනවල නිමාවේ තත්ත්වය අඩු වෙන්න පුළුවන්. නමුත් ඒක අපේ. අපි අනාගත පරම්පරාවට ඉදිරිපත් කරන්න ඕනෑ, " මෙන්න අපි මෙනෙක් කරගෙන ඇවිල්ල තිබෙනවා. මෙතන ඉඳලා මේ කර්මාන්තය දියුණු කර තවත් එහාට ගෙන යාමට ඔබට බාරයි " කියා.

අපට එක දවසකින් මේ ඔක්කොම කරන්න බැහැ. කිසිම ආණ්ඩුවකට ප්‍රශ්න විසඳා ඉවර කරන්න බැහැ. අපි ඒක කියනවා. ප්‍රශ්න එක පාරටම විසඳා ඉවර කරන්න ඕනෑය කියා හැඟීමක් ආණ්ඩුවකට තිබෙනවා නම්, ඒ තරම් මුලාවක් තවත් ඇත්තේ නැහැ. ඒක කරන්න බැහැ. තමුන්නාන්සේලා කොච්චර වැඩ කළත්, කොයි තරම් වේදිකාවල නැගුනුවත්, කොයි තරම් පාර්ලිමේන්තුවේදී කිව්වත්, පත්‍රිකා මගින් ප්‍රචාරය කළත්, තමුන්නාන්සේලා කළාට වැඩිය වැඩ කොටසක් කරන්න බැරුව ඉතුරු වෙනවා.

ඒක හැම වෙලාවෙම තිබෙන සිද්ධියක්. ජනගහනය වැඩි වෙනවා. ප්‍රශ්න වැඩි වෙනවා. තමුන්නාන්සේලා කියනවා රෙදිපිළිවලින් රට ස්වයංපෝෂිතය කියලා. තමුන්නාන්සේලාට බාධක ඇති වුණා. ත්‍රස්තවාදී කල්ලියෙන් බාධක ඇති වුණා. තව මොන මොන දේවල් ඒවිද කියල දන්නේ නැහැ. ඒවා ආපුවාම සමහර විට අර බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්න බැහැ. ඊළඟට නිෂ්පාදන තත්ත්වය අඩපණ වුණාම, ජනගහනය වැඩි වන ප්‍රමාණයේ හැටියට රෙදි නිෂ්පාදනය මදි වෙනවා.

යම්කිසි විධියකින් තුන්වැනි ලෝක යුද්ධයක් වගේ දෙයක් ඇති වුණොත් ලංකාවේ නිෂ්පාදන අඩපණ වුණොත් විදේශවලින් අපට රෙදි ගේන්න පුළුවන් වෙනවාද ? ඔය ගණනට අපට රෙදි දේවිද ? ඔය දැන් තිබෙන ගණන් සමහර වෙලාවට හතර පස් ගුණයකින් වැඩි වේවි. එතකොට අපට පුළුවන් වේවිද විදේශවලින් රෙදි ගන්න. අපි ස්වයංපෝෂිත වෙන්න ඕනෑ.

අ. භා. 4.45

අපි සහල් නිෂ්පාදනය කරන්නේ ඇයි ? මේ රටේ අපේ ස්වයංපෝෂිත තත්ත්වය හැම වේලාවේම තිබෙන්න ඕනෑ. අපට යම්කිසි විධියකින් විදේශීය බලපෑම් ඇති වී, යුද්ධයක් වගේ අපට වළක්වන්න බැරි දේකින් යම්කිසි බලපෑමක් ආවොත්, ඒ අවස්ථාවේදී අපේ රටේ ජනතාවට කරදරයක් නැතිව සෑහෙන දුරට හරි ජීවත් වෙන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. ඉදිරියේදී අපට කියන්න බැහැ රෙදි ඕනෑත් නැහැ කෑම තිබුණොත් පමණක් ඇතියි කියා. කෑම වගේම රෙදිත් අවශ්‍යයි. දිනපතාම හැම තත්පරයකම අවශ්‍යයි. රෙදිත් අවශ්‍යයි, කෑමත් අවශ්‍යයි. ඒ දෙකම එකටයි යන්නෙ. එමනිසා පිටරටින් රෙදි ගෙන ඒම සම්පූර්ණයෙන්ම නවත්වන්න පුළුවන් නම් වහාම නැවැත්විය යුතුයි.

අපේ දේශීය කර්මාන්තය සියයට සියයක්ම නංවන්න ඕනෑ. අපි දේශීය කර්මාන්තකරුවන් ධෛර්‍යමත් කරන්න ඕනෑ. ඒකට තව තවත් වැඩියෙන් ජනතාව හුරු කරන්න ඕනෑ. දේශීය කර්මාන්තකරුවන්ට බදු සහන දෙන්න ඕනෑ. එහෙම කරන්නෙ නැතිව, මේක පාඩුවට දුවනවාය, මේවා විකුණන්න බැරිය, මේකට වෙළඳ පොළක් සොයාගන්න බැරිය කියා ඔවුන් අධෛර්‍යමත් කිරීමෙන් මේ දේශීය කර්මාන්තය නංවන්න බැහැ. දේශීය වෙළඳ පොළ සොයා දෙන්න ඕනෑ. ඒ ගැන ප්‍රචාර ගෙනයන්න ඕනෑ. දේශීය කර්මාන්තය මැරෙන්න දෙන්න බැහැ. දේශීය කර්මාන්තය මරනවා නම් එය ජනතාව මැරීමක් ; ජනතාවගේ දේශීයකම නැති කිරීමක් ; ජනතාවගේ දේශප්‍රේමී බව නැති කිරීමක් ; ජනතාවගේ දේශමමත්වය නැති කිරීමක්. මේ රටේ එවැන්නක් කිරීමට රජයට අවශ්‍යතාවක් තිබෙනවාද ? මොන ආණ්ඩුවද එවැන්නකට කැමති වන්නෙ ? නමුත් අර විධියේ ප්‍රතිපත්තියක් ගෙනයනවා නම් වෙන්නෙ ඒකයි.

මේ වැය ශීර්ෂ යටතේ ගරු ඇමතිතුමා පොරොන්දු රාශියක් දී තිබෙනවා, මෙන්න මේවායි මේ අවුරුද්දෙ කරන්නෙ කියලා දේශීය රෙදිපිළි කර්මාන්තය ආරක්ෂා කරනවාය කියා තිබෙනවා ; වැඩි දියුණු කරනවාය කියා තිබෙනවා ; ඕනෑ කරන වෙළඳ පොළ සොයා දෙනවාය කියා තිබෙනවා ; පාරිභෝගිකයාට අවශ්‍ය රෙදි සපයනවාය කියා තිබෙනවා. මේ විධියට පොරොන්දු රාශියක් දී තිබෙනවා. ඒ පොරොන්දු මේ පොතට පමණක් සීමා කරනවාද ? එහෙම නැත්නම් ඒ පොරොන්දු අනුව කටයුතු කරනවාද ? මට දැනගන්නට වුවමනා කරන්නේ ඒකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේ පේෂකර්මාන්ත ඇමතිතුමා හැටියට දී ඇති පොරොන්දු අනුව ක්‍රියා කරන්න තමුන්නාන්සේට ඉඩ දෙන්නෙ නැත්තම් ඊට බාධා කරනවා නම් තමුන්නාන්සේ රජයේ තවදුරටත් ඉඳීම පුදුමයි. වෙන රටවල නම් ඇමතිවරු සමහර විට ඉල්ලා අස් වී අවසානයි. " මගේ ප්‍රතිපත්තියට විරුද්ධයි, ඒ නිසා මට මේක කරන්න බැහැ " කියා අස්වී ගොස් අවසානයි.

මේවා ඇමතිතුමා ඇස්තමේන්තු වැය ශීර්ෂ සම්බන්ධයෙන් දී තිබෙන පොරොන්දු. මේකෙන් දිවුරලා කියනවා ඒවා ක්‍රියාත්මක කරනවාය, දේශීය කර්මාන්තය නංවනවාය කියා. නමුත් දේශීය කර්මාන්ත නංවනවා වෙනුවට විදේශීය රෙදි මෙහාට ආනයනය කර ඒවායින් වෙළඳ පොළ පුරවා අපේ කර්මාන්තය සම්පූර්ණයෙන් නාස්ති කරනවා නම් තමුන්නාන්සේ තේද ඒකට වග කියන්න ඕනැ ? කාගෙන්ද අපි මේවා අහන්නෙ ? කවුද දේශීය රෙදිපිළි කර්මාන්තය ආරක්ෂා කරන්න දියුණු කරන්න පොරොන්දු වී තිබෙන්නෙ ?

අපේ කර්මාන්තයට තිබෙන අඩුපාඩුකම් සම්පූර්ණ කර විදේශ වෙළඳ පොළ අල්ලාගන්නවාය කියා තමුන්නාන්සේ කියා තිබෙනවා. අපේ දේශීය රෙදිපිළි පරිභෝජනය කිරීමට දිරිදෙන කටයුතු සඳහා තමුන්නාන්සේ කොතොක් දුරට ප්‍රචාරක වැඩපිළිවෙළක් ගෙන යනවාද ? එහෙම කරන්නෙ නැත්නම් මේ අමාත්‍යාංශයෙන් කරන වැඩේ මොකක්ද කියා මම දන්නෙ නැහැ.

මේ අමාත්‍යාංශවල සිටින නිලධාරීන් පුංචි බබ්බු නොවෙයි. මම හිතන්නෙ නැහැ පුංචි බබ්බු ඉන්නවාය කියා. නොයෙක් අංශවලින් දියුණුව ලබාගෙන තිබෙන අය, පරිපාලනයට දක්ෂ අය. ඒ වාගේම ගණන් මිනුම්වලට දක්ෂ අය, ආර්ථික විශේෂඥතා ඇති අය මේ අමාත්‍යාංශයේ ඉන්නවා. ඒ අයගේ වැඩ මොනවාද ? අන්තිමට බැලුවම ඇමතිතුමාටත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඇයි තමුන්නාන්සේලා ඒ පැත්තෙන් විවෘත ආර්ථිකයක් දී තිබෙනවා. ඒ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. කැබිනට් මණ්ඩලය තීන්දු කර තිබෙනවා. විවෘත ආර්ථිකය පිළිගන්නවාය කියලා. දැන් තමුන්නාන්සේලාට පෙනී තිබෙනවා විවෘත ආර්ථිකය නිසා දේශීය දේවල් සියල්ලම නැතිවන බව ; ඒවා හෙමිහිට අඩපණ වන බව. විදේශීය දේවල් එන්න එන්නම අපේ රටේ වැඩි වෙනවා. අපේ රටේ වෙළඳාම විදේශිකයන් විසින් අල්ලා ගන්නවා. දේශීය වශයෙන් අපේ රටේ වෙළඳාම අඩපන වෙනවා. නිෂ්පාදනයත් අඩපන වෙනවා. අපේ කර්මාන්තයත් මැරෙනවා.

අපි දැන් විදේශීය රටවල් ගැන ටිකක් හිතල බලමු. ජාත්‍යන්තර වශයෙන් බලන විට ලෝකයේ හැම රටක්ම වගේ උත්සාහ කරන්නේ තමන්ගේ රට තුළ තමන්ගේ නිෂ්පාදනයත් දියුණු කර තමන්ගේ ආර්ථික ක්‍රමය දියුණු කර ගන්නටයි. අනික් රටකට අත නොපා යටත් නොවී ස්වාධීනව ජීවත්වීමට පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්නටයි. හැම රටක්ම බලාපොරොත්තු වෙන්නෙ. විශේෂයෙන්ම " ඇඩ්වාන්ස්ට් කන්ට්‍රිස් " — දියුණුවෙන් වැඩි රටවල් — ඉහළ පෙළේ රටවල් — අරගෙන බැලුවොත් ඒ තත්ත්වයයි තිබෙන්නෙ. අමෙරිකාව පසුගිය කාලයේ ලෝකයේ රටවල් ගණනාවකට දිරව්ව ලණු දුන්නා. මොනවාද? විවෘත ආර්ථික ක්‍රමයක් ඇති කරන්න කිව්වා. ලංකාවත් එයින් එක රටක්. ලෝක බැංකුව මගින් අයි. එම්. එෆ්. එක මගින් විවෘත ආර්ථිකයක් ඇති කරන්නය කියා අපට උපදෙස් දුන්නා. නිදහසේ වෙළඳාම් කරන්න ඉඩ දෙන්න ඕනැ කිව්වා. අපට එහෙම කියල දැන් ඒ අය මොකද කරන්නේ ? කාලයක් තිස්සේ ලනුව දී මේ ලණුව අල්ලා ගත්තාට පසුව දැන් ඒ අය කරන්නේ " ප්‍රොටෙක්ෂනිෂම් " නැත්නම් " ක්ලෝස්ඩ් ඉකොනොමි " එක අනුගමනය කිරීමයි. " විවෘත ආර්ථිකයට අපේ රටේ දොරවල් නැහැ, අපේ ඒ දොරවල් වහනවා, විවෘත ආර්ථිකය තිබුණ කාලය දැන් ඇති. අපට දැන් එය කරගෙන යන්න බැහැ, අපේ ආර්ථිකය අපි දියුණු කර ගන්න ඕනැ " කියලා ඒ ගොල්ලො දොරවල් වහනවා. අපි මෙහේ දොරවල් ඇර තියනවා. විදේශිකයන්ට ඇවිත් අපේ රටේ වෙළඳාම් කරන්න තව තවත් ඉඩ දෙනවා.

අපේ රටේ එක් කෙනෙකුට කරගෙන යන්න පුළුවන් පුංචි කොම්පැනියක් විදේශිකයන්ට භාර දෙනවා. අපේ රටේ උදවියට අපේ රටේ උගතුන්ට එකතු වී කරන්න පුළුවන් පේෂකර්ම සංස්ථාවේ කටයුතු කරගෙන යන්න ඉන්දියාවට දෙනවා. එංගලන්තයට දී තිබෙනවා. ජර්මනියට දුන්නා. ඔය විධියට එක එක රටට දී ඒ රටවල්වලට කියනවා, මෙහි ඇවිත් වැඩ කරන්නය කියා. එයින් පේන්නෙ මොකක්ද ? අපට ලැජ්ජා නැද්ද කියලා මම දන්නෙ නැහැ. අපේ රටේ ඉන්න අපි හැම දෙනාම ලැජ්ජා විය යුතු කාරණයක් මේ. ඇයි ? රෙදි කර්මාන්තය කරගෙන යන්න අපේ රටේ දක්ෂයන් නැද්ද ? පේෂකර්ම සංස්ථාව කියන පොඩි ආයතනය කරගෙන යන්න අපේ රටේ දක්ෂයන් නැද්ද†? මොකක්ද මේකෙ තේරුම ? පේෂකර්ම සංස්ථාවේ අයවැය විස්තරය තිබෙනවා. ඒ තරම් පාඩුවක් සිදුවී තිබෙන බවක් එයින් පෙනෙන්නෙ නැහැ. ලක්ෂ 113 ක පමණ ප්‍රමාණයක් නිපැයුම් කර තිබෙනවා. එයින් විසි ලක්ෂයක් පමණ ඇවිත් තිබෙන්නෙ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයෙනුයි. එක අවුරුද්දකට ලක්ෂ 113 ක නිපැයුම් කර තිබෙනවා. එහෙම නම් පාඩුවක් කෝ ? පේෂකර්මාන්තයෙන් කිසිම පාඩුවක් සිදුවී නැහැ. නිෂ්පාදනය අතින් පාඩුවක් නැහැ. පාඩුවක් සිදුවී තිබෙන්නේ පරිපාලනමය අංශයෙන් සිදුවුණ වැරදි නිසයි. ඒවාට දමා සිටින සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන්, " වර්කින් ඩිරෙක්ටර්ස්ල " වැනි අයගේ දුර්වලකම් නිසා වෙන්න ඇති.

දැන් අර ප්‍රදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි විස්තරයක් කළා. මමත් එයට එකඟ වෙනවා. මමත් මෙවැනි කරුණු ගැන කීප වරක් කියා තිබෙනවා. සමහර විට කෝටි දෙක තුනක් ණයට දුන්නයි කියා, විශාල ව්‍යාපාරයක් පිටුපස්සෙන් යනවා. මම මෙය කීප වතාවක්ම කිව්වා. මම එදත් ඒක තමුන්නාන්සෙලාට පෙන්නා දුන්නා. එක තැනකින් කෝටි එකසිය ගණනක ණයක් ගන්න තියෙනවා. කෝටි එකසිය ගණනක් එක ව්‍යාපාරයකින් ගන්න තිබෙනවා. මොනවද මේවා ? ණයද ? මොකක්ද මේ කරන්නෙ ? මම මේ කාරණය පෙරෙයිදා ඉදිරිපත් කළා. මම ඒ විස්තර නැවත කියන්න යන්නෙ නැහැ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
රෙදිවලටද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
රෙදිවලට දී තිබෙන ඒවාත් එහෙම තියෙනවා. පේෂකර්ම සංස්ථාව ටිකක් පතුරුගාල බැලුවාම පෙනෙයි. සොයාල බලන්න. මම මේ කාරණය කිව්වෙ පේෂකර්ම සංස්ථාව ගැන නොවෙයි. වෙනත් එකක් සම්බන්ධ දෙයකුයි මම කිව්වෙ. මම එදා එය පහදා දුන්නා. **හැන්සාඩ්** වාර්තාවෙත් එය සඳහන් වී තිබෙනවා. මම ඒවා නැවත අදින්න යන්නෙ නැහැ. එයින් පේන්නෙ මොකක්ද ? අපට හොරා යම් යම් දේවල් සිදුවෙනවා. අපි මේවා පෙන්නා දුන්නාම සමහර ඇමතිවරුන් වලිච්චි ගාන්න හදනවා. " අපේ නිලධාරීන් එහෙම නැහැ, අපේ අය හරිම පිරිසිදුයි " කියන එක තමයි මෙතැන ආණ්ඩුවේ ඉස්සරහ පෙළේ අය, ඇමති මණ්ඩලයේ හැම දෙනාම කියන්නේ. එහෙම කියන විට අර නිලධාරීන්ට තවත් ධෛර්යය ලැබෙනවා. මේවා පරීක්ෂා කරන්නේ නැහැ. විභාග කරන්නේ නැහැ. මොකක්වත් නැහැ. ඊළඟට තවත් ගහනවා. සමහර දෙනෙකුගේ බිස්නස් එක තමයි මේ ව්‍යාපාරවලට බැඳිලා කරන්නේ.

ණය දීමේ ක්‍රමයක් තිබෙනවා " ඇඩ්වාන්ස් " දෙනවාය කියා අමුද්‍රව්‍ය සපයන්න. මේ " ආඩ්වාන්ස් " දෙන එක අමු බොරුවක්. ඒවාගේම ප්‍රෝඩාවක්. ඉතාම තද බලවත් හොරකමක් ඒ අය කරන්නේ. සමහර විට අවුරුද්දකට නෙමෙයි, අවුරුදු පහළොවකට විස්සකට ඕනැ කරන අමු ද්‍රව්‍යවලට එක වර " ඇඩ්වාන්ස් " දෙනවා. එතකොට එකවර ලක්ෂ විස්සක් තිහක් හතළිහක් පනහක් පමණ එනවා. ඒ ගොල්ල ඒක වෙනත් බැංකුවල තැන්පත් කරනවා. ඒවායෙන් පොළිය ගන්නවා. සමහර විට ඒ ගොල්ලන්ට ඕනැ කරන වෙනත් තැනක " ප්‍රයිවේට් බිස්නස් " එකක යොදනවා ඒ මුදල්. පොළිය ගන්නවා. මෙහාට අමුද්‍රව්‍ය පොඩ්ඩ පොඩ්ඩ එවනවා. වාර්තා ඉල්ලුවාම තව ණය ගැතියි කියනවා. අවුරුදු පතා ණය ගැතිය කියා වාර්තා සපයනවා. මේවා නැති කරන්න අපට ක්‍රමයක් නැද්ද ? මේවා නැති කළේ නැත්නම් කවදාවත් මේ රට හදන්න හම්බ වෙන්නේ නැහැ. අපට පේනවා " පබ්ලික් එකවුන්ට්ස් කොමිටි " එකේ ඉන්න විට කොයි තරම් රජයේ මුදල් අපතේ යනවාද කියා සමහර අය කරන වංචාවලින්. එහෙම නම් කොයි විධියට ගියත් තමුන්නාන්සේලා රට දියුණු කරන්න ගන්න පියවර මේ විධිය නම් ඒ සම්බන්ධයෙන් අපි කණගාටු වෙනවා.

අපි ඉන්දියාව ආදර්ශයට ගන්න ඕනැ. ඉන්දියාවේ රෙදි කර්මාන්තය අද කොයි තරම් දියුණු වෙලාද කිව්වොත් අපි අපේ පොඩි පේෂකර්ම ආයතන ඉන්දියාවෙ කොම්පැණිවලට වික්කා. ඉන්දියාවෙ කොම්පැනිවලට දුන්නා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

අපට කරන්න බැහැ කියල. අපි කොපමණ දුර්වලද ? ඉන්දියාව අල්ලපු රට. ඉන්දියාවෙ කොම්පැනිවලට අපි දෙනව අපට කරන්න බැහැ කියල. අපට පොඩි පාඩුවක් වුණාය කියා ඒ පාඩු මකා ගන්න අපි කොම්පැනිවලට විකුණනවා. ඒක හරි ක්‍රමයක්ද කියන එක මම දන්නෙ නැහැ. [බාධා කිරීමක්] වේයන්ගොඩ මොකද වෙලා තියෙන්නෙ ? කවුද අපේ අයද ඒක කරන්නෙ ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

විකුණල නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙනම් ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

කළමනාකරණය පමණයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒක කිලාම ඇති. කළමනාකරණය බාර දුන්නාය කියන්නෙ ඒ ගොල්ලන්ට පාලනය කරන්නය කියනවා, අපට පාලනය බැහැ කියල.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඒක පොඩ්ඩක්වත් විකුණල නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

පූගොඩ මොකද කරල තියෙන්නෙ ? ඒකෙන් පේන්නෙ මේක හරියට කරන්න අමාත්‍යාංශයට ඕනැකමක් නැති බවයි. මම නැවතත් අමාත්‍යාංශයට කියනවා අත්යන්ත්‍ර—

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The Hon. Minister has to speak.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I will finish in one minute.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Please do not deprive one of your own Members.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am being interrupted.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The hon. Member for Akmeemana is anxious to speak.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am prepared to finish within one or two minutes.

ගාමිණී අතුකෝරල මහතා
(திரு. காமினி அத்துக்கோறல)
(Mr. Gamini Atukorale)

Sir, he is wasting time. There are other speakers here.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am being disturbed.

1977, 1978 ඉඳලාම අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ තත්ත්වය ගැන අපි කිව්වා. ඒක දියුණු වේගෙන ඇවිත් තිබුණා. අන්තිමට රෙදි නිෂ්පාදනය දියුණු වුණාය කියා, නමුත් විකුණන්න ක්‍රමයක් නැහැයි කිව්වා. නමුත් දේශීය වශයෙන් මේවා විකුණන ක්‍රමයක් වෙළඳ පොළේ ඇති කළා නම් අද සමහර විට ලක්ෂ තුනක හතරක සේවක පිරිසක් ජීවත් වෙනවා. ඒ අයට හොඳට ජීවත් වෙන්න තිබුණා. ඔවුන් ඒ දවස්වල "වීවිං මැෂින්ස්" දෙකක් තුනක් දමා එය හතරක් පහක් ආදී වශයෙන් විකෙන් වික වැඩි දියුණු කරගෙන ගිහින් එයින් ජීවත් වුණා. එය රටේ ලොකු බරක් අඩු වීමක්. රැකියා ප්‍රශ්නය අතින් රජයේ බර අඩු වීමක්.

අ. භා. 5

එක අතකින් අපට හිතෙනවා, පේෂ කර්මාන්ත අමාත්‍යාංශයක් තිබෙන්නේ මොකටද කියා. තිබුණු "weaving mills" අස් කළා නම්, අත්-යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්පූර්ණයෙන්ම වසා දැම්මා නම්, බලවේග පේෂ කර්මාන්තය එහෙමපිටින්ම කොම්පැණිවලට වික්කා නම් තවදුරටත් පේෂ කර්මාන්ත අමාත්‍යාංශයක් තබා ගෙන ඉන්නේ ඇයි ? ඒ අමාත්‍යාංශයෙන් කරන්න මොකක්වත් ඉතුරු වී නැහැ. අයවැය ලේඛනය හදන විට "අපේ අමාත්‍යාංශයේ, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවකයන් නඩත්තු කරන්න මේ තරම් මුදලක් ඕනැය" කියන එක විතරයි, එහෙම නම් දැන් ඒ අමාත්‍යාංශයට ඉතුරු වී තිබෙන එකම කටයුත්ත. [බාධා කිරීම්] ඔව්, පාර්ලිමේන්තුවේ වගේ ගෙවන එකයි, තිබෙන්නේ. ඒ නිසා ඒ තරම් පහළ තත්ත්වයට වැටෙන්න එපාය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. තමුන්නාන්සේට යම්-යම් බලතල තිබෙනවා. ඒ නිසා ඒ බලතල පාවිච්චි කරමින් ආණ්ඩුවට බල කරන්න, මෙන්න මේ විධියට වැඩ කරන්න අවස්ථාව දෙන්නය කියා. ඒ විධියට තමුන්නාන්සේට අවංකව ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න බැරි නම් ඔතැන ඉඳලා හරි යන්නේ නැහැ. අයින් වන්න ඕනැ. [බාධා කිරීම්]

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

තමුන්නාන්සේ මේ පැත්තට එන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු ඇමතිතුමා අවංක දේශපාලකයෙක් නම් කවදාවත් ඔහොම ඉන්නේ නැහැ. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා විවෘත ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධ නම් ඒකත් කියන්න ඕනැ. විවෘත ආර්ථිකයයි, දේශීය නිෂ්පාදනයි කියන දෙක එකට යන්නේ නැහැ [බාධා කිරීම්] ඒ විධියට සකස් වෙන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජී. වී. එස්. ද සිල්වා මහතා (හබරාදුව)
(திரு. ஜீ. வீ. எஸ். த சில்வா — ஹபருதுவ)
(Mr. G. V. S. de Silva - Habaraduwa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන පළමුකොටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම කලින් බලාපොරොත්තු වුණේ නැහැ, මේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න. නමුත් අපේ ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, නිලධාරි මණ්ඩලයටත් ස්තුති කරන්න ඕනෑ නිසයි, මම කථා කරන්න අදහස් කළේ.

ගරු ඇමතිතුමාගේ අනුග්‍රහය ඇතිව, අමාත්‍යාංශයේ ලේකම්තුමාගේත්, විශේෂයෙන් පේෂ කර්මාන්ත අධ්‍යක්ෂතුමාගේත් — ඊ. ජී. ටී. ගුණසිංහ මහත්මයාගේ — උපකාරය ඇතිව මගේ ආසනයේ පේෂකර්ම මධ්‍යස්ථාන 3ක් මේ මෑතකදී විවෘත කළා. ඒවා අවුරුදු ගණනාවක් වහල - දමලයි, තිබුණේ. නමුත් ඇමතිතුමාත්, පේෂකර්මාන්ත අධ්‍යක්ෂතුමාත් බොහොම මහන්සි වී ඒවා නැවතත් විවෘත කළ නිසා, දැන් ඉතාමත් ප්‍රයෝජනවත් විධියට ඒවායේ වැඩ කටයුතු කෙරීගෙන යනවා. ඒ නිසා ඒ ගැන මගේ කෘතඥතාව හා ස්තුතියත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) නොයෙක් විවේචන ඉදිරිපත් කළා. නමුත් මම පෙන්වා දෙන්න කැමතියි, එකක්.

I am reading from page 65 of the "performance - January to September 1985" issued by the Ministry of Plan Implementation. The hon. member for Kotmale is going away. I would like him to be here.

"The production of cotton yarn during the quarter under review was 3.13 M.kgs. The target set for the quarter was 2.807 M.kgs. This reflects a performance of 111.38% of target. It is rarely that the target is exceeded particularly in spinning."

It is very creditable. We should congratulate the Hon. Minister and everybody concerned. It is further stated :

"The textile mills of the G.O.B.U. formerly of the NTC are today the market leaders in the manufacture of cotton yarn and cotton fabrics. During the quarter under review these mills have done much better than they did during the corresponding quarter in 1983, 1984 and 1985."

The production figures in respect of the 3rd quarters of 1983, 1984 and 1985 have shown a big increase - a significant increase, which is very creditable.

"During the quarter under review and also the previous two quarters it has become evident that there is an increasing demand of blended yarn at present. The leading manufactures of blended yarn are the United Spinning & Weaving Mills Ltd. and Asian Cotton Mills Ltd. Very limited quantities of blended yarn are manufactured in some of the Govt. owned mills. With a shift in demand for blended fabrics it is very likely that this increasing demand for blended yarn will continue."

I think the Hon. Minister has taken the correct steps and we must congratulate him for that. Although there is a lot of criticism by hon. Members of the Opposition, I think he has done very well.

According to the information supplied in your own book the employment potential is 1707. I suppose it may be much more than that.

The book goes on to say :

"Looking at the overall position the target set for 1985 in actual fabric production is 162.19 M. mtrs. The actual production achieved by the end of the 3rd quarter has been 96.61 M. Mtrs. which is 79.5% of the target."

That is for the first quarter. It is very creditable and the Hon. Minister and officers of his Ministry and department should be congratulated. It states further :

"As mentioned earlier 3rd quarter of an year is normally a slow moving market period for textiles and it is expected that the market will improve in the fourth quarter when nearing the festival season. This will result in the mills stepping up production.

The export earnings in textiles and readymade garments continue to be quite satisfactory in spite of protectionist action by some of the developed importing countries. While the number of pieces exported during the 1st two quarters of the year amounted to 27.12 M. pieces, the export volume during the quarter under review has been 9.04M. pieces. The f.o.b. value of exports during the first two quarters of the year has been Rs. 2,035.58M. During the third quarter the value of exports has been Rs. 700.26M."

The total value of exports up to end of September 1985 has, therefore, been Rs. 2,735.84 million. That too is very creditable and the Hon. Minister should be congratulated.

"New proposals continued to receive approval from the LIAC during the quarter under review."

There are 27 new projects under the LIAC. In addition, it is stated thus :

"The Textile Training & Services Centre and the Clothing Industry Training Institute in Ratmalana are now in full operation. The services rendered by these two Institutes to the textile industry and the export oriented garment industry respectively are being highly appreciated by the private sector. Donor agencies also have expressed their satisfaction. The activities of both these institutes will gather further momentum as time proceeds."

With these few words I must congratulate the Hon. Minister, the hon. Deputy Minister and all other officers, especially the Secretary and the Director.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member for Akmeemana can speak for 6 minutes because the Hon. Minister has to reply.

රිචඩ් පතිරණ මහතා (අක්මීමන)
(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)
(Mr. Richard Pathirana - Akmeemana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ගරු ඇමතිතුමාගේත් නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්නේ රෙදි මිල සම්බන්ධවයි. මම කථා කරන්නේ අංශ කීපයක රෙදි ගැන පමණයි. විශේෂයෙන්ම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පාවිච්චියට අවශ්‍ය රෙදි සහ සාමාන්‍ය ජනතාව නිතර පාවිච්චියට ගන්නා රෙදිවල මිල හැකි තරම් අඩු කරන හැටියට මම ඉල්ලනවා. අතික් රෙදිවල මිල තරමක් වැඩිවුණාට කමක් නැහැ. මිල වැඩි සමහර රෙදි වර්ග තිබෙනවා. මුදල් තිබෙන අයට ඒවා පාවිච්චි කරන්නට පුළුවන්. නමුත් දුප්පත් දෙමව්පියන්ගේ පාසල් යන දරුවන්ට හා සාමාන්‍ය පන්තියේ සේවකයින්ට අවශ්‍ය කරන රෙදිවල මිල හැකි තරම් අඩු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නට කැමතියි.

තවත් කරුණක් කියන්නට ඕනෑ. මෙය ගරු ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා විවේචනය කිරීමක් නොවෙයි. මේ රජය බලයට පත්වුණාට පසුව මේ අංශය වැරදි ප්‍රතිපත්තියක් අනුගමනය කළා. සීමාරහිතව පිටරට රෙදි මේ රටට ගෙන්වීමට පටන් ගත්තා. ඒ නිසා මේ රටේ දේශීය කර්මාන්තවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

හානියක් සිදුවුණා. එය රෙදි අංශයෙන් පමණක් නොවෙයි, අනික් සෑම අංශයකින්මත් ඒ ආකාරයෙන් සිදුවුණා. මේ විවෘත වෙළඳ ප්‍රතිපත්තිය යටතේ. පසුව තමුන්නාන්සේලා රෙදි ආනයනය කිරීම නතර කළා. නමුත් අද සිදු වන්නේ කුමක්ද ? ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවෙන්ම කී පරිදි පුදුමාකාර අන්දමින් හොර රෙදි ජාවාරම මේ රටේ තිබෙනවා. පුදුමාකාර විධියට පිටරට රෙදි හොරෙන් ආනයනය කරනවා. මෙය නැවැත්තුවේ නැත්තම් මොන ආකාරයකින්වත් දේශීය රෙදි කර්මාන්තය දියුණු කරන්නට පුළුවන්කමක් නැහැ. එමනිසා අද අවශ්‍යව තිබෙන මූලික දෙය නම් පිටරටින් හොරෙන් රෙදි ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නතර කිරීමයි. එසේ නොවුණොත් මේ රටේ දේශීය රෙදි කර්මාන්තයේ වර්ධනයක් ඇති කර ගැනීම ඉතාමත්ම අමාරු වෙනවා.

අනික් කරුණ මෙයයි. අත්යන්ත්‍ර පේෂකාර්මිකයින්ගේ තත්ත්වය ගැන මම කියන්නට කැමතියි. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත මධ්‍යස්ථාන රාශියක් වසා දමන්නට සිදුවුණා. පිටරට රෙදි ආනයනය කරන විට අනිවාර්යයෙන්ම එය සිදු වෙනවා. මේ රටේ ජනතාව ලංකාවේ නිෂ්පාදනය කරන දේට වඩා බොහොම කැමැතියි, පිටරට දේවලට. බොහෝ විට එය සාමාන්‍ය ආකල්පයක් හැටියට තිබෙනවා. එම නිසා පිටරට රෙදි මේ රටට ගෙන්වූවිට දේශීය කර්මාන්තයට නැත්නම් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථානවලට සැහෙන පහරක් වදිනවා. වසා තිබෙන අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන නැවත විවෘත කිරීමේ ප්‍රතිපත්තියක් දැන් තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශය මගින් අනුගමනය කරනවා. එය ඉතාම වැඩදායක පියවරක්. නමුත් ඒ මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කළ යුත්තේ හොඳ වර්ගයේ රෙදියි.

බාල රෙදි නිෂ්පාදනය වුණොත් ඒවා මිළ දී ගන්නට ජනතාව කැමැති වන්නේ නැහැ. ඒ නිසා මේ විවෘත කරනු ලබන මධ්‍යස්ථානවල කටයුතු මැනවින් පරිපාලනය කිරීම අවශ්‍යයි. මේවායේ නිෂ්පාදනය කළොත් බාල වර්ගයේ රෙදි, මේ රටේ ජනතාව කැමති නැහැ ඒවා අඳින්න. බලෙන් තමයි ඒවා විකුණන්න වෙන්නෙ. එමනිසා මේ අත් යන්ත්‍ර මධ්‍යස්ථානවලින් හොඳ රෙදි නිෂ්පාදනය කරන්න කටයුතු යොදන්න ඕනෑ. විවිධ මත පළවුණා පූගොඩ, වේයන්ගොඩ, තුල්හිරිය ආදී ඒ පේෂ කර්ම කම්හල්වල කළමනාකරණය ඉන්දියානු සමූහගම්වලට පැවරීම ගැන. ප්‍රතිපත්තියක් හැටියට මටත් කියන්න තිබෙන්නේ අපි මේ කාරණයට විරුද්ධයි කියන එකයි. මන්ද මේ රටේ අයට මේ කළමනාකරණ දක්ෂතා ලබාදීම අමාත්‍යාංශය මගින් ඉතා ඉක්මනින් කරන්නට ඕනෑ. මේ කම්හල් අපේ රටේම පිරිස් විසින් කළමනාකරණය කර ඒවා ලාභදායී තත්ත්වයෙන් පවත්වාගෙන යන්නට කටයුතු යොදන්නට ඕනෑ. මන්ද, අපට දැනගන්නට තිබෙනවා, මගේ ළඟ හරියටම සංඛ්‍යා ලේඛන නැහැ, දැන් හුඟක් ඒවායින් ලාභ ලැබෙනවා කියා.

එහෙම නම් , එයින් පෙනෙන්නේ මොකක්ද ? ඉන්දියානු සමාගම් ඇවිල්ලා කළමනාකරණය පටන් ගත්තාට පසුව ලාභ ලැබෙනවා නම් හොඳ කළමනාකරණයක් තිබෙනවා නම් අපටත් මේවා ලාභදායීව පවත්වාගෙන යන්නට තිබුණා. ඒකයි ඒකෙ තර්කය. එම නිසා අපි ඉල්ලන්නේ දේශීය අයට මේ කළමනාකරණ පුහුණුව දී ඒ අය ලවා මේ කම්හල් පාලනය කරන්නට වැඩ කටයුතු සකස් කරන්නට කියන එකයි.

මම දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා බටගන්විල හා ඇත්තිලිගොඩ බලවේග පේෂ කම්හල් සම්බන්ධයෙන් මගේ ඉල්ලීම් කිහිපයක් තිබුණා. එය ඉතාමත්ම සාර්ථකව එතුමා මට ඉෂ්ට කර දී තිබෙනවා. ඒ වාගේම අක්මීමන ආසනයේ තිබෙන තමුන්නාන්සේගේ ඉල්ලීමක් පරිදි, දැන්වීමක් පරිදි, අපි විමධ්‍යගත අයවැයෙන් වියදම් කර ප්‍රතිසංස්කරණය කර තිබෙන අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 3 ඉතා ඉක්මණින් විවෘත කරන්න කටයුතු කරන හැටියට ඉල්ලමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

එස්. බී. විජේකෝන් මහතා (මින්නේරිය)
(திரு. எஸ். பி. விஜேகோன் — மின்னேரியா)
(Mr. S. B. Wijekoon – Minneriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩි දෙකක් පමණ කථා කිරීමට අවසර දෙන්න. විශේෂයෙන් එක කාරණයක් ගැන පමණයි මම කථා කරන්නේ. ඊට ප්‍රථමයෙන් මම මතක් කරන්නට ඕනෑ පේෂ කර්ම අමාත්‍යාංශය යටතේ සැහෙන සේවයක් සිදුවෙන බව. ඒ වාගේම වර්තමාන රජය යටතේ පසුගිය අවුරුදු කිහිපය තුළ විශාල දියුණුවක් පේෂකර්ම අමාත්‍යාංශය යටතේ සිදුවී තිබෙන බව මම මතක් කරන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ලොකු වෙහෙසක් අරගෙන මේ සංවර්ධනය ඇති කරන්නට කටයුතු කර තිබෙන බව මතක් කරන අතර මගේ ආසනයේ ප්‍රශ්නයක් ගැන පමණක් මම කථා කරන්නට බලාපොරොත්තු වෙනවා.

අ. භා.5.15

මින්නේරියේ ආසනයේ තිබෙනවා ජාතික පේෂකර්ම සංස්ථාවට අයත් නූල් කැටීමේ විශාල කර්මාන්ත ආයතනයක්. මේ ආයතනය වසා දැනට අවුරුදු දෙකක් පමණ ගත වී තිබෙනවා. මම පසුගිය වර්ෂයේත් මේ සම්බන්ධයෙන් මතක් කළා ගරු ඇමතිතුමාට. ඒ වාගේම වරින් වර මම කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නමුත් අද දක්වා එය විවෘත කර නැහැ. එය විශාල මුදලක් වියදම් කර හැදූ කර්මාන්ත ආයතනයක්. රුපියල් කෝටි ගණනක් වැය කර තිබෙනවා. නමුත් අද වසා දමා තිබෙන නිසා මේ ආයතනයේ ප්‍රශ්න දෙකක් මතුවී තිබෙනවා. එකක් සේවක ප්‍රශ්නය. අනෙක මේ යන්ත්‍ර සූත්‍රවලට වෙන විනාශය. රුපියල් කෝටි ගණනක් වටිනා යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණයක් මෙහි තිබෙනවා. ඒවා දිනෙන් දිනම විනාශයට පත් වෙනවා. අපට දැනගන්නට ලැබී තිබෙන විධියට ඒ යන්ත්‍ර සූත්‍රවල හුඟක් කොටස් ඒ ස්ථානයෙන් ඉවත් වෙලා. ඒ වාගේම ඒවා හුඟක් මළ බැඳී විනාශ වෙන තත්ත්වයකට පත්වී තිබෙනවා. එමනිසා මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය නැවතත් යොමු කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

මෙම කර්මාන්තශාලාවේ 850ක් පමණ සේවකයින් සිටිනවා. දැන් අවුරුදු දෙකක් පමණම ඔවුන්ට ලැබී තිබෙන්නේ පඩි බාගයයි. එයත් සමහරවිට අඩුවෙන අවස්ථා තිබෙනවා. මම නිසා එක්කෝ මේ සේවකයින්ට වන්දි මුදලක් ලබාදී මේ කර්මාන්තශාලාව සම්පූර්ණයෙන් වසා දමන්න. එහෙම නැත්තම් එය නැවත විවෘත කොට ක්‍රියාත්මක කිරීමට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. විශේෂයෙන්ම මෙය දී තිබෙන්නේ විදේශීය සමාගමකටයි. මෙසේ වසා දැමීමට හේතු වශයෙන් දක්වන්නේ එම ප්‍රදේශයෙන් බඳවා ගන්නා ලද සේවක පිරිස කුඹුරු වැඩකරන කාලයට වැඩට එන්නේ නැත කියන හේතුව උඩයි. නමුත් ඒ හේතුව මම නම් පිළිගන්නේ නැහැ. මොකද ? සේවකයන් සේවයට පැමිණීම පිළිබඳ විනය නීතිරීති මාලාවක් තිබෙනවා. ඒ අනුව පරිපාලනය ගෙනයනවා නම්, කළමනාකරණය කරනවා නම්, එයින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා. එම නිසා සේවකයන් පැමිණෙන්නේ නැත කියන හේතුව පිළිගන්නට මම සූදානම් නැහැ. එවැනි තත්ත්වයක් තිබෙනවා නම්, අපට පුළුවන්කමක් තිබෙනවා, සේවයට හරියාකාරව පැමිණෙන්නට පුළුවන් සේවක පිරිස් එම ප්‍රදේශයෙන් බඳවා දෙන්නට. එම නිසා, මේ කම්හල නැවත විවෘත කරනවා නම්, පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් මම සූදානම්, කිසිදු අන්දමක ප්‍රමාදයක් ඇති නොවන අන්දමට කම්හල පවත්වාගෙන යන්නට අවශ්‍ය සේවකයන් එම ප්‍රදේශවලින්ම ලබාදෙන්නට. එම නිසා මෙසේ වසා තැබීම ජාතික අපරාධයක්. එම නිසා මින්නේරියේ පෙහෙකම්හල හැකිතරම් ඉක්මණින් විවෘත කිරීම හෝ සේවකයන්ට වන්දි මුදල් ගෙවා වසා දැමීම හෝ මේ දෙකින් එකක් කිරීමට කටයුතු යොදන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව සලසාදීම ගැන තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය පේෂකර්මාන්ත ඇමතිතුමා)
(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடவைத்தொழில் பிரதி அமைச்சர்)
(Mr. R. M. Dharmadasa Banda – Deputy Minister of Textile Industries)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේෂ කර්මාන්ත අමාත්‍යාශයේ වැය ශීර්ෂය යටතේ ගරු මන්ත්‍රීවරුන් රාශියක්ම කථා කළා. වැදගත් අදහස් කීපයක්ම මතු කළා. ඒ ගැන ඒ ගරු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා. නමුත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කළ කථා අහගෙන ඉන්නවිට, අර අන්ධයන් කීපදෙනෙක් අලියා අත ගා කී දේවල් ගැන කියන ඒ පරණ කතන්දරය මට මතක් වුණා. අලියාගේ කකුල අත ගා බැලූ එක් අන්ධයෙක් ඒක වංගෙඩියක් වාගෙයි කිව්වා. අලියාගේ හොඩවැල, කණ ආදී කොටස් අත ගා බැලූ අන්ධයෝ යම් යම් දේවල් වාගේ යයි කිව්වා. අද විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් අපට චෝදනා නැගුවේ අර අන්ධයන් අලියා අත ගා බැලුවා වාගෙයි. ඒ මන්ත්‍රීවරුන් දන්නේ නැහැ, මොන මොන ක්ෂේත්‍රයට අයත් කර්තව්‍යයන් අපේ අමාත්‍යාංශයෙන් කෙරෙනවාද යන වග. එසේ නොදන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොයෙක් ආකාරයෙන් අපට දෝෂාරෝපණය කරනු ලබුවා. නිදහස් වෙළඳ කලාපයේ නොයෙක් කර්මාන්තශාලාවල සේවකයන්ට ගෙවන පඩි ගැන, කර්මාන්තශාලාවල මැෂින් ගැලවීම ගැන, ඒවා වැසීම ගැන අපේ අමාත්‍යාංශයට දෝෂාරෝපණය කරනවා. නමුත් නිදහස් වෙළඳ කලාපයේ පරිපාලනය අපට නැති බව ඒ මන්ත්‍රීතුමන්ලාට කරුණාවෙන් කියන්නට කැමතියි. ඒ අය තමන්ගේ ෆැක්ටරි ඇර තැබුවත්, වසා තැබුවත් එකයි. ඒවායේ පරිපාලනය සම්බන්ධයෙන් අපට කිසිවක් කරන්නට බැහැ.

ඊලඟට, ඇමරිකානු ජනතාව අපේ ඇඟලුම් කර්මාන්තයට යම් යම් තහංචි දමාගෙන එන විට ඒ ගැනත් දෙස් කියන්නේ අපටයි. ඒ ගැන මොකක්වත් කරන්නේ නැතුව නිකම් ඉන්නා බව අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අපට කියනවා. නමුත් අපේ ඇඟලුම් කර්මාන්ත කරුවන් හෝ කර්මාන්ත ශාලා මඟින් කරන අපනයනවලට දැනට ලැබෙන පහසුකම් වැඩි කර ගැනීමට අපේ අමාත්‍යාංශයෙන් ගන්නට පුළුවන් උපරිම මහන්සිය ගෙන තිබෙන බව ඒ මන්ත්‍රීතුමා නොදන්නවා ඇති. එතුමා ඒ සමගම කිව්වා, අපනයන ප්‍රමාණය අඩු කරනවාය කියා. ඇත්තෙන්ම අඩු කිරීමක් නොවෙයි, සිදු වී තිබෙන්නේ. එක තැනෙක නැවතී තිබීමක් පමණයි. එකෙන් සුළු පාඩුවක් විඳින්නට සිදු වුණු බව ඇත්ත. නමුත් ඇමරිකාවෙන් වන දේවලටත් අපේ අමාත්‍යාංශයට එතුමා දෙස් පවරනවා. එසේ දෙස් පැවරීම ගැන මම කනගාටු වෙනවා. කෙසේ වුණත් අප පුළුවන් තරම් මහන්සි වෙනවා, එම අඩුපාඩුකම් සකස් කර ගන්නට.

කපු මිල ගණන් ගැන සඳහන් කරමින් ලෝක වෙළඳපොලෙනුත්, වෙනත් රටවලිනුත් කපු මිලදී ගන්නවා මිස ඊජිප්තුව, ඇමරිකාව වාගේ රටවලින් කපු මිලදී නොගැනීම ගැන අපට දෙස් නැගුවා. ඒ සමගම කපු මිලදී ගැනීමේ ආයතනවල නොයෙක් නොයෙක් "රැකට්" සිදුවන බවක් ගැනත් එතුමා කිව්වා. එහෙම දෙයක් සිදු වනවා නම්, එතුමාට ඇමතිතුමා නිතර හමුවන නිසා ඒ ගැන පෙන්වා දෙන්නට තිබුණා. මේවා ගැන අපට මතක් කරන්නට වෙනත් ස්ථාන තිබෙනවා. නමුත් මා නම් දන්නේ නැහැ එවැනි "රැකට්" වන බවක් ගැන. නමුත් එතුමාගේ දැනගැනීම සඳහා මම කියන්නට කැමතියි, ලෝක වෙළඳපොලේ කපු මිල ගණන් පිළිබඳව වාර්තා පොතක් මසකට වරක් නිකුත් කරන බව. එම මිලගණන් අනුව අපේ කර්මාන්තවලට කපු ගෙන්වන්වාද කියා අපි නිතර දෙවේලේ බලනවා. අපි කියන්නට සන්තෝෂයි, කවදාවත් එහි සඳහන් මිලට වැඩි මිලකට කපු ගෙන්වා ගෙන නැති බව. ලෝක වෙළඳපොළ යයි කීවාම එක් එක් රටවලට අනුබද්ධිත නොයෙක් මිල ගණන් තිබෙනවා. විශේෂයෙන් ඊජිප්තුවේ නිෂ්පාදනය කරන කපු අපේ රටට ගෙන්නවා ගන්නට ගියොත් දැන් ගෙවන මිලට වඩා තුන් ගුණයක් ගෙවන්නට වෙනවා. එහෙම කළොත්, එරටින් කපු ගෙන්වා, රෙදිමිල වැඩි කළාය කියා අපට තවත් බනීවි. දැන් අපිට බනිනවා ඒ රටවලින් කපු ගෙන්වන්නට ක්‍රියා කලේ නැතැයි කියා. නමුත් ගෙන්වා ගන්නට ගියාම මුහුණ පාන්නට වෙන්නේ තවත් ප්‍රශ්නයකට.

දැනට අපට වුවමනා කරන මාතයේ නූල් නිෂ්පාදනය කර ගැනීම සඳහා අපි කපු ලබා ගන්නේ, ඉතාම පහසු තැන්වලින්. විශේෂයෙන්ම ආසියාකරයේ, ඉන්දියාව, පකිස්ථානය වාගේ රටවලින් දැනට අපි කපු ගෙන්වා ගන්නවා. වෙනත් රටවලින් කපු මිලදී නොගන්නා බවට අපට දෙස් කිව්වත්, පහසු මිලට ගන්නට ඇති තැන් අපි සොයා ගෙන යනවා. හෙට-අනිද්ද වන විට චීනයෙන් කපු මිලදී ගැනීමට අප දැන් සාකච්ඡා කර ගෙන යනවා. යම් විධියකින් චීනයෙන් කපු ලබා ගැනීම අප රටට වාසිදායක වුණොත් අපි ඒ රටින් කපු ලබා ගන්නවා. නමුත් අපට බැහැ, ඒ කියන විධියට ඊජිප්තුවේ නිෂ්පාදනය කරන කපු ගන්න. ඒ කපු ඉතාමත් මිල වැඩියි. ඒ කපුවල මිල අපි දැන් ගන්න මිල වාගේ තුන් ගුණයක් වෙනවා. ඒකටත් බණින්නේ අපටයි.

කර්මාන්තශාලාවල, විශේෂයෙන් නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්ශාලාවල නිතර දෙවේලේ විදුලිබලය ඇණ හිටිනවාය කියලත් අපට බණිනවා. එයට අපේ අමාත්‍යාංශයෙන් මොනවා කරන්නද ? ඒවාට මොකවත් කර් නැහැ කියා අපට බනිනවා. අපේ අමාත්‍යාංශයට අයිති කර්මාන්ත ශාලාවක මොනවා හරි වුණත්, එහි තිබෙන වයර් නරක්වෙලා තිබෙනවා කිව්වොත් ඒ ගැන බලන්න පුළුවන්. නමුත් විදුලි බල මණ්ඩලයේ දෝෂයක් තිබෙනවා නම් අපි ඒවාට මොනවා කරන්නද ? මේ තත්ත්වය අපේ කර්මාන්තශාලාවලට පමණක් නොව මුළු රටටම සිදුවන දෙයක්, ඒකයි මම කිව්වේ, අර අලියා අල්ලාගෙන ·කණ්නු රැළක් කිසි තේරුමක් නැතිව නොයෙක් දේවල් කථා කරනවා වාගේ තමයි මේක විවේචනය කිරීමත් කියලා. රේගුවෙන් අල්ලන ඒවාටත් අපට බනිනවා. රේගුවේ රාජකාරි කරන්න ඕනෑ, රේගුව. රේගුවෙන් නිදහස් කරනවලු, රේගුවෙන් වෙන්දේසි කරනවලු, රේගුවෙන් ආපහු බඩු පිටරට යවනවලු කියා අපට කියනවා. රේගුවට නිදහස තිබෙනවා, රේගුවට කරන්න පුළුවන් දේවල් කරන්න. මේරටට හොරෙන් ගෙනන දේවල් රේගුවෙන් අල්ලා නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපි එයට එපාය කියන්නේ නැහැ. අපි කියන්නේ මීට වඩා වැඩියෙන් රේගුවට නීතිය ක්‍රියාත්මක කරන්න කියලයි. අපේ කර්මාන්තශාලා ආරක්ෂා කර ගැනීම සඳහා මීට වඩා දැඩි පියවර රේගුවට ගන්න කියලයි, අපි කියන්නේ. නමුත් රේගුව කරන වැඩවලට අපට දෙස් කියා හරියන්නේ නැහැ.

මිනිස්සු හොරෙන් රෙදි ගෙනාවත් අපට බනිනවා. අපි කවුරුත් දන්නවා, මෙරටට හොරෙන් රෙදි ගේන බව. මීට පෙරත් කිව්වා, ඔය කියන තරම් විශාල ප්‍රමාණයක් හොරෙන් රෙදි මෙරටට එන්නේ නැහැ කියා. අපි අමතක කරන්න හොඳ නැහැ, අපේ ලාංකිකයින් විශාල ප්‍රමාණයක් පිටරට සිටින බව. ඒ අය සැමදම පාර්සල් මෙරටට එවනවා. මේ රටේ සිටින තමන්ගේ නෝනට, මහත්මයාට අම්මලාට තාත්තලාට, දරුවන්ට, නෑදෑයින්ට, නැන්දම්මලාට, මාමාලාට ඒ අය රෙදි එවනවා. මේ අයගේ උපන්දිනවලට රෙදි එවනවා. එක්කෙනෙකුට රෙදි යාර 12ක් ගෙවන්න පුළුවන්. එවිට ලක්ෂයක් පිටරට ඉන්නවා නම් එක පුද්ගලයෙක් පාර්සල් 10 බැගින් එක අවුරුද්දකට මෙරටට එව්වොත් රෙදි යාර කීයක් මෙරටට එනවද ? එම රෙදි එන්නේ හොරෙන් නොවෙයි. නීතිය අනුව ඒවා ගෙන එන්න පුළුවන්. ඒ වාගේම පිටරට සිටින අය මෙරටට එනවිට අවුරුද්දකට සැරයක් කිලෝ 20 බැගින් ගෙන එන්න පුළුවන්. ඒ අය මොනවා ගෙන්වද කියන්න මා දන්නේ නැහැ. නමුත් ඒවායේ ගෙනෙන්නෙත් රෙදි. යම්කිසි සීමාවක් තුළ නීත්‍යානුකූලව ඒ අයට ඒ රෙදි ගෙන එන්න පුළුවන්. ඒ රෙදි හොර රෙදිය කියන්න බැහැ. නමුත් එක්තරා ප්‍රමාණයකින් හොර රෙදි මෙරටට එන බව රහසක් නොවෙයි. මුදල් ඇමතිතුමා එය පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. ඒ හොර රෙදිත් රේගුවෙන් අල්ලනවා. මේ හොර රෙදි මෙරටට ගෙන ඊම සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයට දෙස් කීම සාධාරණයි කියා මම හිතන්නේ නැහැ.

ඇඟලුම් කර්මාන්තශාලාවල පඩි මදියි කියලත් බනිනවා. පඩි පාලනය කරන්න නොවෙයි අපේ අමාත්‍යාංශය තිබෙන්නේ. ඒ සඳහා කම්කරු ඇමතිතුමා ඉන්නවා. මා දන්නවා, කම්කරු අමාත්‍යාංශයෙන් පඩි නියම කර මාස් පතා ගැසට් එක මඟින් නිවේදනය කරනවා. ඒ සැම පඩියක්ම ඒ අයට ගෙනවා. මම පිළිගන්නවා, පඩි මදියි කියා. නමුත් අපට කරන්න දෙයක් නැහැ. සමහර තැන්වල පුහුණුවන්නන්ට රුපියල් 22 ක් ගෙවනවා. සමහර තැන්වල රුපියල් 17 ක් ගෙවනවා. ඒ ප්‍රමාණය බොහෝම අඩුයි. ඒ පඩිය මදි බව අපි පිළිගන්නවා. මේ කාලයේදී ඊට වඩා පඩියක් ගෙවන්න ඕනෑ. නමුත් ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපට ඇවිත් කියනවා, පඩි වැඩි කලේ නැහැ කියලා. නමුත් ඇඟලුම් කර්මාන්තවල ගෙවන පඩි පාලනය කිරීමට පේෂ කර්මාන්ත අමාත්‍යාංශයට කිසිම බලයක් නැහැ. එය අපට අයිති දෙයක් නොවෙයි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා, ජයේ - පෙරේද එතුමා නවලෝක පෞද්ගලික ආරෝග්‍යශාලාවට ගිය බවත්, එහි ඇඳන්වලට දමා තිබුණේ එන්ගලන්තයෙන්ද කොහෙන්ද ගෙන්වා තිබුණු පිටරට බෙඩ්ෂීට් වගයක් බවත්. ඉතින් දෙයියනේ ඒවාට අපි මොනවා කරන්නද ? නවලෝක ව්‍යාපාරය අයිතිකාරයාට අපි ගිහින් කියන්නද, මේවා ගෙන්වන්න එපා කියලා. අපි මේවා තහනම් කරන්නද ? අපිත් මෙහි බෙඩ්ෂීට්, දෙර රෙදි නිෂ්පාදනය කරනවා. අපිත් ලස්සන ඒවා නිෂ්පාදනය කරනවා. ඇමතිතුමා කිව්වා, එහි ජනේල රෙදි තිබුණා. ඒ රෙදි වේයන්ගොඩ නිෂ්පාදනය කළ රෙදි කියලා. මේ මන්ත්‍රීතුමා කියනවා ඔය වෙන්න පුළුවන් කියලා. නමුත් මේ මන්ත්‍රීතුමාම කියා තිබෙනවා එහි තිබුණු බෙඩ්ෂීට් පිටරට ඒවා කියලා. නවලෝක අයිතිකාරයාට, ඒ ආරෝග්‍යශාලාවේ පාලක මණ්ඩලයට වුවමනා නම් පුළුවන් පිටරට රෙදි දමා ගන්න ඒකට මේ අමාත්‍යාංශයට බැණලා හරියනවාද ? හෝටල්වල තිබෙන මේස රෙදි, අතපිස්නා පිටරට ඒවාය කිව්වා. එවාගේම ඒ අයගේ කාලයේදී හෝටල්වල තිබුණේ දේශීය රෙදිලු. ඒවායේ දේශීය රෙදි තිබීමේ විපාකය වශයෙන් තමයි, 1977 වනවිට නිෂ්පාදනය කළ රෙදිවලින් රෙදි යාර 41 ලක්ෂයක් විකුණාගන්න බැරිව ගොඩගසා තිබුණේ. එයින්ම පෙනෙවා,හෝටල්වල තිබුණු මේස රෙදි කොහේ ඒවාද කියා. ඒ කාලයේදී හෝටල් සඳහා එකරෙදි කැබැල්ලක් නිෂ්පාදනය කර තිබුණේ නැහැ. නමුත් ඒ අය රෙදි ගෙන්වීම තහනම් කර තිබුණා. දැන් තහනමක් නැහැ. නමුත් හෝටල් විශාල ප්‍රමාණයක දැන් සැපයුම් කරන්නේ දේශීය නිෂ්පාදකයන්ය කියන ඒක මම ආඩම්බරයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා]

කියනවා. එතුමා ගිය හෝටලය මොකක්ද කියන්න මම දන්නේ නැහැ — කියනවා නම් මටත් ගිහින් බලන්න පුළුවන්. සමහරවිට එතුමා ගිය හෝටලයේ නැතිවා වෙන්න ඇති. නමුත් හුඟක් හෝටල්වල ලංකාවේ ඇඳරෙදි, මේසරෙදි අතපිස්නා ආදියයි පාවිච්චි කරන්නේ. නමුත් ඒකටත් අපට බනිනවා. ඒ උදවිය මොනවා හෝ පිටරට ඒවා පාවිච්චි කරනවාය කියා බණින්නේ අපටයි. පාර්ලිමේන්තුවේදී අපට බණින විධියට ඒ හෝටලයේදීත් බැන්නාද කියන්න මම දන්නේ නැහැ.

ඊළඟට දැන් මහවැලියේ කපු වගා කරන්නට යනවාය කියා. පොඩ්ඩක් කියාගෙන ගිහින් නැවැත්තුවා. ඉතින් ඒකටත් අපට බණිනවා. කපු ගෙනෙන එකටත් බණිනවා. කපු වගාකරන එකටත් බණිනවා. මහවැලියේ කපු වගා කරන එකටත් බණිනවා. මම හැබැයි මම ඒ උදවිය කන්නු යයි කියන්නේ නැහැ. ඒ උදවියගේ ඇස් පෙනෙන්නේ නැහැයි කියන්නේ නැහැ. නමුත් මට මේ වෙලාවේදී අර කන්නු කීප දෙනෙක් අලියෙක් අල්ලාගෙන කිව්ව කතන්දරය මතක් වුණා. මොකද ? මේ තේරුමක් නැතිව, මේ අමාත්‍යාංශයෙන් කෙරෙන්නේ මොකක්ද කියන එක දන්නේ නැතිව ඔහේ නිකම් මේ ගරු සභාවට ඇවිදින් දෙඩවනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මහතා) අපට දොස් කිව්වා. ඉන්දියාවේ බංකොලොත් වුණ කොම්පැණි අපි මේ රටට ගෙනාවාය කියා එක පැත්තකින් කියනවා. ඒ උදවිය මෙහේ ඇවිදින් බොහොම හොඳ තත්ත්වයේ රෙද්දක් දැන් නිෂ්පාදනය කරනවාය, ඒවාගේම ඒ කර්මාන්තශාලා දැන් ලාභයට දුවවනවාය කියන එකත් එතුමා පිළිගත්තා. මේ අමාත්‍යාංශයට භාරදී තිබෙන කර්තව්‍යය මොකක්ද ? ඒ කාලයේ තිබුණු රෙදි මොනවාද කියා අර මන්ත්‍රීතුමෙක් කිව්වා. ඒ රෙදි වෙනුවට අපට හොඳ රෙද්දක් නිෂ්පාදනය කරන්න කිව්වා. අපි ඒක ලංකාවෙ ඇතුළත තිබෙන කොම්පැණිවලට භාරදී බැලුවා. ඒ උදවිය අසාර්ථකයි. මම ඒ උදවියට දොස් කියනවා නොවෙයි. ඊට පසුව ඇමතිතුමා පුද්ගලිකව සාකච්ඡා කර, හොඳ නමක් තිබෙන සමාගම් කීපයකට මේක භාර දුන්නා. ඉන්දියාවේ ඒ උදවිය බංකොලොත්ය කියා ඒ මන්ත්‍රීතුමා කිව්වා. ඉන්දියාවේ ඒ උදවිය බංකොලොත් නැහැයි කියා මම කියනවා. එහෙම යුගයක් ඉන්දියාවේ තිබුණා. රෙදි කර්මාන්ත ශාලා 110 ක් පමණ බංකොලොත් වුණා. නමුත් ඒවායින් 75 ක් පමණ දැන් නැවතත් පුනරුත්ථාපනය කරලයි තිබෙන්නේ. දැන් බංකොලොත් නැහැ.

විශේෂයෙන් දැන් අපේ රටේ කර්මාන්තශාලා භාරදී තිබෙන එක සමාගමක්වත් ඉන්දියාවේ බංකොලොත් සමාගම් නොවෙයි. මතුගම ගරු මන්ත්‍රීතුමාට කොහෙන් ඒ ආරංචිය ලැබුණාද කියන්න මම දන්නේ නැහැ. අපට ඕනෑ කර තිබුණේ හොඳ රෙද්දක් නිෂ්පාදනය කරන එකයි. මේ රටේ ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ. මේ ආණ්ඩුව බලයට පත් කරන විට බලාපොරොත්තු වුණේ හොඳ තත්ත්වයෙකින් නිෂ්පාදනය වුණ රෙද්දක් අඳින්නයි ; තමන්ට ඕනෑ කරන ප්‍රමාණයක් ගන්න, තමන්ට ඕනෑ කරන දෙයක් තෝරා ගන්න ඉඩ සලස්වා ගන්නයි. අපි ඒ ටික කර තිබෙනවා. අපි පොරොන්දු වුණදේ කර තිබෙනවා. ඉතින් ඒක කර ගන්න නමයි, අපි මේ කණ්ඩායම ගෙනාවේ. අපට තාක්ෂණික ඥණය ඕනෑ කර තිබුණා. පරිපාලන ක්‍රම ඕනෑකර තිබුණා. ඒ ඔක්කොම දැන් හොඳට තිබෙනවා.

ගරු ඇමතිතුමා කලින් ඉදිරිපත් කළ කරුණු අනුව අපි මේ කර්මාන්ත ශාලා ඒ උදවියට භාර දෙන විට එක්කෙනෙකුගේ පඩිය තිබුණේ දළ වශයෙන් රුපියල් 600 යි. තුල්හිරිය, පූගොඩ, මත්තෙගම වේයන්ගොඩ මේ හැම එකකම එහෙමයි.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
නියෝජ්‍ය ඇමතිතුමා කාටද මේවා කියන්නේ ?

ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා
(திரு. ஆர். எம். தர்மதாச பண்டா)
(Mr. R. M. Dharmadasa Banda)
ඒක තමයි, විරුද්ධ පාර්ශ්වයේ කවුරුවත් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අද ඒ සැම කර්මාන්ත ශාලාවකම සේවකයෙකුටම රුපියල් 1,700 කට වඩා ලබා ගන්නට පුළුවන්. ඒ විධියට පඩි වැඩි වී තිබෙනවා. ඒ කම්කරුවන් — අපේ සේවකයන් — දැන් ආශාවෙන් වැඩ කරනවා. පාලනය හොඳයි. ලාභ ලබනවා. ඇමතිතුමා කී පරිදි මේ අවුරුද්දේ මුල් මාස 9 තුළදී පූගොඩ කම්හලෙන් පමණක් රුපියල් ලක්ෂ 250 ක — Rs. 25 Million — ලාභයක් ලබා තිබෙනවා.

දැන් කවුරු කොතැනට ගියත් කථා කරන්නේ මොකක්ද ? අපේ මේ නිෂ්පාදන හොඳයි. අපි හොඳ රෙදි නිෂ්පාදනය කරනවාය කියලයි. ඒකයි අපට භාරදුන් වැඩේ. ඇමතිතුමාට භාර දුන්නේ ඒකයි. ඇමතිතුමා එය කර තිබෙනවා. ඉන්දියානුවන්ට භාර දුන්නාය කියා දැන් මේ ගරු සභාවට ඇවිදින් බණිනවා. හැබැයි දැන් මහරගම ගරු මන්ත්‍රීතුමා පමණක් හොඳින් එක යෝජනාවක් කළා කොයි වෙලාවක හෝ මේවා අපි අපේ අයට භාර දෙන්න ඕනෑයයි කිව්වා. ඇත්ත වශයෙන්ම ඒකයි ඇමතිතුමා කර තිබෙන්නේ. හත් අවුරුද්දකට පමණයි. මේවා භාරදී තිබෙන්නේ. හත් අවුරුද්දකට පස්සේ ඒ වෙලාව වෙනකොට අපේ අය ආවොත් ඒ අයට භාර දෙනවා. පෞද්ගලිකවයි, අපිමේක කියන්නේ, අපේ අයට දැන් මේක ගෙනයන ආකාරය පිළිබඳව වැටහීලත් තිබෙනවා, අවබෝධයකුත් තිබෙනවා.

අ. භා. 5.30

ඒ එක්කම සේවකයන් පුහුණු කිරීම අපි නතර කර නැහැ. ඒ අය පුහුණු කිරීමට ආයතන රත්මලානේ අපි අලුතෙන්ම පිහිටුවා තිබෙනවා. ඒ එක්කම ඒ උදවිය පිටරටවලට යවලත් පුහුණු කරනවා. එහෙම පුහුණු කළාට පසුව යම් දවසක ලාංකිකයන් අතින් මේවා පාලනය වේවි. ඒගැන සැකයක් නැහැ. නමුත් ඒ ගොල්ලන්ට කරන්න බැරි වුණ වැඩය මේ අමාත්‍යාංශය කර තිබෙනවා. ලෝකයේ අනික් ඕනෑම තැනක නිෂ්පාදනය කරන රෙද්දක තත්ත්වයට ලංකාවේත් රෙද්දක් නිෂ්පාදනය කරන්න පුළුවන්කම ලැබුණේ මේ ආණ්ඩුව යටතේ මේ අමාත්‍යාංශය ගෙන ගිය වැඩපිළිවෙළ නිසයි.

ඒ නිසා මම හිතන විධියට අපට දෙස් කියන්නට වුවමනාවක් නැහැ. අපි නිෂ්පාදනය නොකරන දේවල් තිබෙනවා. ඒක ඇත්ත. සමහර දේවල් අපි තවම නිෂ්පාදනය කරන්නේ නැහැ. ඒවා පිටරටින් ගෙන්වනවාට අපේ විරුද්ධත්වයක් නැහැ. දැන් මේ සියයට සියයේ බද්දක් අය කිරීම ගැන හුඟ දෙනෙක් කියනවා. ඒ ගැන අපි කිසිම දෙයක් කියන්නේ නැහැ. මේක අත්හදා බැලීමක් පමණයි කියා ගරු මුදල් ඇමතිතුමාම මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා. ඒක වෙනස් කරන්නට පුළුවන්. 100% බද්ද වෙනස් කරන්නට පුළුවන්. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුවත් අපට යෝජනාවක් නොකිරීම ගැන අපි කනගාටු වෙනවා. කිව්වේ මොකක්ද ? "ගෙන්වන්නට එපා". ගෙන්වන්නට එපාය කියා බැහැ. හැම වර්ගයක්ම නොවෙයි, අපි නිෂ්පාදනය කරන්නේ නැති සමහර වර්ග ගෙන්වන්නට සිදු වෙනවා.

ඒ එක්කම දැන් පාසල් ළමයින්ගේ රෙදි පිළිබඳවත් කිව්වා. ඒ පිළිබඳව මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. පාසල් ළමයින්ට වුවමනා කරන රෙදි වැඩි ප්‍රමාණයක් අපි නිෂ්පාදනය කළේ වැල්ලවත්ත රෙදි කම්හලෙන්. ඒ නිසා පොඩි අඩුවක් වෙන්න ඇති. නමුත් අපි ලබන ජනවාරි අන්තිම වන විට — පෙබරවාරි මාසය වන විට — ලංකාවේ පාසල් ළමයින්ට වුවමනා කරන සම්පූර්ණ රෙදි ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට දැනට පූගොඩ කම්හල හරි ගස්සාගෙන එහි නිෂ්පාදන පටන්ගන්න යනවා. ඒ නිසා ඉන්පසු අඩුවක් වෙන්නේ නැහැ. වැල්ලවත්ත රෙදි කම්හල වැහුවාය කියා අපට බැන්නා. නමුත් වැල්ලවත්ත කම්හලෙන් වූ නිෂ්පාදනය කොහේවත් නතර වී නැහැ. එහි නූවා නිෂ්පාදනය වුනා. ඒ මැෂින්ම ගෙනගොස් දමා ඒ නූවා නිෂ්පාදනය කරන්න අපි දැන් කටයුතු කර තිබෙනවා. ඊළඟට එහි හොඳම රෙදි මුද්‍රණය තිබුණා. ඒ මුද්‍රණ ඒකකයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කප්පන්න යනවා. ඊළඟට පාසල් ළමයින්ගේ රෙදි ප්‍රමාණය හැරෙන්න ඉතුරු සාමාන්‍ය පැබ්රික්ස් අපේ කර්මාන්ත ශාලාවල හොඳට නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ එක්කම, මේ කර්මාන්ත ශාලා අවුරුදු පහකටවත් හොඳට නඩත්තු කරන්න ඕනෑය වෙනස් කරන්න ඕනෑය මැෂින් වෙනස් කරන්න ඕනෑය කියා එතුමා කිව්වා. මම දන්නේ නැහැ මේ මන්ත්‍රීතුමා මොනවා බලලා කථා කරනවාද කියා. මේ තත්ත්වය වෙනස් නොකළා නම් මේ තත්ත්වයේ රෙදි අපි නිෂ්පාදනය කරන්නේ කොහොමද ? එතුමා ඒ එක්කම කිව්වා දශලක්ෂ දෙසියයක් අපි දෙනවාය, ඉල්ලා තිබෙන තවත් සියයක් දෙන්න යනවාය කියා. ඉතින් ඔය ඔක්කොම දෙන්නේ මේවා ආපසු හදන්න. හදන්නේ නැතුව මේ තත්ත්වය ගන්න බැහැ. ඇත්ත වශයෙන්ම එතුමා ඒගැන කල්පනා කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉස්සෙල්ලා අපේ මේ අමාත්‍යාංශය ඒවා කල්පනා කළ බව මම එතුමාට මතක්කරන්න ඕනෑ. දැන් අපි ප්‍රතිපත්තියක් වශයෙන් සෑම අවුරුදු පහකට වතාවක්ම සෑම කර්මාන්ත ශාලාවක්ම නවීකරණය කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. දැන් ඔය තත්ත්වය උදව් හොඳ තත්ත්වයේ රෙදි නිෂ්පාදනය වෙන්නේ ඒ අනුවයි.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
අවුරුදු පහකට වතාවක් නවීකරණය කරන්න ඕනෑ විපක්ෂයයි.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා
(திரு. ஆர். எம். தர்மதாச பண்டா)
(Mr. R. M. Dharmadasa Banda)
" මේ මැෂින් නම් ලාභයට ගේනවා, අය කරන බද්ද සියයට පහයි. නමුත් අමතර කොටස්වලට වැඩිය අය කරනවා " කියා ඊළඟට අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙනාවා. මේ යෝජනාව ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න අපට බැහැ. නමුත් මුදල් අමාත්‍යාංශයත් සමග සාකච්ඡා කර මොකක් හෝ වැඩ පිළිවෙළක් යොදන්න අපට පුළුවන්. එතුමා කියනවා මේ නිදහස් වෙළඳ කලාපයේ තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවලට ටෙලෙක්ස් මැෂින් දෙන්නලු. නව ටෙලිෆෝන් පහසුකම් දෙන්නලු. ඒ ගොල්ලන්ට සහනදායක මිලකට ලොරි දෙන්නලු. මේ ලංකාවේ තිබෙනවා ඇඟලුම් නිෂ්පාදකයින්ගේ සංගමයක්. ඒ සංගමයෙන් මෙහෙම කිසි දෙයක් ඉදිරිපත් වුණාය කියා මම දන්නේ නැහැ. දැන් මට පෙනෙන හැටියට ඒ සංගමයේ නියෝජිතයා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා වෙන්න ඕනෑ. මම හෙට ඒ සංගමයෙන් ඒ ගැන අහනවා. ඒ සංගමයට පහසු ක්‍රමයකට ලොරි ඉල්ලනවා. කොහෙම හරි දෙන්නලු. අමතර කොටස් දෙන්නලු. පඩි ගැන නම් වෙනත් විධියකට කිව්වා. ඊළඟට ටෙලෙක්ස් දෙන්නලු.

ජී. වී. එස්. ද සිල්වා මහතා
(திரு. ஜீ. வீ. எஸ். த சில்வா)
(Mr. G. V. S. de Silva)
කොටස් ඇති.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා
(திரு. ஆர். எம். தர்மதாச பண்டா)
(Mr. R. M. Dharmadasa Banda)
කොහොමද මම දන්නේ නැහැ. ඇඟලුම් කර්මාන්තකරුවන්ගේ නියෝජිතයා හැටියට, ප්‍රකාශකයා හැටියට කටයුතු කිරීමට මෙතරම් වුවමනාවක් ඇයි කියා අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න වෙනවා. මේගොල්ලෝ හත් අවුරුදු ආණ්ඩු කාලය තුළ කී දෙනෙකුට ටෙලෙක්ස් මැෂින් දීලාද මේ කථා කරන්නේ කියන එකයි මම අහන්නේ. ගරු සභාපතිතුමනි, 1977 අපි මේ ඇඟලුම් කර්මාන්තශාලා භාරගන්න කොට, ඒ කර්මාන්තශාලාවලින් ලැබුණු ආදායම දස ලක්ෂ 130යි. අද මේ අවුරුදු අට ඇතුළත, මේ ඇමතිතුමාට ඇමති ධුරය ලැබුණාට පසුව ඒ දස ලක්ෂ 130 ආදායම් ප්‍රමාණය දස ලක්ෂ 7,500 දක්වා නංවා තිබෙනවා. මොනවාද තව කියන්නේ ? ඔක්කොටම ටෙලෙක්ස් දෙන්න කියා තව ඉල්ලනවා. ටෙලෙක්ස් නොවෙයි අපට ඕනෑ, මේවායේ නිෂ්පාදනය වැඩි කරන්න ; වැඩි මුදල් මෙහාට ගන්න.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
ටයිප් රයිටර් එකක්වත් තිබුණේ නැහැ.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා
(திரு. ஆர். எம். தர்மதாச பண்டா)
(Mr. R. M. Dharmadasa Banda)
ටයිප් රයිටර් එකක්වත් තිබුණේ නැහැ. 1977 වනකොට දස ලක්ෂ 130ක් ඉපයුවේ. අවුරුදු අටකදී දස ලක්ෂ 7,500 දක්වා නංවා තිබෙනවා. එය මදිද ? හැබැයි ඒ ගැන මොකුත් කථා කරන්නේ නැහැ. දැන් ඉල්ලන්නේ ටෙලෙක්ස් මැෂින්. ඒ ළඟට මේ රෙදි නිෂ්පාදනවල කොටස් වෙළඳ පොළේ මිල පහළ බහිනවා කියා එතුමා කිව්වා. ඒ ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මොකද, සාමාන්‍ය මිනිසුන්ට ඒවායේ කොටස් නැති නිසා ඒවා ගැන කියන්න ඕනෑ නැහැ. එහෙත් ඒ මන්ත්‍රීතුමාට ඇති.

ගරු සභාපතිතුමනි, කපු මිල ගැන එතුමා තව එකක් කිව්වා. කපු මිල නියම කරන්නේ අපි නොවෙයි. තවමත් සියයට අනූපහකටත් වැඩි ප්‍රමාණයක් අපි කපු ගෙන්වන්නේ පිටරටින්. මේ කපු මෙහිම නිෂ්පාදනය කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශයත් සමග එකතු වී අපි පුළුවන් තරම් මහන්සි ගත්තා. ඊට පසුව ඒ වැඩ අධිකාරියක් හැටියට වෙනමම කණ්ඩායමක් යොදා කපු නිෂ්පාදනය කරගන්න වැඩ පිළිවෙළක් දැන් හරි ගස්සාගෙන යනවා. ඒක අපට ඇති දෙයක් නොවෙයි. නමුත් මේ රටේ කොයිතරම් කපු ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවාද කරනවාද, ඒ සම්පූර්ණ කපු තොගය මිලදී ගන්න අපි සූදානම්ය කියන ප්‍රතිඥාව අපි දී තිබෙනවා. මේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ 100%ක්ම ගැනීමට සූදානම් වී තිබෙන්නේ මොන ආයතනයද ? අපි ගන්න සූදානම්. මේ රටේ නිෂ්පාදනය කරන සම්පූර්ණ කපු ප්‍රමාණයම අපි ගන්න සූදානම්. අපි කපුවල මිල නියම කරන්නේ, අපි පිටරටින් ගෙන්වන කපුවල මිල ප්‍රමාණයේ හැටියටයි.

කපුවල මිල වැඩිය කියා කිව්වා. දැන් කිලෝ එකක් රුපියල් 90ය කියා කිව්වා. වෙන්න පුළුවන්. දැන් හැත්තෑවේ කාලය නොවෙයි. විදුලිබලය ලබාගන්න වැඩිය වියදම් කරන්න ඕනෑ. මම ඉස්සෙල්ලා කිව්වා, එදා පඩිය රුපියල් 600ය කියා. නමුත් අද පඩිය රුපියල් 2,000ක් ගෙවන්න වී තිබෙනවා. විදුලි බල ගාස්තු වැඩිය ගෙවන්න ඕනෑ. ආණ්ඩුවට වෙනත් ගෙවීම් කරන්න වී තිබෙනවා, ඒ ගෙවීම් ගෙවන්නත් ඕනෑ. ඒ එක්කම අපි පිටරටටත් ගෙවන්න ඕනෑ. ඒ ගෙවීම එන කොට තමයි, මේ ගණන.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය ගැන. එතුමන්ලා ඒ ගැන කතා කළා. පසුගිය වතාවේ නූල් මිල වැඩි කරන කොට, ඇමතිතුමා ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා, අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයට වුවමනා කරන නූල්වල මිල වැඩි නොකරන්න. බලවේග පේෂ කර්මාන්තය සඳහා පාවිච්චි කරන නූල්වල මිල විතරයි, වැඩි කළේ. අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා පාවිච්චි කරන නූල්වල මිල පොඩ්ඩක්වත් වැඩි කළේ නැහැ. ඒ ගණනටම තිබෙනවා. ඒ නිසා අත්යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදකයින් විසින් පාවිච්චි කරන නූල්වල කිසිම මිල වැඩි වීමක් වෙන්න බැහැ. මොකද අපි ඒ නූල් විකුණන්නේ පරණ මිලටම නිසා. තවත් පහසුකමක් හෙට අනිද්දා ඇති කරාවි. අපි ඒ අයගේ සමූපකාර සංගම්වලට කියනවා නූල් බෙදා හැරීම සමූපකාර සමිතිවලින් කරන්න පටන් ගන්නය කියා.

හුඟ දෙනෙක්ම කිව්වා අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය වැහිලා තිබෙන්නේ පේෂකර්ම අමාත්‍යාංශයේ වරදින්ය කියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ තිබුණු අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ආයතන එකක්වත් තවම වැහිලා නැහැ. අපට පෙනුන, 1978, 1979 කාලයේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයෙන් 45%ක්ම කරගෙන ගියේ සමූපකාර අංශයෙන් බව. අපේ අමාත්‍යාංශයෙන් දීලා තිබෙනවා, ගුරුවරයෙක්. අපේ අමාත්‍යාංශයෙන් දීල තිබෙනවා ගොඩනැගිල්ලක්. අමාත්‍යාංශයෙන් දීලා තිබෙනවා යන්ත්‍ර. තවත් ඕනෑ නම් අපි මෝස්තර දෙනවා. සතයක්වත් අය කරන්නේ නැහැ. සමූපකාර සමිති එකතු වෙලා, ඒ සමූපකාර සමිතිවලින් තමයි. මේවායේ පරිපාලනය ගෙන යන්නේ. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා කොළඹ සමූපකාර ඒකක 140ක් තිබුණා කියා. මම දන්නවා, දැන් ඒක 14ට බැහැලා තිබෙනවා. සමූපකාර සමිතිවලින් ඒවා පරිපාලය කළේ. අපේ කිසිම පාලනයක් නැහැ. සමූපකාර සමිති නූල් ගන්නවා ; රෙදි වියනවා ; විකුණනවා. අපට ඇති පාලනයක් නැහැ. නමුත් ඒ ගොල්ලන්ට ආධාර වශයෙන් අපි යන්ත්‍ර, ගොඩනැගිලි, ගුරුවරුන් ඔක්කොම දුන්නා. නමුත් ඒ ගොල්ලො දැන් බංකොලොත් වෙලා තිබෙන්නේ. සමූපකාර සමිතිවලින් ගෙනිච්ච ඒවා තමයි සම්පූර්ණයෙන් දැන් වැහිලා ගිහින් තිබෙන්නේ. ඒ වගේ ඒවායින් 450ක් දැන් නැවත පටන් ගැනීමට කටයුතු කර තිබෙනවා.

450න් 250කට ආසන්න ප්‍රමාණයක් දැන්ම විවෘත කර ඉවරයි. මම හිතනවා, ලබන අවුරුද්ද ඇතුළත ගරු ඇමතිතුමා ඉතුරු ටිකත් විවෘත කිරීමට කටයුතු කරාවිය කියා. මම හිතන හැටියට, අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් (රිචඩ් පතිරණ මහතා), හබරාදුව ගරු මන්ත්‍රීතුමාත් (ජී. වී. එස්. ද සිල්වා මහතා) අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන ඉල්ලුවා. අපි ඒවත් ලබා දෙනවා. ඒවා දීලා අවසානයේදී තවත් වුවමනා වුණොත් ඇමතිතුමා තීරණයක් ගනීවි ඒවටත් මොනවාද කරන්නේ කියා. ඒ මධ්‍යස්ථාන වැහුණේ පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ වරදකින් නොවෙයි. එහෙම වැහිලා තිබෙන්නේ පේෂකර්ම අමාත්‍යාංශය යටතේ තිබුණු ඒවා නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා]

1978, 1979 දී අපි ඉල්ලා සිටියා, සමුපකාර සමිතිවල තිබෙන ඔක්කොම පේෂකර්ම මධ්‍යස්ථාන අපේ දෙපාර්තමේන්තුවට බාර දෙන්නය කියා. එද එහෙම අපට බාර දුන්නා නම් ඔය එකක්වත් අපි වැහෙන්න ඉඩ තියන්නේ නැහැ. නමුත් අපට බාර දුන්නේ නැහැ. ඒගොල්ලො ගෙන යනවාය කිව්වා. ඒකේ ඵල විපාක තමයි, ඒවා ගෙන යන්න බැරුව අන්තිමට වහලා දමල තිබෙන්නේ. දැන් අපි ඒවාට ආයිත් සැරයක් කර ගහනවා. අපේ තිබෙන යුතුකමක් වශයෙන් නැවතත් අපි ඒවා විවෘත කරනවා. ඒ මගින් අපි පුළුවන් තරම් සහනයක් සලස්වන්න හදනවා. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා මේ නිසා දහස් ගණනකට රක්ෂා නැති වෙලායි කියල. ඒක මම හිතන්නේ නැහැ, ඇත්තක්ය කියා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) විශාල වැරදි සංඛ්‍යාලේඛන මෙහාට ඉදිරිපත් කළා. මම මේ ගැන අවුරුදු ගණනක්ම කිව්වා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා නොවෙයි, ඒක ගැන වචනයක්වත් කිව්වේ. අද කියනවා, එතුමන්ලා 77 පරදින කොට ලංකාවේ අත්යන්ත්‍ර එක් ලක්ෂ විසි පන්දහක් ක්‍රියාත්මක වෙමින් පැවතුණාය කියා. එක් ලක්ෂ විසි පන්දහ ලැයිස්තුවල තිබුණු අත්යන්ත්‍ර ප්‍රමාණය. ක්‍රියාත්මක වුණේ විසි තුන් දහයි. අද ඇවිල්ලා කියනවා අත්යන්ත්‍ර විසි පන්දහක් ක්‍රියාත්මක වුණාය කියා ඒ කාලයේ. මීට ඉස්සෙල්ලා අවුරුදුවල මම සංඛ්‍යාලේඛන ඉදිරිපත් කර තිබෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ සංඛ්‍යාලේඛන වැරදියි. අත්යන්ත්‍ර විසිතුන් දහයි ක්‍රියාත්මක වෙමින් පැවතුණේ. ඒ මන්ත්‍රීතුමා වැරදි ආරංචි වගයක් අරගෙන තිබෙන්නේ.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, අපේ අමාත්‍යාංශය අපට බාර දී තිබෙන වැඩ කටයුතුවලින්, විශේෂයෙන්ම අපෙන් බලාපොරොත්තු වුණේ රෙදිවල තත්ත්වය නැංවීමයි ; හොඳ තත්ත්වයේ රෙදි නිෂ්පාතය කරවීමයි ; හොඳ තත්ත්වය නූල් නිෂ්පාදනය කරවීමයි. අපි ඒ ටික කරලා තිබෙනවා. ඒවාගේම කර්මාන්තශාලා පරිපාලන කටයුතු ටික හරියට කර තිබෙනවා. ඊළඟට කාර්මිකයා පුහුණු කරන්න ඕනෑ, කාර්මිකයන්ට හොඳ ඥානයක් දෙන්න ඕනෑ. ඒ ටික දීලා තිබෙනවා. ඒ සඳහා රත්මලානේ මධ්‍යස්ථාන දෙකක් පිහිටුවා තිබෙනවා. එකක් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක්. අනික කර්මාන්තශාලාකරුවන්ට වුවමනා කරන ඥානය ලබාගැනීම සඳහා අත්හද බැලීම් ආදී සියල්ල කරන පයෝෂණායතනයක්. අපට ඒ සඳහා ලැබුණ විදේශ ආධාරත් අපේ ධනයත් එකතු කරලයි ඒ ආයතන පිහිටුවා තිබෙන්නෙ. ඒ දෙකෙන්ම විශාල සේවයක් සිදුවී තිබෙනවා.

අපට තවදුරටත් මේවා වර්ධනය කරන්න පුළුවන්කම ලැබෙන්නෙ තමුන්නාන්සේලාගේද සහයෝගය ඇතිවයි. විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලා දැන් පිළිගන්නවා නම් හොඳ තත්ත්වයෙ රෙදි අද නිෂ්පාදනය කරනවාය කියලා එහෙම නම් කරුණාකර අපත් එක්ක එකතු වෙන්න එන්න. රටට වුවමනා කරන සම්පූර්ණ රෙදි ප්‍රමාණය අපට නිෂ්පදනය කරන්න අපිත් එක්ක එකතු වෙන්න. මේ රටට වුවමනා කරන රෙදි වර්ග සියල්ලම නිෂ්පාදනය කරන්න පුළුවන්. අපි ආශා කරනව බොහොම හොඳ රෙදි අඳින්න. සමහරවිට හොඳ කලිසම් රෙදි පමණක් අපි තවම නිෂ්පාදනය කර නැහැ. ඒ හොඳ ඒවාත් නිෂ්පාදනය කරන්නට අපට උදව් දෙන්නය, අපිත් එක්ක එකට හිටින්නය කියලා මම විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා.

සමහර විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් කිව්වා අපි සමහර තැන්වලට නූල් බෙදන්නෙ නැත කියා. ඒ සඳහා සෑම තැනම නියෝජිතයන් පත්කර තිබෙනවා. මම දන්නෙ නැහැ එහෙම නොබෙදන්නෙ මොකද කියලා. මම සොයා බලන්නම්. සෑම තැනකටම නියෝජිතයන් පත්කර තිබෙන නිසා සෑම තැනටම නූල් ලැබෙන්න ඕනෑ. අත්යන්ත්‍රකාරයොත් කොළඹට එන්න ඕනැලු, නූල් ලබාගන්න. නැහැ. අත් යන්ත්‍රකාරයන්ට ගමේදීම ගන්න පුළුවන්.

මම අවසාන වශයෙන් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට දන්වන්න කැමතියි මොන අලුත් අත්හද බැලීම් ආවත් අපේ කර්මාන්තශාලා වැටෙන්න ඉඩ නොදී කර්මාන්තශාලාවලින් හොඳම තත්ත්වයේ රෙදි ටික නිෂ්පාදනය කරමින් හොඳ ලාබෙකට මෙය පවත්වාගෙන යන්න අමාත්‍යාංශයට පුළුවන් උත්සාහ දරන බව. ගරු ඇමතිතුමාගේ ආකල්පය ඒකයි. ඇමතිතුමා බලන්නෙ කොයි වෙලාවෙත් හොඳ රෙද්දක් හදල මහජනයා සතුටු කරන්නයි.

සැකයක් ඉපදුණා අපේ කර්මාන්තශාලා වැසේවිය කියා. එහෙම වෙන්නෙ නැහැ. බය වෙන්න ඕනෑ නැහැ. වැරදි ආකල්පයක් තිබෙනවා අපේ බලවේග කර්මාන්තශාලා ටිට ඉන්දියාවට විකකාය කියා. මම දන්නෙ නැහැ මේ කවුරු කියන ඒවාද කියලා. ඉන්දියාවේ කිසිම කෙනෙකුට විකුණා නැහැ. ලංකාවේ අයටයි විකුණල තිබෙන්නෙ. මා ළඟ ඒ සියලු වාර්තා තිබෙනවා. ඒ සඳහා උනන්දුවක් දැක්වූ විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් කවුරුත් දැන් මෙහි නැති නිසා මම ඒවා කියවන්න යන්නෙ නැහැ. අපට ගෙවීම් කර නැති අය ඉන්නවා. එසේ ගෙවා නැති කර්මාන්තශාලාවක් ආපසු ගත්තා. එය නැවතත් ටෙන්ඩර් කළා. වෙනත් කෙනෙකුට දුන්නා. ඊළඟට ගෙවා නැති තවත් හත්දෙනෙකුටම උසාවියේ නඩු දමා තිබෙනවා. ඒ මුදල් අය කරගන්න. තවත් එක කර්මාන්තශාලාවක් අපට ආපසු භාරගන්න තිබෙනවා. අපි මේ විධියට නීත්‍යානුකූලව වැඩ කරගෙන යනවා. ගහල පන්නන්න බැහැ. ඒ ගොල්ලන්ගෙ ඒ සිරිත් ඇති. අපට ඒවා කරන්න බැහැ.

අවශ්‍ය සංඛ්‍යාලේඛන සියල්ලක්ම ගරු ඇමතිතුමා ඉදිරිපත් කළා. මෙම අමාත්‍යාංශයෙන් – අපෙන් – බලාපොරොත්තු වන රෙදි නිෂ්පාදනය සහ ආදායම් ලබන ඇඟළුම් කර්මාන්ත කටයුතු අපි උපරිමයට කර තිබෙනවා. අපි ඒවා තවත්දුරට දියුණු කරනවා. අපේ රෙදි පිටරට යැවීමට අපි උපක්‍රම් යොද තිබෙනවා. අපේ කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන රෙදි අපි හෙමින් සීරුවේ ඇඟළුම්කරුවන් ලවා මහන රෙදිවලට එකතුකර මහන රෙද්දට මසා කෑලි වශයෙන් අපි පිටරට යවනවා. මේ අවුරුද්දේ පසුගිය තුන්මාසය ඇතුළත දශලක්ෂ 130ක ප්‍රමාණයක දැනටමත් පිටරටට ගිහින් තිබෙනවාය කියා ඇමතිතුමා විස්තර කිව්වා. ඒ ප්‍රමාණය වැඩි කරගෙන යනවා. ඒ නිසා නියෝජ්‍ය සභාපතිතමනි, ලංකාවේ වෙළඳපොළට පමණක් නොවෙයි අපේ රෙදි විදේශ වෙළඳපොළටද යවන්න අපි පුළුවන් තරම් උත්සාහ ගන්නවා. විරුද්ධ පක්ෂයේ එහෙන් මෙහේන් අත්ධකාරයේ අත ගාන්නේ නැතිව අපේ වැරදි තිබෙනවා නම් අපට කෙළින්ම කියලා අපට ඒවා හදගන්න අවස්ථාව දෙන්නය කියලා ඉල්ලනවා.

අ. භා. 5. 45

අවසාන වශයෙන් මේ වැඩ කටයුතුවලට සහාය දුන් ලේකම්තුමාගේ පටන් අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවෙන් සියලුදෙනාටම ස්තුතිය ප්‍රකාශ කරමින් මම නවතිනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නියෝජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා බොහොම දක්ෂ ලෙස විස්තරයක් ඉදිරිපත් කර චෝදනාවලටත් ප්‍රශ්න වලටත් පිළිතුරු දීම ගැන. සාමාන්‍යයෙන් ස්වාභාවිකව නින්ද ගිය මනුෂ්‍යයකු කුද්දන්න බොහොම ලෙහෙසියි. නමුත් හොරට බුදියගන්න මිනිහා—ඔය එහෙ මෙහෙ ගිහින් ඇවිත් රෑට හොරට බුදිය ගන්න මිනිහා—කුද්දන්න හරිම අමාරුයි. ඒ වගේම තමයි, විරුධ පක්ෂයේ මන්ත්‍රීවරු. විශේෂයෙන්ම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එහෙමයි. මේ ආණ්ඩුව පටන්ගත්ද සිට පේෂ කර්මාන්ත ක්ෂෙත්‍රයේ මේ අමාත්‍යාංශයෙන් කෙරුණු වැඩ කටයුතු ගැන මම ක්‍රමානුකූලව ශාස්ත්‍රානුකූලව සියලුම කරුණු පැහැදිලි ලෙස විස්තර කළා. ඒක අහන්න අකැමැති වුණා නේ. ඒක අහන්න හරි අකමැතියි. මේ දියුණුව ගැන අහන්න බොහොම අකමැතියි. ඊෂ්‍යාවක්ද කියල මම දන්නෙ නැහැ. එහෙම නැත්නම් පරණ කරුමයක්ද කියා මම දන්නෙ නැහැ. ඇත්තවශයෙන්ම කියනවා නම් රෙද්ද ඇඳ ඇඳ ඉස්තරම්ම රෙද්ද ඇඳ ඇඳ ඒකට ගරහනවා. ඒක තමයි සිද්ධ වී තිබෙන්නෙ. මෙතැන අපි කථා කරන විට, උත්තර දෙන විට ඒව අහගන්න ඉන්නෙත් නැහැ. මොන තරම් ව්‍යාජ පිළිවෙළකටද විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් කටයුතු කරන්නේ කියන එක එයින්ම පෙනෙනවා. ජාතිය වෙනුවෙන් කරන සටනක්ද, ජාතියකට අයිති පුද්ගලයන්ද, ජාති හිතෛෂීව ක්‍රියා කරනවාද කියන එක එයින් තේරුම් ගන්න පුළුවන්. මේ හොඳට ඇහැට පෙනෙන දෙයක්. අද රෙදි ගැන කවුරුත් කථා කරන්නෙ නැහැ. මේ අවුරුදු හත තිස්සේ අපි මෙය භාර අරගෙන කරගෙන යනවා. පසුගිය අවුරුදු තුනටම එක රෙදි යාරයක්වත් අපි ගෙන්වූවේ නැහැ. මේ රටේ දේශීය නිෂ්පාදන අපි දියුණු කළා. පාඩුවට දුවන ලද මෝල් ඔක්කොම අද ලාභයට දුවනවා. අපි මෙය භාර ගන්න විට බැංකු ණය රුපියල් දස ලක්ෂ 430ක් තිබුණා. මේ කර්මාන්තය ඉන් එහාට ගෙන යන්න බැරි තත්ත්වයකුයි තිබුණේ. නමුත් අද ලාභ ලැබෙනවා. ඉතින් අපි මේවා කියන විට පිළිගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැරි ඇයි ? රෙද්ද ඇඳ ඇඳ කවුරු හරි කියන එකක් අල්ලා ගෙන කථා කරනවා. එහෙම නැත්නම් අපි කියන දේ පිළිගන්නේ නැතිව වුවමනාවෙන්ම මේ කර්මාන්තය පාච්චල් කරමින් කථා කරනවා.

අද රටේ මහජනතාව බොහොම සන්තෝෂයෙන් ඉන්නවා. එද මේ රටේ එක් කෝටි පනස් ලක්ෂයක් පමණ ජනතාව දුක් වින්ද. පාන්දර හුලු අතු අරගෙන පවුලේ ඔක්කොම එක්ක ගිහින් පෝලිමේ ඉන්නවා. දුවට පාසල් යන්න රෙදි කෑල්ලක් ගත්තෙ. චීත්ත කෑල්ලක් ගත්තෙ ඒ විධියට පෝලිමේ ඉඳලයි. සමහර විට පුරුෂයා සහ භාර්යාව රෙද්ද මාරු කරගෙන ඇන්ද. මේ රටේ එහෙම කාලයක් තිබුණ බව දැන් ඒ අයට අමතක වී තිබෙනවා. මේ රටේ තිබුණේ ඒ විධියේ තත්ත්වයකුයි. හරියට මැරිල ඉපදුන අය වගේ දැන් කථා කරන්වා. එද තිබුණු තත්ත්වය සම්පූර්ණයෙන්ම අමතක කර දමා දැන් මේ තරම් දියුණුවක් ඇති කරමින් ගෙන යන වැඩ පිළිවෙළේ අඩුපාඩුකම් පෙන්වනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දැන් ටෙලෙක්ස් යන්ත්‍ර සොයනවා. ඉස්සර ඒ උදවියට විදේශ විනිමය උපයන ඇඟලුම් යවන්න පුළුවන් වුණේ කොයි තරම් ප්‍රමාණයකද ? අද ඒ මගින් අපි දහස් ගණනක් කෝටි ගණනක් විදේශ විනිමය උපයනවා. දැන් ටෙලෙක්ස් යන්ත්‍ර දෙන්නය, වාහන දෙන්නය කියා අපට උපදෙස් දෙන්න එනවා. අපේ අඩුපාඩුකම් පෙන්වනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, ඔය විධියට බලන විට දිව්‍ය සළු ගෙනැවිත් දුන්නත් මේ අය සතුටු කරන්න බොහොම අමාරුයි. කුණු කරවල කන මනුෂ්‍යයාට හොඳ කරවල දීල හරියන්නෙ නැහැ. එහෙම තත්ත්වයක් අද සිදුවී තිබෙන්නෙ. හොඳට කඩවසම් විධියට, ඇඟ වැහෙන විධියට ඇඳුම් අඳිනවාට විරුද්ධ පක්ෂය කැමති නැහැ. ඉස්සර සලුසලෙන් රෙදි ගෙන්වුවා තමුන්නාන්සේලාට මතක ඇති. ඒ ගෙන්වූ රෙද්ද අඟල් හයක් කොටයි. මොන දර්ශනයක් බලන්නද මම දන්නෙ නැහැ. අවශ්‍ය නියම උස ප්‍රමාණයට වඩා අඟල් හයක් කොට රෙද්දක් ගෙන්වූවා. එසේ රෙදි ගෙන්වූ පසු මෙහිදී යන්ත්‍රවලින් ඒ රෙදි පලල් කරන්න සමහර උදවියට සිදු වුණා. එහෙත් නියම ප්‍රමාණයට සකස් කර ගන්න බැරි වුණා. අන්න ඒ විධියේ තත්ත්වයකුයි තිබුණේ.

අද අපට ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කළා. වැල්ලවත්ත මෝල වැහුවාට පසුව මොනවාද කරන්නෙ කියා මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මූණසිංහ මහතා) ඇසුවා. ඒ මෝල වැහුවෙ ඇයි කියා ඇසුවා. ටෙන්ඩර් නොකැඳවූයේ ඇයි කියා ඇසුවා. අපි ජාත්‍යන්තර මට්ටමෙන් ටෙන්ඩර් කැඳෙව්වා. ටෙන්ඩර් කැඳවා නැවත වරක් මේ මෝල හෝමාගම පිහිටුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලුවා. ටෙන්ඩර් කරුවන් ඉදිරිපත් කර තිබුණ මිල ඉතාම අධිකයි. ඒ අනුව අපි මේ මෝල හැදුවා නම් අපට එය ලාභයට දුවවන්න පුළුවන් වන්නෙ නැහැ. ඒ නිසා එය නතර කරන්න සිදු වුණා. කම්කරුවන් සේවක පිරිස් සියලු දෙනාටම වන්දි ගෙව්වා. කාලය ගත වන නිසා විස්තර සියල්ල මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපි මෝල වහන්න කලින් ඒ සේවක පිරිස්වලට දැනුම් දුන්නා, අපි මේ වෙනුවට අළුතින් මෝලක් විවෘත කරන්න යනවා, එහි සේවයට යන්න කැමති නම් නියමිත වන්දි මුදලෙන් සියයට 50ක් ගෙවනවා කියා. ඊට පස්සේ මෝල විවෘත කළාම අපි සැම කෙනකුටම රැකියා දෙන බව කිව්වා. අපි මේක වහනවාය වන්දි ගෙවනවාය කිව්වාම හැම කෙනෙක්ම වන්දි ඉල්ලා ගත්තා. එනකොට අපි අළුත් මෝලක් දැම්මට තීරණය කරලත් නැහැ ; එය ප්‍රතික්ෂේප කරලත් නැහැ. එහෙම තත්ත්වයක් තිබුණේ. රුපියල් දස ලක්ෂ පනස් හතක් – 57 Million – වන්දි වශයෙන් ගෙවා තිබෙනවා.

බදුල්ලේ මන්ත්‍රීතුමා (ඩී. වින්සන්ට් ඩයස් මහතා) චෝදනාවක් කළා. ඒ ගැන විස්තර සහිතව අපට කරුණු දුන්නොත් පරීක්ෂා කර බලන්න අපි ලැස්තියි. තවම මම එහෙම එකක් ගැන දනගෙන නැහැ. මම නිලධාරී මහත්වරුන්ගෙන්, ලේකම් මහතාගෙන් ඇසුවා, මෙවැනි දෙයක් සිද්ධ වෙලා තිබෙනවාද කියා. උන්නැහේලාගේ මතකයේ හැටියට නම් එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. රෙදි වගයක් හොර රහසේ ගෙන්නුවාය, එසේ හොර රහසේ ගෙන්නු රෙදි ආපසු පිටරටට ඇරියාය කියන චෝදනාවක් කළේ. ඒ දෙකම ගැන අපට විස්තර දුන්නොත් ඒ ගැන පරීක්ෂා කර බලා පිළිතුරු දෙන්න ලැස්තියි.

නූල් නිෂ්පාදනය සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිතුමා කතා කළා. නූල් මිල වැඩියයි සමහර අය කියනවා. ලෝක වෙළෙඳ පොළේ නූල් මිල ගැන සලකා බලන විට සමහර විට පිටරටින් ගෙන්නනවා නම් මීට වඩා මිල අඩු වෙන්න පුළුවන්. නිෂ්පාදක රටවලින් විදේශවලට යවන විට ඒ ගොල්ලන්ට සහනයක් දෙනවා. එනකොට අපට තරගකාරී තත්ත්වයක් තිබෙන්නේ. අපි නිෂ්පාදනය කරන්නේ කපුවලට යන මුදලත් කුලියට යන මුදලත් විදුලි බලය ආදී දේවලට යන මුදලත් බලා යම්කිසි සුළු ප්‍රමාණයක ලාභයක් ලබාගෙන පමණයි. ඒ ප්‍රමාණය අනුව අපට පාඩුවට මෙය කරන්න බැහැ. ඒවා තමයි බෙදා හරින්නේ හැම තැනම. පාඩුවට විකුණන්නේ නැහැ. නමුත් මිල වැඩියි කියන්නත් බැහැ.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ඇහුවා ඇයි සමහර නූල් ගෙන්වන්න ඉඩ දෙන්නෙ නැත්තේ කියා. අපි නූල් මෙහි නිෂ්පාදනය කරනවා. මේ රටට අවශ්‍ය රෙද්ද වියන්න වුවමනා කරන මානයේ නූල් හුඟක් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම සමහර උදවිය ' බ්ලෙන්ඩඩ් යාන් ', කෘත්‍රිම නූල් ඉල්ලනවා. අපිත් ඒවා සෑහෙන ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා. නමුත් මේ රටේ නිෂ්පාදනය කරන ප්‍රමාණය ඉල්ලුමේ ප්‍රමාණයට මදි නිසා ඒ උදවියට පිටරටින් ගෙන්වන්න අපි ඉඩ දෙනවා. අපි ඒ සඳහා වෙනම බලපත්‍ර දෙනවා. ඒ විධියේ ප්‍රශ්නයක් තිබෙන විට එහෙම කරනවා. එහෙම නැත්නම්, නූල් සෑහෙන පමණටත් වඩා නිෂ්පාදනය කරන්නත් අපේ මැෂින්වල ධාරිතාවක් තිබෙනවා. ඒකයි තත්ත්වය. අපේ කැටිම් අංශයේ තිබෙන ඔක්කොම යන්ත්‍ර වැඩ කරන්නෙ නැහැ. සමහරවිට වැඩ කරන්නේ ෂිෆ්ට් දෙකයි.

වේයන්ගොඩ කර්මාන්තශාලා ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කරුණු කිව්වා. ඒකේ වෙළඳාම් අංශයේ අප ලාභ ලබන්නේ ' ට්‍රේඩිං ප්‍රොෆිට් '–ලක්ෂ පහක්ද කොහෙදෝ කිව්වා. නැහැ. අපි දස ලක්ෂ දෙකක් පමණ ලාභ ලබනවා. නමුත් අවාසනාවකට ගත්තු ණයතුරුස්වල පොලිය පමණක් ගෙවන්නත් විශාල මුදලක් අවශ්‍ය වෙනවා. මාසයකට ආදායම දස ලක්ෂ දෙකයි – 2 Million – නමුත් මාසයකට පොලිය පමණක් දස ලක්ෂ තුන හමාරක් ගෙවන්න සිදු වී තිබෙනවා. මේකයි අපට තිබෙන කරදරය. නමුත් අපි යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා මුදල් ඇමතිතුමාටත් භාණ්ඩාගාරයටත් මේ ගැන යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්න කියා.

මෙහි තිබෙන යන්ත්‍ර හුඟාක් පැරණියි. අවුරුදු විස්සක් වෙනවා. සමහර යන්ත්‍ර අපි අළුතෙන් දමා තිබෙනවා. දැන් මුද්‍රණ යන්ත්‍ර අළුතෙන් දමා තිබෙනවා. නව යන්ත්‍ර රාශියක් දන්න තිබෙනවා. ඒ අළුතෙන් දමනතුරු වර්ෂයක් පාසා ක්‍රමානුකූලව වැඩ කරන්න අපි සැලැස්මක් සකස් කර තිබෙනවා. මේ තත්ත්වය නිසා දිගින් - දිගටම පාඩු ලබන්න සිදු වෙනවා. ඒ තත්ත්වය වළක්වා ගන්න නම්, ගෙවන්න සිදු වී තිබෙන පොලියට සමාන මුදලක් ණයක් හැටියට නොව ආධාර මුදලක් හැටියට ආණ්ඩුවෙන් ලබා ගන්න අපට සිදු වෙනවා. අද ඒ කම්හලේ තත්ත්වය හුඟක් හොඳයි. ඒ කම්හලේ නිෂ්පාදන ඉතා හොඳ බව මුළු රටම පිළිගෙන තිබෙනවා. ඒ නිෂ්පාදන විදේශවලට පවා යවනවා. ඒ නිසා අපි ඒ කම්හල වහන්න ඉඩ දෙන්නේ නැහැ. යම්කිසි සැලැස්මක් ඇති කොට කම්හල තවදුරටත් හොඳින් පවත්වාගෙන යන්න අපි කටයුතු කරනවා.

මිනුවන්ගොඩ...

මිත්තේරියේ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. විජේකෝන් මහතා) මිත්තේරියේ කර්මාන්තශාලාවේ ප්‍රශ්නය ගැන මට කියන්න පටන් ගත්තේ මම මිත්තේරියේ අතුරු මැතිවරණ වැඩවලට ගිය කාලයේ ඉඳලාමයි. ඒ කර්මාන්තශාලාව සම්බන්ධයෙනුත් යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්න අපි උත්සාහ දරනවා. දැනටමත් අපි පඩි භාගයක් ගෙවනවා. එහි සේවය සඳහා ඉන්නා අයට. මේ තත්ත්වය ඇති වී දැන් අවුරුදු 1 1/2ක් විතර වෙනවා. මේ කර්මාන්තශාලාව සම්බන්ධයෙනුත් මොකක් හෝ තීරණයක් අපි ඉක්මණින්ම ගන්නවා. ඒ ගැනත් අපි දැනටමත් සැලැස්මක් ලෑස්ති කර තිබෙනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඇඟලුම් නිෂ්පාදන සමාගම් හා ඒ කර්මාන්තශාලා ගැනත් කීවා. ඒ සමාගම් දෙකක ව්‍යාපාර කොටස් විකුණන්න කටයුතු කර තිබෙනවා එතුමා ඊයේ රූපවාහිනියෙන් දක්කාය කියාත් කීවා. ඒවායේ කළමනාරිත්වය නරක නිසා වෙන්න ඇති, ඒ සමාගම් දෙකේ කොටස් විකුණන්න ලෑස්ති කර තිබෙන්නේ. අනෙක් ඒවායේ කොටස් විකුණන්නේ නැත්තේ මොකද කියා එතුමා ඇහුවා. කොටස් විකුණු සමාගම් දෙකේ යම් යම් අලාභ තිබෙනවා ඇති. අනෙක් ඒවායේ ලාභ තිබෙනවා වෙන්න ඇති. ඒවායේ කොටස් විකුණන්නේ නැත්තේ ඒ නිසයි. ඒ පොඩි ප්‍රශ්නයවත් එතුමාට තේරෙන්නේ නැහැ. මේ රටේ තිබෙන්නේ ඇඟලුම් කර්මාන්තශාලා දෙකක් පමණද ? සිය ගණන් තිබෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන හිතන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මහතා]

සමහර සේවකයන් මීත්තේරිය හා තුල්හිරිය යන කර්මාන්තශාලා දෙකෙන්ම පඩි ලබනවායයි මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කීවා. එතුමා මට එවැනි කෙනකුගේ නමකුත් ඉදිරිපත් කර තිබෙනවා. තවත් නම් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. අපි ඒවා සෝදිසි කර බලනවා. අපි කොහොමටවත් කැමති නැහැ, පඩි දෙකක් ගන්න ඉඩ තබන්න.

අත් - යන්ත්‍ර පේෂ කර්මාන්තය ගැන මීට කලිනුත් සඳහන් වුණා. මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ තමයි, අත් - යන්ත්‍ර මගින් තියම උසස් වර්ගයේ රෙදි නිෂ්පාදනය කරන්න පටන් ගත්තේ. ඒ නිසා ඒ නිෂ්පාදන විදේශවලට පවා යවන්න අපට දැන් පුළුවන් වී තිබෙනවා. ඒ මගින් ගිය අවුරුද්දේදී අපට රුපියල් දස ලක්ෂ 10ක විදේශ විනිමයක් ලැබී තිබෙනවා. ඒ නිෂ්පාදන ජපන් රටට පවා යවා තිබෙනවා. නෝර්වේ රටටත් ඒවා යවනවා. මීට ඉස්සර — පසුගිය ආණ්ඩුව කාලයේදී — කවදාවත් රෙදි යාරයක්වත් විදේශවලට යවා තිබෙනවාද ? අපි අත් - යන්ත්‍ර පේෂ කර්මාන්තයත් එන්න - එන්නම පුළුල් කරගෙන යනවා. අලුතින් විවෘත කරන සෑම අත් - යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානයකින්ම උසස් වර්ගයේ රෙදි නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපට අඳින්න පුළුවන්, පාවිච්චි කරන්න පුළුවන්, විදේශවලට යවන්න පුළුවන් රෙදි පමණයි, අපි ඒවායින් නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වන්නේ. එහෙම නැතිව පසුගිය ආණ්ඩු කාලයේදී කලා වගේ ණයට වැඩ කරන්න, විකිණෙන්නේ නැති රෙදි නිෂ්පාදනය කොට ගොඩගහගෙන ඉන්න සිදුවන තත්ත්වයක් ඇතිවන්න අපි ඉඩ තබන්නේ නැ.

අ.භා. 6.00

ඊළඟට, අද නිතරම කථා කරන ප්‍රශ්නයක් තමයි, සියයට 100 තීරුබද්ද.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Does the House agree to go beyond 6 p.m.

මන්ත්‍රීවරු
(அங்கத்தினர்)
(Members)

Aye.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

අපි දරා තිබෙන උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් රෙදි නිෂ්පාදනය අතින් මේ රට ස්වයංපෝෂණය වන්න කිට්ටු තත්ත්වයකට ඇවිත් තිබෙනවා. රෙදිවලින් ස්වයංපෝෂණය විය හැකි තරමේ නිෂ්පාදන ධාරිතාවක් අපේ කම්හල්වලට තිබෙනවා. ඒ වාගේම අපි නිෂ්පාදනය කරන රෙදිවල තත්ත්වයත් දැන් බොහොම දියුණුයි. එවැනි අවස්ථාවක තමයි, ඕනෑම කෙනකුට පිටරටින් රෙදි ගෙන්වීමට අවසරදී ඒ සඳහා සියයට 100 ක තීරු බද්දක් පනවන්න ආණ්ඩුව කටයුතු කළේ. "ඕ.ජී.එල්." ක්‍රමය යටතේ පිටරටින් බඩු ගෙන්වන්න කිසි කෙනෙක් විශේෂ අවසරයක් ගන්න ඕනෑ නැහැ. ඒ අනුව බැංකුවකින් "එල්. සී." එකක් අරගෙන පිටරටින් රෙදි ගෙන්වන්න ඕනෑම කෙනකුට පුළුවන්කම තිබෙනවා. ඒ අයගෙන් තමයි, සියයට 100 තීරුබද්දක් අය කර ගන්න ආණ්ඩුව අදහස් කළේ.

ඒකට හේතුව මොකක්ද ? මේ රටට හොරෙන් රෙදි ගෙන්වා අසුවුණු අවස්ථා බොහොමයක් තිබුණා. ඒ බව මහජනයාටත් දැනගන්න ලැබුණා. රේගු දෙපාර්තමේන්තුවට හා පොලීසියටත්, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවටත් එවැනි නොයෙකුත් අවස්ථා අසු වී තිබෙනවා.

මෙවැනි හොර ජාවාරම්වලට තුඩුදුන් තවත් හේතුවක් තිබෙනවා. මේ රටේ ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තය මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය යටතේ පුළුල් වුණා. දැන් " කන්ටේනර් " ක්‍රමයටයි, ඒ සඳහා අවශ්‍ය රෙදි පිටරටින් ගෙන්වන්නේ. නිෂ්පාදිත ඇඟළුම් ආපහු පිටරට අරින්නේත් ඒ ක්‍රමයටමයි. මේ හැම " කන්ටේනර් " එකක්ම පරීක්ෂා කර බැලෙන්නේ නැහැ. එය හොර ජාවාරම්වලට රුකුලක් වී තිබෙනවා. ඒ නිසා, ඇඟළුම් නිෂ්පාදන සඳහා ගෙන්වන රෙදි සම්බන්ධයෙන් පමණක් අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු සූදානම් කළා. ඒ රෙදි සඳහා පමණක් වෙනම " Bonded warehouses scheme " එකක් ක්‍රියාත්මක කරනවා. ඒ රෙදි රේගුව යටතේ තිබෙන ගබඩාවල, වෙනම තබනවා. ඒවා පාවිච්චි කරන විට අපේ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුත් රේගුවේ නිලධාරි මහත්වරුත් එක්ව නිෂ්පාදන කටයුතු සඳහා ඒවා එළියට දීලා නැවත ලොක් කරලා තබන්නටත්, ලේඛන පවත්වා ගෙන යන්නටත්, නැවත ඒ නිෂ්පාදන පිටරට යවන විට හරියාකාර පරීක්ෂා කර බලා යන්නටත් ක්‍රමයක් සකස් කර තිබෙනවා. එයට කියන්නේ " Bonded warehouses scheme " කියලයි. දැන් මාස 10 ක පමණ කාලයක් මේ රටේ ඒ ක්‍රමය පැවතුණා.ඒ නිසා ඒ ක්‍රමය ඇති කළාට පසුව ඇඟලුම් නිෂ්පාදන රෙදිවලින් පිටට යන්නේ බොහෙම අල්පයයි කියන එක ගැන අපට සෑහීමකට පත් වන්නට පුළුවන්. අතිකුත් හොරෙන් එන ඒවා එන්නේ බෝට්ටුවලින් මුහුද මැදට ගෙස් නැව්වලින් හොරෙන් අරගෙනයි. එවැනි සිද්ධිනුත් එතරම් නැහැ. ඒවා ලොකුවට පත්තරවල වැටුණා. මේවා හැමදාම කරන්න පුළුවන් දේවලුත් නොවෙයි. අසුවූ අවස්ථාවලදී ඒ අයට දඬ ගැසුවා. එය නතර කිරීමට වෙනත් නොයෙක් දේවලුත් කළා. මෙහි යම්කිසි දියුණු අවස්ථාවක් එන විට ගරු මුදල් ඇමතිතුමාත් ආණ්ඩුවත් කල්පනා කළා, තීරුබදු ක්‍රමයක් ඇති කර ලංකාවට රෙදි ගෙන්වීම නීදහසේ කරන්නට ඉඩ දුන්නොත් හොරෙන් කරන ජාවාරම් නතර වෙයි කියා. ඒ නිසා ඒ ගැනත් අපි ටිකක් ඉවසිල්ලෙන් ඉන්නට ඕනෑ. මේ යෝජනාව ගෙනාවේ ගිය මාසයේ 13 වැනිදායි. මෙය මොන ක්‍රමයකට යනවාද කියා අපි බලන්නට ඕනෑ. තව සමහර අය එල්. සී. යවලත් නැතිව ඇති, අළුතින් ගෙන්වන්නට. සළුසලත් යවා නැහැ. සළුසලට ඊයේ පෙරේදා මම අවසරය දුන්නා.

ළමයින්ට ඇඳුම් මැසීමට වුවමනා කරන රෙදි ටික දැන් පොළොව යටට ගිහින්. underground. දැන් ජනවාරි මාසයේදී ළමයින්ට පාසල් යන්නට අවශ්‍ය කරන සුදුරෙදි නැතිලු ! අපිත් සුදුරෙදි නිෂ්පාදනය කරනවා. අපේ ඒවා කපුවලින් නිෂ්පාදනය කරන රෙදියි. කෘත්‍රිම හා කපු මිශ්‍ර නිෂ්පාදන අපි වැඩිපුර කරන්නේ නැහැ. කපු නිෂ්පාදන නම් ඕනෑ තරම් තිබෙනව. නමුත් කොළඹ ලොකු විද්‍යාලවලට යන සමහර ළමයින්ට අර කෘත්‍රිම රෙද්ද ඕනෑ කරනවා. ඒක ඇන්දම ටිකක් හොඳට තිබෙනවා. කපු රෙදි ඇන්දම දහඩිය දමන්නේ නැහැ. ඇඟටත් ටිකක් සනීපයි. නමුත් කෘත්‍රිම එක පෙනීමට හොඳ නිසා එයට ආශා කරන පිරිසක් කොළඹ සිටිනවා. පිටිසර පළාත්වල නම් එවැනි තත්ත්වයක් නැහැ. ඒ අය කපුරෙදි අඳින්නට ලැහැස්තියි. තිබෙන රෙදි ටික යට ගසා දැන් බොරු තත්ත්වයක් පෙන්වා තිබෙනවා රෙදි නැහැයි කියා. ඒ නිසා ඒ හිඟය මකන්නට අපි පෙරේද සළුසලට බලයක් දුන්නා, පාසල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගවුම්වලට හා ෂර්ට්වලට වුවමනා කරන සුදුරෙදි ගෙන්වන්නට. ඒ නිසා යට ගසා තිබෙන ඒවාත් උඩට එන්නට පුළුවන්. ඉතින් අපිත් මේ අලුත් ක්‍රමය ගැන පොඩ්ඩක් බලමු. ගරු මුදල් ඇමතිතුමා කිව්වා වගේ අපි ක්‍රමානුකූලව බොහොම ශීඝ්‍ර ලෙස මේ රට රෙදි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වන තත්ත්වයට ගෙනෙන අවස්ථාවක එයට පටහැනිව තැත්තම් එයට කරදරකාරී පියවරක් එනවා නම් ඒ ගැන ගරු මුදල් ඇමතිතුමත් ගරු ජනාධිපතිතුමාත් කැබිනට් මණ්ඩලයත් කල්පනා කරන්නට ලැහැස්තයි. අන්න ඒ බව මම ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ නිසා අපි ඉක්මන් වෙන්න වුවමනා නැහැ. මේක අලුත් යෝජනාවක්. එය ක්‍රියාත්මක වන්නේ කොහොමද කියා බලමු. නිලධාරීන් හා විශේෂඥයින් අවුරුදු ගණනාවක් තිස්සේ කල්පනා කරලයි, මේ ක්‍රමය ඇතිකර තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන අපි ටිකක් බලමු, ක්‍රියාත්මක වන්නේ කොයි ආකාරයටද කියා.

මීට වඩා කථා කරන්නට මම අදහස් කරන්නේ නැහැ. වුවමනා කරන කථාව මම මුළින්ම කළා. මේ රටේ මේ සම්බන්ධයෙන් කෙරෙන දේවල් ඒ කථාවෙන් තේරුම් ගන්නට පුළුවන්. අවශ්‍ය කරුණු ඔක්කෝම මම ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විවේචනය කරනවිට මීට පසුවවත් මේවා කියවා බලා කරුණු දැනගෙන විවේචනය කරන්නය කියා මම ඉල්ලනවා. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කථා කිරීම, ධෛර්යදීම හා සහයෝගයදීම ගැන. ඒ සමගම මේ අවස්ථාව මම ප්‍රයෝජනයට ගන්නවා අපේ අමාත්‍යාංශයේ සිටින සෑම නිලධාරියෙකුටම මගේ ස්තුතිය පුද කරන්නටත්. විශේෂයෙන්ම ලේකම්තුමාත් අතිකුත් නිලධාරීනුත් කර්මාන්තශාලාවල සේවකයින් ඇතුළු සෑම අංශයකම සේවකයිනුත්, කළමනාකාරිත්වයත් ආදි වශයෙන් ඒ සියළු දෙනාම උපරිම සහයෝගය දුන්නා. මේ රටේ සිටින එක්කෝටි පනස් ලක්ෂයක් වන ජනතාවගේ දෙවැනි අවශ්‍යතාවය වන — පළමු වන අවශ්‍යතාවය කෑමයි, දෙවන අවශ්‍යතාවය වස්ත්‍රයි — රෙදි නිෂ්පාදනයට දෙන ලද ඒ ධෛර්යට හා උපකාරයට මගේ ස්තුතිය ඒ අයට පිරිනමමින් මම නිහඬ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 50,50,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 50,50,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 5,050,000, for Head 175, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන. – රෙදි කර්මාන්ත නගා සිටුවීම හා සංවර්ධනය කිරීම – මූලධන වියදම, රු. 5,25,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— புடைவைக் கைத்தொழில்களின் அபிவிருத்தியும் மேம்பாடும் —ஆக்கப்பொருட் செலவு, ரூபா 5,25,00,000

Programme 1.– Promotion and Development of Textile Industries – Capital Expenditure Rs. 52,500,000.

"175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 5,25,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

175 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 5,25,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 52,500,000, for Head 175, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන. – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – පුනරාවර්තන වියදම, රු. 21,98,000

நிகழ்ச்சித் திட்டம் 2.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — மீண்டுவரும் செலவு, ரூபா 21,98,000

Programme 2.– General Administration and Staff Services – Recurrent Expenditure, Rs. 2,198,000

"175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 21,98,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவரும் செலவுக்கான ரூபா 21,98,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,198,000, for Head 175, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන. – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා – මූලධන වියදම, රු. 1,30,000

நிகழ்ச்சித் திட்டம் 2.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — ஆக்கப் பொருட் செலவு, ரூபா 1,30,000

Programme 2.– General Administration, Staff Services – Capital Expenditure Rs. 130,000.

"175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,30,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

175 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 175, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 130,000, for Head 175, Programme 2, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 175, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

176 වන ශීර්ෂය – රෙදි කර්මාන්ත දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන. – රෙදි කර්මාන්ත අභිවර්ධනය හා උන්නතිය – පුනරාවර්තන වියදම, රු. 3,45,28,000

தலைப்பு 176.— புடைவைக் கைத்தொழில் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— புடைவைக் கைத்தொழில் அபிவிருத்தியும் மேம்பாடும் — மீண்டுவரும் செலவு, ரூபா 3,45,28,000

HEAD 176.– DEVELOPMENT OF TEXTILE INDUSTRIES

Programme 1.– Promotion and Development of Textile Promotion – Recurrent Expenditure, Rs. 34,528,000

"176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,45,28,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 3,45,28,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 34,528,000, for Head 176, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන. – රෙදිකර්මාන්ත අභිවර්ධනය හා උන්නතිය – මූලධන වියදම, රු. 15,41,000

நிகழ்ச்சித் திட்டம் 1.— புடைவைக் கைத்தொழில்' அபிவிருத்தியும் மேம்பாடும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 15,41,000

Programme 1.– Promotion and Development of Textile Production – Capital Expenditure Rs. 1,541,000

"176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 15,41,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

176 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 15,41,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 176, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,541,000, for Head 176, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 176, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

එකල්හි වේලාව අ. භා. 6 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි ; නැවත රැස්වීම 1985 දෙසැම්බර් 18 වන බදාදා.

நேரம் பி. ப. 6 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது புதன்கிழமை, 18 டிசெம்பர் 1985.

It being 6 p.m. the Chairman left the Chair to report Progress.

Committee report Progress ; to sit again on Wednesday 18th December 1985.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෞඛ්‍ය ඇමති වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

சுகாதார அமைச்சர் வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து அவர்களது சொந்த விளக்கம்

PERSONAL EXPLANATION BY DR. RANJITH ATAPATTU, MINISTER OF HEALTH

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1985 දෙසැම්බර් 11 වැනි බදාදා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරද්දී බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) කළ ප්‍රකාශයක් ගැන පැහැදිලි කිරීමක් කරන්නට මට සිද්ධවෙලා තිබෙනවා. එතුමා කළ ප්‍රකාශය එදින හැන්සාඩ් වාර්තාවේ, 38 වන කාණ්ඩයේ II වන කලාපයේ 1589 වැනි තීරුවේ මෙසේ සටහන් වෙනවා :

"දැනට දේශීය වෛද්‍යවරුන් හැටියට ලියාපදිංචි වී සිටින විශාල සංඛ්‍යාවකට බලපාන වගන්ති කීපයක් සඳහන් වෙලා තිබෙනවා. මේ පිළිබඳව උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේදීත් දේශීය වෛද්‍ය ක්‍රමය උගතුන් සහ ඉංග්‍රීසි වෛද්‍ය ක්‍රමය උගතුන් සහභාගි වෙලා අදහස් ප්‍රකාශ කළා මට මතකයි. මේ අයට බටහිර වෙදකම ගැනත් යම් ප්‍රමාණයක අවබෝධයක් දිය යුතුය කියා එම සභාවට සහභාගි වුණු මහාචාර්ය ඩැෆ්නී ආටිගල මහත්මිය ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළා."

ඒ ප්‍රකාශය ගැන මහාචාර්ය ඩැෆ්නී ආටිගල මහත්මිය මට ලිපියක් එවා තිබෙනවා. මම එය කියවන්නම්.

"The Hon. Dr. Ranjith Atapattu,
Minister of Health.

Dear Sir,

Teaching of Western Medicine to Ayurvedha Students

I refer to a statement alleged to have been made in Parliament by Mr. Amarasiri Dodangoda (SLFP) member for Baddegama on the above subject, which was published along with other Parliamentary Proceedings in the Ceylon Daily News of 12th December 1985 on p. 12. He has stated that I have supported the suggestion made that Ayurvedha students should be given instructions in Western Medicine.

I wish to inform you that I have not at any time made such a statement.

I shall be most grateful to you if you would kindly take this matter up when the House meets again.

Thank you."

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member for Yapahuwa. Not here.

මෙරිල් කාරියවසම් මහතා (අගලවත්ත)
(திரு. மெரில் காரியவசம் — அகலவத்த)
(Mr. Merril Kariyawasam – Agalawatta)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රශ්නයක් දැනුම් දී තිබෙනවා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහන්නට. නමුත් අධ්‍යාපන ඇමතිතුමාවත්, නියෝජ්‍ය ඇමතිතුමාවත් මේ සභා ගර්භයේ නැහැ. මම මේ ප්‍රශ්නයට නෝටිස් දුන්නේ පසුගිය බ්‍රහස්පතින්ද. මම දන්නෙ නැහැ මේ ප්‍රශ්නය ඇසීමෙන් වැඩක් තිබෙනවාද කියා.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please ! You can raise the Question now and they can answer tomorrow.

මෙරිල් කාරියවසම් මහතා
(திரு. மெரில் காரியவசம்)
(Mr. Merril Kariyawasam)

මම මේ ප්‍රශ්නය අහන්නේ මේ ගුරුවරුන් පිළිබඳව තිබෙන ඉතා භාරදූර තත්ත්වයක් සම්බන්ධයෙනුයි. අපේ අගලවත්ත වාගේ ආසනවල ගුරු පුරප්පාඩු රාශියක් තිබෙනවා. දැනට අපි සංඛ්‍යාලේඛන අනුව ගණන් බැලුවාම 159ක් පුරප්පාඩු තිබෙනවා. නමුත් ඒ ප්‍රදේශයේ ඉගැන්වූ ගුරුවරුන්, කළුතර දිස්ත්‍රික්කයේ ඉගැන්වූ ගුරුවරුන්, මෙවර ගුරු පුහුණුව ලැබූ උදවියව, මේ අවුරුද්දේ ට්‍රේනිං සෙන්ටර්ස්වලින් සමත්වී පිටවූ අයව, නැවත අපේ ආසනවලට එවන්නේ නැතුව, ඒ අයව රත්නපුර දිස්ත්‍රික්කයට යවන්න අධ්‍යාපන අමාත්‍යාංශය තීරණයක් ගෙන තිබෙනවා. සමහර ගුරුවරුන්ගේ සේවා ස්ථානයන් වශයෙන් නම් කර තිබෙනවා, අගලවත්ත ප්‍රදේශය. නමුත් එසේ නම් කර තිබුණු ගුරුවරුන් අපේ ප්‍රදේශ වැනි දුෂ්කර ප්‍රදේශවලට එවන්නේ නැතිව, වෙනත් දිස්ත්‍රික්කවලට යවන්න අමාත්‍යාංශය තීරණයක් අරගෙන තිබෙනවා. අපිට එක්කෝ පිටින් ගුරුවරුන් දෙන්න ඕනෑ. එසේ නැත්නම් අඩු ගණනේ අපේ ආසනවල ඉපදෙන, අපේ ආසනවල ජීවත් වන, අපේ ආසනවල මිය යන්නට නියමිත ගුරුවරුන් සේවය සඳහා අපේ ආසනවලට එවන්න ඕනෑ. ඒ කිසිවක් නැතිව, ඒ ගුරුවරුනුත් වෙනත් දිස්ත්‍රික්කවලට යැවීමෙන් ගුරුවරුන්ට යහපතක් වෙන්නේත් නැහැ. අපේ පාසල්වල ඉගෙන ගන්න දරුවන්ට යහපතක් වෙන්නේත් නැහැ.

දැනට ඇති සංඛ්‍යාලේඛන අනුව බලන විට අපේ ආසනයේ තිබෙන පාසල් 86න් පාසල් 43ක්ම ඉංග්‍රීසි උගන්වන්නට එක ගුරුවරයෙක්වත් නැහැ. විද්‍යා, ගණිත, විෂයයන් උගන්වන්න ගුරුවරුන් නැහැ. මගේ ආසනය දුෂ්කර ආසනයක් හැටියට නම් කර තිබෙනවා. පසුගිය දවස්වල දුෂ්කර දීමනා දීම සම්බන්ධයෙන් විමර්ශනයක් කළ අවස්ථාවේදී, අගලවත්ත ආසනයේ පාසල් 86න් පාසල් 66ක්ම ඇතුළත් වුණා, එක්කෝ දුෂ්කර පාසල් ගණයට, එසේ නැත්නම් අති දුෂ්කර පාසල් ගණයට. සමහර පාසල් තිබෙන්නේ කොපමණ දුෂ්කර ප්‍රදේශවලද කිව්වොත්, මගේ ආසනයේ එක පාසලක් තිබෙනවා, ඒ පාසලට යන්න බස් එකෙන් බැහැලා හැතැප්ම අටහමාරක් පයින් යන්න ඕනෑ. තව පාසලකට හැතැප්ම දෙක තුනක්ම පයින් යන්න තිබෙනවා. තවත් පාසල්වලට යන්න තිබෙන්නේ ඒදඬු දෙක තුනකින් ගොඩ වෙලයි. සමහර පාසල් තිබෙන තැන්වල නවතින්නටවත් තැනක් නැහැ. ඒ දුෂ්කරතාවයන් බොහොම තිබෙන නිසා අපේ ආසනවල පාසල්වලට ගුරුවරුන් ගෙන්වා ගැනීම අමාරුයි. දැනට අධ්‍යාපන දෙපාර්තමේන්තුව අගලවත්ත වැනි ප්‍රදේශවල ගුරුවරුන් වෙනත් දිස්ත්‍රික්කවලට යැවීමට හේතුවක් වශයෙන් කියන්නේ මොකක්ද ? වර්ෂාවසානයේදී අපේ දිස්ත්‍රික්කයෙන් පත්වීම් ලබා දිස්ත්‍රික්ක ක්‍රමය යටතේ මොනරාගල, වවුනියාව වගේ දිස්ත්‍රික්කවල සේවය කළ ගුවරුවරුන් ලබන අවුරුද්දේ කළුතර දිස්ත්‍රික්කයට එන නිසා ඒ ගුරුවරුන් එම ප්‍රදේශවලට දෙන්න පුළුවන්ය කියන එකයි. ඒ ගුරුවරුන් කිසි කෙනෙක් අගලවත්තට එන්නේ නැහැ. මන්ද ඒ උදවිය හොරණ, පානදුර, කළුතර වගේ තැන්වල උදවියයි. අවුරුදු හත අට දුර ස්ථානයක සේවය කර ගමට පත්වීමක් අරගෙන එන පුද්ගලයා හිතන්නේ තමන්ගේ ගම අසල උගන්වන්නටයි.

පානදුරේ ඉන්න ගුරුවරයෙකුට අගලවත්තේ පාසලකට යන්න අඩු වශයෙන් බස් හතරකවත් යන්න ඕනෑ. ඔවුන් පාන්දර 4ට සූදානම් වෙලා බස් එකට නැග්ගොත් පමණයි, අඩු වශයෙන් උදේ 9ට වත් අගලවත්තට යන්න පුළුවන් වෙන්නේ. එම නිසා ඒ උදවිය එන්නේ නැහැ, ඒ ප්‍රදේශවලට. තමන්ගේ සේවා ස්ථානය වශයෙන් අගලවත්ත ඉල්ලා තිබෙන ගුරුවරුන්, කළුතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිස්ත්‍රික්කයේ ගුරුවරුන්, අගලවත්ත ආසනය ඇතුළත ඉපදිලා ඉගෙන ගෙන, උගත්වලා, මැරෙන්න නියමිත ගුරුවරුන් පිට තැන්වලට යවන්නේ අපේ ආසනයේ මේ තරම් බැරෑරුම් තත්ත්වයක් තිබියදීයි. මේ අවුරුද්දේ දැනටමත් 160 ගණනක ගුරුවරුන්ගේ ඇබෑර්තු අගලවත්ත ආසනයේ තිබෙන නිසා මේ තීරණය වෙනස් කර කළුතර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් අගලවත්ත, බුලත්සිංහල වැනි කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි දුෂ්කර පාසල්වලට ඔවුන් පත් කර එවන්න බැරි ඇයි කියා මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put and agreed to

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.15ට 1985 නොවැම්බර් 28 වන දින සභා සම්මතිය අනුව 1985 දෙසැම්බර් 18 වන බදාදා පූ. භා. 9 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி. ப. 6.15 மணிக்கு, பாராளுமன்றம் அதனது 1985 நொவம்பர் 28 ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 1985 டிசெம்பர் 18, புதன்கிழமை மு. ப. 9 மணிவரை ஒத்திவைக்கப் பட்டது.

Adjourned accordingly at 6.15 p.m. until 9.00 a.m. on Wednesday, 18th December 1985, pursuant to the Resolution of the Parliament of 28th November 1985.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීහු මීට පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1985 දෙසැම්බර් 31 වන අඟහරුවාද

නොපමාව ලැබෙනසේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1985 டிசெம்பர் 31, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

not later than

Tuesday, 31st December 1985

Contents of Proceedings	:	**From 9.00 a.m. to 6.15 p.m. on 17.12.1985**
Final set of manuscripts received from Parliament	:	**7.20 p.m. on 18.12.1985**
Printed copies despatched	:	**19.12.1985 morning**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா: ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org